305 වන කාණ්ඩය - 02 වන කලාපය
தொகுதி 305 - இல. 02
Volume 305 - No. 02

2023 අගෝස්තු 09වන බදාදා
2023 ஓகஸ்ட் 09, புதன்கிழமை
Wednesday, 09th August, 2023

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
ගරු හරින් ප්‍රනාන්දු මහතා විසින් 2023.08.08 දින මතු කරන ලද වරප්‍රසාද ප්‍රශ්නය
කථානායකතුමාගේ සහතිකය
ජාතික උරුමයන් සුරැකීම උදෙසා ක්‍රියාත්මක වීම පිණිස වන පාර්ලිමේන්තු සංසදය ස්ථාපිත කිරීම

**ගරු ජනාධිපතිතුමාගේ විශේෂ ප්‍රකාශය**

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා**

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව**

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
ධීවර කර්මාන්තය මුහුණ දෙන ගැටලු
ජල හිඟය නිසා ගොවීන් මුහුණ දෙන ගැටලු

**"අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ අඩුපාඩු:**
මුදල් රාජ්‍ය ඇමතිතුමාගේ ප්‍රකාශය

**වරප්‍රසාද යෝජනා:**
2023.07.02 දින "ඉරිදා මව්රට" පුවත් පත් වාර්තාව

**ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

**විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර හා තුන්වන වර කියවා සම්මත කරන ලදී

**ධීවර සහ ජලජ සම්පත් පනත:**
නියෝග

**ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:**
සලකා බලා තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

**කල්තැබීමේ යෝජනාව:**
කුකුළු පාලනය සහ බීඩි කර්මාන්තය ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළක්

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
மாண்புமிகு ஹரின் பர்னாந்துவினால் 2023.08.08ஆம் திகதியன்று எழுப்பப்பட்ட சிறப்புரிமைக் கேள்வி
சபாநாயகரது சான்றுரை
தேசிய மரபுரிமைகளைப் பாதுகாப்பதற்கான பாராளுமன்ற ஒன்றியத்தைத் தாபித்தல்

**மாண்புமிகு சனாதிபதியினது விசேட கூற்று**

**அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்**

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை**

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**
மீன்பிடிக் கைத்தொழில் எதிர்நோக்கும் பிரச்சினைகள்
நீர் பற்றாக்குறையால் விவசாயிகள் எதிர்கொள்ளும் பிரச்சினைகள்

**"அஷ்வசும" நலன்புரி நன்மைகள் திட்டத்திலுள்ள குறைபாடுகள்:**
நிதி இராஜாங்க அமைச்சரினது கூற்று

**சிறப்புரிமைப் பிரேரணைகள்:**
2023.07.02ஆம் திகதிய "இரிதா மவ்ரட" பத்திரிகை அறிக்கை

**பந்தய, சூதாட்ட விதிப்பனவு (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**ஒதுக்கீடு (திருத்தம்) சட்டமூலம்**:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

**கடற்றொழில் மற்றும் நீர்வாழ் உயிரின வளங்கள் சட்டம்:**
ஒழுங்குவிதிகள்

**இலங்கை வரிவிதிப்பு நிறுவகம் (கூட்டிணைத்தல்) (திருத்தம்) சட்டமூலம்:**
பரிசீலிக்கப்பட்டுத் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**
கோழி வளர்ப்பு மற்றும் பீடிக் கைத்தொழிலைப் பாதுகாக்கும் வேலைத்திட்டம்

# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
Question of Privilege Raised by Hon. Harin Fernando on 08.08.2023
Speaker's Certificate
Establishment of Parliamentary Caucus for Functioning Towards Safeguarding National Heritages

SPECIAL STATEMENT BY HONOURABLE PRESIDENT

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

PUBLIC FINANCE COMMITTEE REPORT

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE
Issues Faced by Fishing Industry
Problems Faced by Farmers Due to Scarcity of Water

SHORTCOMINGS IN "ASWESUMA" WELFARE BENEFIT SCHEME:
Statement by State Minister of Finance

PRIVILEGE MOTIONS:
News Report in "Irida Mawrata" Newspaper of 02.07.2023

BETTING AND GAMING LEVY (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended

APPROPRIATION (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed

FISHERIES AND AQUATIC RESOURCES ACT:
Regulations

SRI LANKA INSTITUTE OF TAXATION (INCORPORATION) (AMENDMENT) BILL:
Considered, read the Third time, and passed as amended

ADJOURNMENT MOTION:
Programme to Protect Poultry Farming and Beedi Industry

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2023 අගෝස්තු 09වන බදාදා*
*2023 ஓகஸ்ட் 09, புதன்கிழமை*
*Wednesday, 09th August, 2023*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### ගරු හරින් ප්‍රනාන්දු මහතා විසින් 2023.08.08 දින මතු කරන ලද වරප්‍රසාද ප්‍රශ්නය
### மாண்புமிகு ஹரின் பர்னாந்துவினால் 2023.08.08ஆம் திகதியன்று எழுப்பப்பட்ட சிறப்புரிமைக் கேள்வி
### QUESTION OF PRIVILEGE RAISED BY HON. HARIN FERNANDO ON 08.08.2023

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

I wish to announce to this august Assembly the Ruling with reference to the Question of Privilege raised by the Hon. Harin Fernando in Parliament on 08.08.2023.

Article 4(c) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka provides that "the judicial power of the People shall be exercised by Parliament through courts, tribunals and institutions created and established, or recognized, by the Constitution, or created and established by law, except in regard to matters relating to the privileges, immunities and powers of Parliament and of its Members, wherein the judicial power of the People may be exercised directly by Parliament according to law;".

I also emphasize that according to Article 148 of the Constitution, "Parliament shall have full control over public finance. No tax, rate or any other levy shall be imposed by any local authority or any other public authority, except by or under the authority of a law passed by Parliament or of any existing law".



I wish to announce, firstly, that the Cabinet of Ministers unanimously approved the Domestic Debt Optimization Programme proposed by the Ministry of Finance, Economic Stabilization and National Policies at a special Cabinet Meeting held on 28.06.2023.

Afterwards, the Resolution for the implementation of the Domestic Debt Optimization to restore sovereign debt sustainability was approved by the Committee on Public Finance of Parliament by a majority of Committee Members at the Committee Meeting held on 30th June 2023.

Thereafter, as the subject matter contained in the said Resolution was essentially a matter of public finance, the Resolution for the implementation of the Domestic Debt Optimization to restore sovereign debt sustainability was passed by a majority Vote in Parliament on the 01st of July, 2023 with 122 Members voting in favour and 62 against.

As the Resolution for the implementation of the Domestic Debt Optimization to restore sovereign debt sustainability has now been passed by Parliament on 01.07.2023, the Resolution is beyond the jurisdiction of the Supreme Court or any other court established under the 1978 Constitution of Sri Lanka and cannot be questioned and/or reviewed and/or challenged.

The Ruling given on the 20th of June, 2001 by the Hon. Anura Bandaranaike, Speaker of Parliament, held in unequivocal terms that Parliamentary proceedings cannot be called in question and/or interferred and/or intervened by courts and also held that the Supreme Court had no jurisdiction to issue interim orders, restraining the Speaker of Parliament in respect of the steps he is empowered to take under Standing Order 78A and the interim order of the Supreme Court is not binding and of no legal obligation to comply.

I also wish to highlight Section 3 of the Parliament (Powers and Privileges) Act, No. 21 of 1953 read with Article 67 of the 1978 Constitution in this context, which provides that the Proceedings of Parliament shall not be liable to be impeached or questioned in any court or place out of Parliament.

Hence, no court established under the Constitution of Sri Lanka is empowered to issue orders or judgments of any nature against a Resolution already passed by Parliament having followed the due Parliamentary process, and any such order or judgment of courts would amount to a violation of item 01 of Part B of Parliament (Powers and Privileges) Act, No. 21 of 1953, as amended.

Thank you.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Kiriella?

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇති කර ගත් ගිවිසුම - Staff-level Agreement එක - නිසා ඇති වන ඵල විපාක ගැන කථා කරන්න ඒ යෝජනා සම්මතය ඇත්ත වශයෙන්ම පාර්ලිමේන්තුවට ගෙනෙන්න අවශ්‍යතාවක් තිබුණේ නැහැ. මම මේ බව ඊයේත් කිව්වා. රජයට ඕනෑ නම් ඒක පාර්ලිමේන්තුවට ගේන්නේ නැතිව පාර්ලිමේන්තුවෙන් පිටදී ඒ අවශ්‍ය කටයුතු කරන්න තිබුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, now the - *[Interruption]*

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
පොඩ්ඩක් ඉන්න. මට කථා කරන්න ඉඩ දෙන්න.

ආණ්ඩුවමයි මේක පාර්ලිමේන්තුවට ගෙනාවේ. පාර්ලිමේන්තුවට ගෙනැවිත් ඒකට ඡන්දයකුත් ගත්තා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
You said that yesterday. Now, the Ruling has been given and that is final.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Please, let me speak.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
If you want to debate it, you had better go for a separate debate.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
The Hon. Speaker has made a Ruling on that.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මට පොඩ්ඩක් කථා කරන්න දෙන්න. කවුරුන් හෝ ඒ සම්බන්ධයෙන් අධිකරණයට ගිහින් තිබෙනවා නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I am sorry, we cannot proceed with it beyond that. - *[Interruption]* Thank you very much.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
පොඩ්ඩක් ඉන්න. *[බාධා කිරීම්]* කවුරුහරි අධිකරණයට ගිහින් තිබෙනවා. අධිකරණයේ ක්‍රියාත්මක වීම නවත්වන්න තමයි මේක ගෙනැල්ලා තිබෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரும்)
(The Hon. Dinesh Gunawardena - Prime Minister and Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government)
ගරු කථානායකතුමනි, ඔබතුමා විසින් දෙන ලද තීරණයකට එකඟ නැත්නම් ඒ සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු පිළිවෙත ස්ථාවර නියෝගවල පැහැදිලිව සඳහන්ව තිබෙනවා. එම නිසා ඔබතුමා දුන් තීරණය අනුව අපි පාර්ලිමේන්තුවේ කටයුතු ඉදිරියට ගෙන යමු. ස්ථාවර නියෝගවලට පටහැනිව එක එක දේවල් ප්‍රකාශ කරන්න බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Let us proceed with the Business of the Day, please.- *[Interruption]*

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
එතකොට අධිකරණයට මේක -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
We will now proceed with the Business of the Day .- *[Interruption]* You have a day's debate on that.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
No, no.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No, you can. -*[Interruption]*

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, එතකොට ඒක අධිකරණයකට විභාග කරන්න -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Now, it is not the time to discuss all those details. Thank you. - *[Interruption]*

## II
## කථානායකතුමාගේ සහතිකය
## சபாநாயகரது சான்றுரை
## SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මවිසින් 2023 අගෝස්තු 08වන දින "දූෂණ විරෝධී" සහ "අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ" නමැති පනත් කෙටුම්පත්වල සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
Hon. Speaker, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, වැදගත් කාරණයක් ඉදිරිපත් කරන්න ඔබතුමාගේ අවසරය ලබා දෙන්න.

අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ සඳහන් වෙනවා මූලික අයිතිවාසිකම් පිළිබඳව. එයට අනුව, මේ රටේ පුරවැසියන්ට එක හා සමාන සැලකීමක් දක්වන්න ඕනෑ කියන මූලික අයිතිය තහවුරු කර තිබෙනවා. ගරු කථානායකතුමනි, යම් රාජ්‍ය ක්‍රියාදාමයක් තුළ මේ රටේ පොදු ජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී තිබෙනවා නම්, එකම රටක පුරවැසියන්ට එක හා සමාන සැලකිල්ලක් නොදක්වමින් විවිධාකාරයෙන් සලකනවා නම් ඒ පුරවැසියාට අයිතියක් තිබෙනවා, අධිකරණයේ පිහිට පතලා ව්‍යවස්ථාදායකය හෝ විධායකය හෝ ඉදිරිපත් කරන යෝජනා අභියෝගයට ලක් කරන්න.

ගරු කථානායකතුමනි, බොහොම ගෞරවයෙන්, වගකීමෙන් මම මේ කාරණය කියන්නේ. මෙතැනදී ඔබතුමාගේ කටින්ම කියැවුණා, domestic debt restructuring ගැන. දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම තුළ මේ රටේ වැඩ කරන ජනතාවට එක සැලකිල්ලකුත්, primary bondholdersලාට තවත් සැලකිල්ලකුත්, ඒ කියන්නේ සුපිරි පොහොසතුන්ට එක සැලකිල්ලකුත්, වැඩ කරන ජනතාවට තවත් සැලකිල්ලකුත් දැක්වීම තුළ fundamental rights application එකක් හරහා මේ රටේ පුරවැසියෙකු අධිකරණයට ගියොත්, අධිකරණයට අයිතිය තිබෙනවා, ඒ කරපු රාජ්‍ය ක්‍රියාදාමය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලද, නැද්ද, ඒ පුද්ගලයාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වෙලා තිබෙනවාද, නැද්ද කියන එක ගැන මතයක් පළ කරන්න; නියෝගයක් දෙන්න. අධිකරණයට fundamental rights jurisdiction එක නැහැ කියන්න බැහැ නේ. මේකයි ප්‍රධාන අරමුණ. මේ රටේ පුරවැසියන්ට පවතින රජය දෙයාකාරයෙන් සලකන කොට - primary bondholdersලාට, සුපිරි පොහොසතුන්ට ලොකු profit windfall එකක්, මහා ලාභ ගංගාවක් නිර්මාණය කිරීමත්, වැඩ කරන ජනතාවගේ අර්ථසාධකය, භාරකාර අරමුදල් කප්පාදු කිරීමත් කරන විට - මූලික අයිතිවාසිකම් පෙත්සමක් හරහා අධිකරණයේදී ඒවා අභියෝගයට ලක් කරන්න ඇත්ත වශයෙන්ම පුළුවන්. එවිට ඒ සම්බන්ධයෙන් තීන්දුවක් දෙන්න අධිකරණයට පුළුවන්. ඒක පාර්ලිමේන්තුවට නතර කරන්න බැහැ. අපි අන්න ඒකත් විශේෂයෙන් පැහැදිලිව මතක් කරනවා, අපේ විපක්ෂය වෙනුවෙන්. - *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, ඊයේ දිනයේදීත් මේ වරප්‍රසාද ප්‍රශ්නය මතු කළ වෙලාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4වන ව්‍යවස්ථාවේ ඡේද කීපයක් මම ඉංග්‍රීසි භාෂාවෙන් උපුටා දැක්වුවා. මම මේ අවස්ථාවේදී ඒවා සිංහල භාෂාවෙන් උපුටා දක්වනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4වන ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ පරමාධිපත්‍යය ක්‍රියාත්මක කිරීම ගැනයි. 4 (ආ) යටතේ සඳහන් පරිදි, ජනතාවගේ විධායක බලය ක්‍රියාත්මක වන්නේ ජනතාව විසින් පත් කර ගන්නා ලද විධායක ජනාධිපතිවරයා මඟින්.

ඊළඟට, 4 (අ) යටතේ සඳහන් පරිදි, ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක වන්නේ මේ ගරු පාර්ලිමේන්තුව විසින් සහ ජනමත විචාරණයක දී ජනතාව විසින්.

දැන් මම කියවන්නම්, 4 (ඇ) ඡේදය.

එහි මෙසේ සඳහන් වෙනවා:

"නීතිය අනුව පාර්ලිමේන්තුව විසින් ම ක්‍රියාත්මක කළ හැකි පාර්ලිමේන්තුවේ සහ එහි මන්ත්‍රීවරයන්ගේ වරප්‍රසාද, පරිහාර හා බලතල සම්බන්ධයෙන් විනා ජනතාවගේ අධිකරණ බලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කොට පිහිටුවන ලද හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගන්නා ලද නැතහොත් වෙනත් යම් නීතියකින් ඇති කොට පිහිටුවන ලද අධිකරණ, විනිශ්චය අධිකාර සහ ආයතන මගින් පාර්ලිමේන්තුව විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය;"

1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මෙතැනින් එහාට ගිහිල්ලා තමයි ජනතාවගේ අධිකරණ බලය පාර්ලිමේන්තුවට තිබුණේ. හැබැයි, 1978 ව්‍යවස්ථාව සම්පාදනය කිරීමේදී එවකට අග්‍රාමාත්‍යවරයාව සිටි ගරු රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති විශේෂ කාරක සභාවකින් ගෙනෙන ලද යෝජනාවක් අනුව තමයි මේ 4 (ඇ) ව්‍යවස්ථාව මේ ආකාරයෙන් කෙටුම්පත් වෙලා තිබෙන්නේ. මම ඒකත් සඳහන් කරන්න ඕනෑ. That is the history.

ගරු කථානායකතුමනි, ඊළඟට මම පැහැදිලිව පෙන්නුම් කර දෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 76වන ව්‍යවස්ථාව. ඒකේ කියන්නේ ව්‍යවස්ථාදායක බලය පවරා දීම ගැන. 76 (1) ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ මොකක්ද?

එහි මෙසේ සඳහන් වෙනවා:

"පාර්ලිමේන්තුව විසින් පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක බලය අත් නොහළ යුත්තේ ය. කිසිම ආකාරයකින් අන්සතු නො කළ යුත්තේ ය. කවර වූ හෝ ව්‍යවස්ථාදායක බලයක් ඇති කිසිම අධිකාරයක් පාර්ලිමේන්තුව විසින් නොපිහිටුවිය යුත්තේ ය."

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන් මහතා]

That is the supremacy of Parliament. ඒක මේ රටේ විතරක් නොවෙයි, පාර්ලිමේන්තු ක්‍රමයක් තිබෙන, සම්ප්‍රදායක් තිබෙන ඕනෑම රටක එහෙමයි. වෙස්ට්මින්ස්ටර් ආකෘතියේ තිබෙන්නා වූ පාර්ලිමේන්තුවක වුණත් මේ සිද්ධාන්තය එලෙසමයි.

ගරු කථානායකතුමනි, ඊළඟට මම යනවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 120වන ව්‍යවස්ථාවට. ඒකේ සඳහන් වෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණ බලය පිළිබඳව. ඒ ගැන කිසිම ගැටලුවක් නැහැ. ඕනෑම කෙනෙකුට 120 ව්‍යවස්ථාව, 121 ව්‍යවස්ථාව සහ 122 ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත්, ජනතාවගේ පරමාධිපත්‍ය බලය කියන එක 4වන ව්‍යවස්ථාවෙන් පැහැදිලිව මේ ආයතන තුනට දීලා තිබෙනවා. මෙහිදී ගරු කථානායකතුමා විසින් ඉතාම නිවැරදිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අදාළ ව්‍යවස්ථා පැහැදිලි කරමින් තමයි ඊයේ මතු කරන ලද වරප්‍රසාද ප්‍රශ්නය සම්බන්ධයෙන් තීන්දුව දුන්නේ. ඒ විතරක් නොවෙයි. 2001දී ගරු අනුර බණ්ඩාරනායක මැතිතුමා දුන් තීන්දුවක් තිබෙනවා. එතකොට මමත් මේ පාර්ලිමේන්තුවේ සිටියා. ඒ ගැනත් ඔබතුමාගේ තීන්දුවේදී පෙන්නුම් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා ඔබතුමා විසින් දෙන ලද තීන්දුවක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ වාදයක් කරන්න බැහැ. එහෙම කරනවා නම් ස්ථාවර නියෝග යටතේ වෙනම ගත යුතු ක්‍රියා මාර්ගයක් තිබෙනවා. අපි ඔබතුමාගේ තීන්දුවට ගරු කරනවා. එදා බහුතර ඡන්දයකින් Resolution එක pass කරලා තිබෙනවා. That is the supremacy of Parliament.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

I would like to say this. දැන්, කවුරු හරි අධිකරණයට ගිහිල්ලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක ඔබතුමා දැන් කිව්වා නේ.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
එතකොට සභානායකතුමා කියපු විධියට, - *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
I was talking about Article 120 of the Constitution; I just highlighted the Article.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Please give me one minute.

අධිකරණයට බලය තිබෙනවාද, නැද්ද කියලා අධිකරණය තීන්දු කරයි. ඇයි ඔබතුමා පොහොර දාන්නේ? ඔබතුමා පොහොර දානවා, අධිකරණය හය කරනවා. ඔබතුමා අධිකරණය හය කරනවා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
No, that is wrong.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කියන කථාව වැරදියි, කිරිඇල්ල මන්ත්‍රීතුමා

So, that is the Ruling and there is no change in that. If you accept it, do so or otherwise, forget about it.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ තීන්දු-තීරණ ගැනීමේ බලය අපි අභියෝගයට ලක් කරන්නේ නැහැ. හැබැයි, ඔබතුමා තීන්දුවක් ප්‍රකාශයට පත් කරනවා සේම ඊට පරස්පර අදහසක් දක්වන්න ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තුව තුළ ඔබතුමා ඉඩ ලබා දෙන්න ඕනෑ.

මම මේ අවස්ථාවේ ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. රජයේ යම්කිසි ක්‍රියාදාමයක් තුළ මේ රටේ පුරවැසියන්ට අසාධාරණයක් සිදු වෙනවා නම්; එකම රටක පුරවැසියන් කොට්ඨාසයකට දෙබිඩි ආකාරයෙන් - දෙවිධියක - සැලකීමක් වෙනවා නම්, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම යටතේ ඔවුන්ට අධිකරණයට ගිහිල්ලා ඒක අභියෝගයට ලක් කරන්න හැකියාවක් නැද්ද? ඔබතුමා හොඳින්ම දන්නවා, මේ රටේ වැඩ කරන ජනතාවගේ කර පිට domestic debt restructuringවල බර පටවලා, පීඩනය, අසහනය, කලකිරීම කියන ඔක්කොම පටවලා, primary bondholdersලාට profit windfall එකක් දීලා තිබෙන බව; ලාභ ගංගාවක් ලබා දීලා තිබෙන බව.

ඒක අභියෝගයට ලක් කරන්න මේ රටේ පුරවැසියන්ට අයිතිය තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔය කාරණය ගැන ඔබතුමා වෙනම විවාදයක් කරන්න. ඔය කාරණය හැමදාම මේ සභාවේ දී ඔබතුමා කියනවා නේ.

## III

## ජාතික උරුමයන් සුරැකීම උදෙසා ක්‍රියාත්මක වීම පිණිස වන පාර්ලිමේන්තු සංසදය ස්ථාපිත කිරීම

தேசிய மரபுரிமைகளைப் பாதுகாப்பதற்கான பாராளுமன்ற ஒன்றியத்தைத் தாபித்தல்

ESTABLISHMENT OF PARLIAMENTARY CAUCUS FOR FUNCTIONING TOWARDS SAFEGUARDING NATIONAL HERITAGES

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ජාතික උරුමයන් සුරැකීම උදෙසා ක්‍රියාත්මක වීම පිණිස වන පාර්ලිමේන්තු සංසදයක් නවවැනි පාර්ලිමේන්තුව සඳහා ස්ථාපනය කිරීම සඳහා වූ රැස්වීමක් 2023 අගෝස්තු 09 වැනි බදාදා, එනම් අද දින, ප.ව 3.00 ට කාරක සභා කාමර අංක 08 හිදී පැවැත්වීමට නියමිත බව දන්වන අතර, ඒ සඳහා සහභාගි වන ලෙස සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට කාරුණිකව ආරාධනය කරනු කැමැත්තෙමි.

## ගරු ජනාධිපතිතුමාගේ විශේෂ ප්‍රකාශය
## மாண்புமிகு சனாதிபதியினது விசேட கூற்று
## SPECIAL STATEMENT BY HONOURABLE PRESIDENT

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා)**

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சரும்)

(The Hon. Ranil Wickremesinghe - President, Minister of Defence and Minister of Finance, Economic Stabilization and National Policies)

ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එන ලද දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් පළාත් සභා ක්‍රමය මෙරටට හඳුන්වා දුන්නේ 1987 අවුරුද්දේ. දැන් අවුරුදු 36ක් තිස්සේ පළාත් සභා ක්‍රමය අපේ රටේ ක්‍රියාත්මක වෙනවා. හැබැයි, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව ගැටලු ගණනාවක් තිබෙනවා. ඒ වාගේම, පළාත් සභා පිළිබඳවත් ගැටලු ගණනාවක් තිබෙනවා. රටක් හැටියට ඉදිරියට යන්න නම් අපි මේ ගැටලු නිරාකරණය කරගත යුතුයි. අපේ රටේ අභිවෘද්ධියට සහ අනාගතයට ගැළපෙන ආකාරයට දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කළ යුතුයි. ඒත් එසේ කළ හැක්කේ මේ පාර්ලිමේන්තුවේ සිටින අපි හැමෝම විවෘත සහ මැදිහත් සිතින් යුතුව, ගැඹුරු සාකච්ඡාවකින් පසුව එකඟත්වයකට පැමිණියොත් විතරයි. අන්න ඒ නිසා තමයි පසුගිය දා අප සර්ව පාක්ෂික සමුළුවක් සංවිධානය කළේ.

දේශපාලන පක්ෂ ගණනාවක නියෝජිතයන් ඒ සමුළුවට සහභාගි වුණා. ඒ සියලුදෙනාට මා ස්තුතිවන්ත වෙනවා. එම සමුළුවේදී බලය විමධ්‍යගත කිරීම පිළිබඳව පූර්ණ එකඟතාවකට පැමිණීමට අපට පුළුවන්කමක් ලැබුණේ නැහැ. බලය විමධ්‍යගත කිරීමේ නිශ්චිත ජාතික වැඩ පිළිවෙළක් පිළිබඳව විවෘත අදහස් එහිදී ඉදිරිපත් කෙරුණේ නැහැ. සමහර දේශපාලන පක්ෂ අදහස් ඉදිරිපත් කිරීමට අදිමදි කරන බව හා වැඩි කැමැත්තක් නොදක්වන බව පැහැදිලි වුණා. සමුළුවට සහභාගි වූ සමහර දේශපාලන පක්ෂ ඊට සහභාගි වුණේ අවිශ්වාසය හිතේ තියාගෙනයි. අතීතයේ පැවැති යම් යම් සර්ව පාක්ෂික සමුළු පිළිබඳව ඔවුන් ලබා ඇති අත්දැකීම් ඊට හේතු වන්නට ඇති. අපි දැන්වත් මේ තත්ත්වය වෙනස් කරමු. විපක්ෂයේ කාර්යභාරය ආණ්ඩුවේ සියලු කාර්යයන්ට විපක්ෂ වීම යයි හිතන සම්ප්‍රදායයෙන් ඉවත් වෙමු. ආණ්ඩුවේ කාර්යභාරය විපක්ෂයේ අදහස් සැලකිල්ලට නොගෙන ක්‍රියා කිරීම යන පිළිවෙතින් ඈත් වෙමු. අප සියලුදෙනාම විශ්වාසයෙන් හා වග කීමෙන් යුතුව ක්‍රියා කරමු. අපේ රට ඉදිරියට ගෙන යා හැකි වන්නේ අප සියලුදෙනාම එකට එක්ව අලුත් මාවතක ඉදිරියට ගමන් කළොත් පමණයි. ඒ අලුත් සම්ප්‍රදායය බිහි කරන්න අපි වෙහෙසෙමු. මම හැම විටම අවධාරණය කරන කරුණක් යළිත් මෙහිදී මතු කර පෙන්වන්න කැමැතියි. අතීතය පාරමින් ඉන්නේ නැතුව අපි අනාගතය ගැන හිතමු. ඔබටත්, මටත් කටුක අතීත අත්දැකීම් තිබෙනවා. ඒක ඇත්ත. නමුත්, ඒවා ගැන වාද විවාද නොකර අපි අනාගතය ගැන සාකච්ඡා කරමු. රටේ අනාගතය ගැන සිතා අවංක චේතනාවන් පෙරදැරිව එකට එක්ව පොදු තීරණයකට එළඹෙමු. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා පළාත් සභා ක්‍රියාත්මක කිරීමේදී පසුගිය අවුරුදු 36 පුරා අපි සාර්ථක වුණාද? අසාර්ථක වුණාද? එසේ සාර්ථක වෙන්න හෝ අසාර්ථක වෙන්න බලපෑ හේතු මොනවාද? අපි මේ ගැන කථා බහ කරමු; සාකච්ඡා කරමු; ගැඹුරින් විමසා බලමු.

අපි ලෝකයේ නව ප්‍රවණතා ගැන අධ්‍යයනය කරමු. අපේ කලාපයේ ඉන්දියාව හා චීනය වාගේම බටහිර ලෝකයේ ඇමෙරිකා එක්සත් ජනපදය, කැනඩාව වැනි විශාල රටවල් බලය විමධ්‍යගත කර තිබෙනවා. ඒ වාගේම එක්සත් රාජධානිය, නෙදර්ලන්තය, ජපානය වැනි කුඩා රටවල් ද බලය විමධ්‍යගත කර තිබෙනවා. මම චීනයෙන් එක් උදාහරණයක් ගෙන පෙන්වන්නම්. චීනයේ සුළුතර ජනවර්ග ඉන්නේ මුළු ජනගහනයෙන් සියයට 9කටත් අඩුවෙන්. නමුත් කලාප, කෝරළ, මහ නගර ආදී පාලන ව්‍යුහ ගණනාවක් තුළ මේ සුළු ජන වර්ගයන්ට ස්වායත්ත පාලන බලතල ඔවුන් ලබා දී තිබෙනවා. මේ වාගේ ලෝකයේ විවිධ රටවල් ජාතික ප්‍රතිපත්තියක් යටතේ බලය විමධ්‍යගත කර ගැනීම් සාර්ථක කරගත් අවස්ථා ගැන අපි සොයා බලමු. ඒ රටවලින් පාඩම් ඉගෙන ගනිමු. ඒ සියල්ලම සලකා බලා අපේ රටට වඩාත් ගැළපෙන ක්‍රමය හඳුනා ගනිමු.

ගරු කථානායකතුමනි, අපි අවුරුද්දකට පළාත් සභා වෙනුවෙන් රුපියල් බිලියන 550ක් පමණ වැය කරනවා. That is, half a trillion rupees! මේ මුදල්වලට සාධාරණයක් පළාත් සභාවලින් ඉටු වෙනවාද? මේ මුදල් ජනතා යහපත වෙනුවෙන් යෙදවී තිබෙනවාද? ඒ, අප අවධානය යොමු කළ යුතු එක් කාරණයක්. ඒ කියන්නේ හැම පුද්ගලයෙකු ම පළාත් සභාවක් නඩත්තු කරන්න අවුරුද්දකට රුපියල් 22,000ක් වියදම් කරනවා. ඒ කියන්නේ මේ හැම ශිෂ්‍යයෙකුටම පළාත් සභා වෙනුවෙන් රුපියල් 22,000ක් වියදම් කරන්න තිබෙනවා. හතරදෙනෙකුගෙන් යුත් පවුලක් පළාත් සභාවක් නඩත්තු කරන්න රුපියල් 88,000ක් වියදම් කරනවා. ඒ මුදල්වලට සරිලන ප්‍රතිලාභ ඔවුන්ට ලැබෙනවාද? එච්චරයි මම අහන්නේ. ඒ ගැන හිතන්න. ඇත්ත වශයෙන්ම අපට පළාත් සභා අහෝසි කරන්න බැහැ. දැන් විවිධ ආණ්ඩු රටවල් ගණනාවකට ප්‍රතිඥා දීලා තිබෙනවා, පළාත් සභා ක්‍රියාත්මක කරනවා කියලා. එහෙම නම් මොකක්ද දැන් කරන්නේ? අපි මේක හරියට ක්‍රියාත්මක කර ගත්තොත්, අපට අනෙක් වැඩවලට රුපියල් බිලියන 50ක්වත් මේකෙන් බේරාගන්න පුළුවන්ද කියායි ඉස්සෙල්ලා මම බලන්නේ. ඊට වඩා කරන්න පුළුවන් නම් මට ප්‍රශ්නයක් නැහැ.

පළාත් සභා සහ මධ්‍යම රජයත්, පළාත් පාලන ආයතනත් අතර බලය සහ බලතල වෙන් වෙන්ව පැහැදිලි කර දී නැහැ. ඒ නිසාම, පළාත් සභාවල සහ මධ්‍යම රජයේ විෂයන් අතර ගැළපීමක් නැහැ. වැඩ කටයුතු කරද්දී එකිනෙක හැප්පෙනවා, එකම වැඩේ දෙතැනකින් සිද්ධ වෙනවා, වැඩ කටයුතු ප්‍රමාද වෙනවා. ඒ වාගේම ජනතාවගේ ගැටලු ලිහෙනවා වෙනුවට වැඩි වෙනවා. මෙන්න මේ වාගේ හේතු නිසා පළාත් සභා සුදු අලියෙකු ලෙස හඳුන්වන පිරිසක් ද අපේ රටේ ඉන්නවා. හැබැයි, ඒ සියලු අඩුපාඩු සහ දුර්වලතා මැද ශ්‍රී ලංකාවේ දේශපාලන මහ කෙරෙහි තීරණාත්මක බලපෑමක් ඇති කළ ආයතන පද්ධතියක් ලෙස පළාත් සභා හඳුන්වන්න පුළුවන්. පළාත් සභා දක්ෂ දේශපාලන නායකයන් බිහි කිරීමේ තවානක් මෙන්ම ව්‍යවස්ථාදායකයට සහ පාර්ලිමේන්තුවට අවතීර්ණ වීමේ ප්‍රවේශ මාර්ගයක් වී තිබෙනවා. පළාත් සභා මන්ත්‍රී ධුරයෙන් දේශපාලන ගමන් මඟ ඇරඹූ විවිධ පුද්ගලයන් රටේ විධායක ජනාධිපති ධුරයට, අගමැති ධුරයට, කැබිනට් මණ්ඩලයට, වෙනත් වගකිව යුතු තනතුරුවලට පත් වූ අවස්ථා ගණනාවක් අතීතයෙන් අපට සොයා ගන්න පුළුවන්. අද මේ සභාවේ වාඩි වී සිටින මැති ඇමතිවරුන් අතර සැලකිය යුතු පිරිසක් පළාත් සභාවල මන්ත්‍රී ධුරයේ සිට මහ ඇමති ධුරය දක්වා විවිධ තනතුරු දරා තිබෙනවා.

පළාත් සභා හඳුන්වා දෙන අවස්ථාවේ යම් යම් දේශපාලන පක්ෂ ඊට විරුද්ධ වුණා. සමහර පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදීව විරුද්ධත්වය ප්‍රකාශ කළ අතර, තවත් අය ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස ඊට විරුද්ධ වුණා. ඒ නිසා ජීවිත ගණනාවක් අහිමි වුණා, රටේ දේපළ සහ ජාතික සම්පත් ගිනිබත් වුණා. ඒ, අතීතය.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

ඒත් දැන් පාර්ලිමේන්තුව නියෝජනය කරන කිසිදු දේශපාලන පක්ෂයක් පළාත් සභා අහෝසි කළ යුතු යැයි කියන්නේ නැහැ. ඒ සියලු පක්ෂවල නියෝජිතයන් පළාත් සභා නියෝජනය කර තිබෙනවා. මෙහිදී තවත් කරුණක් පිළිබඳව අපි අවධානය යොමු කළ යුතු වෙනවා. පළාත් සභා බලය බෙදීම, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ රටේ උත්තරීතර නීතියයි. එය නොසලකා ඉන්නට අපට හැකියාවක් නැහැ. එය ක්‍රියාත්මක කිරීමට විධායකයත්, ව්‍යවස්ථාදායකත්වයත් බැඳී සිටිනවා.

ගරු කථානායකතුමනි, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ බලය බෙදීම ගැන මගේ යෝජනා සහ ඉදිරි ක්‍රියා මාර්ග දැන් මේ සභාවට ඉදිරිපත් කරනවා. ඒ යෝජනා පිළිබඳව ගැඹුරින් විමසා බලන්න. ඔබ ඔබේ අදහස් ඉදිරිපත් කරන්න. ඒ සියලු අදහස් සැලකිල්ලට ගෙන පළාත් සභාවල කාර්යභාරය සහ ඒවායේ අනාගතය පිළිබඳව අවසන් තීරණයට එළැඹීමේ වගකීම සම්පූර්ණයෙන්ම මෙම ගරු සභාව සතු වෙනවා. මගේ පක්ෂයෙන් ඉන්නේ ගරු මන්ත්‍රීවරු තුන්දෙනායි. ගරු මන්ත්‍රීවරු 225දෙනාගේම සහයෝගය වුවමනායි, මේක සම්මත කර ගන්න.

ගරු කථානායකතුමනි, දියුණු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයන්හි නව ප්‍රවණතාව කුමක්ද? කේන්ද්‍රීය පාලනයක් වෙනුවට විමධ්‍යගත පාලනයක් බිහි කිරීම. ඒ හරහා දේශපාලන, ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික කටයුතු මහ ජනතාවට සමීප වන ලෙස බලය විමධ්‍යගත කිරීම. මේ සඳහා ලොව විවිධ රටවල විවිධ ක්‍රම භාවිත කරනවා. විමධ්‍යගත කිරීම ඍජු ප්‍රජාතන්ත්‍රවාදය - direct democracy - වෙත ළං වීම සඳහා මාර්ගයක් ලෙස සලකනවා.

සියලු ජනතාව එක්රැස් වී තීරණ ගන්නා ඍජු ප්‍රජාතන්ත්‍රවාදයක් වෙත යෑමට කිසිම පාලන ක්‍රමයකට හැකියාවක් නැහැ. නමුත් දේශපාලන, ආර්ථික සහ සමාජ ක්‍රියාවලියේ ජනතා සහභාගිත්වය සහ අභිමතය ප්‍රකාශ වෙන ආකාරයෙන් ආයතන ව්‍යුහයක් ගොඩනැඟීමට හැකියාව තිබෙනවා. පළාත් සභා ක්‍රමය ජනතාව වෙත බලය රැගෙන යන එක් ව්‍යුහයක්.

ඊට අමතරව, ජනතාව වෙත බලය රැගෙන යෑමේ තවත් ක්‍රමවේද කීපයක් අප මෑතකදී ආරම්භ කළා. ආංශික අධීක්ෂණ කාරක සභා ශක්තිමත්කොට, ඒ සඳහා තරුණ ප්‍රජාව සහභාගි කරවීමට කටයුතු කළේ ඒ අරමුණ අනුවයි. ඒ වාගේම බිම් මට්ටමේ ජනතාව පාලන කටයුතුවලට සහභාගි කරවා ගැනීම අරමුණු කරගෙන ජනසභා ස්ථාපිත කිරීම සඳහා දැන් අප කටයුතු කරමින් සිටිනවා. ජනසභා ලේකම් කාර්යාලය අප ආරම්භ කළා. නියැදි ජනසභා පිහිටුවීමෙන් පසු, ජනසභා පනත ගෙන ඒමට අප පියවර ගන්නවා. මෙවන් පසුබිමක අප කළ යුත්තේ පළාත් සභා ඔස්සේ වැඩි-වැඩියෙන් ජනතාව වෙත බලය ලබා දීමේ ක්‍රමවේද සහ සැලසුම් සකස් කිරීම බව මගේ අදහසයි. ජාතික එකමුතුව ආරක්ෂා කිරීමේ ආයතනයක් ලෙසත් පළාත් සභා යොදා ගැනීමට අපට හැකි වෙන්නේ එවිටයි.

ගරු කථානායකතුමනි, පසුගිය කාලය පුරා පළාත් සභා සහ එහි අනාගතය පිළිබඳව ගැඹුරින් සලකා බැලුණු ලේඛන කීපයක් පාර්ලිමේන්තුව ආශ්‍රිත විවිධ කමිටු මඟින් නිකුත් කර තිබෙනවා. මගේ සභාපතිත්වයෙන් පැවති ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුව 2017 සැප්තැම්බර් 21වන දින නිකුත් කළ අතුරු වාර්තාව ඉන් එකක්. එම අතුරු වාර්තාව මඟින් ලබා දුන් නිර්දේශයන්ට පාර්ලිමේන්තුව නියෝජනය කළ හැම පක්ෂයක්ම එකඟ වුණා. එම අතුරු වාර්තාව මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3, 4 සහ 5 වන ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව නිර්දේශ ලබා දී තිබෙනවා. මෙම යෝජිත ව්‍යවස්ථා සංශෝධන අප පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා.

එසේම පහත දැක්වෙන කරුණු ක්‍රියාත්මක කළ යුතු බව ඒ වාර්තාවේ සඳහන් වෙනවා.

1. පළාත් ලැයිස්තුවේ අඩංගු කරුණු සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති සැකසීමේදී, පළාත් සභාවන්හි සහභාගිත්වය ලබා ගැනීම.

   In formulating National Policy on matters contained in the Provincial List, the Central Government shall adopt a participatory process with the Provincial Council.

2. පළාත් ලැයිස්තුවේ ඇති විෂයයන් සම්බන්ධ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම මඟින් මධ්‍යම රජයට විමධ්‍යගත බලතල පවරා ගැනීමක් හෝ පළාත් සභාව මඟින් ක්‍රියාත්මක කරලීමට ඇති විධායක හා පරිපාලන බලතලවලට කිසිදු බලපෑමක් හෝ සිදු නොවීම.

   Formulation of National Policy on a Provincial List matter would not have the effect of the Centre taking over executive or administrative powers with regard to the implementation of the said devolved power.

3. එකී විමධ්‍යගත විෂය ක්‍රියාත්මක කිරීමේ විධායක හා පරිපාලන බලතල පළාත් සභා වෙතම රැඳීම.

   The Province will retain the executive or administrative powers (implementation powers) with regard to the said devolved power.

ඉහත සඳහන් යෝජනා තුන මම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධනයක් ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. ඊට පස්සේ ඒ වැඩ කටයුතු ඉදිරියට ගෙන යන්න ඔබට භාර දෙනවා.

ගරු කථානායකතුමනි, එම අතුරු වාර්තාව පිළිබඳව අදහස් දක්වමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ, ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ, ජාතික හෙළ උරුමය, ඒකාබද්ධ විපක්ෂය, සමස්ත ලංකා මුස්ලිම් කොංග්‍රසය, සමස්ත ලංකා ජනතා කොංග්‍රසය, ඊළාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය, දෙමළ ප්‍රගතිශීලී සන්ධානය යන පක්ෂ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු ඩග්ලස් දේවානන්දා මහතා සහ ජනාධිපති නීතිඥ ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මහතා ලේඛන ඉදිරිපත් කළා. ඒ පිළිබඳවත් අපි අවධානය යොමු කළ යුතුයි.

පාර්ලිමේන්තුව සහ පළාත් සභා අතර සබඳතා පිළිබඳව සොයා බැලීම සඳහා පත් කරන ලද කමිටුවේ වාර්තාවත්, මධ්‍යම පර්යන්ත සබඳතා පිළිබඳ අනුකාරක සභාවේ වාර්තාවත් අපේ සැලකිල්ලට බඳුන් කළ යුතු වෙනවා.

මේ ලේඛන සියල්ලම මඟින්, පළාත් සභා ක්‍රමය අපේ පාලන ක්‍රමයෙන් ඉවත් කළ නොහැකි ආයතනික ව්‍යුහයක් ලෙස පිළිගෙන තිබෙනවා. ජනවාර්ගික අර්බුදයට විසඳුමක් ලෙස හෝ විමධ්‍යගත කිරීමේ ඒකකය ලෙස හෝ පළාත් සභා පිළි නොගන්නා ජනතා විමුක්ති පෙරමුණ සහ ජාතික හෙළ උරුමය පවා පළාත් සභා ක්‍රමයේ සංශෝධනය විය යුතු කරුණු මෙන්ම සංශෝධනය නොවිය යුතු කරුණු ද ඇති බව පිළිගෙන තිබෙනවා. මේ සියල්ල ඔස්සේ යළි යළිත් තහවුරු වන්නේ පළාත් සභාව ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රමයෙන් හෝ දේශපාලනයෙන් ඉවත් කළ නොහැකි ස්ථාවර සාධකයක් බවට පත්වී ඇති බවයි.

ගරු කථානායකතුමනි, සියලු දෙනාටම එකඟ විය හැකි විසඳුමකට අපට එළඹීමට හැකියාව ලැබේ නම් ජාතික අනන්‍යතාව ආරක්ෂා කර ගෙන එකම ජාතියක් ලෙස නැඟී සිටීමටත්, රටේ

බලය මහජනතාව වෙත ළඟා වන ආකාරයට විමධ්‍යගත කිරීමටත් අපට අවස්ථාව සැලසෙනවා. පළාත් සභා ස්ථාපනය කළේ උතුරු නැඟෙනහිර පළාත්වලට පමණක් නොවෙයි. ඒවා පළාත් නවයටම අදාළ වෙනවා.

පළාත් සභා නිසි මඟකට යොමු කිරීම මඟින් එක් අතකින් ජාතික එකමුතුභාවය ආරක්ෂා වෙනවා. අනෙක් අතින්, වඩාත් කාර්යක්ෂම, වැඩි සේවාවක් සැලසෙන ආයතන පද්ධතියක් ලෙස තහවුරු කළ හැකි වෙනවා. එමඟින් බලය පොදු ජනතාවට ආසන්න වන ආකාරයෙන් විමධ්‍යගත කිරීම සඳහා අවස්ථාව සැලසෙනවා. ඒ නිසා පළාත් සභා ක්‍රමය මහජනතාවට යෝග්‍ය වන, මහජනතාවගේ අවශ්‍යතා ඉටු කරන, රටේ සංවර්ධනය සඳහා දායක වන ආයතනයක් ලෙස සංවර්ධනය කිරීම අපගේ මූලික අරමුණක් විය යුතුයි.

මේ සඳහා අවශ්‍ය පසුබිම සැකසීම උදෙසා පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පත් ගණනාවක් ඉදිරිපත් කිරීමටත්, නව ක්‍රියා මාර්ග ගණනාවක් ගැනීමටත් මම යෝජනා කරනවා.

1. ප්‍රාදේශීය ලේකම්වරුන් පත් කිරීම
2. අධ්‍යාපනය සම්බන්ධ සේවා ක්‍රියාත්මක කිරීමට පළාත් සභාවට අවශ්‍ය බලය ලබා දීම. පළාත් සභා ලැයිස්තුවේ 3 වන උපලේඛනයේ සඳහන් වන පාසල් අධ්‍යාපනය පිළිබඳ වූ සියලු බලතල ක්‍රියාත්මක කිරීම.
3. වෘත්තීය හා තාක්ෂණික පුහුණු කටයුතු සම්බන්ධ සේවා වෙනුවෙන් පළාත් මණ්ඩල පිහිටුවීම.
4. විශ්වවිද්‍යාල පිහිටුවීම සඳහා පළාත් සභාවලට බලය ලබා දීම.
5. කෘෂි නවීකරණය සහ බිම් මට්ටමේ සියලු කෘෂි සේවා සැපයීම සඳහා පළාත් සභාවලට බලය ලබා දීම.
6. පළාත් සංචාරක ප්‍රවර්ධන මණ්ඩල පිහිටුවීම.
7. ජාතික වැදගත්කමකින් යුතු කර්මාන්ත සම්බන්ධයෙන් වන සීමාව රුපියල් මිලියන 4 සිට රුපියල් මිලියන 250 දක්වා ඉහළ දැමීමට කර්මාන්ත පනතට සංශෝධන එක් කිරීම.

   පාර්ලිමේන්තුව එකඟ වන්නේ නම් මේ සීමාව රුපියල් මිලියන 500 දක්වා ඉහළ නැංවීමට වුණත් අප සූදානම්.
8. පළාත් සභාවලට බලය පවරා ඇති කාර්යයන්ගෙන් සමහරක් තවමත් මධ්‍යම රජය යටතේ ක්‍රියාත්මක කෙරෙන බැවින් ඒ වරද නිවැරදි කිරීම.
9. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුකූලව දිස්ත්‍රික් සංවර්ධන සභා පිහිටුවීම.

ඒ කාරණයත් අපි නීතියෙන් කරන්න ඉන්නේ.

මධ්‍යම ආණ්ඩුවේ ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව සෑම පළාත් සභාවක්ම තුන් අවුරුදු සංවර්ධන සැලැස්මක් සකස් කිරීම. මධ්‍යම රජයේ සංවර්ධන වැඩසටහන් ද තම තමන්ගේ බල ප්‍රදේශවලට අනුගත වන ආකාරයට මෙම සැලසුමට ඇතුළත් කළ යුතුයි.

මෙම තුන් අවුරුදු සැලැස්ම දිස්ත්‍රික් සංවර්ධන සභා ඔස්සේ ක්‍රියාත්මක කිරීම සහ එය ක්‍රියාත්මක කිරීමේ වගකීම පළාත් සභා වෙත පැවරීම. ඒ කාර්යයේදී ඒ ඒ දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, පළාත් සභා මන්ත්‍රීවරු සහ පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරු එකට එක්ව ක්‍රියා කළ හැකි නෛතික පරිසරයක් සකස් කළ යුතුයි.

ගරු කථානායකතුමනි, දැනට ව්‍යවස්ථාවේ සඳහන් මධ්‍යම ආණ්ඩුවේ බලතල ලැයිස්තුව, පළාත් සභා බලතල ලැයිස්තුව සහ සමගාමී ලැයිස්තුව යළි අධ්‍යයනය කොට අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීම සඳහා අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කිරීමට අප පියවර ගන්නවා. පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු පක්ෂවල සහාය මීට ලබා ගන්නවා.

1987 අංක 42 දරන පළාත් සභා පනත මඟින් පළාත් සභා අමාත්‍යවරයෙකු සතු වගකීම් මොනවාද, පළාත් අමාත්‍ය ලේකම්වරයෙකු සතු වගකීම් මොනවාද, අනෙකුත් නිලධාරින් සතු වගකීම් මොනවාද යන්න නිශ්චිත ලෙස අර්ථ දක්වා නැහැ. ඒ නිසාම යම් යම් වැරදි අවබෝධ, ගැටලු සහ අවුල් ඇති වෙනවා. ඒ නිසා ඔවුන් සතු බලතල නිශ්චිත කෙරෙන ආකාරයට පළාත් සභා පනත සංශෝධනය කළ යුතු වෙනවා.

ගරු කථානායකතුමනි, පළාත් සභා සම්බන්ධ මේ නීති සංශෝධනය කර ගැනීමෙන් හා නව නීති සම්මත කර ගැනීමෙන් පසුව පාර්ලිමේන්තුවේ එකඟත්වය ලබාගෙන පළාත් සභා ඡන්ද විමසීමේ පනත සංශෝධනය කිරීමටත් අප සූදානම්. දැනට මේ සම්බන්ධයෙන් යෝජනා තුනක් ඉදිරිපත් වී තිබෙනවා. ඒවාත් මම කියන්නම්.

1. දිස්ත්‍රික් සමානුපාතික ක්‍රමය යටතේ ඡන්දය පැවැත්වීම.
2. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පළාත් සභා සඳහා තරග කිරීමේ අයිතිය ලබා දීම.
3. කාන්තා නියෝජනය සියයට 25ක් හෝ එයට වැඩි ප්‍රමාණයක් දක්වා ඉහළ නැංවීම.

මේ පිළිබඳවත් සාකච්ඡා කර එකඟතාවක් ලබා ගෙන පළාත් සභා ඡන්දය පැවැත්වීමට අප පියවර ගන්නවා.

පළාත් සභා ක්‍රියාත්මක වනතෙක් පළාත් ආණ්ඩුකාරවරුන්ට උපදෙස් ලබා දීමට උපදේශක සභාවක් පත්කිරීම පිළිබඳ අපේ අවධානය යොමු වී තිබෙනවා. එම උපදේශක සභාවේ සාමාජිකයන් ලෙස පළාත් අධීක්ෂණ කමිටු සභාපති හෝ ප්‍රධානීන්, දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපතිවරු සහ පළාතේ දේශපාලන පක්ෂ නියෝජනය වන පරිදි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පත් කළ හැකියි. ඒ වාගේම නීති සම්පාදනය සඳහා තවත් කමිටුවක් පත් කළ යුතු යැයි අප යෝජනා කරනවා. එමඟින් සම්පාදනය කරන නීති කෙටුම්පත් සඳහා උපදේශක කමිටුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු නීතියක් බවට පත් කර ගැනීමට හැකියාව ලැබෙනවා. එම වගන්ති දැනටමත් ව්‍යවස්ථාවේ තිබෙනවා. ආණ්ඩුකාරවරයාත්, නම් කරන ලද පළාතේ මන්ත්‍රීවරයෙකුත් මෙම උපදේශක සභාවේ සම සභාපතිත්වය දැරිය යුතුයි. විධායකය සම්බන්ධ කරුණු සාකච්ඡා කරන අවස්ථාවල දී ආණ්ඩුකාරවරයා සභාපති ධුරය හොබවන අතර, ව්‍යවස්ථාදායක කරුණු සාකච්ඡා කරන අවස්ථාවල දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා සභාපති ධුරය දරනවා.

දැනට පළාත් සභා අමාත්‍යාංශ 45ක් ක්‍රියාත්මක වෙනවා. මේ අමාත්‍යාංශ සඳහා අධීක්ෂණ කමිටු පත් කිරීමටත්, වෙනත් වගකීම් නොදරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඒවායේ ප්‍රධානීන් ලෙස පත් කිරීමත් අපට කළ හැකියි. දෙපාර්ශ්වයෙන්ම ඒ සඳහා තෝරා ගැනීම අවශ්‍ය වෙනවා. එක පක්ෂයකින් නොවෙයි.

ගරු කථානායකතුමනි, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පළාත් සභා වෙත බලය පැවරීමේ දී වඩාත් සංවේදී විෂයයක් බවට පත්ව ඇත්තේ පොලිස් බලතල. ඒ නිසා මා යෝජනා කරන්නේ අප මුලින්ම අනෙක් බලතල පිළිබඳව එකඟත්වයකට පැමිණීම වඩාත් ප්‍රායෝගික බවයි. අපි පියවරෙන්

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

පියවර ඉදිරියට යමු. සංවේදී විෂයයන් සඳහා මූලිකත්වය ලබා දුන්නොත්, සමහර විටෙක කිසිදු එකඟත්වයකට එළැඹෙන්නට අපට අපහසු වේවි. අපි අගින් පටන් ගන්නේ නැතිව මුලින් පටන් ගනිමු.

ඒ නිසා අප මුලින්ම අනෙකුත් බලතල විමධ්‍යගත කිරීම ගැන කථා කර, පොදු එකඟතාවකට එළඹෙමු. එහිදී බලතල විමධ්‍යගත කිරීම සම්බන්ධයෙන් දකුණේ මහ ඇමතිවරුන්ගේ වාර්තාව පදනම් කර ගන්න අපට පුළුවන්. හැම ක්‍රියාවක්ම පොදු එකඟත්වයට අනුව සිදු කරමු. රටේ අනාගතය වෙනුවෙන් එකට එක්ව පොදු තීරණ ගැනීමට මේ පාර්ලිමේන්තුවට ශක්තිය සහ බුද්ධිය ඇති බව පෙන්වා දෙමු.

Hon. Speaker, that is my statement on what we are going to do regarding provincial councils.

I also want to make a second statement regarding the steps we have taken to meet the concerns of the Tamil MPs of the North and the East so that we could move towards reconciliation.Sir, it is my sincere intention to progress without any political motivation, addressing the issues faced by the Tamil people in the North and the East in order to secure a much needed, sustainable national reconciliation in the country. Reconciliation, undoubtedly, is an indispensable factor for Sri Lanka's own development. My recent meeting with Tamil Parliamentarians representing the Northern and Eastern Provinces was premised on this aspect. Subsequent to this meeting, I believe it is important to keep the Members of this august House informed of the matters discussed, as it forms the basis of the proposed trajectory the Government would seek to pursue in this regard.

In this context, continued action on the relevant issues are envisioned to contribute towards national reconciliation, which I will now seek to outline:

**Anti-Terrorism Bill**

Following the discussions of the suggested amendments to the Bill, it would be presented to the Cabinet for approval. Subsequent to that, the Bill will be re-gazetted and any person can then petition the Supreme Court and the Supreme Court will have the last say with regard to the provisions of the Bill.

**Anti-Corruption Bill**

I am pleased that the Anti-Corruption Bill was passed in Parliament last month with Amendments proposed by the Supreme Court in its Determination and other stakeholders, but without a vote. It has already been gazetted.

**Truth-seeking Mechanism and the Bill**

The Interim Secretariat for the Truth-seeking Mechanism has been established and a Director General has been appointed. In addition, three Divisions have been established covering Legal and Policy, Public Relations and Information Technology. Applications have been sought for key staff positions for the operationalization of the Secretariat, particularly for stakeholder consultations and preparations of drafting guidelines and policies until the formal mechanisms could commence following the relevant laws being enacted. Civil society stakeholder consultations including the UN agencies are continuing and when exhausted, Cabinet approval will be sought and it will be processed to become a legal framework.

**Office for the National Unity and Reconciliation (ONUR) Bill**

The ONUR draft law has been submitted to the Attorney-General for the certification of constitutionality, which will subsequently be presented to Parliament. Additionally, the National Action Plan on Reconciliation drafted by ONUR will be presented to the Cabinet in the near future.

**Office for Reparations**

At present, payments of monetary relief have been granted for 203 cases of missing persons from the North-East conflict amounting to Rs. 40.6 million, as at July, 2023. The process is continuing.

**Office on Missing Persons (OMP)**

I reiterate the need to uphold justice for the people of the North and the East. Of the 21,374 complaints received by the OMP, investigations into 3,462 cases have been completed at present. Investigations are progressing on the remaining complaints and this process could get accelerated following the truth-seeking mechanism being fully operationalized. It would now be appropriate for those seeking particulars of missing persons to submit detailed information to the Interim Secretariat.

Sir, I **table*** the document containing the relevant information as Annex 1.

The OMP has commenced tracking missing persons. Further, action is being taken to expedite the data-entering process in order for its completion within three months. The issuance of the Certificate of Absence - CoA - is being expedited. The OMP and the Attorney-General's Department are working on a Case Handling Policy and have drafted guidelines, focusing on effective management of complaints to the previous Commissions and the OMP. Endorsement for the guidelines will be sought from the Cabinet. Further, the OMP with 10 new panels totalling 24, which are expected to be in operation from August, has planned to have a resource team per district for referral services.

The Members of Parliament are free to take up relevant issues with the Offices of Reparations and Missing Persons. The OMP has already outlined its time frames in relation to their scope of work.

---

** කථාව අවසානයේ පළ කර ඇත.*
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

**Granting Presidential Pardon to Prisoners involved in LTTE Activities**

Prisoners are under the three categories of remand prisoners, numbering 21, prisoners imposed with death sentence, three and those imposed with other sentences, 22. It has been decided to consider only the last two categories of prisoners for being granted Presidential Pardon in terms of Article 34(1) of the Constitution. In this context, considering the recommendations of the Hon. Minister of Justice, Prison Affairs and Constitutional Reforms, Presidential approval has been granted to remit the balance sentences and release 11 of the prisoners under the last category.

**Establishment of the National Land Commission**

Steps are being taken to expedite the establishment of the National Land Commission - NLC - and a National Land Utilization Policy. A draft National Land Commission Law has been prepared and is being further studied for formulating a policy pertaining to the alienation of State land. A Land Commission Policy Act is also expected to be in place by September for the NLC to be guided in their functions. The composition of the NLC would be amended to include nine representatives from the Provinces and 12 government officials.

**Resolution of Land Matters**

It may be recalled that an injunction order had been obtained from the Supreme Court in 2020 on the release of residual forest lands by a Special Committee. Subsequently, following discussions in May this year, the possibility of demarcating forests and wildlife conservation areas based on the 1985 Land Use Maps was requested to be examined. Consequently, a Cabinet Memorandum on this issue was submitted and approval was obtained to enforce the release of such forest lands by an Inter-Ministerial Committee. The withdrawal of the original interim order is being processed.

In the meantime, a database has been evolved, focusing on the said Land Use Maps, current land use patterns and proposals of the Divisional Secretaries related to the lands managed by the Forest Department in all districts of the North and the East. Maps containing information related to the districts have been made available for viewing by the Members of Parliament in the relevant District Secretariats for a period of two months. Sir, I **table*** the list of contact details of the relevant officials for this purpose as Annex II.

The proposals presented at the Divisional Secretariat level are to be considered by the Inter-Ministerial Committee, following the legal proceedings on the withdrawal of the original interim order. A Committee chaired by the Secretary to the President will examine and facilitate matters relating to land. So, issues could be taken up with that Committee.

* *කථාව අවසානයේ පළ කර ඇත.*
* *உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
* *Produced at end of speech.*

**National Plan for Archaeology**

The Department of Archaeology and the Central Cultural Fund have been informed that land demarcation and excavation across the country should be done according to a National Plan. The Director General of Archaeology has been instructed to prioritize and plan excavation work, identification of sites and the manner in which they should be executed. An Action Plan will be presented by the Department of Archaeology for the activities related to the identification of the areas to be conserved and/or proper acquisition to take place.

**Road Map for the Issuance of All Country Passports for Sri Lankans living in Rehabilitation Camps in South India**

The Department of Immigration and Emigration has received a list of 2,678 Sri Lankans living in South Indian Rehabilitation Camps. Of the aforementioned number, those with both Sri Lankan Birth Certificates and National Identity Cards can be issued All Country Passports. The timelines for the issuance of the said documentation span two to four weeks. A considered decision would need to be taken with regard to the issuance of All Country Passports to those Sri Lankans living in Rehabilitation Camps in South India.

**Resettlement of Internally Displaced Persons (IDPs) in the Northern and Eastern Provinces**

The Presidential Secretariat, Northern Province Coordination Office has been established to assist the IDPs who have been affected due to the North and East conflict. As you are aware, people who were internally displaced in the North and the East were accommodated in welfare centres or have been living with their friends and relatives.

After the restoration of normalcy, they have largely returned to their places of origin. Following the resettlement of a majority of the people with housing and livelihood support, its current status in the Northern and Eastern Provinces is hereby **tabled*** as Annex III.

Action continues to resettle IDP families in the Northern and Eastern Provinces. Of the five districts in the Northern Province, resettlement of IDPs remains only in the Jaffna and Kilinochchi Districts. In Jaffna, there are 15 welfare centres with a total of 136 families and another 2,175 families are living with friends and relatives. There are no IDP families living in Welfare Centres in Kilinochchi. However, 182 families remain with their friends and relatives in the Peninsula, and 177 in Pachchilaipalli Division.

In the Eastern Province, IDPs are present only in Trincomalee and Ampara Districts and they live with friends and relatives, and there are no welfare camps in that province.

* *කථාව අවසානයේ පළ කර ඇත.*
* *உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
* *Produced at end of speech.*

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

Particular attention has to be given to resolving problems associated with displaced persons' resettlement, which also requires releasing privately held lands for public use. I have tasked the officials to take immediate action to settle these issues by devising effective mechanisms for their resolution.

**Lands to be released by armed forces- Northern Province.**

Of the total land area in Jaffna amounting to approximately 253,283 acres, the occupation by the security forces and the Police, in 2009 was 26,812 acres. Presently, 90 to 92 per cent of the land occupied by the security forces and the Police in 2009 has been released from time to time. Accordingly, 22,990 acres comprising 817 acres of State and 22,101 acres of private lands have been released. The current extent of occupied lands by the security forces and the Police is 3,754 acres, of which 862 and 2,892 acres are State and privately-owned, respectively.

Further release of the land is envisaged under the category of:

(i) Land for immediate release comprises 1.4 acres in Jaffna, 13 acres in Kilinochchi and 20 acres in Mullaitivu, as identified by the Army and the Navy.

(ii) The Army has earmarked 53 acres in the Jaffna District to be released in three to six months' time.

(iii) A land strip of approximately 290 acres from the Security Forces Army Cantonment, Palaly has been identified to be released temporarily for specific purposes, including agricultural and seasonal crops.

(iv) Regarding lands that cannot be presently released, a study is being carried out in this regard on the instructions of the Army Commander to ascertain the possibility of further freeing up of land in the Northern Province.

I am aware that this is an area of contention for the Northern populace and therefore, we will continue to seek ways and means to release, as far as possible, the military -occupied lands in that Province.

I would also like to state, in regard to what I have mentioned here, the steps we are taking. There will be certain matters which the MPs from those areas would like to raise. Specially, they may suggest different timelines and some amendments. So, I have asked the Minister of Foreign Affairs and the Minister of Justice, Prison Affairs and Constitutional Reforms to deal with all those requests. Therefore, I would request you all to take up any issues on that matter with the two Ministers.

**Development Plans for North and East**

It is imperative to create extensive and practicable plans to develop the Northern and the Eastern Provinces. Anticipating that renewable energy could meet 70 per cent of the country's national electricity need by 2030, one of the key objectives of both the Northern and the Eastern Development Plans is to harness the region's renewable energy potential through the production of green hydrogen and green ammonia, using innovative technologies. This strategy aims to attract investments and could transform the Ports of Colombo and Trincomalee as hubs for export of green hydrogen. Pooneryn is being earmarked to be developed as the main town for this purpose.

We have already taken steps on creating a conducive environment for the investment and export of solar and wind power, culminating in a Memorandum of Understanding with India to facilitate collaborative efforts in this area. The Adani Group has come forward to invest in the renewable energy sector of Sri Lanka. I believe that this collaborative approach could lead to substantial growth in this area.

Additionally, the "Water to the North" Programme comprises the development of various waterways. In this context, the Government has already approved the projects for the Poonakary Tank and the Malwathu Oya and they have been put in the special list or the priority list of irrigation works. Talks are presently continuing on the "River for Jaffna" Project, which would bring fresh water to the Jaffna Lagoon and increase the capacity of the Iranamadu Tank. The Small Tanks Renewal Project is important to be accomplished. In fact, that Project will give rise to developing the agricultural and solar energy sectors in the Northern Province.

In addition to this, the Economic Subcommittee of the Cabinet is today considering two Cabinet Papers - one, by the Minister of Irrigation and the other, by the Minister of Water Supply - to look at the development of water supply for urban use in the Jaffna Peninsula as well as developing some of the other projects like Parangi Aru. So, there will be a Committee chaired by my Adviser, Dr. R. Samaratunga to look at those plans and to make a combined plan.

It is also essential to upgrade air and sea connectivity in the North. The development of the KKS Harbour and the Vavuniya and Palali Airports and the establishment of a ferry service connecting the Northern Province to South India are facilities which have been earmarked. The establishment of Investment Promotion Zones in KKS, Paranthan and Mankulam are being worked towards. I will get the BOI to take those over.

We also have plans for the development of tourist attractions in Jaffna and Mannar through a tourist cruise project around the Mannar Fort, the Kankesanthurai Port, the islands and Vadamarachchi. Under an Agriculture Modernization Programme, we will seek to promote coconut cultivation in the Vanni. Jaffna, being home to a seat of excellence in higher education with its University, would be developed as a University City. Additionally, land has been identified in KKS for the establishment of a campus under the aegis of the SLIIT.

Similarly, plans for developing the Eastern Province are progressing with Trincomalee being the core. India's assistance, as our closest neighbour, in implementing the Trincomalee District Development Project is of immense value to Sri Lanka. The ongoing cooperation in the development of the Trincomalee Tank Farms and India's agreement to further enhance Trincomalee as a national and regional hub of industry, energy and economic activity is a fillip for developing further mutually beneficial cooperation. The Eastern Province plays an important role in naval affairs and the Trincomalee Port should be made into a leading, strategic port. It is important that we work together with India when developing the Eastern Province Port, by having discussions on several programmes in that region. Further, we cannot limit the economic activities of that Port solely to the Trincomalee District. This should be connected with the cities of Anuradhapura, Vavuniya and Dambulla, especially when the District of Vanni and the Eastern and the North-Central Provinces are responsible for the bulk of agricultural production. Since India has a lead to develop industries in that Province, an industrial zone should be created. The Port, therefore, will also be connected with that and we are planning to establish a Joint Task Force for this purpose.

From an economic point of view, the Eastern Province has much to offer the tourism industry. In particular, there is the cultural triangle of Anuradhapura, Polonnaruwa and Dambulla, which is in close proximity to the Eastern Province and could be a natural route for enhanced visits by tourists to the beach-fronted cities of Batticaloa, Arugam Bay and Trincomalee. The Cabinet also approved Surbana Jurong to cover planning from Verugal Aru to Arugam Bay for tourism purposes. The cruise tourism initiatives could also be a part of this development plan.

The fisheries, agriculture and animal husbandry sectors are well poised for modernization in the Eastern Province. In this context, the opening of the Land Systems A and B of the Mahaweli Right Bank will provide the much-needed impetus for enhancing agricultural pursuits.

I hope that some of the Hon. Members of Parliament who continue a misplaced refrain of the Government purportedly selling out the country to a third party will now constructively understand that no country can progress alone, that, too, especially in the instance of a nation emerging from an unprecedented economic crisis, as has been the experience of Sri Lanka. It must be understood that engaging in a robust relationship with our closest neighbour India would undoubtedly strengthen our ability towards ensuring mutually beneficial cooperation. You have my assurance that I will not engage in initiatives inimical to the sovereignty and integrity of this country. In the same manner, I urge all of you for constructive engagement in our quest for national reconciliation, considering that the interests of the people is the bedrock for our country's development.

ගරු කථානායකතුමනි, අද අපි මේ පසුකරමින් සිටින්නේ කඩා වැටුණු ආර්ථිකයක් යළි ඔසවා තැබීමේ දුෂ්කර කාලපරිච්ඡේදයක්. මේ අප ශීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් ලබා ගත යුතු කාලයක්. එවැනි ශීඝ්‍ර සංවර්ධනයක් දැනට ක්‍රියාත්මක කරන පළාත් සභා ක්‍රමය යටතේ ලබා ගන්න ඇති ඉඩකඩ ඉතා අල්පයි.

1977 දී ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමන් යටතේ අපේ රටේ ශීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් ඇති වුණා. නමුත් යුද්ධය නිසා ඒ සංවර්ධනය අඩාළ වුණා. මේ රටේ සෑම පුරවැසියෙකුම යුද්ධය නිසා පීඩාවට පත් වුණා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ දී යුද ගැටුමේ අවසානයක් දකින්න අපට හැකි වුණා. දැන් යුද ගැටුම අවසන් වී අවුරුදු 14ක්. හැබැයි, බලය බෙදීම හා පළාත් සභා ප්‍රශ්න විසඳා ගන්න අපි අසමත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි සියලුදෙනා ජාතියක් විධියට එකතු වෙලා මේ ප්‍රශ්නය විසඳන්නට කටයුතු කරමු. අපේ ප්‍රශ්නවලට විසඳුම් සොයා ගත යුත්තේ අප විසින්මයි. වෙනත් රටකට හෝ බාහිර පාර්ශ්වයකට අපේ ප්‍රශ්න විසඳන්නට බැහැ. ඒ අයට මම කියන්නේත් නැහැ. අපේ ප්‍රශ්න අපම විසඳා ගන්න ඕනෑ. අපේ ප්‍රශ්න අපම විසඳාගෙන යළිත් ශීඝ්‍ර ආර්ථික හා සමාජ සංවර්ධන මාවතකට අපේ රට ගෙන යන්නට අපි එකට එක් වෙමු.

ගරු කථානායකතුමනි, මා ජනාධිපති ධුරයට පත්ව ගත වූ වසරක කාලපරිච්ඡේදය තුළ පාරදෘශ්‍යභාවය, වගවීම, වගකීම සහ යහපාලනය තහවුරු කරමින් ක්‍රම වෙනස්කම් - system changes - ගණනාවක් හඳුන්වා දුන්නා. ව්‍යවස්ථා සංශෝධනයක් ගෙන එන ලෙස වෙනත් කිසිදු පාර්ශ්වයකින් ප්‍රබල බලපෑමක් නොතිබුණු අවස්ථාවක මම විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ සභාවට ඉදිරිපත් කළා; එය සම්මත කර ගත්තා. එමඟින් ජනාධිපති ධුරයේ බලතල අඩු වුණා. මැතිවරණවල දී සිදුවන මූල්‍ය ඇතුළු විවිධ අවභාවිත ක්‍රියා වළක්වාලීම උදෙසා මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගත්තා. අපේ රටට පිළිලයක් වී ඇති දූෂණ වංචා වළක්වාලීම සඳහා ක්‍රියාත්මක වූයේ දුර්වල, දුබල පනතක්. මම ඒ වෙනුවට ඉතා ප්‍රබල සහ ශක්තිමත් මෙන්ම ජාත්‍යන්තර ප්‍රමිතීන් හා ගැළපෙන දූෂණ විරෝධී පනත් කෙටුම්පත මේ සභාවට ඉදිරිපත් කර සම්මත කර ගත්තා. ඒ වාගේම, ආණ්ඩුවල අවශ්‍යතා මත වගකීම් විරහිතව රටේ මූල්‍ය පාලනය අයාලේ යෑම වළක්වාලීම උදෙසා ශ්‍රී ලංකා මහ බැංකුව පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගත්තා.

පසුගිය තරුණ විරෝධතාවලදී ක්‍රම වෙනසක අවශ්‍යතාව දැඩිව අවධානය කෙරුණා. අපේ රටේ බහුතර ජනතාවක් ක්‍රම වෙනසක් ඉල්ලා සිටිනවා. මා පෙර සඳහන් කළ පියවර සියල්ලෙන්ම අපි කළේ ක්‍රම වෙනසකට මුල පිරීමයි. පළාත් සභා සම්බන්ධයෙන් ද අපි මේ ක්‍රම වෙනස සිදු කළ යුතුයි.

මහජනතාවට විශ්වාසය තැබිය හැකි, මහජනතාවගේ ගැටලුවලට විසඳුම් ලබා දෙන, කාර්යක්ෂම, නාස්තියෙන් සහ දූෂණයෙන් තොර පළාත් සභා පද්ධතියක් ගොඩ නැඟීම තුළින් ප්‍රබල ක්‍රම වෙනසක් ඇති කරලීම සඳහා අපට අවස්ථාව සැලසෙනවා. ජනතාව වැඩි වැඩියෙන් එකමුතු කර, ජාතික සමගිය තහවුරු කරලීම උදෙසා පළාත් සභා උපයෝගි කර ගැනීමේ අවකාශය උදා වෙනවා. ඊට අදාළ මගේ යෝජනා සහ ක්‍රමවේද මම මේ ගරු සභාවට දැන් ඉදිරිපත් කළා. ඒ වාගේම අදාළ කෙටුම්පත් පවා මම මේ සභාවට ඉදිරිපත් කරනවා. දැන් තිබෙන්නේ ඔබේ වාරයයි. ඔබ ඒ ගැන ගැඹුරින් විමසන්න. ඔබේ අදහස් දක්වන්න.

මෙතැනින් ඉදිරියට යෑමේ පියවර ගැනීමේ පූර්ණ බලතල ඇත්තේ මේ ගරු සභාවේ ඔබටයි. පොදු එකඟතාවක් ඔස්සේ ඒ පියවර ගන්නට එක්වන ලෙස මම ඔබ සැමගෙන් ඉල්ලා සිටිනවා.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

රටේම අවශ්‍යතාවක් සාර්ථක කර ගැනීමට මේ පාර්ලිමේන්තුවට ශක්තිය මෙන්ම පුළුල් දැනුමක් ඇති බව තහවුරු කරන්නට එක්වන ලෙස මම මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**** සභාමේසය මත තබන ලද ඇමුණුම්:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புகள் :*
*Annexes tabled:*

(i)

**G) Office on Missing Persons - Progress as at July 12, 2023**

**A. Number of Complaints of Missing Persons – As of July 10th 2023**

| No | Description | Sub total | Total |
|---|---|---|---|
| 01 | **Total Number of Complaints / Cases received by the OMP initially** | | **21,374** |
| 02 | **No. of Cases with missing military personnel/ Cases with double entries** | | **6,386** |
| 03 | **The number of active complaints / Cases** | | **21,374 - 6,386 = 14,988** |
| 04 | **Total number of preliminary inquiries concluded** | | **3,462** |
| | In 2020 | 184 | |
| | In 2021 | 95 | |
| | In 2022 | 2,110 | |
| | In 2023 | 1,073 | |
| 05 | **Balance cases to be inquired** | | **11,526** |
| | Cases reported with the date of missing between **2000- 2021 – Phase I** | **2,563** | |
| | Cases reported with the date of missing between **1980-2000 – Phase II** | **3,173** | |
| | Cases reported with the date of missing **before 1980 + the date is not clear – Phase III** | **5,278 + 512 = 5,790** | |

**B. Number of Complaints of Missing Persons by Province**

| Province | No of Complaints (reported as missing after 2000) | No of cases Inquired – (of the complaints reported as missing after 2000) |
|---|---|---|
| Northern | 3,656 | 2,065 |
| Eastern | 1,897 | 1,233 |
| North Central | 92 | 1 |
| Western | 89 | 65 |
| Southern | 78 | 90 |
| Northwestern | 75 | 1 |
| Central | 59 | 5 |
| Sabaragamuwa | 51 | 2 |
| Uva | 28 | 0 |
| **Total** | **6,025** | **3,462** |

**C. Progress made based on the inquires conducted (as of July 2023)**

| | | |
|---|---|---|
| 1. **No of cases Inquired as of July 2023** | = | **3,462** |
| **Support related to Legal instruments:** | | |
| 2. No of Families assisted to get Certificate of Absence | = | 1,313 |
| 3. No of Families Referred to RG for COD as requested | = | 239 |
| **Family support:** | | |
| 4. No of Families assisted through OR –Revival payment | = | 2,104 |
| 5. No of families assisted for banking, asset management | = | 13 |
| 6. No of families referred for Household Economic Support | = | 608 |
| **Further investigations:** | | |
| 7. No of complaints referred for further investigations | = | 732 |

a. No. of prison visits - 07
b. No. of ongoing court cases in N&E (OMP as observer) - 13
c. No. of cases in which OMP directly involved in N&E - 11

**Further Information**

a. OMP has started tracing of missing persons through the **Tracing Unit**. Expectation is to conclude at least 2-3 cases this year.

b. Action is being taken to expedite the data entering process and complete it within 3 months. Issuance of Certificate of Absence (COA) is being expedited.

c. OMP is also consulting with the Attorney General's Department to work on a **Case Handling Policy** document, and outline a **framework/guide for case closure, amalgamation, and merger of multiple/double entry files/complaints.** Accordingly, OMP and AGs Department have drafted guidelines focusing on effective management of complaints made to the previous commissions and the OMP. OMP will submit the guidelines to Ministry of Justice for its endorsement by the Cabinet.

d. OMP will train 10 new panels in July 2023. Recruitment of panel members is in progress and it is expected that these panels will start functioning from August. Therefore a total of 24 panels will be in operation from August. Further, OMP has planned to have a resource team per district for referral services.

e. OMP continuously engages with the civil society on possible areas of cooperation such as providing psycho-social support/ livelihood support/building capacity and technical assistance. Three project proposals have been shared with agencies concerned with raising funds (focusing on Psycho-social and Economic supports, Data Entry and Capacity building, and legal awareness/training to victims, media, court staff, and lawyers)

(ii)

**Details of District officials Hon. MPs may contact for viewing of District Maps**

| Electoral District | Officials | Name | Contact No |
|---|---|---|---|
| Jaffna | Govt. Agent - Jaffna | Mr.A.Sivabalasundaran | 777456465 |
| | Addl.GA (Land) - Jaffna | Mr.K.Srimohan | 776033312 |
| | | | |
| | Govt. Agent - Kilinochchi | Mrs.R.Ketheswaran | 773184119 |
| | Addl.GA (Land) - Kilinochchi | Mr.S.Muralitharan | 776539952 |
| Wanni | Govt. Agent - Mannar | Mrs.A.Stanley De Mel | 779677733 |
| | Addl.GA (Land) - Mannar | Mr.Y.Paranthaman (Act) | 706599078 |
| | Govt. Agent - Mullaitivu | Mr.K.Umamaheswaran | 714471128 |
| | Addl.GA (Land) - Mullaitivu | Mr.K.Gunapalan | 772487292 |
| | Govt. Agent - Vavuniya | Mr.P.A.Sarathchandra | 718088083 |
| | Addl.GA (Land) - Vavuhiya | Mrs.Sulojane Kugan | 774492129 |
| Trincomalee | Govt. Agent - Trincomalee | Mr.B.H.N.Jayawickrama | 773658560 |
| | Addl.GA (Land) - Trincomalee | Mr.S.Suthakaran | 718242482 |
| Batticaloa | Govt. Agent - Batticaloa | Mrs.K.Pathmarajah | 718178371 |
| | Addl.GA (Land) - Batticaloa | Mrs.S.Srikanth | 771528938 |
| | | | |
| Digamadulla | Govt. Agent - Ampara | Mr.C.Abeywickrama | 718113785 |
| | Addl.GA (Land) - Ampara | Mr.V.Jegatheesan | 776967229 |

(iii)

**L) Resettlement of Internally Displaced Persons (IDP) in North and East Provinces**

This report is on the progress, key accomplishments, and updates with special reference to the reintegration of IDPs especially focusing on resettlement, reintegration and reunification process in post conflict circumstances.

The Presidential Secretariat Northern Province Coordination Office was established with the purpose of assisting to the IDPs who have been affected due to conflict for the following purposes:

- To improve access to national protection and humanitarian assistance for IDPs in the North and North-East of Sri Lanka;
- To extend the capacity of the government, NGOs and displaced communities to respond to displacement and bring about lasting solutions.
- To stabilize displaced communities and provide conditions for solutions.
- To facilitate the return and reintegration of displaced populations, with particular attention to vulnerable groups.
- To advocate for the implementation of policies that protect the rights of the displaced and other victims of the conflict.
- To minimize internal displacement and provide alternatives to flight from regions of instability.

People who were internally displaced due to the internal conflict of the North and East were accommodated in Welfare Centers and some of them living with their friends and relatives are gradually resettled after restoration of normalcy to their places of origin. Such people have been provided with all basic amenities and services by the respective district and divisional administration in coordination with stakeholders including INGOs and NGOs.

Following the resettlement of a majority of people with housing and livelihood support, the current status of IDPs of the Northern and Eastern provinces is appended below on District basis.

**Northern Province**

Of the 05 Districts in the Northern Province, resettlement of IDPs remains only in Jaffna and Kilinochchi Districts.

**a)Jaffna District:** Remaining IDPs to be Resettled (No. of Families) - 2311

| 1. In Welfare Centers /Camps | 2. With Friends and Relatives |
|---|---|
| 136 | 2175 |

**i)Priority is given to resettle the 136 families who live in Welfare Centers in Jaffna.**

| | |
|---|---|
| Number of Welfare Centers in Jaffna - 15 | |
| Total No.of Families in Welfare Centers / Camps -136 | |
| **Description** | **No.of Families** |
| **Action Taken to Resettle *** | **106** |
| Land Provided. Housing is on going | 10 |
| Housing will be provided | 08 |
| Land Purchased but not provided | 06 |
| To be relocated at Palaly North (Land cleared) | 71 |
| Land Identified and ready to Purchase | 02 |
| Land Identified to Purchased(Allocation Received) | 09 |
| **Action To Be Taken *** | **30** |
| Own Land in HSZ | 09 |
| Landless | 21 |

*** NGO Assistance to Provide for 106 Families in Welfare Centre in Jaffna**

| Organization | No.of Temporary Shelters | No.of Toilets | No.of Wells |
|---|---|---|---|
| **Offer Ceylon** | 20 | 20 | - |
| **Rahama** | 25 | 5 | 5 |

For IDPs living in welfare centers, all facilities are provided for their well-being and basic facilities for their children, schooling and welfare facilities as well access to economic activities and also protection of their rights and privileges.

**** Action to be Taken to Resettle the 30 IDP families in Welfare Centers in Jaffna**

- Release of lands from the occupation of Military.
- Lands purchased from government funds
- State land has been identified near the coastline for fishery community.
- A discussion with NGOs and INGOs was held to request for assistance to provide shelter facilities, water, sanitation and livelihood support for the IDPs.

**ii)Actions Taken to Resettle IDPs Living with Friends and Relatives in Jaffna**

As their lands are located in the center of the Army, Navy and Police Headquarters area, when legal acquisition was initiated, a case was filed in the Supreme Court. However these families live within or adjoining Thelipallai divisional area and divisional administration has provided all basic facilities. Their rights are also protected irrespective of their IDP status.

**b)Kilinochchi District**

There are no IDP families living in Welfare Centers in Kilinochchi. However 182 families remain with their friends and relatives in the Peninsula. 177 IDPs live in Pachchilaippalli Division, under the GN divisions of Iththavi, Mugamalai and Vempodukerny where demining is in progress. The demining agencies such as MAG, DASH and Halo Trust who are engaged in the demining process have agreed to expedite and release the land in order to resettle the IDPs within their origin places.

Similar to the Jaffna District, people from this area are also provided facilities and have their rights protected irrespective of their IDP status.

| | DS Division | GN Division | No.of to be Resettled families | Current Problem delaying resettlement | Action for resettlement |
|---|---|---|---|---|---|
| 01 | Karachchi | Malayalapuram | 02 | Army Occupied | |
| | | Kanagambikaikulam | 02 | | |
| | | Thiruvaiaru | 01 | | |
| 02 | Pachchilaippalli | Iththavi | 02 | Land mines | Clearance works on going |
| | | Mugamalai | 44 | | |
| | | Vempodukerny | 131 | | |
| Total | | | 182 | | |

**Eastern Province**

Of the 03 Districts, IDPs are present only in Trincomalee and Ampara Districts and they live with their friends and relatives. There no Welfare Camps in the Eastern Province.

**1. Trincomalee District**

In Trincomalee District, 39 families belonging to Kinniya Divisional Secretariat live with their friends and relatives. A land has identified to resettle them, and policy level agreement has been reached with the Land Reform Commission for the use of this land.

| No | DS Division | GN Division | Number of families to be resettled | Action for resettlement |
|---|---|---|---|---|
| 01 | Kinniya | Upparu | 39 | Land identified and submitted for approval of Land Reform Commission. |

Earlier there were 55 IDP families in Kinniya Division but this number has declined doe to Death, receipt of assistance from other housing programs and refusal to Refused to resettle due to various reasons such as their elderly status (living with their children).

**2. Ampara District**

| No | DS Division | GN division | No. of. Families | Actions being Taken |
|---|---|---|---|---|
| 01 | Pothuvil | Kanakar Kiramam Urani | 204 | Land Issuing programme (Land Kachcheri) has been held for 125 families. Arrangements are being made to hold Land Kachcheris for rest of the families. |

Due to constraints of budgetary provision for housing and facilities, a request has been made to bi- lateral agencies for assistance for the IDPs.

**Priority is given for families based on the number of members per family and the period of their displacement.**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

Hon. Speaker, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔව්, ගරු රවුෆ් හකීම් මැතිතුමා.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

Sir, the Hon. President has made an elaborate Statement on his intentions regarding devolution, development matters as well as regarding reconciliation in the North and the East, together with the other intended legislations he wants to introduce. While thanking him for his elaborate Statement - perhaps, we can debate it on a different day - in the mean time, I would earnestly request the President to look at two issues. One is - Hon. President, I have raised this issue with you personally as well - you had referred to the participation of some parties with misconceptions at the All Party Conference. We, too, participated with some inhibitions, but then, unfortunately, it came true when issues relating to elections were taken up. Now, we have an issue particularly relating to the North and the East. Muslims are an integral part of the Northern and the Eastern Provinces and as stakeholders, similarly as you have had discussions with the Tamil Members of Parliament, we, too, would like to have a direct

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා]

discussion with you rather than with your Foreign Minister and the Minister of Justice, Prison Affairs and Constitutional Reforms. We would appreciate it if we, as Muslim Members of Parliament, be given a chance to have a same level of discussions so that we also can resolve some of these issues.

In the meantime, we also have another issue, which we have raised with the Prime Minister and the Hon. Janaka Wakkumbura, the State Minister in charge of the subject, is also aware of it. It relates to the impending elections for the local government authorities. I am not going to raise an issue about those elections now because that creates disturbances. Our problem is, as Party Leaders, we have been seriously hampered with many candidates, who have got their political rights but are government servants, now being misplaced; they have gone to other schools on transfers and there are various other issues. If there is no intention of holding elections, you had rather cancel the nominations and allow those people to get back to their original places of work. So, this is a serious issue, Hon. President and you had better earnestly consider this. I think all the Party Leaders will agree on this, if at all it happens. - *[Interruption.]*

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)

Firstly, regarding answering the issues of the Muslims - I do not think others will take that up - as far as I am concerned, I am prepared to meet you all, as I said, after I discuss this. I am prepared to discuss the matters concerning the Muslims, not only in the North and the East, but also in the rest of the country. The Minister of Foreign Affairs and the Minister of Justice have been appointed because we have given certain timelines and information. If the Tamil Members representing the North and the East want a change in that or want more information, then, they can contact those Ministers. So, that is limited to that issue. And, now that you have requested, we will cancel those election nominations. There is no problem. - *[Interruption.]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමා කැඳවපු සර්ව පාක්ෂික සාකච්ඡාවේදී අපි ඉල්ලීමක් කළා, රජය පාර්ශ්වයෙන් ඉදිරිපත් විය යුතු යෝජනා ඉදිරිපත් කරන්න කියලා. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා අද යම් තාක් දුරකට යම් කිසි යෝජනා ප්‍රමාණයක්, අදහස් සහ කෙටුම්පත් ඉදිරිපත් කරලා තිබෙනවා. ඉතින්, අපි ප්‍රගතිශීලී විපක්ෂයක් හැටියට ඔබතුමාගේ යෝජනා පරිශීලනය කරලා මේ කාර්යයට සද්භාවයෙන් යුක්තව සහභාගි වෙලා වැඩ කටයුතු කරන්න අදහස් කරනවා.

ඒ වාගේම මම මේ අවස්ථාවේ යෝජනා කරන්න කැමැතියි, ප්‍රධාන වශයෙන් කරුණු දෙකක්. ඇමෙරිකා එක්සත් ජනපදයේ හිටපු ජනාධිපතිවරයෙකු වූ ඒබ්‍රහම් ලින්කන් මහතා විටෙක ප්‍රකාශ කළා, "Democracy is a government of the people, by the people and for the people" කියලා. ඔබතුමාත් මේ ගැන හොඳින් දන්නවා ඇති. එතකොට, "government by the people" කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන පුරුකක්. මම ඔබතුමාට කියන්න කැමැතියි, Government එක නිර්මාණය කරන්න ඕනෑ ජනතා ස්වෛරීත්වය, ජනතා පරමාධිපත්‍යය, ජනතා ඡන්ද බලය තුළ බව. විශේෂයෙන්ම දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කරුණු-කාරණා සාකච්ඡා කරනකොට කවුරු සඳහා ද ඒක ක්‍රියාත්මක කරන්නේ කියා බලන්න ඕනෑ. අද පළාත් සභා එකකවත් මහජන නියෝජිතවරු නැහැ.

දැන් ජනාධිපතිතුමා සඳහන් කළා, තවානක් ගැන. පළාත් පාලන ක්ෂේත්‍රයත්, පළාත් සභා ක්ෂේත්‍රයත් දේශපාලන ක්ෂේත්‍රයේ ඉහළට එන තවාන්. නමුත්, අද ඒ තවාන් ඔක්කෝම මැරිලා. ඇයි? ඒ මැතිවරණවලට ඉඩක් නැහැ. අද මැතිවරණ භීතිකාවක් තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, make a Government by the people, make provincial councils by the people. ඒ නිසා මම මේ අවස්ථාවේ ඔබතුමාට යෝජනා කරනවා, කරුණාකරලා එදා ඒ සර්ව පාක්ෂික සාකච්ඡාවේදී අපි ඉදිරිපත් කරපු කරුණු-කාරණා සැලකිල්ලට ගෙන මේ වරමට ඉඩක් දෙන්න කියලා. මොකද, දැන් දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කවුරු මොන දේ ක්‍රියාත්මක කළත්, පළාත් පාලන ක්ෂේත්‍රයත්, ආණ්ඩුකාරවරයාගේ බලතල හරහා පළාත් සභා ක්ෂේත්‍රයත් විධායකය අතේ තිබෙන බව අපි හැමෝම දන්නවා. ඒ නිසා වැදගත්ම මූලික පියවර වන්නේ පළාත් සභා ක්ෂේත්‍රයේ වරමකට ඉඩ දෙන එක බව මම විශ්වාස කරනවා. වරමකට ඉඩක් ලබා දීම සඳහා අපි හැමෝටම එකතු වෙලා කඩිනමින් අපේ අනුමැතිය ලබා දෙන්න පුළුවන්. මම කියන්නේ පළාත් සභා දෙකක විතරක් නොවෙයි, පළාත් සභා නවයේම මේ කර්තව්‍යය ක්‍රියාත්මක කරලා මහජන නියෝජිතයන් පත් කරලා, ඒ අය සමඟත් සාකච්ඡා කරලා අපට දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඉදිරි ගමන ගැන කථා කරන්න පුළුවන් බවයි. ඔබතුමාත් මේ ගැන හොඳින් දන්නවා. හොඳට කියවලාත් ඇති. එක්සත් රාජධානියේ හිටපු අග්‍රාමාත්‍යවරයෙකු වූ වින්ස්ටන් චර්චිල් මැතිතුමා කිව්වා, "A functioning, robust democracy requires a healthy educated, participatory followership, and an educated, morally grounded leadership" කියලා. එතකොට අද මේ රටේ තිබෙන moral right එක මොකක්ද?

ගරු ජනාධිපතිතුමනි, දැන් ඔබතුමා කිව්වා, ඔබතුමාට ඉන්නේ මන්ත්‍රීවරු දෙන්නෙක්ද, තුන්දෙනෙක්ද කියන කථාව. එහෙම නැහැ නේ. ඔබතුමා පත් වුණේ මන්ත්‍රීවරු 134දෙනෙකුගේ පාර්ලිමේන්තු වරමෙන්. එතකොට 134දෙනෙකුගේ පාර්ලිමේන්තු වරමෙන් ඔබතුමා පත්වෙලා අගමැතිවරයෙකුත් පත් කරලා, ඇමති මණ්ඩලයකුත් පත් කරලා, රාජ්‍ය ඇමතිවරුත් පත් කරලා තිබෙනවා. ඒ නිසා ඔබතුමාට පැහැදිලි වගකීමක් තිබෙනවා, මේ රටේ ජන වරමට ඉඩක් ලබා දෙන්න. ඒ ගැන ඔබතුමා මේ සභාවේ ඉන්න අවස්ථාවේ මම මේ ඉල්ලීම කරනවා.

එකට කටයුතු කරනකොට අපි හැමදාම දැක්ක දෙයක් තමයි, ඔබතුමා ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ලොකු හඬක් නැඟූ බව. විපක්ෂයේ ඉන්නකොට ඒ නඟපු හඬ, අගමැතිවරයා වුණාට පස්සේත්, ජනාධිපතිවරයා වුණාට පස්සේත් වෙනස් වෙන්න බැහැ. ප්‍රතිපත්තිගරුක වෙන්න ඕනෑ. ඒ නිසා මම ඔබතුමාගෙන්

ඉල්ලීමක් කරනවා, මැතිවරණයකට ඉඩක් දෙන්න, ජන වරමකට ඉඩක් දෙන්න, ජන පීඩක - ජනතාව අසහනයට ලක් කරන - විවිධ ක්‍රියාදාමවලින් වළකින්න කියලා. එදා රාජ්‍ය භීෂණයට, රාජ්‍ය ත්‍රස්තවාදයට විරුද්ධව නැඟී සිටියා සේ, අදත් රාජ්‍ය භීෂණයෙන්, රාජ්‍ය ත්‍රස්තවාදයෙන්, මර්දනයෙන් වැළකී සිටින්න කියලා මම ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම ඔබතුමා ඉදිරිපත් කරපු මේ යෝජනා පිළිබඳ යම් කාරණයක් මම කියන්න කැමැතියි. ඔබතුමා ප්‍රකාශ කළා, මේ විපක්ෂය හැම වෙලාවේම විපක්ෂ වෙනවා කියලා. නැහැ, විපක්ෂය හැම වෙලාවේම විපක්ෂ වෙන්නේ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සාධනීය වෙනස්කම් කරනකොට, ඒවාට අප පක්ෂපාතී වුණා. Anti-Corruption Bill එක ගේනකොට අපි සහයෝගය ලබා දුන්නා. IMF මූලික ව්‍යුහය පිළිබඳව සාකච්ඡා කරනකොට අපි විරුද්ධ වුණේ නැහැ. හැබැයි, IMF Agreement එකේ ප්‍රතිපාදන තුළ මේ රටේ වැඩ කරන ජනතාවට අසහනය, පීඩනය, දුෂ්කරතාව උදාකර දී primary bondholdersලාට windfall profits දෙනකොට, සමාජ සාධාරණත්වය ගැන කථා කරන අපට කොහොමද ඒක අනුමත කරන්න පුළුවන් වෙන්නේ? ඉතින්, ඒවාට අපි විරුද්ධ වුණා. හැබැයි, ඔබතුමා ඉදිරිපත් කරපු කෙටුම්පත් පිළිබඳව, අදහස් හා යෝජනා පිළිබඳව අපි ප්‍රගතිශීලීව හිතනවා; we are going to think of your proposals in a progressive manner. හැබැයි, ඒ මොන දේ කරන්නටත් පෙර මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, අර තවාන් ටික මැරෙන්න දෙන්න එපා කියලා. නමුත්, ඒවා දැන් භාගෙට මැරිලා ඉවරයි. මොකද, මැතිවරණයක්, වරමක් නොමැති වීම නිසා. ඒ නිසා ඔබතුමාගේ න්‍යාය පත්‍රයට ඇතුළු කරන්න, වහාම ක්‍රියාත්මක වෙන පරිදි පළාත් සභා මැතිවරණය පවත්වමු කියන යෝජනාව. ඒ මැතිවරණයත් එක්ක, ඒ එන ජන වරමත් එක්ක අපට පුළුවන්, මේ සංශෝධනය බොහොම ප්‍රගතිශීලීව දුර දක්නා නුවණින් ඉදිරියට ක්‍රියාත්මක කරන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, -

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, මම විපක්ෂ නායකතුමාට පිළිතුරු දුන්නාට පසුව මෙතුමන්ලා ඉදිරිපත් කරන කාරණා ගන්න පුළුවන්. එහෙම නැත්නම් එතැන හිර වෙයි. පළමුවෙන් මම කිව්වේ, අපේ ව්‍යවස්ථා සංශෝධනය සහ නීති සංශෝධන ඉදිරිපත් කළාට පසුව, ඒ නීති ටික සම්මත කරලා ඡන්දය පවත්වනවා කියන එකයි. එහෙම නැහැ කියලා මම කිව්වේ නැහැ. මම ව්‍යවස්ථා සංශෝධනය දෙන්නම්, ඒක සම්මත කරන්න. නීති ටික සම්මත කරන්න. *[බාධා කිරීම්]* මම කිව්වා, ඕනෑ සංශෝධන ටික ගෙනෙන්න කියලා. *[බාධා කිරීම්]* ඔබතුමන්ලායි මේක ඉල්ලුවේ. ඒ අනුව ඊට පසුව ඡන්දය පවත්වන්නම්. මට කිසිම ප්‍රශ්නයක් නැහැ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමන්ලා, කරුණාකර නිශ්ශබ්ද වෙන්න. *[බාධා කිරීම්]*

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)

එතුමන්ලාට පසුව කථා කරන්න පුළුවන්. දැන් මට කථා කරන්න දෙන්න. ඒබ්‍රහම් ලින්කන් ජනාධිපතිතුමා තවදුරටත් කිව්වා, "......and that Government of the people, by the people, for the people, shall not perish from the earth" කියලා. ඒ නිසා ඒකට විරුද්ධව ක්‍රියා කළ Maryland ප්‍රාන්ත සභාව විසුරුවා හැරියා. ජනාධිපතිතුමාට ව්‍යවස්ථාවෙන් අයිතියක් තිබුණේ නැහැ. නමුත් West Virginia ප්‍රාන්ත සභාව විසුරුවා හැරියා. කිසියම් සභාවක් එක්සත් ජනපදයට පක්ෂ නැහැ කියලා සැක කළොත්, එතුමා එය විසුරුවා හැරියා. කියවන්න මෙරිමන් නඩුව. මෙරිමන් නඩුවේදී හබයාස් කෝපුස් ආඥාව එතුමා අහෝසි කළා. ඒක අහෝසි කළ හැක්කේ අධිකරණයට විතරයි. ඒත් එතුමා ඒක කළා. විපක්ෂ නායකතුමා මට කියනවා නම් ඒබ්‍රහම් ලින්කන් වාගේ ඉන්න කියලා, මම එහෙම ඉන්නම්. කිසිම ප්‍රශ්නයක් නැහැ. *[බාධා කිරීම්]* The other thing is, you want elections. How can I give you elections, when you are not even bringing in the Motion of No Confidence? We offered you all the chance this week, but you all did not take it. When do you want to take it up? So, how can I give you elections, when you cannot even bring in a Motion of No Confidence?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විපක්ෂ නායකතුමනි, ඔබතුමා කථා කරලා ඉවර කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා හොඳින් දන්නවා, Parliamentary Business Committee එකේ තීන්දු තීරණ ගත්තාට පසුව මැදක් හරියකදී ඇවිල්ලා - *[බාධා කිරීමක්]* අපට No-Confidence Motion එකට දීර්ඝ කාලයක් අවශ්‍යයි. *[බාධා කිරීම්]* I was listening to you, Hon. President. Please let me reply. ගරු ජනාධිපතිතුමා කිව්වා, ඡන්දය පවත්වන්න ලෑස්තියි කියා අවසානයේ. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමාම ඔබතුමාගේ කථාවේදී කිව්වා, මුලදී කරන්න ඕනෑ දේ අගදී කරන එකත්, අගදී කරන්න ඕනෑ දේ මුලදී කරන එකත් නොවෙයි කළ යුත්තේ, ඒක ඒ විධියට කෙරෙන්න ඕනෑ කියලා._ඇත්ත වශයෙන්ම මුලදී අපට අවශ්‍ය ජන වරමක්. ඒ වාගේම ඔබතුමා සඳහන් කළා, United Statesවල විවිධ ප්‍රාන්ත බෙදී යන්නට, කැඩී යන්නට ගිය මොහොතේ ජනාධිපතිවරයාට ව්‍යවස්ථාවෙන් බලතල නැතුව විසුරුවපු එක ගැන. පළාත් පාලන ආයතන 339ක් හෝ 341ක් කැඩී යන්න ඉල්ලා නැහැ නේ; provincial councils බෙදී යන්න,

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කැඩී යන්න ඉල්ලා නැහැ නේ. වැරදි උදාහරණ ගෙනෙන්න එපා. අපට අවශ්‍ය ජනවරම. අපට අවශ්‍ය මැතිවරණය. ඒ නිසා මැතිවරණය තියන්න ඕනෑ, ප්‍රථමයෙන්. මැදදී හෝ අගදී නොවෙයි. ඔබතුමාගේ ඔය විවිධ උදාහරණ හරහා මේ සභාව නොමඟ යවන්න එපා කියා මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම මම තව කාරණයක් කියන්න කැමැතියි. අද මාධ්‍යවලත් ගිහිල්ලා තිබෙනවා, අපි සෞඛ්‍ය ඇමතිවරයාට විරුද්ධව ඉදිරිපත් කරපු විශ්වාස භංග යෝජනාව ආපස්සට ගන්නවා කියලා. එහෙම දෙයක් නැහැ. ඒක අපට ඕනෑ. අපට එක දවසක නොවෙයි, දවස් තුනක විවාදයක් ඕනෑ. තමුන්නාන්සේලාට ඕනෑ ඕනෑ විධියට ඉක්මනින් විවාද අරගෙන ඒවා අවසන් කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ. ඒක හරියට කරන්න; නිවැරදිව කරන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, there is a convention that when you put forward a Motion of No Confidence, it must be disposed of immediately.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

No, no.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)

You read Erskine May. කියවන්නේ නැතුව කෑ ගහන්න එපා. *[බාධා කිරීමක්]* So, we are ready for that. මම මෙච්චරයි කියන්නේ. හෙට, අනිද්දා, සෙනසුරාදා අපි ඒකට වෙන් කරනවා. ලෑස්තිද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

ලෑස්තියි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)

විශ්වාස භංග යෝජනාව හෙටයි, අනිද්දායි, සෙනසුරාදයි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔව්, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමා මීට පෙර කරපු පැහැදිලි කිරීමේදී කිව්වා, උතුර හා නැඟෙනහිර පළාත්වල ගැටලු ගැන එතුමා දෙමළ පක්ෂවල මන්ත්‍රීවරුත් එක්ක සාකච්ඡා කරනවා කියලා. ඒ වාගේම ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා කිව්වා, ඒ පළාතේ මුස්ලිම් මන්ත්‍රීවරු එක්කත් කථා කරන්න කියලා. මට අහන්න තිබෙන්නේ, ඒ පළාත් දෙකේ සිංහල මන්ත්‍රීවරුන්ට කියන්න තරම් ප්‍රශ්නයක් ඔබතුමාට නැද්ද? යාපනයේ තිස්ස විහාරයේ පින්කම කරගන්න දුන්නේ නැහැ, 20ක්, 25ක් ඇවිල්ලා; කුරුන්දි විහාරයේ ප්‍රශ්නය තිබෙනවා. ඒ නිසා ඔබතුමා ජාතිකත්ව අනුව බෙදන්නේ නැතුව උතුර හා නැඟෙනහිර සිංහල, දෙමළ, මුස්ලිම් හැම මන්ත්‍රීවරයෙක් එක්කම කථා කරන්න, ආණ්ඩුවේ සහ විපක්ෂයේ; ඒ කොහේ හිටියත්. ඒ පළාත් දෙකේ ප්‍රශ්නය කිසියම් ජන කොටසකට දෙකකට ඌනනය කරන්න එපා. ඒක වැරදියි. *[බාධා කිරීමක්]* ඒ පළාත්වල සුළු ජාතියක් හැටියට ඉන්න සිංහල මිනිස්සුන්ට පුදුම ප්‍රශ්න ගොඩක් තිබෙනවා. ඒවා මේ සභාවේ සාකච්ඡාවට ගැනෙන්නේ නැහැ. මෙතැන අම්පාරේ මන්ත්‍රීවරු ඉන්නවා, ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ. මඩකලපුවේ මන්ත්‍රීවරු ඉන්නවා. ත්‍රිකුණාමලයේ මන්ත්‍රීවරු ඉන්නවා. ඒ හැමෝම එක්ක සාකච්ඡා කරන්න. කරුණාකරලා, 'එක ජන කොටසක් හෝ දෙකක් විතරක් තමයි උතුරු හා නැඟෙනහිර අයිතිකාරයෝ, අනික් අය නිකම් ඔහේ පීවං ජන කොටස්' කියන මානසිකත්වයෙන් මේ දිහා බලන්න එපා. මගේ ඉල්ලීම එච්චරයි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)

ගරු මන්ත්‍රීතුමනි, මේ සාකච්ඡාව ආරම්භ වුණේ උතුරු, නැඟෙනහිර ද්‍රවිඩ මන්ත්‍රීවරු මා එක්ක සාකච්ඡාවට ආ නිසායි. අද තමයි මෙතුමා පටන් ගත්තේ. ඔබතුමා කිව්ව නිසා අපි සිංහල අයගේ ප්‍රශ්නත් සාකච්ඡා කරමු. ඒකේ ප්‍රශ්නයක් නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඉක්මනට කියන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, ඇත්තටම ජනාධිපතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. එතුමා ප්‍රශ්න කිහිපයකට විසඳුම් ගණනාවක් ගෙනැල්ලා තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට අපි මේ සම්බන්ධව ජනාධිපතිතුමා එක්ක කථා කළා. අපට කරන්න පුළුවන් හොඳ දේවල් තිබෙනවා නම් අපි ඒවාට උදවු කරනවා. ඒක වෙනම කාරණයක්. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා මේ යෝජනා ටික ගෙනෙනකොට ආණ්ඩුවේ ප්‍රධාන පක්ෂය වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ලේකම්වරයා එදා කෙළින්ම කිව්වා, මේකට ඔබතුමාට කිසි බලයක් නැහැ, ඒ නිසා ඒ ගැන කථා කරන්න එපා කියලා. ඒ නිසා මම අහන්න කැමැතියි, මේක ඔබතුමාගේ පෞද්ගලික යෝජනාවලියක් ද කියලා. මොකද, මේවා ගෙනෙන්න ඕනෑ ආණ්ඩුව විධියට. දැන් ඔබතුමා ගෙනෙනවා එක එක පනත් කෙටුම්පත්. උදාහරණයක් කිව්වොත්, ඔබතුමා ගෙනෙන්න හදන පනත් කෙටුම්පත් සම්බන්ධව මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරනකොට, අපි යම්කිසි විධියකට හොඳ අදහස් ටිකක් ඉදිරිපත් කරලා ඒවාට සහයෝගය දෙනකොට ආණ්ඩුවේ ප්‍රධාන පක්ෂය වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ලේකම්වරයා මේ විධියට කියනකොට මොකක්ද වෙන්නේ? මම අහන්න කැමැතියි අපේ හිටපු නායකතුමා වන මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙන්, මේ

සම්බන්ධව ඔබතුමන්ලාගේ පක්ෂයේ මතය මොකක්ද කියලා. මොකද, ජනාධිපතිතුමා මේ යෝජනාවලිය ගෙනෙනකොට ඔබතුමන්ලාගේ පක්ෂයේ මන්ත්‍රීවරු පිරිසක් ඒකට විරුද්ධ වුණොත්, ඊට පස්සේ ආණ්ඩුවේ මතයක් විධියට නොවෙයි ඒක යන්නේ. ඊළඟට, වෙනත් කාරණයක් විධියට ඒක මතුවෙන්න පුළුවන්. ජනාධිපතිතුමාගේ අදහස්වලට අපි ගරු කරනවා. ඒවා ඉතාම හොඳයි. ඒ වාගේම විශේෂයෙන්ම මේ ආණ්ඩුවේ මතය මොකක්ද කියලා අපි අහනවා. මොකද, මේවා ගැන ඔබතුමන්ලාගේ බෙදීමක් තිබෙන්න විධියක් නැහැ. ඒ නිසා ආණ්ඩුවේ මතය මොකක්ද කියන එක අහන්න කැමැතියි. ඒ වාගේම, මේ පිළිබඳව විශේෂයෙන්ම උතුර, නැඟෙනහිර ඉන්න සිංහල ජනතාවගේ අදහස් ටිකත් අනිවාර්යයෙන් ගත යුතුයි. විමල් වීරවංශ මැතිතුමා කියන නිසා නොවෙයි, ඒක ඔබතුමා ජනාධිපතිතුමා විධියට, රටටම නායකත්වය දෙන පුද්ගලයා විධියට තීරණය කළ යුතුයි. ඔබතුමාට ඡන්ද 134ක් ලබා දුන් අයගෙනුත් මම ඉල්ලනවා, කරුණාකර එක මතයක ඉඳගෙන මේ යෝජනාවලිය ගෙනෙන්න කියලා. එතකොට අපට සාකච්ඡා කරලා දිය හැකි සහයෝගය ලබා දෙන්න පුළුවන්.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු කථානායකතුමනි, අපේ ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු යෝජනා ගැන සලකා බලනවා කියලා අපේ විපක්ෂ නායකතුමාත් කිව්වා.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා පොඩ්ඩක් ඉන්න. මම දැක්කා නැඟිටලා ඉන්නවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒ ගැන සලකා බලා අපි ඒකට හොඳ ප්‍රතිචාරයක් ලබා දෙන්නම්. හොඳ නම් හොඳයි, නරක නම් නරකයි කියලා අපි ඔබතුමන්ලාට දන්වන්න කැමැතියි. හැබැයි, මම එක් කාරණයක් මතක් කරන්න ඕනෑ. මේ ගිවිසුම අත්සන් කළේ අපි නොවෙයි, තමුන්නාන්සේලායි. තමුන්නාන්සේලා තමයි එදා ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ ආණ්ඩුව කාලයේ රජීව් ගාන්ධි මැතිතුමා ගෙන්වලා මේ ගිවිසුම අත්සන් කළේ. අපි ඒකට විරුද්ධව පිටකොටුවේ උද්ඝෝෂණය කළා. මහින්ද රාජපක්ෂ මහත්මයා ඒ ගැන දන්නවා. මෙතැන ඉන්නවා තවත් ජ්‍යෙෂ්ඨ ඇමතිවරු. දැන් හුඟක් අය මැරිලා. ඒ ගිවිසුමට විරුද්ධව අපි පිටකොටුවේ බෝ ගහ ළඟ උද්ඝෝෂණය කළා. ඒ අවස්ථාවේ අපට කඳුළු ගෑස් ගැහුවා. ඒ කාලයේ ඒඑස්පී ගෆූර් මහත්තයා හිටියා. ගෆූර් මහත්තයා ගැන ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාත් දන්නවා.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
එදා මාත් හිටියා බෝ ගහ යට-*[බාධා කිරීමක්]*

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
එතකොට කිරිඇල්ල මන්ත්‍රීතුමාත් අපිත් එක්ක හිටියේ. දැන් මම මේ පැත්තේ ඉන්නවා වාගේ එතුමාත් එදා අපිත් එක්ක හිටියේ. එදාත් අපට හොඳටම ගැහුවා.

ඊළඟට, හම්බන්තොට වරාය වෙනුවෙන් උද්ඝෝෂණය කරනකොටත් අපට ගැහුවා. අපි ඉපදිලා තිබෙන්නේම ගුටි කන්න, ගරු ජනාධිපතිතුමනි. අරගළය කාලයේත් අපට ගැහුවා. දැනුත් මම අමාරුවෙන් හුස්ම ගන්නේ අරගළකාරයෝ මට ගහපු හින්දා. ඒක නම් කළේ තමුන්නාන්සේලාගේ පැත්තෙන් නොවෙයි. ඒ ගැන ඇහුවොත් මට වටපිට බලන්න පුළුවන්. නමුත් මම දැන් ඒ ගැන වැඩිය මොකුත් කියන්නේ නැහැ.

මම කියන්නේ මේකයි. අපි ගුටි කෑවා, අපි ටික දවසකින් මැරිලා යයි. නමුත්, මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ ඔබතුමාගේ කාලයේදීම මේ ප්‍රශ්නය ඉවර කරන්න කියලායි. එහෙම නැත්නම් අපේ දරු මුනුපුරන්ටත් අපට වාගේම ගුටි කන්න සිද්ධ වෙනවා ඉදිරියේදී. එහෙම වෙන්න ඉඩ තියන්න එපා. එහෙම වුණොත් මම හිතන විධියට ඔබතුමාට යහතින් ජීවත් වෙන්න හම්බ වෙන්නෙත් නැහැ, මැරුණාට පස්සේත් ඉන්න හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා කොහොම හරි මේ ප්‍රශ්නය විසඳන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, ඔබතුමාත් පළාත් සභාවක ප්‍රධාන ඇමතිවරයකු හැටියට කටයුතු කරලා තිබෙනවා. මේ මා ළඟ සිටින අමාත්‍යවරු දෙදෙනෙකුත් ප්‍රධාන අමාත්‍යවරු ලෙස කටයුතු කර තිබෙනවා. අපි හිටියේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ. අදටත් පක්ෂයක් හැටියට අපි ඉන්නේ එතුමාගේ නායකත්වය යටතේ. එතුමා මේ සභාවේ සිටියදීමයි මම මේ කාරණය කියන්නේ. එතුමා හැම දාම කිව්ව දෙයක් තමයි ඒකීය රාජ්‍යයක් තුළ බලය බෙදිය යුතුයි කියන එක. ඒ ස්ථාවරයේ ඉඳගෙන, පළාත් සභාවල මහ ඇමතිවරුන්ට කැබිනට් එකට ඇවිල්ලා වාඩි වෙලා කටයුතු කරන්න අවස්ථාව ලබා දුන් නායකයෙක් තමයි මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා. පොහොට්ටුවේ බෙදීමක් ගැන කියන්න ඇතැම් අය උත්සාහ දරනවා. බලය බෙදීම සඳහා එකඟතාව දීපු, Thirteen plus ගැන කථා කරපු නායකයෙක් තමයි මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා. *[බාධා කිරීම්]* ඉතින් ඒක හංගන්න දෙයක් නොවෙයි. ඒ නිසා ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන සර්ව පාක්ෂික සමුළුවට සම්බන්ධ වෙලා සාධනීය කරුණු කාරණා පිළිබඳ අපේ මතය කියන්න පුළුවන්කමක් තිබෙනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙන් අවසරය අරගෙනයි මම මේ කාරණය පැහැදිලි කළේ.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ගරු කථානායකතුමනි, දැන් අපේ ජනාධිපතිතුමා ප්‍රකාශ කළා වෙනත් රටකට අපේ රටේ ප්‍රශ්න විසඳන්න බැහැ කියලා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වුණේ කොහොමද කියලා ඔබතුමාට අමතක ද දන්නේ නැහැ.

[ගරු ගෙවිඳු කුමාරතුංග මහතා]

දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ II වන ලැයිස්තුව -සංවෘත ලැයිස්තුව- යටතේ, පොලිස් බලතල පිළිබඳව සඳහන් වෙනවා. එහි තිබෙනවා, "...යම් පළාතකට අයත් පොලිස් හමුදාවක සාමාජිකයන් සතු බලතල හා ඒ බලතලවල විෂය පථය ඒ පළාතෙන් පිටත දුම්රිය පළාත්වල..." යනුවෙන්. ගරු කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමනි, අපේ රටේ දුම්රිය පළාත් කියලා දෙයක් තිබෙනවා ද? මේ වෙන රටක දී ලියලා බලහත්කාරයෙන් අපේ රට මත පටවපු සංශෝධනයක් අපි කරඋඩ තියාගෙන යනවා.

ගරු ජනාධිපතිතුමා කථා කළා, 2017 දී ඉදිරිපත් කළ ව්‍යවස්ථා සංශෝධන ගැන. ගරු අගමැතිතුමනි, ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමනි, අපි එකතු වෙලා නිර්මාණය කරපු 69 ලක්ෂයක ජනවරම තිබෙන්නේ මෙතුමා 2017 දී ගෙනාපු "ඔරුමිත්ත නාඩු" ව්‍යවස්ථා සංශෝධනවලට විරුද්ධව නොවෙයි ද? ඔබතුමන්ලාගේ ජනවරමට එරෙහිව ද මේ කටයුතු කරන්නේ? ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ලැබුණු 69 ලක්ෂයක ජනවරම වෙනුවෙන් තමයි අද රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් ජනාධිපතිවරයා විධියට පත්වෙලා තිබෙන්නේ. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමනි, ඒ ජනවරම පැහැදිලිවම නිර්මාණය කළේ ඔබතුමා. ඒ, ජනාධිපතිතුමා අද සඳහන් කරපු 2017 ඉදිරිපත් කළ ව්‍යවස්ථා සංශෝධනවලට එරෙහිව. ඒ නිසා කරුණාකරලා මේ රටේ ජනමතය විසින් පරාජය කරපු ව්‍යවස්ථාවක් කර තබාගෙන යන්න එපා. මේ පාර්ලිමේන්තුවේ එකඟතාව මත ඒ ජනවරමට අනුකූල වෙච්ච සංශෝධනයක් හෝ එකඟතාවක් ගොඩනඟනවා නම් ඒක වෙනම කාරණයක්.

දෙවැනි කාරණය මේකයි ගරු ජනාධිපතිතුමනි. ඔබතුමා දෙමළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු තෝරාගෙන වාර්ගික පදනමක් මත කටයුතු කිරීම ගැන අපි ඉතාම ලජ්ජා වෙනවා. අද කියනවා, මුස්ලිම් වාර්ගික පදනම මත ඒ අයටත් සාකච්ඡාවක් දෙන්නම් කියලා. ඔබතුමාට බැරි වුණා ආදර්ශයක් දෙන්න, අඩුම තරමින් උතුරු-නැඟෙනහිර දෙ පළාතේ සියලු මහජන මන්ත්‍රීවරු ගෙනැල්ලා එවැනි සාකච්ඡාවක් පවත්වන්න. ලජ්ජයි. ඒ එක්කම ඔබතුමා කියනවා, පළාත් පාලන මැතිවරණයේදී තැන්පත් කළ ඇප මුදල් ආපසු දෙන්නම් කියලා. ඔබතුමා කථා කරන්නේ බලය විමධ්‍යගත කිරීම ගැන, ගමට බලය දීම ගැන, පළාතට බලය දීම ගැන. නාම යෝජනා කැඳවලා, ඇප මුදල් බාර අරගෙන, ඡන්ද නොපවත්වා ඔබතුමා කරන්න යන බලය බෙදීම මොකක්ද? ඒ දේවල් කරන්නේ කවුරු වෙනුවෙන් ද? ඔබතුමාගේ අනාගත ජනාධිපති සිහිනයක් වෙනුවෙන් අපේ මව්බිම පාවා දෙන්න අපි එකඟ වෙන්නේ නැහැ කියන කාරණය අපි කියන්න ඕනෑ.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු කථානායකතුමනි, ජනාධිපතිතුමා මේ සභාවට ඉදිරිපත් කරපු කරුණු සම්බන්ධයෙන් පොදුජන පෙරමුණේ මැති ඇමතිවරු සිහිකල්පනාවෙන් යුක්තව කථා කරයි කියලා මම හිතනවා. මම විපක්ෂයේ හිටියත්, අදහස් උදහස්වලින් අපි පොදුජන පෙරමුණ එක්කයි හිටියේ; කටයුතු කළේ. අපට හෘදය සාක්ෂියක් තිබෙනවා. විශේෂයෙන්ම අපි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ජනාධිපති වීමට උදව් කරපු, ඒ සඳහා කැප වෙච්ච අය. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා අද මේ ඉදිරිපත් කරපු කාරණාවල තිබෙන බරපතළකම මේ සභාව තේරුම් ගත්තා ද කියලා මම දන්නේ නැහැ. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා ඉතා පැහැදිලිව ජාතිකවාදී නොවී කටයුතු කළ යුතුයි. ඔබතුමාට මේ රටේ තිබෙන්නේ පොදු ප්‍රශ්නයක්.

රටේ මූල්‍ය අර්බුදයක් තිබෙනවා; සංස්කෘතික අර්බුදයක් තිබෙනවා. ජනතාවගේ ඒ ප්‍රශ්න විසඳීමට ජාතික කාරණා මුලට ගන්න එපා. උතුරු පළාතේ බලතල, දකුණු පළාතේ බලතල, මුස්ලිම් ජනතාවගේ බලතල, නැඟෙනහිර පළාතේ බලතල නොවෙයි. ඔබතුමා ගෙනාපු කාරණාව තමයි ආයෝජනය කරන්න බිලියන ගණන් පළාත් සභාවට ගෙනෙන්න පුළුවන් කියන එක. ඒකේ තිබෙන බරපතළකම මේ සභාව ගැඹුරින් කල්පනා කරයි කියලා මා විශ්වාස කරනවා. යම් කිසි පළාතකට එහෙම ගෙනෙන්න බහැ.

ඊළඟට ඔබතුමා කිව්වා, චීනයේ අසවල් පළාතට ස්වයං බලතල දීලා තිබෙනවා කියලා. චීනය කියන්නේ එහෙම බලතල දෙන රටක් නොවෙයි. චීනය පාලනය වෙන්නේ කොමියුනිස්ට් පක්ෂයෙන්. තනි පක්ෂයක් තිබෙන්නේ. ඒ පක්ෂය යටතේ බලතල බෙදීම කියන්නේ ජනතාව මත. එහේ තනි පක්ෂ ඒකාධිකාරයක් තිබෙන්නේ. චීනයේ ආකෘතිය වෙනස්. ඒක මෙතැන කථා කරන්න පුළුවන් එකක් නොවෙයි. ඒක ප්‍රජාතන්ත්‍රවාදී රටක් නොවෙයි. ඒ නිසා ඔබතුමා මේ ගෙනෙන කාරණා එකකට එකක් පරස්පරයි.

ආපසු ජනතා රැල්ලක් -මහා ජන ආවේගයක්- ඇති වෙලා කැරලිකාරී තත්ත්වයකට යන්න බැහැ. අදත් අපි විරුද්ධයි පළාත් සභාවලට. හැබැයි අපි කියන්නේ නැහැ, පළාත් සභා අහෝසි කරන්න කියලා. අසල්වැසි ඉන්දියාව තරහා කරගෙන ආපසු ගැටුමක් ඇති කර ගන්න අපි කැමැති නැහැ. අද දෙමළ ජනතාවගේ ප්‍රශ්නය සියයට 50කින් විසඳන්න පුළුවන් වාතාවරණයක් තිබෙනවා. ඉතිරි සියයට 50 හැදෙන්නේ, උතුරේ හා නැඟෙනහිර පවතින සහ රට පුරා පවතින මේ බරපතළ ආර්ථික ප්‍රශ්නයට උත්තරයක් හෙව්වොත් පමණයි. ඔබතුමා කිව්වා, ප්‍රශ්නයේ මුල ගැන කථා කරන්න ඕනෑ කියලා. මුල මොකක්ද? අද සියයට 50කට හරියට කන්නවත් නැහැ. ඒ ප්‍රශ්නය ගැන දෙමළ, සිංහල අපි ඔක්කෝම එක්කාසු වෙලා කථා කරමු. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් උතුරට බලතල දුන්නාය කියලා ප්‍රශ්නය විසඳෙනවාද? ඔබතුමන්ලා එදා කිව්වා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාපු ගමන් යුද්ධය ඉවරයි කියලා. යුද්ධය ඉවර වුණාද? යුද්ධය ඉවර වුණේ ත්‍රස්තවාදයට එරෙහිව හමුදාව මෙහෙයවලා කරපු යුද්ධයකින්. එහෙම නැතුව එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමායි, ඔබතුමායි කියපු විධියට පැය 24න් අපට සාමය උදා වුණාද? නැහැ. ඒ නිසා රටේ ජනතාවගේ කෝපය අවුස්සන්නේ නැතුව කටයුතු කරන්න ඕනෑ. විශේෂයෙන්ම අපි කැමැති නැහැ, ආපසු ජාතිවාදී අරගළයකට යන්න. ඔබතුමා අද මේ කරන වැඩෙන් සම්පූර්ණයෙන් වෙන්නේ, ආපසු මේ රටේ ජාතිවාදී ගැටුමකට පාර හොයා ගන්න එකයි. ඒකට අපි කැමැති නැහැ. අපි කැමැතියි සිංහල දෙමළ සියලුදෙනා එකතු වෙලා රටේ ප්‍රමුඛ ජාතික ප්‍රශ්නයට උත්තර හොයන්න. ගරු ජනාධිපතිතුමනි, ඒ සඳහා ඔබතුමා ගෙනෙන්න වැඩ පිළිවෙළක්. විපක්ෂයේ හිටියත් කොහේ හිටියත් එතැනදී අපි එකට ඉන්නවා. පළමුවෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ඔබතුමා මැතිවරණය පවත්වන්න. ඒක කවුරුත් ඉල්ලන එකක්. ස්තුතියි.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

ගරු කථානායකතුමනි, අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංගයක් තමයි දහතුන්වන සංශෝධනය. ඒ ගැන සාකච්ඡා කරන්න පුළුවන්, ප්‍රශ්නයක් නැහැ. පොලිස් බලතල ගැන, ඉඩම් බලතල ගැන සාකච්ඡා කරන්න පුළුවන්, ප්‍රශ්නයක් නැහැ. තිබෙන නීතිය ගැන සාකච්ඡා කරන්න පුළුවන්, ප්‍රශ්නයක් නැහැ. මම අහගෙන හිටියා, අපේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට උත්තරයක් හැටියට ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක, ප්‍රසන්න

රණතුංග මැතිතුමා නැඟිටලා කිව්වා, මහින්ද රාජපක්ෂ මැතිතුමා තවමත් -අදත්- දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය plus විධියට ඉන්නවා කියලා. Thirteen plus කිව්වා. *[බාධා කිරීමක්]* හරි, හරි. ප්‍රශ්නයක් නැහැ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්නකෝ. *[බාධා කිරීමක්]*

පොඩ්ඩක් ඉන්නකෝ. අපි වචනවල පැටලෙන්න ඕනෑ නැහැ. මහින්ද රාජපක්ෂ මහත්මයා Thirteen plus ගැන කථා කරපු කෙනෙක් කියලා ප්‍රසන්න රණතුංග ඇමතිතුමා කිව්වා. ගරු ප්‍රසන්න රණතුංග ඇමතිතුමනි, ඔබතුමා ළඟ වාඩි වෙලා ඉන්නවා, මමත් නියෝජනය කරපු බස්නාහිර පළාත් සභාවේ පළමුවන මහ ඇමති සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා. ඔබතුමාත් හිටපු මහ ඇමති. ඔබතුමන්ලා දෙදෙනාම බස්නාහිර පළාත් සභාවේ හිටපු මහ ඇමතිවරු. පළාත් සභා ක්‍රමය ගැන කවුරු මොනවා කිව්වත්, අපට ඒවා පිළිගන්න බැහැ. පළාත් සභා මේ රටට ඇවිල්ලා ඉවරයි. ඒක ආපස්සට යවන්න බැහැ. සාකච්ඡා කරලා එහි බලතල වෙනස් කරගන්න. ඒකේ ප්‍රශ්නයක් නැහැ. අද මේ රටේ අලුත් ප්‍රශ්නයක් හදන්න ඕනෑ නැහැ. දැන් තිබෙන ප්‍රශ්න අපට හොඳටෝම ඇති.

මම කාරණයක් කියන්න කැමැතියි. මහින්ද රාජපක්ෂ මැතිතුමනි, ඔබතුමාට මතක ඇති. යුද්ධය අවසන් කරපු කාලයේ - 2009දී - වතාවක් මම ඔබතුමා හමු වුණා. ඔබතුමාත් එක්ක සාකච්ඡා කරපු වෙලාවේ මම කිව්වා, ඔබතුමා සිංහල ජනතාවගේ විශ්වාසය ලබා ගත්ත මහා නායකයෙක්, යුද්ධය අවසන් කරපු විධියටම බලය බෙදලා, ජනතාවගේ හිත දිනාගෙන, මේ ප්‍රශ්නය සම්පූර්ණයෙන් අවසන් කරන්න ඔබතුමාට දැන් අවස්ථාව තිබෙනවා කියලා. නමුත්, ඔබතුමා ඒක කළේ නැහැ; මහ හැරියා. කමක් නැහැ. දැන් හරි ඒකට අවස්ථාව ඇවිත් තිබෙනවා. අපි ඒක කරමු.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු ජනාධිපතිතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න.

මේ රටේ ඉතිහාසය පුරාම මහ පක්ෂ දෙකෙන් එක පක්ෂයක් ව්‍යවස්ථා වෙනසකට යනකොට අනෙක් පක්ෂය විරුද්ධ වුණා. කොළ පාට පක්ෂය වෙනසක් ගෙනෙන කොට නිල් පාට පක්ෂය විරුද්ධ වුණා. නිල් පාට පක්ෂය වෙනසක් ගෙනෙන කොට කොළ පාට පක්ෂය විරුද්ධ වුණා. නමුත්, මේ අවස්ථාවේ පළමුවැනි වතාවට එවැනි දෙයක් නැහැ. එම නිසා මම ආඩම්බර වෙනවා, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා ගැන. මොකද, අපි මේ අවස්ථාවේ මේ ජාතික ප්‍රශ්නයත් එක්ක දේශපාලනය කළේ නැහැ. මේ ජාතික ප්‍රශ්නය එනකොට අපි ඒකත් එක්ක දේශපාලනය කළේ නැහැ. අපි ඒ ගැන ආඩම්බර වෙනවා. අපි එහෙම කරන්නේ නැහැ. අපි කකුලෙන් අදින්නේ නැහැ. එම නිසා ගරු ජනාධිපතිතුමනි, අවස්ථාව අරගෙන ඔබතුමා මේ ප්‍රශ්නයට විසඳුම හොයන්න. හැබැයි ඔබතුමා ඉන්න ආණ්ඩු පක්ෂය පැත්තේ අය ඔබතුමා සමඟ එකඟද කියලා බලන්න. ඒකයි අපට දැනගන්න ඕනෑ. එහෙම බවක් අපට පෙනෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]* එකඟ බවක් තිබෙනවා නම් හොඳයි. අපේ ප්‍රසන්න රණතුංග ඇමතිතුමා කියපු විධියට, සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා කියපු විධියට කටයුතු කරනවා නම් හොඳයි. අපට අවශ්‍ය ඒකයි. කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා කියනවා වාගේ අපි මේ ප්‍රශ්නය සම්පූර්ණයෙන් ඉවර කරමු. *[බාධා කිරීමක්]* පළාත් සභා ඡන්දයත් තියන්න. ප්‍රශ්නයක් නැහැ.

එක සැරයකට කියනවා Thirteen plus කියලා. ඊට පස්සේ minus කිව්වා. එහෙම කිව්වේ නැහැ කියලාත් කියනවා. එහෙම කරන්නේ නැතුව අපි එක තැනක ඉඳිමු. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා පළාත් සභා ක්‍රමය මේ රටට ඇවිල්ලා ඉවරයි. ඒක ආපස්සට යවන්න බැහැ. ඕනෑ නම් අපි සාකච්ඡා කරලා ඒ බලතල ටික වෙනස් කර ගනිමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි හරි, ගරු මන්ත්‍රීතුමා. ඉක්මන් කරන්න. මේ කාරණය පිළිබඳව අපට විවාදයකට යන්න වෙලාවක් නැහැ.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
අපි සාකච්ඡා කරමු. නමුත් ඒකට විරුද්ධ වෙන තැනට යන්න එපා. එච්චරයි මම කියන්නේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, I want to reply to the Hon. Mano Ganesan.

මම එකක් කියන්න කැමැතියි. දැන් අපට කරන්න තිබෙන්නේ මේවා ගැන ආපහු වාද විවාද කරන එක නොවෙයි, අදාළ පනත් කෙටුම්පත ආවාම ඒ ගැන තීරණයක් ගන්න එක. ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා මගෙන් අහනවා, මහින්ද රාජපක්ෂ මැතිතුමා ගැන. මම මේ ගැන සඳහන් කළේ කැබිනට් මණ්ඩලයේ ඉන්න ඇමතිවරුන්ට විතරයි. මම මේ කථාව ගැන එතුමාට කිව්වේ නැහැ. එතුමා මෙතැනට ආවා. තමුන්නාන්සේලා මට කියනවා, රාජපක්ෂලාට යට වෙන්න එපා, තනියම වැඩ කරන්න කියලා. තනියම වැඩ කරන කොට අහනවා, රාජපක්ෂලාට යට වුණේ නැත්තේ ඇයි කියලා. දෙකෙන් එකක් තීරණය කරලා මට කියන්න. *[බාධා කිරීම්]* මට කියන්න. මොකක්ද මම කරන්න ඕනෑ? *[බාධා කිරීම්]*

මට කියනවා, රාජපක්ෂට යට වෙලා වැඩ කරන්න එපා කියලා. ඒ කියන විධියට වැඩ කළාම කියනවා, රාජපක්ෂට යට වෙලා වැඩ කරන්න කියලා. *[බාධා කිරීම්]* ඉතින්, නියම රාජපක්ෂවාදීන් ඉන්නේ මෙතැන. *[බාධා කිරීම්]* රාජපක්ෂවාදීන් ඉන්නේ මෙතැන. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, කරුණාකර නිශ්ශබ්ද වෙන්න. ඔය ගැන විවාදයක් ඕනෑ නම් එය වෙනම දිනයක ගන්න. අද ඒක කරන්න වෙලාවක් නැහැ. *[බාධා කිරීම්]*

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, මම යෝජනාවක් කරන්නම්. මේ ප්‍රශ්නය ගැන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සියලුදෙනාම - ආණ්ඩුව පැත්තේ ඉන්න අය විතරක් නොවෙයි, ඒ ලැයිස්තුවෙන්

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

ආපු දැන් විපක්ෂය පැත්තේ ඉන්න අයත්- මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මුණ ගැහිලා තීරණයක් ගන්න. මම නොවෙයි නේ කිව්වේ, ඔබතුමන්ලා නේ කිව්වේ- *[බාධා කිරීම්]* විපක්ෂය කිව්වේ මොකක්ද? මහින්ද රාජපක්ෂ මැතිතුමා- *[බාධා කිරීම්]* ඉතින් ඔබතුමන්ලා ඔක්කෝම එතුමා හමුවෙලා රැස්වීමක් පවත්වලා ඒක කරන්න. මට වැඩක් නැහැ ඒ්ක. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දිනට නියමිත කටයුතු,-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි,-

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාට අවස්ථාව ලබා දුන්නා. ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාරණය ඉක්මනට කියන්න.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ சபாநாயகர் அவர்களே, இந்த நாட்டில் அரசியலமைப்புக்கான 13ஆவது திருத்தச் சட்டத்தை அமுல்படுத்துவது தொடர்பான விடயத்தைக் குழப்பிவிட வேண்டும் என்பதில் மாண்புமிகு சனாதிபதி அவர்கள் வெற்றி கண்டிருக்கிறார். இன்று இங்கு பேசிய பல்வேறுபட்ட தரப்பினருடைய கருத்துக்களைப் பார்க்கின்றபோது, இந்த நாட்டில் இனப் பிரச்சினைக்கு ஒரு தீர்வு வரக்கூடாது என்பதில் அவர்கள் மிகத் தெளிவாக இருக்கிறார்கள் என்பது தெரிகின்றது. அடுத்து ஒரு தேர்தலை நோக்கிய நிலையில், மாண்புமிகு சனாதிபதி அவர்கள் இந்த நாட்டில் 13ஆவது திருத்தச் சட்டத்தை நடைமுறைப்படுத்துகின்ற விடயத்தை குழப்பமான ஒரு சூழலுக்குள் கொண்டுவந்திருக்கிறார் என்பது மட்டும் மிகத் தெளிவாகத் தெரிகின்றது.

இந்த நாட்டில் இனப் பிரச்சினைக்குத் தீர்வு காணப்பட வேண்டுமா, இல்லையா? என்பதில் எத்தனை சிங்களத் தலைவர்கள் தெளிவாக இருக்கிறார்கள்? நீங்கள் இனப் பிரச்சினைக்குத் தீர்வு காண்பதற்குத் தயாராக இருந்தால், முதலில் தமிழ் மக்களுடைய அரசியல் அபிலாஷைகளை, அவர்களுடைய எண்ணங்களைப் பிரதிபலிக்கக்கூடிய வகையில், 70 வருஷங்களுக்கும் மேலாக அவர்கள் படுகின்ற துன்ப, துயரங்களுக்கு ஒரு முடிவை எட்டுங்கள்! அவ்வாறு செய்தால், இந்த நாட்டை அபிவிருத்தி செய்வதில்கூட, அவர்கள் பங்காளிகளாக இருப்பார்கள் என்பதைத்தானே நாங்கள் இங்கு பல தடவை சொல்லியிருக்கிறோம். தமிழர்களுக்கு சமஷ்டி அடிப்படையிலான ஒரு தீர்வு வேண்டுமா, இல்லையா? அல்லது அவர்கள் தனித்துச் செல்ல வேண்டுமா, இல்லையா? என்பது தொடர்பாக அம்மக்களுடைய மனங்களை அறிய, நீங்கள் வடக்கிலும் கிழக்கிலும் மலையகத்திலும் கொழும்பிலும் வாழுகின்ற தமிழர்களிடம் பொதுசன வாக்கெடுப்பொன்றை நடாத்தத் தயாரா? என நான் கேட்க விரும்புகின்றேன். உங்களுடைய அதிகாரத்துக்குள், நீங்கள் சொல்வதைக் கேட்டுத்தான் தமிழர்கள் இருக்கவேண்டும் என்றே இங்கு எல்லோரும் பேசுகிறார்கள். இது மிகவும் மோசமானதொரு நிலைமை! முதலில் இந்த நிலைப்பாட்டிலிருந்து வெளியிலே வாருங்கள்! இனவாதச் சிந்தனையிலிருந்தும் இனவாதக் கருத்துக்களிலிருந்தும் வெளியிலே வந்து, நீதியான முறையில் இந்தப் பிரச்சினைக்குத் தீர்வு காணும் வகையில், உங்களுடைய மனங்களை மாற்றுங்கள்! தயவுசெய்து, இந்த விடயத்தைக் குழப்பாதீர்கள்! இவ்விடயம் குழம்பிவிட்டது என்றுதான் நான் நினைக்கின்றேன். இவ்விடயம் குழம்பினால், தேர்தலும் நடக்காது; தீர்வும் வராது. இந்த நாட்டையும் தலைவர்களையும் குழப்பமான நிலையில் வைத்திருப்பதில் இப்போதைய அரசு வெற்றி கண்டிருக்கின்றது.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා අවස්ථා ගණනාවක් කථා කළා. තවත් කියන්න දෙයක් ඉතුරු කරලා තිබෙනවාද? මොනවා කථා කරන්නද? *[බාධා කිරීමක්]*

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)
Sir, can I clarify the matters raised by the Hon. Sivagnanam Shritharan?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, please.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)
He is the only Tamil MP who raised an issue, firstly, on having federalism, whether you can have Tamils only. No, you cannot. It is as those in the country as a whole electorate or as people of two provinces. That is, unless they change the Constitution. But, I have taken into view what the Tamils have wanted and that they have been suffering. - [*Interruption* ] You are calling me a Sinhala racist and the Hon. (Ven.) Athuraliye Rathana Thero is calling me a Tamil supporter. So, where do I stand? Anyway, I understand the problems you are having.

All I want is to ensure that the Thirteenth Amendment is implemented because we are spending half a trillion rupees on provincial councils! The people of the North, the South or the Uva are not getting any benefit out of

them. So, let us do it. When you do it, it will also resolve part of the issues there. I am trying to act within the Constitution. But, if the Hon. Member wants to talk of anything else, I am prepared to. I know he represents an area where people are undergoing a lot of suffering. I understand that, but the best thing is that we all get together and see how we can resolve it.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Thank you. - [Interruption.]

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා, ඉක්මනින් කියන්න.

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
ගරු කථානායකතුමනි, ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා මෙහෙම කථා කරන එක හොඳයි. හැබැයි, අද මේ රටේ මූලික ප්‍රශ්නය දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයද? පළාත් සභා බලවත් කරන එකට, පළාත් සභා මැතිවරණය පවත්වන එකට පළාත් සභා ක්‍රමය වෙනුවෙන් පෙනී සිටින දේශපාලන පක්ෂයක් හැටියට අපි එකඟයි. හැබැයි, අද තිබෙන මූලික ප්‍රශ්නය ඒකද? උතුරේ මිනිස්සුවත් දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉල්ලන්නේ නැති වෙලාවක, මේ රටේ පළාත් සභා සම්පූර්ණයෙන් හකුළා දමලා පළාත් සභා මැතිවරණය පවත්වන්නේ නැතිව ඉන්නවා. ඒ නිසා පළාත් සභාවල බලය ගැන කථා කිරීම වෙනුවට අඩුම ගණනේ දැනට තියන්න ඕනෑ යුතු පළාත් සභා ඡන්දය තියන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඔය කාරණය විවාදයකදී මතු කරන්න.

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
ගරු කථානායකතුමනි, මට තවත් විනාඩියක කාලයක් ලබා දෙන්න.

අපි ජනාධිපතිතුමාගෙන් ප්‍රධාන වශයෙන් ඉල්ලා සිටිනවා, මේ පාර්ලිමේන්තුවේ කාලය රටේ මූලික ප්‍රශ්නවලට පාවිච්චි කරන්න කියලා. අද ගොවියාට බොන්න වතුර ටික නැහැ; කුඹුරු කරන්න වතුර ටික නැහැ; ඉස්පිරිතාලවල බෙහෙත් ටික නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඔය කාරණය විවාදයේදී ඉදිරිපත් කරන්න. අද විවාදයේදී ඔබතුමාත් කථා කරනවා නේ.

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
රටේ ආර්ථිකය සම්පූර්ණයෙන් බංකොලොත් වෙලා. ඒ නිසා ගරු කථානායකතුමනි,-

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මේ මුළු විපක්ෂයම අහන්නේ මේකයි. ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ යෝජනා අහගෙන ඉඳලා අපි මහින්ද රාජපක්ෂ මැතිතුමාට ප්‍රශ්නයක් ඉදිරිපත් කළා, එතුමාගේ පක්ෂයේ මතය මොකක්ද කියලා. එතුමාගෙන් ඒ ප්‍රශ්නය ඇහුවාම, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා නැගිටලා එතුමා වෙනුවෙන් උත්තර දෙනවා. අපට අවශ්‍යයි ආණ්ඩුවේ මතය මොකක්ද කියලා දැන ගන්න. මොකද, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ තමයි-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, එතැන point of Order එකක් නැහැ. බොහොම ස්තුතියි.

අද දිනට නියමිත කටයුතු.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, මම වෙනුවෙන් ඇවිල්ලා මම පිළිතුරු දුන්නා. [බාධා කිරීම්] කියන්න මම කැබිනට් එකට හැර වෙන කාටවත් එච්චර නැහැ කියලා. [බාධා කිරීම්] මම දන්නවා, ඔබතුමායි, රාජපක්ෂලායි අතර තිබෙන නෑකම. ඒක මම කියන්න අවශ්‍ය නැහැ නේ. ඉතින් ඇයි මට ඇවිල්ලා කියන්නේ? [බාධා කිරීම්]

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ප්‍රසන්න රණතුංග මහතා (නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற் கோலாசானும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Urban Development and Housing and Chief Government Whip)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

(ii) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ වාර්ෂික වාර්තාව; සහ

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

(iii) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2022 වර්ෂය සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2022 වර්ෂය සඳහා උපරිමාධිකරණ විනිශ්චයකාරවරු - ශීර්ෂ අංක 04 හි කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2021 වර්ෂය සඳහා රුහුණ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(ii) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්; සහ

(iii) 2021 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා (වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி நிமல் சிறிபால த சில்வா - துறைமுகங்கள், கப்பற்றுறை மற்றும் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala de Silva, Attorney-at-Law - Minister of Ports, Shipping and Aviation)
ගරු කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் வெகுசன ஊடக அமைச்சரும்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2019, 2020 සහ 2021 වර්ෂ සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා; සහ

(ii) 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු හරින් ප්‍රනාන්දු මහතා (සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஹரின் பர்னாந்து - சுற்றுலாத்துறை மற்றும் காணி அமைச்சர்)
(The Hon. Harin Fernando - Minister of Tourism and Lands)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2022 වර්ෂය සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ
(ii) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2022 වර්ෂය සඳහා බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආගමික කටයුතු හා සහජීවනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කංචන විජේසේකර මහතා (විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - Minister of Power and Energy)

ගරු කථානායකතුමනි, 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ වාර්ෂික වාර්තාව;
(ii) 2020 වර්ෂය සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ වාර්ෂික වාර්තාව; සහ
(iii) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා, ඔබතුමාගේ හදිසි ප්‍රශ්නය මොකක්ද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, ගරු ප්‍රසන්න රණතුංග අමාත්‍යතුමා ගරු සභාවේ ඉන්න වෙලාවේ මම මේ කාරණය කියන්න කැමැතියි. එතුමා දන්නවා, මම ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් ඇමති හැටියට හිටපු කාලයේ NEMO කියලා ආයතනයක් තිබුණු බව. රණසිංහ ප්‍රේමදාස මැතිතුමා තමයි ඒ ආයතනය පටන් ගෙන තිබුණේ. ඒ ආයතනයේ සේවකයන් ඉතා අසරණ තත්ත්වයකට පත් වෙලා හිටියේ. ඒ වෙලාවේ මම රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ඒ ආයතනය අනුයුක්ත කළා. ඒ අනුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ එක කොටසක් බවට ඒ ආයතනය පත් කළා. එමගින් ඒ NEMO කියන ආයතනයේ සේවකයන්ගේ ප්‍රශ්න - ගැටලු - ගොඩක් විසඳුණා. ඔවුන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ශක්තිමත් කරන්නත් දායක වුණා. නමුත් අවාසනාවට යහ පාලන ආණ්ඩුව කාලයේ ආපසු ඒ NEMO කියන ආයතනය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් වෙන් කරලා, වෙනම සභාපතිවරයෙක් පත් කරලා, වෙනම ආයතනයක් බවට පත් කර තිබුණා. නමුත් අද වෙලා තිබෙන්නේ මේකයි. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ඇති වෙලා තිබෙන සහ ඇති කර තිබෙන කඩා වැටීම විසින් මුදල් අමාත්‍යාංශයෙන් යම්කිසි වන්දි ක්‍රමයක් යෝජනා කරලා, ඒ සේවකයන්ට කැමැත්තෙන් අයින් වෙන්න ඉඩ හදා දීලා තිබෙනවා. හැබැයි, NEMO කියන ආයතනයේ සේවකයන්ට මාස තුන හතරක ඉඳලා පඩිත් නැහැ. ඒ මිනිස්සුන්ට අර විධියේ උත්තරයකුත් නැහැ. ඒ අය අද ගොඩක් අසරණ වෙලා ඉන්නවා. ඒ නිසා, ගරු විෂයය භාර අමාත්‍යතුමාගෙන් මම මේ කාරණය දැනගන්න කැමැතියි. NEMO කියන ආයතනයේ සේවකයන් මාස තුන හතරක් පඩි නැතිව ඉතා අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවා.

[ගරු විමල් වීරවංශ මහතා]

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ අයට නම් නියම උත්තරයක් නොවුණත්, යම් කිසි උත්තරයක් හෝ මුදල් අමාත්‍යාංශයෙන් ලැබෙමින් තිබෙනවා. හැබැයි, NEMO කියන ආයතනයේ සේවකයන් වෙනුවෙන් ගන්නා පියවර මොකක්ද කියලා මම දැන ගන්න කැමැතියි.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, ඒ පිළිබඳව මේ වෙනකොටත් අපි දීර්ඝ වශයෙන් සාකච්ඡා කරමින් පවතිනවා. මේ වෙනකොට NEMO කියන ආයතනය මුදල් අමාත්‍යාංශය යටතට අරගෙන තිබෙනවා. මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් එක්ක අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා මේ වෙනකොටත් සාකච්ඡා කරලා, ඒ අයගේ වැටුප් පිළිබඳව කථා කර ගෙන යනවා. මේ පිළිබඳව ඉදිරියේ දී සම්පූර්ණ වාර්තාවක් සමඟ ඔබතුමාට පිළිතුරක් ලබා දෙන්න මම කටයුතු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කාරක සභා වාර්තා පිළිගැන්වීම. ගරු ඩග්ලස් දේවානන්දා ඇමතිතුමා.

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා (ධීවර අමාත්‍යතුමා)**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா - கடற்றொழில் அமைச்சர்)
(The Hon. Douglas Devananda - Minister of Fisheries)

கௌரவ சபாநாயகர் அவர்களே, கடற்றொழில் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழுவிற்கு ஆற்றுப் படுத்தப்பட்ட -

(i) 1996ஆம் ஆண்டின் 2ஆம் இலக்க, கடற்றொழில் மற்றும் நீர்வாழ் உயிரின வளங்கள் சட்டத்தின் 61ஆம் பிரிவின் (1)ஆம் உப பிரிவின் (ப) எனும் பந்தியின்கீழ் கடற்றொழில் அமைச்சரினால் ஆக்கப்பட்டு, 2023 பெப்ருவரி 13ஆம் திகதிய 2319/21ஆம் இலக்க அதி விசேட வர்த்தமானியில் பிரசுரிக்கப்பட்ட ஒழுங்கு விதிகள்;

(ii) 1996ஆம் ஆண்டின் 2ஆம் இலக்க, கடற்றொழில் மற்றும் நீர்வாழ் உயிரின வளங்கள் சட்டத்தின் 61ஆம் பிரிவின்கீழ் கடற்றொழில் அமைச்சரினால் ஆக்கப் பட்டு, 2023 பெப்ருவரி 13ஆம் திகதிய 2319/20ஆம் இலக்க அதிவிசேட வர்த்தமானியில் பிரசுரிக்கப்பட்ட ஒழுங்குவிதிகள்;

(iii) 1996ஆம் ஆண்டின் 2ஆம் இலக்க, கடற்றொழில் மற்றும் நீர்வாழ் உயிரின வளங்கள் சட்டத்தின் 61ஆம் பிரிவின் (1)ஆம் உட்பிரிவின் (தஉ) என்னும் பந்தியின்கீழ் கடற்றொழில் அமைச்சரினால் ஆக்கப் பட்டு, 2023 பெப்ருவரி 13ஆம் திகதிய 2319/19ஆம் இலக்க அதிவிசேட வர்த்தமானியில் பிரசுரிக்கப்பட்ட ஒழுங்குவிதிகள்;

(iv) 1996ஆம் ஆண்டின் 2ஆம் இலக்க, கடற்றொழில் மற்றும் நீர்வாழ் உயிரின வளங்கள் சட்டத்தின் 6,7,8,9 மற்றும் 10ஆம் பிரிவுகளுடன் சேர்த்து வாசிக்கப்படும் சொல்லப்பட்ட சட்டத்தின் 61ஆம் பிரிவின்கீழ் கடற்றொழில் அமைச்சரினால் ஆக்கப்பட்டு, 2023 பெப்ருவரி 01ஆம் திகதிய 2317/59ஆம் இலக்க அதிவிசேட வர்த்தமானியில் பிரசுரிக்கப்பட்ட ஒழுங்கு விதிகள்;

(v) 1996ஆம் ஆண்டின் 2ஆம் இலக்க, கடற்றொழில் மற்றும் நீர்வாழ் உயிரின வளங்கள் சட்டத்தின் பிரிவு 61(1)(தள, தஎ) மற்றும் (ந) என்பதன்கீழ் கடற்றொழில் அமைச்சரினால் ஆக்கப்பட்டு, 2022 டிசம்பர் 15ஆம் திகதிய 2310/37ஆம் இலக்க அதிவிசேட வர்த்தமானி யில் பிரசுரிக்கப்பட்ட ஒழுங்குவிதிகள்; மற்றும்

(vi) 2020ஆம் ஆண்டுக்கான இலங்கை தேசிய நீரியல் வாழ் செய்கை அபிவிருத்தி அதிகாரசபையின் வருடாந்த அறிக்கை

தொடர்பிலான அக்குழுவின் அறிக்கையை நான் சமர்ப்பிக்கின்றேன்.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත යොමු කරන ලද විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

**විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත;**

2022 අංක 43 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි. අදාළ සංශෝධනය 2023.08.08 වැනි දින පාර්ලිමේන්තුවේ මුදල් කාරක සභාවේ අවධානයට යොමු විය. ඒ අනුව, 2022 අංක 43 දරන විසර්ජන පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදයේ රුපියල් බිලියන 4,979ක් වූ ණය ගැනීමේ සීමාව රුපියල් බිලියන 13,979 දක්වා වැඩි කිරීම මඟින් රුපියල් බිලියන 9,000ක නැවත ණය නිකුත් කිරීම සඳහා ණය සීමාව සංශෝධනය කිරීමේ අවශ්‍යතාව සහ පනතේ 2 (4) වන උප වගන්තිය හා දෙවන උපලේඛනය සංශෝධනය කිරීම මඟින් ණය ආපසු ගෙවීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට අවශ්‍ය ප්‍රතිපාදන සලසා දීමක් ලෙස රුපියල් බිලියන 4,222.23 සිට රුපියල් බිලියන 13,222.23ක් වූ වියදම් සීමාව වැඩි කිරීම සිදු වේ.

**සංශෝධනයේ බලපෑම**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම ලබා ගැනීමට අදාළ වැඩසටහන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් සැලසීම වෙනුවෙන් සිදු කරන තාක්ෂණික ක්‍රියාවලියක් වන නිසා නාමික වශයෙන් පමණක් මෙම ණය ගැනීමේ සීමාව සහ ණය ආපසු ගෙවීමේ ප්‍රතිපාදන වැඩි වේ.

ගරු කථානායකතුමනි, සමාජයේ මතයක් ඇති වුණා, මේ ගරු මන්ත්‍රීතුමන්ලාත් ප්‍රකාශ කළා, රුපියල් බිලියන 9,000ක අතිරේක ණය ගැනීමක් යෝජනා කරලා තිබෙනවා කියලා. ඒ ගැන අපි මුදල් අමාත්‍යාංශයෙන් විමසීමක් කළා.

ඒ අනුව මුදල් අමාත්‍යාංශය කාරක සභාවට පොරොන්දු වුණා, කිසිම ආකාරයක අලුත් ණය ගැනීමක් කරන්නේ නැහැ කියලා. නමුත්, විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී භාණ්ඩාගාර බිල්පත් බැඳුම්කර වීම නිසාත්, ඒ වාගේම විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ අවශ්‍යතාව සඳහා පමණක් -ඒ කියන්නේ ගණකාධිකරණ ක්‍රියාවලියක් සඳහා පමණක්- මෙය සිදු කරන බවත් අපට පැවසුවා. ඒ අනුව අපි බලාපොරොත්තු වෙනවා, මේ වැඩි කරන මුදල අලුතින් ණය ගැනීමක් සඳහා යොදා නොගන්නා බවට මුදල් අමාත්‍යාංශයෙන් ලබා දුන් පොරොන්දුව ඉටු කරයි කියලා.

දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේදී විශ්‍රාම අරමුදලෙහි - Superannuation Fund එකේ - තෝරා ගන්නා ලද අංශ කිහිපයක පමණක් අඩංගු 2032 වර්ෂය දක්වා කල් පිරෙන භාණ්ඩාගාර බිල්පත් රුපියල් බිලියන 6,000ක් ද, විදේශීය ණයට අදාළ භාණ්ඩාගාර බැඳුම්කර රුපියල් බිලියන 3,000ක වටිනාකමකින් යුතු ණය ප්‍රමාණයේ ද එකතුව වූ රුපියල් බිලියන 9,000ක ණය ප්‍රමාණය දිගු කාලීනව ආපසු පියවෙන ණය බවට පත් කිරීමේ ක්‍රියාවලියට යටත් වීම පමණක් මෙහිදී සිදුවන නිසා රාජ්‍ය වැය ශීර්ෂවල සිදුවන නාමික වෙනස්කමක් පමණක් මෙහිදී සිදු වේ.

2032න් පස්සේ සිදුවන ණය ගනුදෙනු තවදුරටත් රජයට බරක්. එය මෙතැනට අදාළ වෙන්නේ නැහැ කියන එකත් මම ප්‍රකාශ කරන්න ඕනෑ.

එනම්, මෙම අනුමත ණය ගැනීමේ සීමාව සංශෝධනය කිරීමේ අරමුණ වන්නේ ණය ප්‍රතිනිකුත් කිරීමේ ක්‍රියාවලියට සහාය සැලසීම පිණිස සිදුවන තාක්ෂණික ගැළපීම්/ ගිණුම්කරණ ගැළපීම් සිදු කිරීම පමණක් බව පෙන්වා දීලා තිබෙනවා. ඒ ගැන අපට පොරොන්දු වෙලා තිබෙනවා. ඒ ගැන ක්‍රියා කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

**කාරක සභාවේ තීරණ**

සලකා බැලීමෙන් අනතුරුව කාරක සභාව, විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත අනුමත කරන ලද අතර, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව අද පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයිද තීරණය කළා.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා**
(மாண்புமிகு நாலக பண்டார கோட்டேகொட)
(The Hon. Nalaka Bandara Kottegoda)

ගරු කථානායකතුමනි, බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

(i) 2022 වර්ෂය සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(ii) 2021 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2021 වර්ෂය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා (ධීවර රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியல் நிஷாந்த த சில்வா - கடற்றொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Piyal Nishantha De Silva - State Minister of Fisheries)

ගරු කථානායකතුමනි, බොරලැස්ගමුව, අබේරත්න මාවත, 3 වැනි පටුමග, 35/2 බී දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. නිමල් වික්‍රමආරච්චි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු මිලාන් ජයතිලක මහතා**
(மாண்புமிகு மிலான் ஜயதிலக்க)
(The Hon. Milan Jayathilake)

ගරු කථානායකතුමනි, කිරිඳිවැල, හිස්වැල්ල, මුත්තෙට්ටුවත්ත, 147/සී දරන ස්ථානයෙහි පදිංචි එම්.ඩී.කේ. මල්දෙණිය මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු කථානායකතුමනි, පොළොන්නරුව, රවුම් පාර, අංක 122 දරන ස්ථානයෙහි පදිංචි පී.ඊ.එම්. රමණී පලිපාන මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)

Hon. Speaker, I present a petition from Mr. Mahendra Karaputugala of No. 61, Pallekele, Kundasale.

**ගරු යදාමිණී ගුණවර්ධන මහතා**
(மாண்புமிகு யதாமிணீ குணவர்தன)
(The Hon. Yadamini Gunawardena)
ගරු කථානායකතුමනි, හංවැල්ල, නිරිපොල, වනාත වත්ත, 44/2 දරන ස්ථානයෙහි පදිංචි එන්.ජී.ජී.එන්. කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### 2019-2022 කාලය තුළ කොවිඩ්-19 මෘතදේහ: බැහැර කිරීමේ ක්‍රම
### 2019-2022ஆம் காலப்பகுதியில் இறந்த கொவிட் -19 உடல்கள்: அகற்றிய முறைகள்
### COVID-19 DEAD BODIES DURING 2019-2022: METHODS OF DISPOSAL

860/2023

**1. ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) වර්ෂ 2019 සිට 2022 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ -

(i) රසායනාගාර පරීක්ෂණවලින් තහවුරු කරන ලද මුළු කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාව;

(ii) තහවුරු කරන ලද මුළු කොවිඩ්-19 මරණ සංඛ්‍යාව;

(iii) එම මරණ සංඛ්‍යාව වයස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, පදිංචි පළාත සහ දිස්ත්‍රික්කය, ජනවර්ගය සහ ආගම අනුව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) වර්ෂ 2019 සිට 2022 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 -

(i) මෘත දේහ බැහැර කිරීම සඳහා යොදාගත් ක්‍රමවේද/ක්‍රමවේදය කවරේද;

(ii) ආදාහනය කිරීමෙන් බැහැර කරන ලද මෘත දේහ සංඛ්‍යාව කොපමණද ;

(iii) භූමදානය කිරීමෙන් බැහැර කරන ලද මෘත දේහ සංඛ්‍යාව කොපමණද;

(iv) වයස, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය, පළාත සහ දිස්ත්‍රික්කය, ජන වර්ගය සහ ආගම අනුව ආදාහනය කරන ලද සහ භූමදානය කරන ලද මෘත දේහ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2019 முதல் 2022ஆம் ஆண்டு வரையான காலப் பகுதியினுள் இலங்கையில் கொவிட்-19 நோயுடன் தொடர்புடையதாக -

(i) ஆய்வுகூடத்தினால் உறுதி செய்யப்பட்ட நோயாளர்களின் மொத்த எண்ணிக்கை;

(ii) உறுதிசெய்யப்பட்ட மரணங்களின் மொத்த எண்ணிக்கை;

(iii) மரணித்தவர்களின் வயது, பால், வதிவிட மாகாணம் மற்றும் மாவட்டம், இனம் மற்றும் சமய அடிப்படையிலான மரணங்களின் எண்ணிக்கை விபரங்கள்;

ஆகியவற்றை அவர் இச்சபைக்கு வெவ்வேறாகத் தெரிவிப்பாரா?

(ஆ) 2019 முதல் 2022ஆம் ஆண்டு வரையான காலப் பகுதியினுள் இலங்கையில் கொவிட்-19 மரணங்களுடன் தொடர்புடையதாக -

(i) சடலங்களை அகற்றுவதற்குப் பயன்படுத்தப்பட்ட முறை/முறைகள்;

(ii) தகனக்கிரியை மேற்கொள்ளப்பட்ட சடலங்களின் மொத்த எண்ணிக்கை;

(iii) அடக்கம் செய்யப்பட்ட சடலங்களின் மொத்த எண்ணிக்கை;

(iv) தகனக்கிரியை மற்றும் அடக்கம் செய்யப்பட்டவர்களின் வயது, பால், வதிவிட மாகாணம் மற்றும் மாவட்டம், இனம் மற்றும் சமய அடிப்படையிலான விபரங்கள்;

ஆகியவற்றை அவர் இச்சபைக்கு வெவ்வேறாகத் தெரிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he inform this House, separately -

(i) the total number of laboratory-confirmed cases;

(ii) the total number of confirmed deaths; and

(iii) the breakdown of deaths based on age, gender, province and district of residence, ethnicity and religion of the deceased;

with regard to the COVID-19 disease in Sri Lanka during the period from 2019 to 2022?

(b) Will he also inform this House, separately -

(i) the method/s used for disposal of dead bodies;

(ii) the total number of dead bodies disposed of by cremation;

(iii) the total number of dead bodies disposed of by burial; and

(iv) the breakdown of dead bodies disposed of by cremation and burial based on age, gender, province and district of residence, ethnicity and religion of the deceased;

with regard to the COVID-19 deaths in Sri Lanka during the period from 2019 to 2022?

(c) If not, why?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (සෞඛ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல - சுகாதார அமைச்சர்)
(The Hon. Keheliya Rambukwella - Minister of Health)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කොවිඩ්-19 ආරම්භයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා රසායනාගාර පරීක්ෂණවලින් තහවුරු කරන ලද කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාව 671,893කි.

(ii) කොවිඩ්-19 ආරම්භයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා තහවුරු කරන ලද කොවිඩ්-19 මරණ සංඛ්‍යාව 16,817කි.

(iii) සෞඛ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග විද්‍යා ඒකකයේ පවතින තොරතුරු අනුව තහවුරු කරන ලද කොවිඩ්-19 මරණ සංඛ්‍යාව වයස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, පදිංචි පළාත සහ දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් පහත පරිදි වේ.

<u>වයස</u>

| වයස් කාණ්ඩය | එකතුව |
|---|---|
| 0 - 10 | 43 |
| 10 - 20 | 46 |
| 20 - 30 | 134 |
| 30 - 40 | 373 |
| 40 - 50 | 1,024 |
| 50 - 60 | 2,280 |
| 60 - 70 | 3,931 |
| 70 - 80 | 5,120 |
| 80 - 90 | 3,144 |
| 90 -100 | 708 |
| 100-110 | 14 |
| **මුළු එකතුව** | **16,817** |

<u>ස්ත්‍රී/පුරුෂභාවය</u>

| ස්ත්‍රී/පුරුෂභාවය | එකතුව |
|---|---|
| ස්ත්‍රී | 7,361 |
| පුරුෂ | 9,456 |
| මුළු එකතුව | 16,817 |

<u>පළාත</u>

| පළාත | එකතුව |
|---|---|
| දකුණ | 1,537 |
| මධ්‍යම | 1,451 |
| නැගෙනහිර | 748 |
| සබරගමුව | 1,454 |
| ඌව | 748 |
| බස්නාහිර | 8,012 |
| උතුරු | 691 |
| උතුරු මැද | 727 |
| වයඹ | 1,449 |
| **මුළු එකතුව** | **16,817** |

<u>දිස්ත්‍රික්කය</u>

| දිස්ත්‍රික්කය | එකතුව |
|---|---|
| ගාල්ල | 895 |
| හම්බන්තොට | 237 |
| මාතර | 405 |
| නුවරඑළිය | 329 |
| නුවර | 834 |
| මාතලේ | 288 |
| කෑගල්ල | 559 |
| රත්නපුරය | 895 |
| ත්‍රිකුණාමලය | 229 |
| අම්පාර | 271 |
| මඩකලපුව | 248 |
| බදුල්ල | 505 |
| මොණරාගල | 243 |
| කොළඹ | 3,335 |
| ගම්පහ | 3,134 |
| කළුතර | 1,543 |
| අනුරාධපුරය | 469 |
| පොළොන්නරුව | 258 |
| යාපනය | 386 |
| කිලිනොච්චිය | 71 |
| මන්නාරම | 31 |
| මුලතිව් | 44 |
| වවුනියාව | 159 |
| පුත්තලම | 384 |
| කුරුණෑගල | 1,065 |
| **මුළු එකතුව** | **16,817** |

(ආ) (i) කොවිඩ්-19 මෘත දේහ බැහැර කිරීමේ දී, කොවිඩ්-19 වයිරස් ප්‍රභේදයේ ස්වභාවය සහ ලෝකයේ අනෙකුත් රටවල් ක්‍රියා කරන ලද ආකාරය සලකා මහජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂණය උදෙසා "කොවිඩ්-19 ආසාදිත මෘත ශරීර ආදාහනය කළමනාකරණය පිළිබඳ තාක්ෂණික කමිටුව" විසින් වරින් වර නිර්දේශ ලබා දීම සිදු කර ඇත. එහිදී මිය ගිය පුද්ගලයන්ගේ මරණවල අවසන් කටයුතු කිරීමට අදාළව කමිටුව විසින් පහත නිර්දේශ ඉදිරිපත් කරනු ඇත.

මිය ගිය පුද්ගලයන්ගේ මෘත ශරීර පැය 24ක් ඇතුළත ආදාහනය කිරීම.

තෝරාගත් හුදකලා භූමිවල මෘත ශරීර භූමදානය කිරීම.
මේ සඳහා ඔඩ්ඩමාවඩි සුසාන භූමිය තෝරාගෙන භූමදාන කටයුතු සිදු කරන ලදී.

(ii), (iii) කොවිඩ්-19 ආරම්භයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා තහවුරු කරන ලද කොවිඩ්-19 මරණ සංඛ්‍යාව 16,817කි. ඉන් 2021.03.05 දින සිට භූමදානය කිරීමෙන් බැහැර කරන ලද මෘත දේහ සංඛ්‍යාව 3,634කි.

[ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා]

(iv) සෞඛ්‍ය අමාත්‍යාංශය සතුව පවතින තොරතුරු අනුව ආදාහනයෙන් සහ භූමදානයෙන් බැහැර කරන ලද මෘත දේහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් වෙන් වශයෙන් පහත පරිදි වේ.

| ක්‍රමවේදය | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|
| ආදාහනය | 5,136 | 8,047 |
| භූමදානය | 2,225 | 1,409 |
| මුළු එකතුව | 7,361 | 9,456 |

(ඈ) පැන නොනඟී.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේ, විශ්වාස භංග යෝජනාවකට මුහුණ දී සිටින අමාත්‍යතුමෙක්. එතුමාගෙන් අපි බලාපොරොත්තු වෙනවා, අවංක පිළිතුරු. මම එතුමාගෙන් එක දෙයක් පැහැදිලි කර ගන්න ඕනෑ. එතුමා මගේ ප්‍රශ්නයේ (අ) (iii) වෙනුවෙන් පිළිතුර ලබා දෙන විටත්, (ආ) (iv) වෙනුවෙන් පිළිතුර ලබා දෙන විටත් මා අසා තිබෙන ප්‍රශ්නවලට අනුකූලව පිළිතුරු ලබා නොදුන් බව මට පෙනී ගියා. විශේෂයෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය, පදිංචි පළාත විතරක් නොවෙයි, ජන වර්ගය සහ ආගම් වශයෙනුත් මම ඒ නම් ඉල්ලා සිටියා. මොකද, මීට කලිනුත් මේ තොරතුරු වසන් කිරීමේ උත්සාහයක් තිබුණා. මේ අසාධාරණයට පත් වුණු, විශේෂයෙන්ම මේ මෘත දේහ ආදාහනය කිරීමට ගත්ත තීරණය උඩ යම් යම් ආගම් අදහන පවුල්වලට විශාල ප්‍රශ්න ඇති වුණු බව අපි කවුරුත් දන්නවා.

ඒ විස්තර අපි දැනගත යුතුයි. ඒ ඒ ආගම් අදහන කී දෙනෙක් මිය ගිය පසුව එසේ ආදාහනය කළාද කියන කාරණය පිළිබඳව තිබෙන තොරතුරු අපට ලබා ගැනීමට අවශ්‍යයි. ඒ මත තමයි මේ ප්‍රශ්නය මම පැන නැඟුවේ. නමුත්, ඒකට අදාළව පිළිතුරක් නොලැබුණු බව මට පෙනී යනවා. අපි අමාත්‍යතුමාගෙන් අහනවා, අපට පෞද්ගලිකව හෝ ඒ තොරතුරු ලබා දිය හැකිද කියලා.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
දැනට පිළිතුර ලබා දී තිබෙනවා. නමුත් ඔබතුමා කියනවා නම්, මේ ගැන මීට වඩා details ලබා ගෙන පෞද්ගලිකව හෝ ලබා දෙන්නම්.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය,- *[බාධා කිරීමක්]* මම ඉල්ලා සිටියේ එසේ ආදාහනය කළ මෘත දේහ අයත් අයගේ ජන වර්ගය අනුව අපට නම් වශයෙන් වෙනම ලබා දෙන්න කියලායි. *[බාධා කිරීමක්]* නම් වශයෙන් දෙන්න.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ඒ කියන්නේ ජන වාර්ගික වශයෙන්ද?

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
නැහැ, නැහැ. නම් වශයෙන් දුන්නත් ඇති.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
පුද්ගලයන්ගේ නම් වශයෙන්ද?

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ඔව්, එහෙම දුන්නාම ඇති. එහෙම දුන්නා නම් අපට ඒක තෝරා ගන්න පුළුවන්. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, වකුගඩු ආශ්‍රිත රෝගයක් හේතුවෙන් රිජ්වේ ආර්යා ළමා රෝහලට ඇතුළත් කළ අවුරුදු තුනක පමණ දරුවෙකුගේ වම් වකුගඩුව රෝගී තත්ත්වයක පැවැති බැවින් එය ඉවත් කිරීමට තීරණය කර තිබුණා. ඒ ශල්‍යකර්මය කරන වෙලාවේ නීරෝගීව තිබුණු අනෙක් වකුගඩුවත් ඉවත් කිරීම හේතුවෙන් ඒ දරුවා මිය ගියා. මේ සිද්ධිය පිළිබඳව විශාල ආන්දෝලනයක් පවතිනවා. ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වනවා කියලා අපට ආරංචියි. මොකද, පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසුව හෙළිදරව් වුණා, දෙපැත්තේ තිබිය යුතු kidneys එකට බද්ධ වෙලා horseshoe kidney එකක් විධියට තිබුණු බව. හදිසි මරණ පරීක්ෂණ වාර්තාව වාගේම අධිකරණ වෛද්‍ය නිලධාරිගේ වාර්තාවත් ඒ ආකාරයට ලබා දීලා තිබෙනවා. මේක කරුණු වසන් කිරීම සඳහා කරන දෙයක්. එවැනි අවයව ඉවත් කළාම මේ වාගේ ප්‍රශ්නයක් ඇතිවන නිසා අඩුම වශයෙන් ඒවා සුරක්ෂිතව තබා ගත යුතුයි. ඒ නිසා ඒවා විනාශ කරලාද, නැත්නම් තබාගෙන සිටිනවාද කියා සොයා බලන්න. ඒ දෙමව්පියන්ට එය විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඉතා දුප්පත් පවුලක දරුවෙකුට වුණු මේ විපතට අදාළ කරුණු සංවිධානාත්මකව වසන් කිරීමට උත්සාහයක් දරන බවට චෝදනාවක් තිබෙනවා. ඒ පිළිබඳව සොයා බලා ඔබතුමා පිළිතුරක් ලබා දෙනවාද?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
අනිවාර්යයෙන්ම. ඒ පිළිබඳව මේ වන විටත් විමර්ශනයක් කරනවා. හැබැයි, ළමා රෝහලේ අධ්‍යක්ෂතුමා ප්‍රකාශයක් කළා, එම වකුගඩුව තවම freezersවල තිබෙනවා කියලා. එතකොට පරස්පරයක් මතු වෙනවා, අධිකරණ වෛද්‍ය නිලධාරිගේ ප්‍රකාශ සහ මේ තත්ත්වය තුළ. අධිකරණය මේ ගැන ප්‍රශ්න කර තිබෙනවා. හැබැයි, සෞඛ්‍ය අමාත්‍යාංශය පැත්තෙන් මම මේ සම්බන්ධව තිබෙන සියලු වාර්තා ඔබතුමාට ඉදිරිපත් කරන්නම්.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමනි, ඇත්තටම ගරු රවුෆ් හකීම් මැතිතුමාට මේ කරුණ පොඩ්ඩක් වැරදුණා. අධ්‍යක්ෂතුමා තමයි කිව්වේ, එම දරුවාගේ වකුගඩු දෙක බද්ධ වෙලා තිබුණු බව. නමුත්, පශ්චාත් මරණ පරීක්ෂණය කළ JMOගේ කථාවේදී කියැවුණේ එම දරුවාට තිබුණේ එක වකුගඩුවයි කියන කාරණය. දෙවැනි ප්‍රශ්නය තමයි, මේ JMO කවුද කියන එක. ගිය අවුරුද්දේ -2022- දෙසැම්බර්වලදී ශ්‍රී ලංකා වෛද්‍ය සභාව ඔහුගේ ලියාපදිංචිය තහනම් කර තිබෙනවා. අපේ වැඩ කරන කොට, අපට තිබෙන ලොකුම ගැටලුව ආයතනයකින් අපේ රක්ෂාව නැති වෙන එක නොවෙයි, ලියාපදිංචිය නැතිවීමයි. ලියාපදිංචිය නැති වෙනවා කියන්නේ ඊට පසුව අපට ලෝකයේ කොහේටවත් ගිහිල්ලා වැඩ කරන්න බැරි වෙනවා කියන එකයි.

අපට "Doctor" කියන title එක දෙන්නේ ඒ සහතිකයත් එක්ක. එහෙම නැතිව අපට උපාධිය දුන්නා කියලා අපි දොස්තරලා වෙන්නේ නැහැ. ඔය දොස්තර කියන title එක ඒ වෙලාවට වෛද්‍ය සභාවෙන් දෙනවා. ඒ දෙන්නේ ලියා පදිංචියත් එක්ක. එතකොට ඒ ලියා පදිංචිය නැති වුණාම ඔහු වෛද්‍යවරයෙක් නොවෙයි. ඔහු වෛද්‍ය උපාධිධාරියෙක් වෙන්න පුළුවන්. නමුත් වෛද්‍යවරයෙක් නොවෙයි. පසුගිය දෙසැම්බර් මාසයේ ඉඳලා මේ අගෝස්තු මාසයේ 20වැනි දින වෙනකම් ඔහුගේ ලියා පදිංචිය තහනම් කරලා තිබෙනවා. එතකොට ඔහු වෛද්‍යවරයෙක් නොවෙයි. නමුත් ඔහු පශ්චාත් මරණ පරීක්ෂණ දෙකක් කරලා තිබෙනවා. එකක් තමයි දිනේෂ් ෂාෆ්ටර්ගේ පශ්චාත් මරණ පරීක්ෂණය. දෙවැනි එක තමයි මේ වකුගඩු රෝගී දරුවාගේ පශ්චාත් මරණ පරීක්ෂණය. මේ පිළිබඳව ඔහුගෙන් ඇහුවාම ඔහු කියනවා, "අමාත්‍යාංශයට දන්වලා, අමාත්‍යාංශයට appeal එකක් ඉදිරිපත් කරලා වැඩ කළා" කියලා. අමාත්‍යාංශයට ඒක කරන්න බැහැ. කවදාවත් වෛද්‍ය සභාවේ තීන්දුවක් අමාත්‍යාංශයට වෙනස් කරන්න බැහැ. මේ ගැන පරීක්ෂණයක් කරලා වහාම අපට වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා මම ඇමතිතුමාට කියනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා, ඉක්මන් කරන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ඉක්මන් කරනවා. ගරු කථානායකතුමනි, ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා මතු කළේ ඉතාම සංවේදී කාරණාවක්. මේ සිද්ධියෙන් පස්සේ ඒ වෛද්‍යවරයා වහාම රටින් පිටව යනවා. ඔහු ඕස්ට්‍රේලියාවේ පදිංචියට යනවා. එතකොට කෙනෙකුට එක එක දේවල් හිතෙන්න පුළුවන්. මේ දරුවාගේ වකුගඩුව කාට හෝ වික්කාද, මොකක්ද වුණේ කියලා හිතෙන්න පුළුවන්. මෙහෙම දෙයක් වුණාම ඒ වෛද්‍යවරයාට සදාචාරාත්මක යුතුකමක් තිබුණා, ඒ පශ්චාත් පරීක්ෂණය පවත්වන තෙක් ලංකාවේ රැඳී සිටින්න. දැන් වෛද්‍යවරු විශාල වශයෙන් රට යනවා. ඒක වෙනම කථාවක්. හැබැයි, මේ සිද්ධිය හේතුකොට ගෙන මේ වෛද්‍යවරයා එදාට පස්සේ එක පාරටම විදේශගතවීම හරිම අසාමාන්‍යයි. මේ සිද්ධියත් සාමාන්‍ය සිද්ධියක් නොවෙයි. ඒ නිසා අපි සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු රාජිත සේනාරත්න මන්ත්‍රීතුමා මතු කරපු කාරණයත් ඉතා බරපතළ කාරණයක්. දිනේෂ් ෂාෆ්ටර්ගෙයි, මේ දරුවාගෙයි පශ්චාත් මරණ පරීක්ෂණ විතරක් නොවෙයි, තව ගොඩක් පරීක්ෂණ ඔහු කරලා තිබෙනවා. ඒ සියල්ලටම ඔහු ලබා දීලා තිබෙන්නේ පිළිගන්න පුළුවන් වාර්තා නොවෙයි. ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග අපට පැහැදිලි කරන්න.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ගරු කථානායකතුමනි, මම මේ සභාවට වාර්තාවක් දෙන්නම්. නමුත් වෛද්‍ය සභාව තහනම දාලා තිබෙන්නේ වෛද්‍යවරයකු හැටියට කටයුතු කරනවාට නොවෙයි. මම ඒක බොහොම පැහැදිලිව දන්නවා. තහනම තිබෙන්නේ JMO කෙනෙකු හැටියට වැඩ කරන්නයි. එහෙම තමයි දැනට වාර්තාවල තිබෙන්නේ. ඒ කෙසේ වෙතත්, මම මේ ගැන මේ වෙලාවේ ඔබතුමාත් එක්ක වාදයකට පැටලෙන්න කැමති නැහැ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
මම කියනකම් පොඩ්ඩක් ඉන්න, ගරු මන්ත්‍රීතුමා. මේ වෙලාවේ මේ කාරණය අතුරු ප්‍රශ්නයක් විධියටයි නැඟෙන්නේ. මේ වෙනකොට ඒ කරුණු කාරණා ගැන කථා කරන්න අපි දැනුවත් නැහැ. ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට අදාළව දැන් අතුරු ප්‍රශ්න තුන හෝ හතර මේ අහන්නේ. මම මේ සම්බන්ධයෙන් සම්පූර්ණ තොරතුරු එක්ක වාර්තාවක් සපයන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)
ගරු කථානායකතුමනි, පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. වෛද්‍ය සභාවේ ලියා පදිංචිය නැති වෙනවා කියන්නේ, වෛද්‍යවරයෙක් වශයෙන් ලියා පදිංචිය නැති වෙනවා කියන එකයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක එතුමා දන්නවා.

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ වකුගඩු රෝගීන්: සුබසාධනය
அநுராதபுர மாவட்டத்திலுள்ள சிறுநீரக நோயாளர்கள்: நலன்புரி
KIDNEY PATIENTS IN ANURADHAPURA DISTRICT: WELFARE

869/2023

**2. ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා අනුරාධපුර දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වී ඇති වකුගඩු රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වකුගඩු රෝගීන් අතරින් මේ වනවිට වකුගඩු ආධාර දීමනාව ලබන රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (i) හි සඳහන් වකුගඩු රෝගීන්ගේ සුබසාධනය සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு முதல் இதுவரை அநுராதபுர மாவட்டத்தின் ஒவ்வொரு பிரதேச செயலகப் பிரிவிலும் பதிவாகியுள்ள சிறுநீரக நோயாளி களின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

(ii) மேற்படி சிறுநீரக நோயாளிகளில் இன்றளவில் சிறுநீரக நோயாளர்களுக்கான கொடுப்பனவைப் பெறும் நோயாளிகளின் எண்ணிக்கை யாது;

(iii) மேலே (i)இல் குறிப்பிடப்படும் சிறுநீரக நோயாளிகளின் நலன்புரிக்காக மேற்கொள்ளப் படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he inform this House -

(i) the number of kidney patients who have been reported in each Divisional Secretary's Division of the Anuradhapura District in each year from 2015 up to now, separately;

(ii) the number of such kidney patients who receive the kidney allowance at present; and

(iii) the measures that will be taken towards the welfare of the kidney patients referred to in (i) above?

(b) If not, why?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2015 -2022 දක්වා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22 තුළ වාර්තා වී ඇති වකුගඩු රෝගීන් සංඛ්‍යාව වර්ෂ අනුව පහත දැක්වේ.

| | |
|---|---|
| 2015 | 2,835 |
| 2016 | 3,287 |
| 2017 | 2,380 |
| 2018 | 1,613 |
| 2019 | 1,506 |
| 2020 | 889 |
| 2021 | 822 |
| 2022 | 1,083 |

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වශයෙන් ඇති තොරතුරු ඇමුණුම මඟින් දක්වා ඇත.

ඇමුණුම **සභාගත*** කරමි.

(ii) වකුගඩු රෝගීන්ට අදාළ දීමනා ලබා දීම සිදු කරන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශය නොව කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාතංශයට අයත් සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟිනි. ඒ නිසා සෞඛ්‍ය අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ නොවේ.

(iii) වකුගඩු රෝගීන්ගේ සුබසාධනය සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග:

- මේ වන විට අනුරාධපුර දිස්ත්‍රික්කයට රුධිර කාන්දුකරණ යන්ත්‍ර 52ක් ලබා දී ඇති අතර, ඒවා අනුරාධපුර, පදවිය, මැදවච්චිය, කැබිතිගොල්ලෑව සහ තඹුත්තේගම රෝහල්වල ස්ථාපිත කිරීම.
- 2017 වර්ෂයේ සිට අනුරාධපුර ශික්ෂණ රෝහලට රුධිර කාන්දුකරණයට අමතරව පරිතාන කාන්දුකරණය - peritoneal dialysis - සඳහා පහසුකම් ලබා දීම.
- රුධිර කාන්දුකරණ රෝගීන්ට ප්‍රවාහන පහසුකම් ලබා දෙමින් නවාතැන් පහසුකම් සැපයීමට සහ වකුගඩු රෝගය පිළිබඳව වෛද්‍ය නිලධාරින් සහ හෙද නිලධාරින් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස "මෙත්සිරි සෙවණ" ගොඩනැඟිල්ල ඉදිකිරීම.
- අනුරාධපුර දිස්ත්‍රික්කය පුරා ජනතාවගෙන් සියයට 95කට වැඩි ප්‍රමාණයක් ආවරණය වන පරිදි ප්‍රතිආශ්‍රැතිකරණ පානීය ජල පෙරන යන්ත්‍ර -osmosis drinking water filters - ලබා දීම.
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වකුගඩු රෝගීන්ට නිවාස ආධාර ලබා දීම.
- 2022 වර්ෂයේදී සාමාන්‍ය ජනතාව වකුගඩු රෝගීන් දැයි හඳුනා ගැනීම සඳහා සියලු පහසුකම් සහිත ජංගම රසායනාගාර බස් රථයක් දිස්ත්‍රික්කය වෙත ලබා දීම.
- රජය විසින් හඳුනාගත් වකුගඩු රෝගීන්ගේ පවුල්වල අධ්‍යාපනය ලබන දරුවන් සඳහා ශිෂ්‍යාධාර සහ අඩු ආදායම්ලාභී වකුගඩු රෝගීන් සඳහා මූල්‍යාධාර පහසුකම් සැපයීම.

(ආ) පැන නොනඟී.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු ඇමතිතුමනි, වකුගඩු රෝගීන් සම්බන්ධ ගැටලුවක් තමයි ඔබතුමාගෙන් අතුරු ප්‍රශ්නයක් විධියට අහන්න තිබෙන්නේ. ඔබතුමා දැන් කිව්වා, "මෙත්සිරි සෙවණ" වකුගඩු රෝගීන්ගේ පහසුව සඳහා ඉදිකරලා ලබා දුන්නා කියලා. හැබැයි, කොවිඩ් උවදුර තිබෙන වෙලාවේ එය හදිසි ප්‍රතිකාර ඒකකයක් විධියට පාවිච්චි කළා. දැන් ඒ කටයුතු අවසන් කරලා තිබෙනවා. එය නැවත ලබා ගැනීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ගවලට පවා ගිහිල්ලා තිබෙනවා. එය නැවත වකුගඩු රෝගීන්ගේ ප්‍රයෝජනය සඳහා ලබා දීම වෙනුවෙන් කටයුතු කරන්න බැරි වෙලා තිබෙනවා. එය පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයට අයිතිව තිබෙන්නේ. අනුරාධපුර රෝහල මධ්‍යම රජයට අයිතිව තිබෙන්නේ. මේ දෙක අතර සට්ටනයක් තිබෙනවා. ඒ තුළ "මෙත්සිරි සෙවණ" වකුගඩු රෝගීන්ගේ ප්‍රයෝජනය සඳහා නැවත ලබා දෙන්නේ කවදාද? ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කරන්න පුළුවන්ද?

ඒ වාගේම අනුරාධපුර රෝහලේ තිබෙන ප්‍රශ්නයක් නිසා මම ඔබතුමාගෙන් මේ කාරණයත් අහන්නම්. අනුරාධපුර රෝහලේ කසළ ප්‍රතිචක්‍රීකරණය වෙනුවෙන් පල්දෝරුවක් ඉදිකරලා තිබෙනවා. එහි වැඩ අවසන් කරලා දැනට මාස තුනකට වැඩි

---

* ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

කාලයක් වෙනවා. ඒ සඳහා අවශ්‍ය ගෑස් ලබා නොදීම නිසා දැන් ඒ ප්‍රතිචක්‍රීකරණ කටයුතු කෙරෙන්නේ නැතුව තිබෙනවා. අනුරාධපුර රෝහලේ තිබෙන මේ ගැටලු දෙක සම්බන්ධයෙන් ඔබතුමාට දෙන්න පුළුවන් උත්තරය මොකක්ද? ඒ පල්දෝරුව නැවත ක්‍රියාත්මක කරන්න ඔබතුමා කටයුතු කරනවාද කියන ප්‍රශ්නය තමයි මම අහන්නේ.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

ඔබතුමා අහන ප්‍රශ්නය මේකට අදාළව අහලා තිබුණේ නැති නිසා මට ඒ ගැන එකවර උත්තරයක් දෙන්න බැහැ. ඉදිරි කාලයේදී ඒ කරුණට අදාළව මම ඔබතුමාට පෞද්ගලිකව ඒ තොරතුරු ලබා දෙන්නම්. ඔබතුමා අහලා තිබෙන පල්දෝරුව ගැන ඒ ආකාරයෙන් කටයුතු කරන්න හැකියාවක් තිබෙනවා. Waste management පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. 2015, 2016, 2017 වර්ෂවල ගෙනාපු මැෂින්වල විශාල අර්බුදයක් තිබෙනවා. ඒවා සම්බන්ධ වාර්තාවකුත් මම මේ සභාවට ලබා දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3, ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය ඇහුවේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා අතුරු ප්‍රශ්න විධියට ප්‍රශ්න දෙකක් ඇහුවා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

අනෙක් ප්‍රශ්නයත් ඒ රෝහල සම්බන්ධ ප්‍රශ්නයක්.

ගරු ඇමතිතුමනි, බාල ඖෂධ ගෙන්වනවා කියන කාරණයත් එක්ක ඔබතුමාට විශ්වාස භංග යෝජනාවක් ගෙන එන තැනකට ඇවිල්ලා තිබෙනවා. එහෙම තත්ත්වයක් තිබෙද්දී ඔබතුමා මාධ්‍ය සාකච්ඡාවක් තියනවා. ඒකට මාධ්‍යවේදීන්ට එන්න එපා කියලා දැනුම් දීලා තිබෙනවා කියලා එහෙන් මෙහෙන් දැන ගන්න ලැබුණත් ඔබතුමා ඒ මාධ්‍ය සාකච්ඡාව කළා. අපට සෘජුව ප්‍රශ්න කරන්න තිබෙන්නේ ඔබතුමාගෙන්. අමාත්‍යාංශ ලේකම්තුමන්ලා අක්ෂි කාච විතරක් නොවෙයි, Propofol කියන බාල නිර්වින්දන ඖෂධ ගෙනැල්ලා ප්‍රශ්නයක් වුණාට පස්සේ ඒකට වෙනත් ඖෂධයක් ගෙනෙන්න හදිසි මිලදී ගැනීමේ කටයුතුවලට යනවා. එහෙම කරන්නේ ටෙන්ඩර් පටිපාටියට පිටින් ගිහිල්ලා. අක්ෂි කාච ගෙන්වීමටත් ඒ විධියට කටයුතු කරනවා. ඔබතුමන්ලාට මිලියන 100කට වැඩි මිලදී ගැනීම් සඳහා ටෙන්ඩර් පටිපාටියකින් බැහැරව යන්න බැහැ. එවැනි තත්ත්වයක් තිබෙද්දී ඒ ගණන කොටස්වලට කඩලා කැබිනට් අනුමැතියකින් තොරව මිලදී ගන්න හදනවා. මේ කාරණා ගැන අපි සෘජුව ප්‍රශ්න කරන්නේ ඔබතුමාගෙන්. ඔබතුමා ඒ සඳහා මැදිහත් වෙලා ඉන්නවාද? ඒකෙන් ඔබතුමාටත් කොමිස් මුදලක් එනවාද? මම ඔබතුමාගෙන් අහන්නේ ඒ තත්ත්වය නිවැරදි කරන්න කටයුතු කරනවාද, ඒ පිළිබඳව ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියන එකයි. එක පැත්තකින්, මිනිස්සු ජීවිතවලින් වන්දි ගෙවනවා. අනෙක් පැත්තෙන්, රජයට අලාභ හානියක් සිදු වෙනවා.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

ගරු කථානායකතුමනි, මම පළමුවෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, ටෙන්ඩර් ක්‍රමයෙන් බැහැරව එක බෙහෙතක් හෝ මේ රටට ගෙනැල්ලා තිබෙනවා කියලා මට එක අවස්ථාවක එක දෙයක් පෙන්නුවොත්, එතකොට මම ඔබතුමාගේ ඔය වැඩ පිළිවෙළ පිළිගන්නම්.

දෙවැනි කරුණ මෙයයි. ඔබතුමා කියන ඖෂධ ගෙන්වන එකේ ටෙන්ඩර් එක තවම අවසාන කරලා නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ කාරණයත් මතකයේ තියා ගන්න. ටෙන්ඩර් එකකට රජයේ ලේකම්වරුන් තුන්දෙනෙක් සහභාගි වෙනවා. එහි ඇමතිවරු කවුරුවත් නැහැ. Cabinet-appointed Tender Board එකක ඉන්නවා, ලේකම්වරු තුන්දෙනෙක්; මුදල් අමාත්‍යාංශයේ නියෝජිතවරයෙක්; ගණකාධිකාරිවරයෙක්. ඒ පස්දෙනාම ඒ ටෙන්ඩරයට අත්සන් කරන්න ඕනෑ.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

කොච්චර හිටියත් වැඩක් නැහැ නේ, දිගටම මේ විධියට අක්‍රමිකතා සිදු වෙනවා නම්.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

ඔබතුමා නේ එහෙම කියන්නේ. එහෙම වුණා කියලා කවුද කියන්නේ? ඔබතුමා තමයි කියන්නේ. වෙන කවුරුවත් කියන්නේ නැහැ. ඔබතුමන්ලා සංවිධානාත්මක ලෙස එහෙම කියනවා. අපි ඒකට උත්තර දෙන්න සූදානම්. ඒක තමයි මම අභියෝග කරලා කියන්නේ, ටෙන්ඩරයකට පිටින් එක දෙයක් කරලා තිබෙනවා නම් ඔබතුමා පෙන්වන්න, මේක ටෙන්ඩර් එකට පිටින් කරලා තිබෙනවා කියලා. ඒ නිසා බොරුවට කෑ ගහලා වැඩක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. මේක ඉවර වෙන ප්‍රශ්නයක් නොවෙයි.

ප්‍රශ්න අංක 3, ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා.

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)

ගරු කථානායකතුමනි, මට පොඩි කාරණයක් අහන්න තිබෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

ඔහොම කරන්න එපා, ගරු මන්ත්‍රීතුමා. දැන් වෙලාව බලන්න.

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)

මට පොඩි කාරණයක් අහන්න තිබෙනවා, ගරු ඇමතිතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාලය නාස්ති කරගන්න එපා, ගරු මන්ත්‍රීතුමා. දැන් වේලාව 11.45යි.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
එතුමාටත් අවස්ථාවක් දෙන්න. රාජිත සේනාරත්න මන්ත්‍රීතුමාටත් අවස්ථාව දුන්නා නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සෞඛ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා උත්තර දෙනවාද මේ ප්‍රශ්නවලට? *[බාධා කිරීමක්]* එහෙම නම් අහන්න, ගරු චන්න ජයසුමන මන්ත්‍රීතුමා.

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)
ගරු සෞඛ්‍ය අමාත්‍යතුමනි, වකුගඩු රෝගීන් සම්බන්ධයෙන් කථා කරපු නිසායි මම මේ ප්‍රශ්නය මතු කරන්නේ. ඔබතුමා ඉදිරිපත් කරපු සංඛ්‍යාලේඛන අනුව ජේනවා, අනුරාධපුර දිස්ත්‍රික්කයේත් ඒ අවට ප්‍රදේශවලත් වකුගඩු රෝගීන් සංඛ්‍යාව 2014 සිට ක්‍රමානුකූලව අඩු වී තිබෙන බව. ඒ සඳහා ප්‍රධානම හේතුව වුණේ ප්‍රති ආසූතිය ජල පෙරන යන්ත්‍රවලින් ඒ ජනතාවට ජලය ලබා දීමයි. ඒ ප්‍රති ආසූතිය ජල පෙරන යන්ත්‍ර නඩත්තු කරන්නේ නාවික හමුදාව විසින්. 500කට ආසන්න යන්ත්‍ර ප්‍රමාණයක් තිබෙනවා, උතුරු මැද පළාතේ. හැබැයි දැන් මාස දෙකක සිට ඒ හැම යන්ත්‍රයක්ම නඩත්තු කරපු නාවික හමුදා සෙබළුන් ඒවායින් ඉවත් කරගෙන යනවා. මම මේ කාරණය ආරක්ෂක ලේකම්තුමාගේ අවධානයට යොමු කළා. එතුමා ඒකට ප්‍රමාණවත් ප්‍රතිචාරයක් දැක්වූයේ නැහැ. මිලියන 1.5 කට ආසන්න ජනතාවක් මේ RO machinesවලින් ජලය ලබා ගන්නවා සෞඛ්‍ය අමාත්‍යතුමනි. ඒ යන්ත්‍ර නඩත්තු කිරීමේ කටයුත්ත දැන් සම්පූර්ණයෙන් අඩාළ වී ගෙනයි යන්නේ. එහෙම වුණොත් නැවත වකුගඩු රෝගීන් සංඛ්‍යාව වැඩිවෙන්න ඉඩ තිබෙනවා. ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඒ වාගේම ඒ ජලය නොමිලේයි ජනතාවට ලබා දුන්නේ. ඒ විදුලි බිල ගෙව්වේ, සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින්. හැබැයි, මීට මාස 2කට ඉස්සෙල්ලා මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛයක් මඟින් ඒ විදුලි බිල ගෙවීම නවත්වා තිබෙනවා. ඒ නිසා ඒ ජල පෙරන යන්ත්‍රවලට ලබා දුන් විදුලිය මේ වෙනකොට විසන්ධි කරගෙන යනවා. ඔබතුමා මේ සම්බන්ධයෙන් වහාම මැදිහත් වෙලා ඒ අසරණ ජනතාවට පානීය ජලය ලබා දෙන වැඩ පිළිවෙළට ප්‍රමුඛත්වය දෙන්න. එහෙම නොවුණොත් ලබන අවුරුද්දේ ඉඳලා නැවතත් වකුගඩු රෝගීන් සංඛ්‍යාව වැඩි වෙනවා. බොහොම ස්තුතියි.

## "ගැමි සැරිය" වැඩසටහන: පොළොන්නරුව දිස්ත්‍රික්කය
### “கெமி செரிய” நிகழ்ச்சித்திட்டம்: பொலன்னறுவை மாவட்டம்
### "GEMI SERIYA" PROGRAMME: POLONNARUWA DISTRICT

1306/2023

**3. ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) "ගැමි සැරිය" වැඩසටහන යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ධාවනය කරනු ලබන බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් බස් රථය ධාවනය කරනු ලබන ගමන් මාර්ගය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දුෂ්කර ගම්මානවල ජීවත්වන ජනතාවගේ ප්‍රවාහන පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) “கெமி செரிய” நிகழ்ச்சித்திட்டத்தின்கீழ் பொலன்னறுவை மாவட்டத்தில் சேவையில் ஈடுபடுத்தப் பட்டுள்ள பேருந்துகளின் எண்ணிக்கை யாதென் பதையும்;

(ii) அவ்வொவ்வொரு பேருந்தினதும் பயணப் பாதை தனித்தனியே யாதென்பதையும்;

(iii) பொலன்னறுவை மாவட்டத்தில் பின்தங்கிய கிராமங்களில் வாழும் மக்களின் போக்குவரத்து வசதிகளை மேம்படுத்துவதற்காக மேற்கொள்ளப் படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Highways:

(a) Will he inform this House -

(i) the total number of buses which are operated in the Polonnaruwa District under the "Gemi Seriya" programme;

(ii) separately, the names of routes along which each of those buses is operated; and

(iii) the measures that will be taken to improve transport facilities of the people living in remote villages of the Polonnaruwa District?

(b) If not, why?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) දැනට පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ "ගැමි සැරිය" වැඩසටහන යටතේ බස්රථ ධාවනය නොවන නමුත්, 2023 වර්ෂයේ දී නව සේවා ආරම්භ කිරීමට කටයුතු කෙරේ.

(ii) අදාළ නොවේ.

(iii) ජාතික ගමනාගමන කොමිෂන් සභාව මඟින් 2023 වර්ෂයේ "ගැමි සැරිය" ව්‍යාපෘතිය යටතේ නව සේවා ආරම්භ කිරීම සඳහා උතුරු මැද පළාත් මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරිය හරහා නව මාර්ග හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතින අතර, පොළොන්නරුව දිස්ත්‍රික්කය සඳහා නව "ගැමි සැරිය" සේවා 03ක් ලබා දීමට හැකියාව පවතී.

මේ වන විට ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ 46ක් මඟින් දිනකට ගමන් වාර 274ක් ක්‍රියාත්මක කරමින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දුෂ්කර ගම්මානවල ජීවත්වන ජනතාවට ප්‍රවාහන පහසුකම් සලසන අතර, ඉදිරියේදී ග්‍රාමීය සේවා සඳහා පොළොන්නරුව ඩිපෝව මඟින් බස් රථ 12ක් යොදවා ගනිමින් ගමන් මාර්ග 06ක් ඔස්සේ දිනකට ධාවන වාර 42ක් ක්‍රියාත්මක කරවීමට යෝජිතය.

(ආ) අදාළ නොවේ.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කප්‍රවත්ත කියලා ගම්මානයක් තිබෙනවා. ඒ ගම්මානයේ ඉඩමක වපසරිය මම හිතන්නේ, අක්කර 4ක් පමණ වෙනවා. ඒක, අක්කර හතරේ ඉඩම් තිබෙන ගම්මානයක්. ඒ ගම්මානයේ පාසල් දරුවන් ඉන්නවා, 100කට වැඩි සංඛ්‍යාවක්; විශාල ගමක්. ඒ ගමේ ඉන්න දරුවන්ගෙන් සමහර අය අධ්‍යාපන කටයුතු සඳහා දෙහිඅත්තකණ්ඩියට එනවා, දිඹුලාගලට එනවා, අරලගංවිලට එනවා. නමුත් පාර අබලන් වෙලා කියලා ඒ ගම ඇතුළෙන් බස් එකක් යන්නේ නැහැ. ඔබතුමාගේ සංකල්පයක් යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයටත් අලුත් බස් දුන්නා. ඒ වාගේම ඔබතුමා ඒ ගමටත් කඩිනමින් බස් රථයක් ලබා දෙයි කියලා මම විශ්වාස කරනවා.

ගරු ඇමතිතුමනි, හොරොව්පතානේ ඩිපෝවේ ඉන්න පිරිසකුයි, පෞද්ගලික බස් රථ කණ්ඩායමකුයි අතර ප්‍රශ්නයක් ඇති වුණා. ලංගම සේවයේ ප්‍රාදේශීය ඩිපෝ 7කට ඒ ප්‍රශ්නය බලපෑවා. ඒ තමයි, අනුරාධපුර, දඹුල්ල, කැබිතිගොල්ලෑව, හොරොව්පතාන, කැකිරාව, කන්තලේ හා පොළොන්නරුව යන ප්‍රාදේශීය ඩිපෝ. ජූලි මාසයේ 31වැනි දා තමයි ඒ ප්‍රශ්නය ඇති වුණේ. ඒ ප්‍රශ්නය ඇති වෙච්ච දවසේ විශාල පාඩුවක් සිදුවුණා. දරුවන්ට පාසල් යන්න බැරි වුණා. රජයේ සේවකයන්, පෞද්ගලික අංශයේ සේවකයන් යනාදී සෑම කෙනෙකුටම ලොකු ප්‍රශ්නයක් ඇති වුණා. මම හිතන විධියට කෝටි එකහමාරක විතරක් පාඩුවක් රජයට විඳින්න සිදුවුණා. බස් රථ 400ක් විතර ඒ දින දෙකේ ධාවනය වුණේ නැහැ.

ගරු ඇමතිතුමා, මේකට සම්බන්ධ අයට එරෙහිව නීතිමය කටයුත්තක් කෙරෙනවාද? නැත්නම් දිගින් දිගටම මේවා සිදු වේවි. එහෙම වුණොත් රජයට පාඩු වෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
ගරු මන්ත්‍රීතුමනි, පාඩු ලබන ආයතනයක් නිසා රටේ සියලු ප්‍රදේශවලට බස් රථ ලබා දෙන්න නොහැකි තත්ත්වයක් තිබියදී, ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ අලුත් බස් රථ 500ක් ලංකාව පුරාම සෑම ඩිපෝවකටම ඒකාකාරව බෙදා දීලා තිබෙනවා. ඊළඟට, කොන්දොස්තර, රියැදුරු හිඟය වැළැක්වීම සඳහා මේ දිනවල ඒ බඳවා ගැනීම් කරනවා. ඒ වාගේම දැනට අබලන්ව අයින් කරලා තිබෙන බස් රථ 400ක් අලුත්වැඩියා කරගෙන යනවා. එයින් 175ක් ධාවනයට යෙදෙව්වා. අනෙක් ටිකත් කඩිනමින් හදාගෙන යනවා.

ඊළඟට, විදුලි බස් රථ සඳහා අලුත් ව්‍යාපෘතියක් ආරම්භ කරන්න අපි EOI එකක් කැඳවා තිබෙනවා, නියමු ව්‍යාපෘතියක් ලෙස විදුලි බස් රථ ආනයනය කරන්නට.

ඔබතුමා සඳහන් කළ ඩිපෝ ටික හදා ගන්න අපට කෙටි කාලයක් අවශ්‍ය වෙනවා. ඉතා විශාල හොරකමක් බස් රථවල සිද්ධ වෙන නිසා දිනකට අවශ්‍ය සේවය සඳහා නැවත බස් රථ ගැනීම අසීරු වෙලා තිබෙනවා. ඇඹිලිපිටිය ඩිපෝව පමණක් ගත්තොත්, බස් රථය පිටත් වෙනකොට ටිකට් පත් 24යි. එයින් ලංගම ටිකට් පත් තිබෙන්නේ 7යි. අනික් 17ම හොර ටිකට් පත්. ඒ නිසා එක දිනක එක ගමන් වාරයක පාඩුව එතැන රුපියල් 18,000යි. කඩවත ඩිපෝව ගත්තාම, බස් රථයේ 51දෙනකු ඉන්නවා. ඒ 51දෙනාටම ටිකට් පත් නැහැ. එක ගමන් වාරයක පාඩුව රුපියල් 40,000යි. බස් රථවලින් ඩිපෝවකට ලැබිය යුතු ආදායම නොලැබීම නිසා මහජනයාගේ අවශ්‍යතා ඉෂ්ට කරන්න අලුත් බස් රථ යොදවන්න නොහැකි වීමේ ප්‍රායෝගික ගැටලුවක් තිබෙනවා. අපි මේ ගැටලු ටික විසඳා ගත යුතුයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මට දැනුම් දුන්නොත්, ඒ ගම්මානයට ඩිපෝව ඇතුළේ තිබෙන වෙන බස් රථයක් කළමනාකරණය කරලා ලබාදීම සඳහා කටයුතු කරනවා.

ඒ වාගේම හැමදාම තිබෙනවා පෞද්ගලික බස් රථ සහ ලංගම බස් රථ අතර ගහ ගැනීම්; චණ්ඩිකම්; පොලු මුගුරුවලින් පහර දෙන එක. එතකොට අසරණ වෙන සේවකයෝ ජීවිත ආරක්ෂාව සඳහා සියලු බස් රථ වර්ජනය කරනවා. හේතුව, පොලීසිය විසින් ක්ෂණිකව ඒ අය අත්අඩංගුවට නොගැනීමයි. ඒ නිසා අපි පොලීසියට කියලා තිබෙනවා ඒ අය අත් අඩංගුවට ගන්න කියලා. ඒ වාගේම මම ජාතික ගමනාගමන කොමිසමට කියලා තිබෙනවා, පෞද්ගලික බස් රථ රියැදුරෝ ලංගම බස් රථ රියැදුරන්ට එළව එළවා පහර දෙනවා නම්, ඒ අයගේ ගමන් බලපත්‍රය අහෝසි කිරීම සඳහා කටයුතු කරන්න නීත්‍යනුකූල ක්‍රියාමාර්ග ගන්න කියලා.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා අහනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු ඇමතිතුමනි, 2023 ජූනි 26 දින නිකුත් කරන ලද කැබිනට් තීරණය අනුව, ශ්‍රී ලංකාවේ තිබෙන සියලු අධිවේගී මාර්ග නමක්, ලිපිනයක් නැති Sahasya Investments Limited කියන ආයතනයකට පැවරුවා කියා අධිවේගී මාර්ගවල වැඩ කරන සියලු සේවකයන් බිය වෙලා තිබෙනවා, ඔවුන්ගේ රැකියා නැති වෙයි කියලා. ඒ වාගේම අධිවේගී මාර්ග නිසා තමයි මාර්ග සංවර්ධන අධිකාරියේත් -RDA එකේත් - ලොකුම ලාභය තිබෙන්නේ. ඒ අයත් මේ නිසා බය වෙලා තිබෙනවා. දැන් උද්ඝෝෂණයකට පවා ලෑස්ති වෙලා තිබෙනවා. රැකියා නැති වෙයි, රැකියාවෙන් අස් වෙන්න සිද්ධ වෙයි, "මොකක්ද අපේ ඉරණම private company එකකට මේක දුන්නාම?" කියා ඔවුන්ගේ බිය වීමක් තිබෙනවා. ඔබතුමා මේ කාරණය දන්නවා ඇති. ඒ කියන කාරණය සත්‍යයක්ද? එහෙම වෙලා තිබෙනවා නම්, ඒ අධිවේගී මාර්ගවල වැඩ කරන සේවකයන්ගේ සේවා සුරක්ෂිතතාවක් තිබෙනවාද?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මේ කාරණය මතු කළාට.

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

කොළ කැල්ලක් ගහගෙන වැඩකට ලෑස්ති වෙන බවට මට තොරතුරු ලැබිලා තිබෙනවා. නමුත් ඒ කියන කාරණය සත්‍යයක් නොවෙයි. සත්‍යය වශයෙන් කිව්වොත්, කිසි වෙලාවක අධිවේගී මාර්ගයක් විකුණන්නේ නැහැ. අධිවේගී මාර්ගයක් කිසිම පෞද්ගලික සමාගමකට පවරා දීලාත් නැහැ. කිසිම සේවකයෙක් ඉවත් කරන්නේත් නැහැ. ඒ අධිවේගී මාර්ග පද්ධතිය දියුණු කොට, සංවර්ධනය කොට ව්‍යාප්ත කිරීම සඳහාත්, නාස්තිය, අපතේ යෑම වැළැක්වීම සඳහාත් අලුත් කළමනාකරණ ක්‍රමයක් ක්‍රියාත්මක කරන්න කටයුතු යොදා තිබෙනවා. ඒ අනුව, අධිවේගී මාර්ග මහා භාණ්ඩාගාරය යටතේ රජය සතු සමාගමක් වන සහසා්‍ය සමාගමට- *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. සියයට සියයක් අයිතිය භාණ්ඩාගාරය සතු-*[බාධා කිරීමක්]* මම උත්තර දෙනතුරු ඉන්නකෝ. සියයට සියයක් අයිතිය භාණ්ඩාගාරය සතු සමාගමක් වන සහසා්‍ය කියන සමාගමට ගැසට් නිවේදනයකින් පවරා ගන්නවා.

එසේ පවරා ගැනීමේ බලාපොරොත්තුව මා කියන්නම්. අපේ රට ජාත්‍යන්තරයට විශාල ණයක් ගෙවන්න තිබෙන නිසා ලංකා ආණ්ඩුව සතු වත්කම් ප්‍රමාණය, ආණ්ඩුවට තිබෙන වත්කම්වල වටිනාකම වැඩි කරලා පෙන්වන්න අවශ්‍යයි. එම නිසා මේ මාර්ග ටික ලංකා ආණ්ඩුවේ වත්කම් ලෙස - වෙනම RDA එකේ වත්කම් ලෙස නොවෙයි - පෙන්වීම සඳහා තමයි ගැසට් පත්‍රයකින් අධිවේගී මාර්ග ලංකා ආණ්ඩුවේ ශේෂ පත්‍රයට අරගෙන තිබෙන්නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
RDA එකේ එක,-

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
ඉන්න, මම උත්තරය දීලා අවසන් වනකල්.

මෙම අධිවේගී මාර්ග පද්ධතිය කාර්යක්ෂමතාව වැඩි කරනවා. කැබිනට් පත්‍රිකාවේ සඳහන් පරිදි දැනට අධිවේගී මාර්ගයේ සේවය කරන නිලධාරින්, සේවකයන් සමාගම සමඟම පවරා ගන්නවා. ඒ මෙහෙයුම් කටයුතු, නඩත්තු කටයුතු, ඉදිකිරීම් කටයුතු කරන්නේ මාර්ග සංවර්ධන අධිකාරිය හරහා. දැනට සේවකයන් 1,923ක් ඉන්නවා. ඒ එක් කෙනෙකුගේවත් රැකියාව අහිමි කරන්නේ නැහැ. ඒක මේ රජයේ කළමනාකරණ ක්‍රියාවලියේ රට සතු වත්කම් වැඩි කිරීම සඳහා ගත්තු ඉතාම හොඳ ක්‍රියා මාර්ගයක්. ඒක අපෙන් අරගෙන ලංකා ආණ්ඩුවේ ශේෂ පත්‍රය යටතේ පෙන්වනවා. එවිට ලංකා ආණ්ඩුවේ ශේෂ පත්‍රයට තමයි අධිවේගී මාර්ග ටික අයිති වෙන්නේ. *[බාධා කිරීමක්]* බය වෙන්න එපා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
රැකියා ප්‍රශ්නය නොවෙයි, ගරු ඇමතිතුමනි. RDA එක වැඩි වශයෙන් නඩත්තු වුණේ මේ expresswaysවලින් ලැබෙන ආදායමෙන්. Expresswaysවල ආදායම රජයට ලැබෙන විට ඒ ආදායම භාණ්ඩාගාරයට සෘජුව යනවා මිස RDA එකට එන්නේ නැහැ. ඒ නිසා RDA එකේ සිටින සේවකයන්ද ප්‍රශ්නවලට පැටලෙනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
නැහැ, RDA එක යටතේ තිබෙන වැඩ කටයුතු- *[බාධා කිරීමක්]* දැන් පාරවල් මොකවත් හදන්නේ නැහැ නේ. ඒ නිසා මහ නැගුම යටතේ තිබුණු මහ නැගුම සමාගම, මහ නැගුම ඉමල්ෂන් සමාගම ආදිය - ඒ සමාගම් සියල්ල - ඇවර කරනවා. ඒවා ඇවර කරලා සේවකයන්ට වන්දි දීලා, දැනට 600දෙනෙක් ඉවත් කරලා තිබෙනවා. ඉතිරි ටිකදෙනාට කම්කරු දෙපාර්තමේන්තුවෙන් නියම කරන මුදල් දීලා අවසන් කරනවා. එහෙම කරන්නේ නැතිව ලංකා ආණ්ඩුවට පුළුවන්කමක් නැහැ, ඒ වැඩ නැති සේවකයන් නඩත්තු කරමින් ඉන්න. RDA එකට කිසිවක් වෙන්නේ නැහැ. එහි සිටින සේවකයන්ට, අධිවේගී මාර්ගයේ සේවය කරන අයට කිසිවක් වෙන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -1317/2023- (2), ගරු මොහමඩ් මුසම්මිල් මහතා.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගේ අවසරය මත පොඩි පැහැදිලි කරගැනීමක් කරගන්න අවශ්‍යයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා එයට අවස්ථාව දෙනවාද?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
එළියේදී අහන්න.

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා කැමැත්ත ප්‍රකාශ කළා පොඩි පැහැදිලි කරවා ගැනීමකට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද අමාත්‍යතුමා, කැමැත්ත ප්‍රකාශ කළා කියලා මේ කියන්නේ?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
නැහැ, නැහැ. මේ සභාවේදී නොවෙයි, එළියේදී අහන්න කියලායි ගරු ඇමතිතුමා කිව්වේ.

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
ගරු ඇමතිතුමනි,-

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
කියන්න, කියන්න ඉක්මනින්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමන්ලාත් තේරුම් ගන්න, මේ සභාවේ කාලය නාස්ති කරන්න අපට බැහැ කියලා. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ගිහින් ඇමතිතුමා මුණගැහිලා ඔය කාරණය කියන්න.

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
ඇමතිතුමා මුණගැහෙන්න යන්න පුළුවන්. හැබැයි, මෙතැනදී කියන්න දෙයක් තිබෙනවා නම්, මෙතැනදීම කියලා යන්න එපා යැ.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
ඉතින්, කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගාමිණී වලේබොඩ මන්ත්‍රීතුමා, කියන්න ඉක්මනින්.

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු ඇමතිතුමාට මම මීට කලිනුත් මේ ප්‍රශ්නය යොමු කළා. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ ගැන පොරොන්දුවකුත් වුණා. බලංගොඩ ඉඳලා කුරගල දක්වා දිවෙන පාරේ ඉදිකිරීම් සඳහා ගල් ගෙනිහින් බාලා, ඒ ඔක්කොම කරලා, හොඳට තිබුණු පාර දැන් කඩලායි තිබෙන්නේ. ඒ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු පිරිනමා තිබෙන සමාගම්වල අය එක්ක අපි කථා කළා. සම්පූර්ණයෙන් material එතැනට ගෙනිහින් තිබෙනවා, machinery ගෙනිහින් තිබෙනවා, ඒ ගොල්ලන්ගේ වැඩ කරන force එකත් ඉන්නවා. ඒ ගොල්ලන්ට ඒ වැඩේ කරන්න ඔබතුමාගේ නියෝගයක් විතරයි අවශ්‍ය. ගරු ඇමතිතුමනි, ඒ කොන්ත්‍රාත්තුව ගත්තු සමාගම ඒ කිලෝමීටර 30න් කිලෝමීටර 23ක, 24ක වැඩ සම්පූර්ණයෙන් අවසන් කරලා තිබෙන්නේ. තවත් කිලෝමීටර 4ක, 5ක ප්‍රමාණයක් විතරයි ඉතිරි වෙලා තිබෙන්නේ. පසුගිය මාසය ඇතුළත බස් හතරක් පෙරළුණා. තුන්හතරදෙනෙකුගේ අත පය කැඩිලා ගියා. මාසයකට කුරගලට වන්දනාවේ යන සංචාරකයන් රැගත් බස් හාරපන්සියයකට වඩා වැඩි ප්‍රමාණයක් ඒ පාරේ යනවා. ඉතින්, ඒ පාර විශාල ලෙස ජීවිත හානි සිදු වන ස්ථානයක් බවට පත් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා RDA එක හරහා ඒ කොන්ත්‍රාත්කරුවන්ට කියනවා නම්, ඒ කොන්ත්‍රාත් අරගෙන තිබෙන සමාගම් සූදානම් ඒ කටයුත්ත නිම කරන්න. ඒ නිසා මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා ඒ ගැටලුව විසඳා දෙන්න කියලා. දැන් එතැන දහපහළොස්දහසක් පමණ සෙනඟක් එකතු වෙලා උද්ඝෝෂණයක් කරන්න සූදානම් වෙලා ඉන්නවා. හැබැයි, මම කිව්වා මේ අවස්ථාව විතරක් දෙන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒවා අදාළ නැහැ මෙතැනට.

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
මේ ප්‍රශ්නයට ගරු ඇමතිතුමාගෙන් උත්තරයක් අවශ්‍යයි, ගරු කථානායකතුමනි. මොකද, එතුමා මීට කලින් දවසක ඇවිල්ලා බලලා පොරොන්දු වුණා ඒ ප්‍රශ්නයට විසඳුමක් දෙනවා කියලා. මෙක රටේ සාමාන්‍ය මිනිසුන්ගේ ජීවිත පිළිබඳ ප්‍රශ්නක් නිසා මම එය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, ගරු ඇමතිතුමනි.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
ගරු කථානායකතුමනි, මගේ නියෝගය අවශ්‍ය නම්, පාර හදන එක නතර වෙලා තිබෙන්නේ මගේ නියෝගය නැති නිසා නම් මම තවත් විනාඩි 15ක් ඇතුළත අදාළ නියෝගය දෙන්නම්. ඒක නිසා නොවෙයි පාර හදන එක නතර වෙන්නේ. හේතුව මොකක්ද කියා සොයා බලා ඒකට අවශ්‍ය සාධාරණ විසඳුමක් ලබා දෙන්න මම බලන්නම්.

## ලග්ගල නව නගරයේ ප්‍රාදේශීය රෝහල: විස්තර
### லக்கல புதிய நகர பிரதேச வைத்தியசாலை: விபரம்
### REGIONAL HOSPITAL, LAGGALA NEW TOWN: DETAILS

1323/2023

5. **ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ලග්ගල නව නගරයේ නව ප්‍රාදේශීය රෝහලක් ඉදිකර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම රෝහල ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම රෝහලේ ප්‍රසූතිකාගාරයක් හා වකුගඩු රෝගීන් සඳහා රුධිර කාන්දුකරණ ඒකකයක් නොමැති බව දන්නේද;

(iv) රෝහලේ මේ වනවිට පවතින අඩුපාඩු සම්පූර්ණ කර, එය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) லக்கல புதிய நகரத்தில் புதிய பிரதேச வைத்தியசாலையொன்று நிர்மாணிக்கப்பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி வைத்தியசாலையை நிர்மாணிப்பதற்குச் செலவிடப்பட்டுள்ள தொகை எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி வைத்தியசாலையில் பிரசவ அறை மற்றும் சிறுநீரக நோயாளர்களுக்கான குருதிச் சுத்திகரிப்புப் பிரிவு இல்லையென்பதை அறிவாரா என்பதையும்;

(iv) வைத்தியசாலையில் தற்போது காணப்படுகின்ற குறைபாடுகளைப் பூர்த்திசெய்து, அதனைத் தொடர்ந்தும் அபிவிருத்தி செய்வதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he inform this House -

(i) whether he is aware that a new regional hospital has been constructed in the Laggala New Town;

(ii) if so, the amount spent on the construction of aforesaid hospital;

(iii) whether he is aware that the aforesaid hospital does not have a dialysis unit for kidney patients and a labour room; and

(iv) the steps that will be taken by the Ministry to complete the existing deficiencies of the hospital and develop it further?

(b) If not, why?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

"A" කාණ්ඩයේ ප්‍රාදේශීය රෝහලක් ලග්ගල නව නගරයේ ඉදිකර ඇත.

(ii) මොරගහකන්ද ජලාශය ඉදිකිරීමට සමගාමීව රුපියල් මිලියන 550ක මුදලක් වැය කර මහවැලි අධිකාරිය මඟින් එය ඉදි කර ඇත.

(iii) මෙම රෝහලේ වායුසමනය කරන ලද ප්‍රසූතිකාගාරයක් ස්ථාපිත කර ඇත. වකුගඩු රෝගීන් සඳහා රුධිර කාන්දුකරණ ඒකකයක් මෙහි ස්ථාපිත කර නොමැති නමුත්, ලග්ගල ප්‍රාදේශීය රෝහලට ඉතා ආසන්නව පිහිටා ඇති විල්ගමුව රෝහලේ රුධිර කාන්දුකරණ ඒකකයක් මෙම වර්ෂයේ ඉදිකිරීම සඳහා ජනාධිපති අරමුදලින් රුපියල් මිලියන 25ක මුදලක් වෙන්කොට ඇත. එහි මූලික කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇත.

(iv) ලග්ගල ප්‍රාදේශීය රෝහල "A" කාණ්ඩයේ ප්‍රාදේශීය රෝහලක් - Divisional Hospital, Type A - ලෙස ක්‍රියාත්මක වන අතර, එම මට්ටමෙන් ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය සියලු වෛද්‍ය සහ වෛද්‍ය නොවන උපකරණ හා කාර්ය මණ්ඩල මෙම රෝහල සතුව දැනටමත් පවතී. රසායනාගාර සේවා, අධිසුරැකුම් ඒකකය - High-dependency Unit, විශේෂඥ වෛද්‍ය සේවා ඇතුළු රෝගී සත්කාරක සේවා ගණනාවක්ම මේ වන විටත් ක්‍රියාත්මකව පවතී. එම ප්‍රදේශයේ ජනතාවට ලබා දෙන සේවාව තවදුරටත් පුළුල් කිරීම සඳහා ලග්ගල රෝහල "B" කාණ්ඩයේ මූලික රෝහලක් - Base Hospital , Type B - බවට පත් කිරීමට අවශ්‍ය සලකා බැලීම් මේ වන විටත් සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් සිදු කරමින් පවතී.

(ආ) පැන නොනඟී.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු ඇමතිතුමනි, ඇත්තටම මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා විශේෂයෙන්ම ලග්ගල රෝහල "B" කාණ්ඩයේ රෝහලක මට්ටමට උසස් කිරීම සම්බන්ධයෙන්. කාලයක් තිස්සේ අපි එය බලාපොරොත්තු වුණා, ලග්ගල පිහිටීම සහ පවතින දුෂ්කරතාව මත විශාල ප්‍රශ්නයක් තිබෙන නිසා. ඇත්තටම කියනවා නම්, ඔබතුමා කිව්ව හෙට්ටිපොළ නගරයේ පිහිටි රෝහලේත් රුධිර කාන්දුකරණය පිළිබඳ ඒකකයේ වැඩ තවම ඉවර වෙලා නැහැ. ගරු කථානායකතුමනි, මාතලේ දිස්ත්‍රික්කයේ වැඩිම වකුගඩු රෝගීන් සංඛ්‍යාවක් ඉන්නේ විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ. ඒ නිසා එම ඒකකයට අදාළ වැඩ කටයුතු කඩිනමින් නිම කර දෙන ලෙස ඉල්ලමින් මම පළමුවන අතුරු ප්‍රශ්නය අහනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා රෝහලක් "B" කාණ්ඩයේ රෝහලක් බවට පත් වනකොට විශේෂඥ වෛද්‍යවරු හයදෙනෙකු අවශ්‍ය වන බව. ඒ විශේෂඥ වෛද්‍යවරු හයදෙනා අවශ්‍ය වන්නේ මේ විධියටයි. මා දන්නා තරමින්, කායික රෝග විශේෂඥ වෛද්‍යවරයෙක් සහ ළමා රෝග විශේෂඥ වෛද්‍යවරයෙක් පළමු පියවර හැටියට ලබා දෙනවා. දෙවෙනි පියවර හැටියට radiologist කෙනෙක්, නිර්වින්දන වෛද්‍යවරයෙක්, ශල්‍ය වෛද්‍යවරයෙක්, VOG කෙනෙක් ලබා දෙනවා. මේ පහසුකම් ටික දෙන්න නම් blood bank එකක් සහ radiology department එකක් අවශ්‍ය වෙනවා, scanning, X-rays ආදියට. ගරු ඇමතිතුමනි, ඔබතුමාට පුළුවන්ද, මේක ඉටු කරන්න පුළුවන් කාල වකවානුවක් - timeline එකක් - ගැන කියන්න?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

ගරු මන්ත්‍රීතුමියගේ ප්‍රශ්නය ඉතාම වැදගත් සහ කාලෝචිතයි. අපට තිබෙන ප්‍රශ්නය තමයි, මේ වන විට අපේ ප්‍රාග්ධන වියදම් ලබන අය වැය වනකල් සම්පූර්ණයෙන් වාගේ සීමා කර තිබීම. මේ වන විට ප්‍රාග්ධන වියදම් දරන්නේ ඉතාම සීමාසහිත විධියට. මේ අවස්ථාවේ පිට රට ආධාර ලැබෙන ව්‍යාපෘති පමණයි හුඟක් වෙලාවට ක්‍රියාත්මක වෙන්නේ. මම මුදල් අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරලා තිබෙනවා, අපට අවශ්‍ය ප්‍රාග්ධන මුදල් යම් ප්‍රමාණයක් ලබන අය වැයෙන් පසුව ලබා ගන්න. ඒ, ආරම්භ කරලා තිබෙන ව්‍යාපෘති අවසාන කරන්න සහ අනෙක් ඒවා upgrade කරන්න මිස අලුත් ඒවා පටන් ගන්න නොවෙයි. ඒ අවසරය ලැබුණු වහාම අපට ක්‍රියාත්මක වෙන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු ඇමතිතුමනි, ඒකෙන් අදහස් වෙන්නේ, ලග්ගල රෝහලට අදාළ එම කටයුත්තත් දැනට ආරම්භ කර තිබෙන ව්‍යාපෘති ගණයට අයත් වෙනවා කියන එකද? ඔබතුමා කියපු කාරණය ගැන පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. ඔබතුමා කියපු හැටියට, දැනට ආරම්භ කරලා තිබෙන ව්‍යාපෘතියක් ගණයට තමයි ලග්ගල රෝහලත් අයත් වෙන්නේ. ඒ කියන්නේ, මේ නොවැම්බර් මාසයේ ඉදිරිපත් කරන අය වැයෙන් එයට මුදල් වෙන් කරන්න බලාපොරොත්තු වෙනවා. එහෙම නේද?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

ඔව්.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි. එය අතුරු ප්‍රශ්නයකට වඩා යෝජනාවක් යැයි කිව්වොත් හොඳයි.

ඔබතුමා දන්නවා මීට ඉස්සෙල්ලා කථා කළ, වකුගඩු රෝගී දරුවා පිළිබඳ ප්‍රශ්නය ගැන, පේරාදෙණිය ශික්ෂණ රෝහලේ නිර්වින්දන එන්නතක් භාවිත කිරීමෙන් සිදු වුණු මරණය ගැන. ඒ වාගේ සිදුවීම් නිසා ජනතාව අතර යම් මතයක් ගොඩ නැඟිලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, රෝගියෙකු රෝහලකට ඇතුළත් කළාම මම මෙන්න මේ පෙන්වන විධියේ admission chit එකක් ලියනවා.

ඊට පස්සේ මගේ අතේ තිබෙන මෙන්න මේ වාගේ කොළ කිහිපයක් තමයි දවසින් දවස එකතු වෙන්නේ. ඒ කියන්නේ, ප්‍රතිකාර සටහනක් එනවා. ඊළඟට, second sheet එකක් හැටියට දිනපතා තත්ත්වය වාර්තා කරමින් සම්බන්ධ කරන මෙන්න මේ වාගේ කොළ කිහිපයක් එකතු වෙනවා. හැබැයි මෙතැනදී තිබෙන ගැටලුව මේකයි, ගරු ඇමතිතුමා. මේ පිළිබඳව ජනතාව අතර ප්‍රශ්නයක් තිබෙනවා. රෝගියා දවසින් දවස පරීක්ෂා කරලා, රෝගියාගේ තත්ත්වය පිළිබඳව දවසින් දවස වාර්තා කරලා පොඩි clip එකකින් මේකට අමුණනවා. රෝගියාට මරණය හෝ වෙනත් අනතුරක් සිද්ධ වුණොත් මේ කොළ ගලවලා අලුතින් කොළ ඇතුළු කරනවා කියලා ජනතාව අතර මතයක් තිබෙනවා. ඒ නිසා දවසින් දවස මේ විධියේ කොළ එකතු කරන්නේ නැතිව, එකම පොතක් විධියට හෝ එක sheet එකක් විධියට ඒකේ දිනය දාලා ලිවිය හැකි ආකාරයට සකස් කරනවා නම් හොඳයි කියලා මම ඔබතුමාට යෝජනා කරනවා. මොකද, එතකොට ජනතාව අතර මේ ගැන විශ්වාසයක් ඇති වෙනවා වාගේම, එහි විනිවිදභාවයකුත් තිබෙනවා. වැරැද්ද වෙලා තිබෙන්නේ වෛද්‍යවරයාගෙන් නම්, ඒ වැරැද්ද එතැන නිවැරදි විය යුතුයි. ඒක රෝගියාටම දරා ගන්න ඉඩ සලසන්න අවශ්‍ය නැහැ කියන එක තමයි මගේ යෝජනාව. ඔබතුමාට මේ වෙනුවෙන් යම් දෙයක් කරන්නට පුළුවන් ද කියලා මම අහනවා.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමියනි. ඔබතුමිය කියන කථාවේ යම්තාක් දුරට සත්‍යයක් තිබෙනවා. ඒ සම්බන්ධව කටයුතු කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ නිසා තමයි Medical (Amendment) Act එක වෙනස් කරන්න ගිය සතියට ඉස්සෙල්ලා සතියේ කටයුතු කළේ. මොකද, දැනට තිබෙන එකේ provision එකක් නැහැ. ඒ අනුව යම් යම් වෙනස්කම් කිරීමටත් තීන්දු කළේම ඔය වාගේම කරුණු නිසායි. දැන් තිබෙන නීති-රීති අනුව patient සහ doctor අතරේ තිබෙන සම්බන්ධතා හදිසි අවස්ථාවකවත් එළි දැක්වීමට හැකියාවක් නැහැ. ඒ නීති-රීතිත් එම නිසා වෙනස් කළ යුතුයි. එම නිසා ඒ සම්බන්ධයෙනුත් අපි කටයුතු කරනවා.

පේරාදෙණියේ වෙච්ච සිද්ධිය පිළිබඳවත් ඔබතුමිය සඳහන් කළා. එයට පිළිතුරක් දෙන්නත් මම මේක අවස්ථාවක් කර ගන්නවා. ඒ සම්බන්ධව පත් කරපු විද්වත් මණ්ඩලයක වාර්තාව දැන් ඇවිල්ලා තිබෙනවා. එම වාර්තාව මේ වෙනකොට public document එකක් කරලා තිබෙනවා. එම වාර්තාවේ ඊට අදාළ සම්පූර්ණ විස්තරත්, ඔය කියන බාල බෙහෙත් පාවිච්චිය පිළිබඳ සම්පූර්ණ විස්තරත් මේ වෙනකොට එළිදක්වලා තිබෙනවා. විශේෂයෙන්ම 7දෙනෙකුගෙන් යුතු කමිටුවක් තමයි ඒ සඳහා පත් කර තිබෙන්නේ. WHO එකේ authority එක එක්ක, WHO එකේ Representativeත් ඒකට අත්සන් කරලා තිබෙනවා. ඒක මට බාරදීලා තිබෙනවා. ඒක මම ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළව අදත් පාර්ලිමේන්තුවේ ප්‍රශ්න කිහිපයක් ඇහුවා. ඒ වාගේම මාධ්‍යවලත් මේ කරුණු පළ වෙනවා. මේ කරුණුවලට අදාළව විපක්ෂයෙන් පාර්ලිමේන්තුවට විශ්වාස භංග යෝජනාවකුත් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ විශ්වාස භංග යෝජනාව අද ගන්නවා ද, හෙට ගන්නවා ද කියලා අපි ඊයේ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ දී අසා සිටියා. ආණ්ඩුව මේ සඳහා සූදානම් කියන කාරණාව පැහැදිලි කරලා තිබෙනවා. විපක්ෂ නායකතුමාත් කිව්වා, ඒ ගැන කථා කරන්න එතුමාට දවස් 3ක් ඕනෑ කියලා. ජනාධිපතිතුමා කිව්වා, එහෙම නම් හෙට සිට බ්‍රහස්පතින්දා, සිකුරාදා, සෙනසුරාදා දින තුන ඒ වෙනුවෙන් ලබා ගන්න කියලා. එහෙම වෙනසක් කරනවා නම් පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව කැඳවන්න වෙනවා. දවස් 3ක් හෝ ඒ අවශ්‍ය දින ප්‍රමාණයක් තුළ ඒ ගැන විවාද කරන්න අපි සූදානම්. මොකද, මේ යෝජනාව විපක්ෂයෙන් ගෙනැල්ලා තිබෙන නිසා ඒක විවාදයට ගන්නේ කවදාද කියන කාරණයට විපක්ෂය එකඟ වෙන්න ඕනෑ. විපක්ෂය මේ යෝජනාව හෙට, අනිද්දා සහ සෙනසුරාදා ගන්නවා නම් ආණ්ඩුව ඒකටත් සූදානම්. එහෙම නැත්නම් ඔබතුමන්ලා දිනයක් දෙනවා නම් අපි ඒකටත් සූදානම්.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ඇත්ත වශයෙන්ම මේ සතියේ වැඩ නියම කෙරුවේ පසුගිය අවස්ථාවේ රැස්වූ පක්ෂ නායක රැස්වීමේ දීයි. ඒ පක්ෂ නායක රැස්වීමේ දී තමයි මේ සතියේ වැඩ නියම කරලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. පොඩ්ඩක් ඉන්නකෝ. හෙට වතු කම්කරු ජනතාවගේ ප්‍රශ්න ගැන කථා කරන්න අපි විවාදයක් ඉල්ලා තිබෙනවා. ඒක සති දෙකකට කලින් පක්ෂ නායක රැස්වීමේදී ගත්ත තීරණයක්. That was two weeks ago. මේ සතියට පාර්ලිමේන්තුවේ වැඩ නියම කරලායි තිබෙන්නේ. මේ සතියට නියමිත වැඩ කටයුතු වෙන් කරලා, කථිකයන් නම් කරලා ඔක්කෝම කරලායි තිබෙන්නේ. ඒක හදිසියේ වෙනස් කරන්න බැහැ නේ.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා කියන කාරණයට අපි එකඟයි. අපට ගැටලුවක් නැහැ. නමුත්, රටේ මෙච්චර ලොකු

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

ප්‍රශ්නයක් තිබෙන අවස්ථාවක, මේ ගැන විශේෂ අවධානයක් යොමු කරලා තිබෙන වෙලාවක මේ විවාදය කල් දමන්න ඕනෑ ද කියන එක ඔබතුමන්ලා තීන්දු කරන්න. ඒ පිළිබඳව අපට ගැටලුවක් නැහැ. හැබැයි, අපි මීට පෙරත් මෙවැනි හදිසි අවස්ථාවලදී පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව කැඳවලා දින වෙනස් කරන්න කථා කරගෙන තිබෙනවා. නිලධාරින්ටත් ඒ සඳහා සූදානම් වෙන්න ඕනෑ නිසායි මම මේ ගැන ඇහුවේ. ඒ නිසා හෙට-අනිද්දා වුණත් මේ යෝජනාව ගන්නවා නම් අපි සූදානම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම අපට දින 3ක විවාදයක් අවශ්‍යයි. හැබැයි, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ප්‍රකාශ කරපු ආකාරයට, පක්ෂ නායකයන් රැස්වෙලා මේ සතියේ පාර්ලිමේන්තුවේ කාලසටහන තීන්දු කරලා ඉවරයි.

එතකොට මේ සතියේ කාල සටහන අනුව හෙට තිබෙන්නේ උඩ රට වතු ක්ෂේත්‍රයේ ජනතාවගේ ආර්ථික, සමාජයීය, අධ්‍යාපනික, සෞඛ්‍යමය ප්‍රශ්න රැසක් සම්බන්ධයෙන් වන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව. හෙට, ඒක full day's debate එකක්. ඉතින් මට හිතා ගන්න පුළුවන්, රජයට වතු ජනතාව ගැන එච්චර තැකීමක් නැහැ කියන එක. වතු ජනතාවගේ ජීවිතය පිළිබඳව, ආර්ථික, සමාජයීය ප්‍රශ්න පිළිබඳව උත්තර දෙන්න අමාරු නිසා මේ අය හිතනවා ඇති, හෙට - අනිද්දා සහ ඉන් අනිද්දා දිනවලදී විශ්වාස භංග යෝජනාව විවාද කරන්න. ඉතින් මම මේ අවස්ථාවේ දී ඉල්ලීමක් කරනවා, කරුණාකරලා මේ රටේ වතු ප්‍රජාව එහෙම බාල්දු කරන්නට, ඒ වාගේ පහළ තත්ත්වයකට දමන්නට කටයුතු කරන්න එපා කියලා. සෞඛ්‍ය අමාත්‍යවරයාට විරුද්ධව ගෙනැවිත් තිබෙන විශ්වාස භංග යෝජනාව විවාද කරන්න අපි අනිවාර්යයෙන්ම දින තුනක් ලබා ගන්නවා.

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම දැන් ලොකු ප්‍රවණතාවක් තිබෙන බව අපට දැන ගන්න ලැබී තිබෙනවා. රජයට සම්බන්ධ මන්ත්‍රීවරු ක්‍රම ක්‍රමයෙන් මේ විශ්වාස භංග යෝජනාව පිළිබඳ විවාදයේ දී ඊට පක්ෂව ඡන්දය දෙන්න, එහෙම නැත්නම් ඡන්දය ලබා නොදී ඉන්න සූදානමක් තිබෙන බව අපට ආරංචියි. ඉතින් අපි ඒ අයත් එක්ක සාකච්ඡා කරගෙන යනවා. අපි නිසි වෙලාවට ඒක ගන්නම්. ඒ ගැන ඔබතුමන්ලා කලබල වෙන්න ඕනෑ නැහැ. අපි ඒ වැඩේ හරියට කරන්නම් .

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, වතු කම්කරු ප්‍රජාව ගැන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව හෙට පවත්වන්න අපි ස්ථිර කරලා තිබෙද්දීත් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ගැටලුවක් තිබෙනවා කියලා එතුමන්ලා ලොකුවට කථා කරපු නිසා තමයි හෙට හරි ඒ විවාදයට ගන්නවා නම් ආණ්ඩුව විධියට අපි ඒකට සූදානම් කියලා මම කිව්වේ. නමුත් දැන් පැහැදිලි වෙනවා, එතුමන්ලා තවම ඒකට සූදානමක් නැහැ කියලා. දැනුයි එතුමන්ලා සාකච්ඡා ආරම්භ කරන්නේ, ගරු කථානායකතුමනි. සාකච්ඡා කරන්න දැන් තේ පටන් ගන්නවා කියන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

තනිකර බොරුව!

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, අපි ඉතා හොඳ සූදානමකින් ඉන්නවා. පොඩ්ඩක් ඉස්සරහට යන්න යන්න සූදානම වැඩිත් වෙනවා. ඔය කැකෝ ගහන ඇත්තන්ටත් තීන්දුවක් ගන්න සිද්ධ වෙනවා, මේ රටේ ජනතාව මරණ මංචකයට යවන වැඩ පිළිවෙළත් එක්ක එකට හිට ගන්නවාද, එහෙම නැත්නම් මිනිස්සු ජීවත් කරවන තැන ඉන්නවාද කියලා. *[බාධා කිරීමක්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

ඉස්පිරිතාලය ළඟ මල් ශාලාවක්!

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, එතුමා මරණ මංචකය ගැන කියනවා. ඒවා 1988-1989 කාලයේත් තිබුණා. ඔබතුමන්ලා දන්නවා, ඉතිහාසය. ඒක අලුත් දෙයක් නොවෙයි. විශ්වාස භංග යෝජනාව ගෙනාවොත්, දවස් තුනක් හරි සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තිබෙන ගැටලු ගැන කථා කරන්න ඔබතුමන්ලාට අවස්ථාව තිබෙනවා. අදත් ප්‍රශ්න තුනක් අහලා තිබෙනවා. රටේ මෙච්චර අර්බුදයක් තිබෙනවාය කියලා ඔබතුමන්ලා මාධ්‍ය ඉදිරියේ ලොකුවට කථා කරන නිසායි අපි මේ යෝජනාව කරන්නේ. ඒක ඔබතුමන්ලාගේ අතේ තිබෙන දෙයක්. අපි එයට මැදිහත් වෙන්නේ නැහැ. අපි ආණ්ඩුව පැත්තෙන් යෝජනා කරන්නේ, ඒක ගැන කථා කරලා ඉවර කර ගන්න පුළුවන් කියන එකයි. එතකොට දවස් තුනක් සෞඛ්‍ය ක්ෂේත්‍රය ගැන කථා කරන්න පුළුවන්. ඒකයි අපි යෝජනා කරන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මම නැවත වරක් මේ ගැන කියන්න කැමැතියි. මේ රටේ වතු ප්‍රජාව මුහුණ දෙන ගැටලු පිළිබඳව සාකච්ඡා කරන්න හෙට මුළු දවසම වෙන් කරලායි තිබෙන්නේ. ඒ නිසා අපි අනිවාර්යයෙන්ම ඒකට ප්‍රමුඛතාව ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම විශ්වාස භංග යෝජනාව පිළිබඳව දින තුනක විවාදයක් අපි කරනවා. ඒකේ කිසි ගැටලුවක් නැහැ. ඒක කරන වෙලාව අපි තීන්දු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒක සැප්තැම්බර් මාසයේ ගන්න පුළුවන්.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

එහෙම නම් ඒ ගැන ඊළඟ සතියේ සාකච්ඡාවට ගන්න පුළුවන්, ඔබතුමන්ලා එකඟ නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, එතුමා එකඟයි. කලබල වෙන්න එපා. මීළඟට, ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහන්න.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

*අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தி னின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு அஜித் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE]took the Chair.*

## සමෘද්ධි සහනාධාරලාභීන්: අනුරාධපුර දිස්ත්‍රික්කය
சமுர்த்திப் பயனாளிகள்: அநுராதபுர மாவட்டம்
SAMURDHI RELIEF RECIPIENTS: ANURADHAPURA DISTRICT

1325/2023

**6. ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මේ වනවිට අනුරාධපුර දිස්ත්‍රික්කයේ සමෘද්ධි සහනාධාරලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට එම දිස්ත්‍රික්කයේ සවිබලගන්වන ලද සමෘද්ධි සහනාධාරලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iii) සමෘද්ධි සහනාධාරය ලබා ගැනීමේ අරමුණින් ඉල්ලුම් කර ඇති පවුල් විශාල සංඛ්‍යාවක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිටින බව දන්නේද;

(iv) එම පවුල් සඳහා සමෘද්ධි සහනාධාරය ලබා දීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுப்படுத்துகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அநுராதபுர மாவட்டத்திலுள்ள சமுர்த்திப் பயனாளிகளின் எண்ணிக்கை எத்தனை என்ப தையும்;

(ii) மேற்படி மாவட்டத்தில் இன்றளவில் வலுவூட்டப் பட்டுள்ள சமுர்த்திப் பயனாளிகளின் எண்ணிக் கை எத்தனை என்பதையும்;

(iii) சமுர்த்தி நிவாரணத்தைப் பெறும் நோக்கத்துடன் விண்ணப்பித்துள்ள பெரும் எண்ணிக்கையிலான குடும்பங்கள் அநுராதபுர மாவட்டத்தில் உள்ளன என்பதை அறிவாரா என்பதையும்;

(iv) மேற்படி குடும்பங்களுக்கு சமுர்த்தி நிவாரணத் தைப் பெற்றுக்கொடுப்பதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

(v) ஆமெனில், அத்திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Women, Child Affairs and Social Empowerment:

(a) Will he inform this House -

(i) the number of Samurdhi relief recipients within the Anuradhapura District at present;

(ii) the number of Samurdhi relief recipients who have been empowered by now of that District;

(iii) whether he is aware that there are a large number of families who have tendered applications expecting to obtain Samurdhi relief;

(iv) whether steps will be taken to grant Samurdhi relief to such families; and

(v) if so, on what date?

(b) If not, why?

**ගරු අනුප පස්කුවල් මහතා (සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுப பஸ்குவல் - சமூக வலுவூட்டுகை இராஜாங்க அமைச்சர்)
(The Hon. Anupa Pasqual - State Minister of Social Empowerment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2023 ජූනි මාසය වන විට අනුරාධපුර දිස්ත්‍රික්කයේ සමෘද්ධි සහනාධාරලාභී පවුල් සංඛ්‍යාව 64,803කි.

(ii) දැනට සවිබලගන්වන ලද පවුල් සංඛ්‍යාව 8,399කි. (2020.01.01 සිට 2023.07.17 දින දක්වා)

(iii) 2023 ජූනි මස වන විට සමෘද්ධි පොරොත්තු ලේඛනගත පවුල් 45,069ක් සිටි අතර වර්තමානයේ ක්‍රියාත්මක වන අස්වැසුම වැඩසටහනත් සමඟ තවදුරටත් සමෘද්ධි පොරොත්තු ලේඛන පවත්වාගෙන යෑමේ හැකියාවක් නොමැත.

(iv) සමෘද්ධි සහනාධාරලාභීන් ලෙස සිටි පවුල් සියල්ලම මෙන්ම, පොරොත්තු ලේඛනගත පවුල් ද අස්වැසුම ප්‍රතිලාභ සඳහා ඉල්ලුම් කර ඇත්නම් හා එම වැඩසටහන යටතේ ප්‍රතිලාභ සඳහා හිමිකම් ලබා ඇත්නම් එම දීමනාව හිමිවනු ඇත.

(v) අස්වැසුම ප්‍රතිලාභ වැඩසටහන 2023 ජූලි මස සිට ක්‍රියාත්මක වීමට නියමිතය. එහි සැලසුම සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය මඟින් විටින් විට දැනුම් දෙනවා.

(ආ) ඉහත පිළිතුර අනුව අදාළ නොවේ.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලා දැන් අස්වැසුම කියන අලුත් ව්‍යාපෘතිය ආරම්භ කර තිබෙනවා. ඒක හොඳ නැහැ කියන්නේ නැහැ, ඒක හොඳයි. හැබැයි ඊට වඩා බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. අස්වැසුම සහනාධාරය සඳහා පරණ සමෘද්ධිලාභීන් නැතුව අලුත් කණ්ඩායමක් තෝරලා තිබෙනවා. එහෙම තෝරා ගත්තාට ප්‍රශ්නයක් නැහැ. ඒ තෝරා ගත් අයට motor graders තිබෙනවා, backhoes තිබෙනවා, tippers තිබෙනවා. V8 වාගේ වාහන නැති අය විතරක් තෝරලා තිබෙනවා. ඒ නිසා ඒ තේරිල්ල නම් අන්තිම අසාධාරණ තේරීමක්.

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

පළමුවෙන්ම සමෘද්ධි සහනාධාරය ලබපු හුඟක් අයට දැන් ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා, අස්වැසුම සහනාධාරය නැහැ කියලා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, වහාම ඒ අය සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්න කියලා.

**ගරු අනුප පස්කුවල් මහතා**
(மாண்புமிகு அனுப பஸ்குவல்)
(The Hon. Anupa Pasqual)
ඔබතුමා කිව්වා, ඔබතුමා දැනුවත්ව අස්වැසුම සහනාධාරය නුසුදුසු අයට ලබා දී තිබෙනවා කියලා. ඒ, motor graders, JCB වැනි ඒවා තිබෙන අය. ඔබතුමාට පුළුවන්, ඒ අයගේ නාමලේඛනය මට බාර දෙන්න. පුරවැසියෙකු විධියට ඔබතුමාගේ වගකීමක්, යුතුකමක් තමයි, නුසුදුසු කෙනෙකුට නීතිවිරෝධී අයුරින් යම්කිසි ප්‍රතිලාභයක් ලබා දී තිබෙනවා නම්, ඒ ප්‍රතිලාභය ලබාගෙන තිබෙන අය කවුද කියලා නාමලේඛනයක් මඟින් මා දැනුවත් කරන එක. එතකොට ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්න පුළුවන්. කිය කියා ඉන්න අවශ්‍ය නැහැ. සඳුදා, අඟහරුවාදා දවසක මගේ අමාත්‍යාංශයට ඇවිල්ලා ඒ නාමලේඛනය ලබා දුන්නාම අපි ඒ සම්බන්ධයෙන් නිසි පියවර ගන්නවා.

ඊළඟට ඔබතුමා ඇහුවා, දැනට සමෘද්ධිලාභී පවුල්වලට අස්වැසුම ප්‍රතිලාභය ලබා නොදීම ගැන. මේ වැඩසටහන කරගෙන යන්න මෙතෙක් කල් නිශ්චිත ක්‍රමයක් තිබුණේ නැහැ. ඒක අපි හැමෝම පිළිගන්නවා. විරුද්ධ පක්ෂයේත්, ආණ්ඩු පක්ෂයේත් ඉල්ලීමක් තිබුණා, නිශ්චිත ක්‍රමයක් අනුව රටේම දුප්පත් අය එහෙමත් නැත්නම් ආර්ථික වශයෙන් අපහසුතා තිබෙන අය තෝරලා, ඔවුන් සවිබලගන්වා සමාජගත කරන්න කියලා. ඒ සඳහා තමයි මේ ක්‍රියාවලිය කරන්නේ. එතකොට සමෘද්ධිලාභී පවුල්වලට අනිවාර්යයෙන්ම අස්වැසුම සහනාධාරය ලැබෙන්න ඕනෑ කියලා දෙයක් නැහැ. සමෘද්ධිලාභී පවුල් සම්බන්ධයෙනුත් ඔබතුමන්ලාගේ පැත්තෙන්ම බරපතළ චෝදනාවක් ආවා, නුසුදුස්සන් සියයට 40කට එම සහනාධාරය ලැබිලා තිබෙනවා කියලා. අපි කියන්නේ නැහැ, මේ සහනාධාරය නොලැබිච්ච අය නුසුදුස්සෝ කියලා. සුදුසු නම් ඒ අයට නැවතත් අභියාචනා ඉදිරිපත් කරන්න පුළුවන්. සමහරු අභියාචනා ඉදිරිපත් කරලාත් ඇති. ඒ වාගේම, ඒක ක්‍රියාත්මක වන තෙක් සමෘද්ධිලාභී පවුල් ඔක්කෝටම මේ සහනාධාරය ලැබෙනවා. නමුත්, අනිවාර්යයෙන්ම ලැබෙන්න ඕනෑ කියලා අපට කියන්න බැහැ. නිශ්චිත ක්‍රමය තුළ සුදුසුකම් ලබා නැත්නම් ඒ අයට එම සහනාධාරය ලැබෙන්නේ නැහැ. සුදුසුකම් ලබා තිබෙනවා නම් ලැබෙනවා. ඒ අනුව අභියාචනා ඉදිරිපත් කිරීම තමයි ඒ අය කළ යුත්තේ. නොදැනුවත්කම නිසා මේ සඳහා අභියාචනා ඉදිරිපත් කරලා නැත්නම් ඉදිරියේදී නැවතත් දිනයක් දෙනවා, අභියාචනා ලබා දෙන්න.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඔබතුමාත් දන්නවා, ලංකාවේම සමෘද්ධි බැංකු 1,089ක් තිබෙන බව. ඒවායේ සේවකයෝ 6,744ක් වැඩ කරනවා. සමෘද්ධිලාභීන් සමෘද්ධි බැංකුවෙන් තමයි ණය ගත්තේ. සමෘද්ධි බැංකුවෙන් ණය ගත්ත අයට සමෘද්ධිය නැතිවීම නිසාත්, අස්වැසුම සහනාධාරයට ඇතුළු වෙච්ච නැති නිසාත් එම ණය ගෙවන්න බැරි ප්‍රශ්නයක් එනවා. මේ වාගේ ප්‍රශ්නයකුත් ඉදිරියට තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේවා අපේ රටේ දුප්පත් මිනිස්සුන්ගේ මුදල් නේ. අන්තිමට කියයි, බොල් ණය වශයෙන් කපා හරිමු කියලා. එහෙම කරන්නේ නැතුව සමෘද්ධි සහනාධාරලාභීන්ට සාධාරණ පියවරක් ගන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම BoC එකත්, People's Bank එකත් මඟින් තමයි අස්වැසුමේ මුදල් ලබා දෙන්න තීරණය කරලා තිබෙන්නේ. සමෘද්ධි බැංකුව හරහා නැවත වාරයක් මේ දේ කර ගත්තොත්, මේ බැංකුවත් ඉදිරියට පවත්වාගෙන යනවා, ඒ සේවකයෝත් සේවයේ යෙදෙනවා. එහෙම නැත්නම් අන්තිමට මේ බැංකුවත්, සේවකයෝත් නැති මට්ටමට එයි. ඇයි එහෙම කරන්නේ කියලා මම ඔබතුමාගෙන් අහනවා.

**ගරු අනුප පස්කුවල් මහතා**
(மாண்புமிகு அனுப பஸ்குவல்)
(The Hon. Anupa Pasqual)
ඒක හොඳ ප්‍රශ්නයක්, ගරු මන්ත්‍රීතුමනි. හැමෝම අහන ප්‍රශ්නයක් තමයි, සමෘද්ධි ප්‍රතිලාභීන් නැති වුණොත් සමෘද්ධි බැංකුව කඩා වැටෙනවාද කියන එක. සමෘද්ධි බැංකු පිහිටෙව්වේ මිනිස්සුන්ට මුදල් ගෙවමින් සඳහටම තියාගෙන ඉන්න නොවෙයි. ඒ වාගේම සමෘද්ධි බැංකු ක්‍රියාත්මක වුණේත් රජයේ මුදල්වලින් නොවෙයි. සමෘද්ධි බැංකුව මුලින් පටන් ගත්තේ ජනතාවගේ මුදල්වලින්. ජනතාවගේ ප්‍රතිපාදනවලින්, ඉතිරිකිරීම්වලින් තමයි මේ දැවැන්ත බැංකු පද්ධතිය ඇති වුණේ. එහි පළමුවැනිම ඉලක්කය බවට පත් වුණේ ගිනි පොලීකාරයන්ගෙන්- *[බාධා කිරීම්]* මට කථා කරන්න දෙන්නකෝ. අදාළ නැති ඒවාට කථා කරන්නේ නැතුව ඉන්නකෝ. අස්වැසුම තුළින් ජනතාව සවිබලගැන්වීමේ ක්‍රියාවලිය සඳහා ගරු ජනාධිපතිතුමා අපට අවශ්‍ය මුදල් ලබා දී තිබෙනවා. ඒ, අස්වැසුම ප්‍රතිලාභය යටතේ ප්‍රතිලාභ ලබාගන්න අය වසර තුනක් තුළ සවිබලගැන්වීමටයි.

ඒක අපේ ප්‍රධාන කාර්යභාරයක්. රටේ දුප්පත්කම නැති කිරීම මිසක් දුප්පත්කම සඳහටම පවත්වාගෙන යෑම නොවෙයි, සමෘද්ධි ව්‍යාපාරයේ ඉලක්කය බවට පත් වුණේ. දකුණු කොරියාව වාගේ අපි ආදර්ශයට ගත් කිසිම රටක් දුප්පත්කම පවත්වාගෙන ගියේ නැහැ. සමෘද්ධි ව්‍යාපාරය තුළින් අපි සියයට 28 සිට සියයට 6 දක්වා දුප්පත්කම අඩු කරලා තිබෙනවා. අපි දුප්පත්කම නැති කිරීමේ මෙහෙයුම තමයි දැන් ක්‍රියාත්මක කරන්න හදන්නේ. රුපියල් 4,500කින් ණය මුදලක් ගෙවන්න බැහැ. ණය මුදල ගෙවීම සඳහා මේ සමෘද්ධි ප්‍රතිලාභය විතරක් නොවෙයි පාවිච්චි කරන්නේ. සවිබලගැන්වීමේ ක්‍රියාවලිය තුළ සමෘද්ධි බැංකු මඟින් ලක්ෂ 11ක් සවිබලගන්වා තිබෙනවා. පොඩ්ඩක් නොවෙයි, ලක්ෂ 11ක්. අමාත්‍යාංශය මඟින්ම සවිබලගැන්වුවත් සම්බන්ධ තමයි මේ දත්ත දීලා තිබෙන්නේ. නමුත් බැංකු මඟින් සවිබලගැන්වූ සංඛ්‍යාව ලක්ෂ 11කට වඩා වැඩියි. ඒ නිසා බැංකුවකින් ණයක් ලබා ගත්තාම, අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමයෙන්, එහෙම නැත්නම් සමෘද්ධිය හරහා නොවෙයි ඒ ණය ගෙව්වේ. සවිබලගැන්වීමේ ක්‍රියාවලිය හරහා තමන්ගේ ව්‍යාපාරය තුළින්, එහෙම නැත්නම් නව ආදායම් මාර්ග තුළින් තමයි ඒ ණය ගෙව්වේ. ඒ නිසා ණය ගෙවීම පිළිබඳව කිසිදු ගැටලුවක් මතු වෙන්නේ නැහැ. මේ රුපියල් 2,500න්, රුපියල් 4,500න් ණය ගෙවලා කරපු ව්‍යාපෘති නොවෙයි අති බහුතරයක් තිබෙන්නේ. ඒ නිසා යම්කිසි කෙනෙකුට මේ අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමයට ලියාපදිංචි වෙන්න බැරි වුණු නිසා බැංකු ණය ගෙවා ගන්න බැහැ කියන කාරණාව පදනමක් සහිත ප්‍රකාශයක් නොවෙයි. කෙසේ වෙතත්, මම ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වන්නම්.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ එකඟතාව ලැබෙනවා නම් ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා යම් ප්‍රශ්නයක් අහන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු අනුප පස්කුවල් මහතා**
(மாண்புமிகு அனுப பஸ்குவல்)
(The Hon. Anupa Pasqual)
අහන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු දොලවත්ත මන්ත්‍රීතුමා, කෙටියෙන් ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම ඊයේත් මේ ප්‍රශ්නය ඇසුවා. නමුත්, ඔබතුමා රාජකාරි කටයුතු නිසා මෙතැනින් ගිහිල්ලා තිබුණා. මට කාරණාවක් පැහැදිලි කර ගන්න අවශ්‍යයි. අපි කවුරුත් දන්නවා, සමෘද්ධිය සහ අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් දිගටම අර්බුදයක් ඇති වෙලා තිබෙන බව. අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වෙන්න කිව්වාම සමෘද්ධිලාභීන් හිතුවා, ඒ අයට සමෘද්ධිය ලැබෙන නිසා අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය යටතේ නැවත ලියාපදිංචි වෙන්න අවශ්‍ය නැහැ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ඒකට අභියාචනා කරන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒ කියන්නේ, ඉල්ලුම් කළත් අවස්ථාව නොලැබුණු අයට අභියාචනා කරන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාට යෝජනාවක් කරන්න කැමැතියි, අතෘප්තියට පත් වෙච්ච අයට, ඒ කියන්නේ සමෘද්ධි ආධාර ලැබෙන අස්වැසුමට ඉල්ලුම් කරන්න බැරි වුණු අයට නැවත ඒ සඳහා ඉතා කඩිනමින් අවස්ථාවක් විවර කර දෙන්න කියලා. ඒ සඳහා සාධාරණ කාල පරිච්ඡේදයක් ලබා දෙනවා නම්, මේ සමාජය තුළ තිබෙන ව්‍යාකුලත්වය මඟ හරවාගන්නත්, මේ ප්‍රශ්නය ගොඩක් ව්‍යාකුල කරලා, වැඩි කරලා පෙන්වන අයටත් උත්තරයක් ලබා දෙන්න පුළුවන් කියලා මම හිතනවා. එම නිසා මම ඒ කාරණයට ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඒ පිළිබඳ ඔබතුමාගේ අදහසත් මම දැනගන්න කැමැතියි.

**ගරු අනුප පස්කුවල් මහතා**
(மாண்புமிகு அனுப பஸ்குவல்)
(The Hon. Anupa Pasqual)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම ඒක හොඳ ප්‍රශ්නයක්. නමුත්, අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමයට තෝරා ගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන් කරන්නේ මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු ශෙහාන් සේමසිංහ මැතිතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය මඟින්. මට ඒ ක්‍රියාවලිය පැහැදිලි කරන්න පුළුවන්. ඒ යෝජනා ක්‍රමයට නොදැනුවත්කම නිසා ඉල්ලුම් කරන්න අවස්ථාව නොලැබුණු අයට ජූලි මාසයේදී නැවතත් අවස්ථාව ලබා දෙනවා කියලා සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය මඟිනුත්, ඒ අදාළ අමාත්‍යාංශය මඟිනුත් තීරණය කරලා තිබුණා. ඒ අවස්ථාවත් ලැබිලා නැත්නම් අනිවාර්යයෙන්ම ලබන මාසයේදී හෝ ඒ සඳහා අවස්ථාව ලබා දෙන්න කියලා මම යෝජනා කරන්නම්. මොකද, ඒක ව්‍යුහයේ තිබෙන දෙයක්. ගරු මන්ත්‍රීතුමනි, එය ඉක්මන් කිරීමට අවශ්‍ය කටයුතු මම කරන්නම්.

**ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා**
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු කුමාරසිරි මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාරණයත් කෙටියෙන් ඉදිරිපත් කරන්න.

**ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා**
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, සමෘද්ධි වැඩසටහනින් ලක්ෂ 4කට ආසන්න ප්‍රමාණයක් ඉවත්වෙලා තිබෙනවා. ඒ වාගේම 120,000ක් පමණ අභියාචනා ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත්, තවම ඒ පිළිබඳව සමාලෝචනයක් කරලා නැහැ. ඒ කටයුතු සමාලෝචනය කරලා අවසාන කරන්නේ කවදාද කියලා ඔබතුමාට කියන්න පුළුවන්ද?

**ගරු අනුප පස්කුවල් මහතා**
(மாண்புமிகு அனுப பஸ்குவல்)
(The Hon. Anupa Pasqual)
දැන් සමාලෝචන ක්‍රියාවලිය සිද්ධ වෙනවා. අභියාචනා ක්‍රියාවලිය සිද්ධ වෙනවා. මෙතෙක් කල් එහෙම ක්‍රියාවලියක් තිබුණේ නැහැ නේ. සමෘද්ධි ව්‍යාපාරය තුළ අභියාචනා කැඳවීමේ කාලයක් තිබුණේ නැහැ. දැන් අභියාචනා ඉදිරිපත් කිරීමට කාලයක් තිබෙනවා, විරෝධතා ඉදිරිපත් කිරීමට කාලයක් තිබෙනවා. Applications ඉදිරිපත් කරන්න අවස්ථාව දීලා තිබෙනවා. ඒ ඉදිරිපත් කරන ලද applicationsවලට අනුව දැන් අභියාචනා පරීක්ෂා කරනවා. අවසන් කරන දිනය ප්‍රකාශයට පත් කරන්නේ, මුදල් අමාත්‍යාංශයේ සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය මඟින්. වැඩිදුරටත් තොරතුරු ලබා ගැනීමට ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමාට යොමු කරන්න ඕනෑ. නමුත්, දැන් ඒ ක්‍රියාවලිය සිද්ධ වෙනවා. ඒ ක්‍රියාවලිය ආරම්භ කරලා තිබෙන්නේ. දැන් අභියාචනා පරීක්ෂා කිරීමේ කටයුතු කරනවා. විරෝධතා පරීක්ෂා කිරීමේ කටයුතුත් කරනවා. අවසන් කරන දිනය අදාළ අමාත්‍යාංශයෙන් දැනුම් දෙයි. ඒ නිසා එම ක්‍රියාවලිය නිසි පරිදි කෙරුණ බව මට කියන්න පුළුවන්.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මට කිහිපදෙනෙක් ඒ පිළිබඳව කථා කළා. පළමුවැනි list එකේ ඒ අයගේ නම් තිබෙනවා. දෙවැනි list එකේ නම් නැහැ. එතකොට ඒ අය කොහොමද list එකට ඇතුළු වෙන්නේ? කරුණාකරලා ඔබතුමා ඒ ගැන පොඩ්ඩක් පැහැදිලි කරන්න. මොකද, අපේ මහනුවර දිස්ත්‍රික්කයේ කිහිපදෙනෙක් මගෙන් ඒ ගැන ඇහුවා. ඒකයි මම අහන්නේ.

**ගරු අනුප පස්කුවල් මහතා**
(மாண்புமிகு அனுப பஸ்குவல்)
(The Hon. Anupa Pasqual)
අදාළ අමාත්‍යාංශයෙන් ප්‍රශ්නයට උත්තර දෙනවා කිව්වා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ranjith Siyambalapitiya - State Minister of Finance )
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳව ඊයේ විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නයක් ඇහුවා. අද ඒකට පිළිතුරක් දෙන්න සියල්ල සූදානම් කරලා තිබෙන්නේ. මට අවස්ථාව ලැබුණාම පිළිතුර ලබා දෙනවා. එතකොට ඔබතුමාට දැන ගන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු කංචන විජේසේකර අමාත්‍යතුමා.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලට උත්තර දෙන්න ඇමතිවරුන්ට උදේ ඉඳලා සභාවේ ඉන්න කියලා තිබෙනවා. ඔබතුමා කියන්න, ප්‍රශ්නයක් ඇහුවාම අතුරු ප්‍රශ්න කීයක් අහන්න දෙනවාද කියලා. මේ 225දෙනාම නැඟිටියොත් අතුරු ප්‍රශ්න අහන්න, ඒකට ඉඩ දෙන්නේ නැහැ නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, ගරු ඇමතිතුමනි.

## බඩඉරිඟු නිෂ්පාදනය සහ ආනයනය: විස්තර
### சோள உற்பத்தி மற்றும் இறக்குமதி: விபரம்
### PRODUCTION AND IMPORT OF MAIZE: DETAILS

1714/2023

**7. ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ බඩඉරිඟු අවශ්‍යතාව හා නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලය තුළ බඩඉරිඟු ආනයනය කර තිබේ නම්, ආනයනය කරන ලද බඩඉරිඟු ප්‍රමාණය හා ඒ සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාව බඩඉරිඟුවලින් ස්වයංපෝෂිත කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் இதுவரை இலங்கைக்கான சோளத்தின் தேவை மற்றும் உற்பத்தியின் அளவு ஒவ்வோர் ஆண்டின் அடிப்படையில் தனித்தனியாக எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி காலப்பகுதியில் சோளம் இறக்குமதி செய்யப்பட்டிருப்பின், இறக்குமதி செய்யப்பட்ட சோளத்தின் அளவு மற்றும் அதற்காகச் செலவு செய்யப்பட்ட தொகை ஒவ்வொரு வருட அடிப்படையில் தனித்தனியாக எவ்வளவு என்பதையும்;

(iii) இலங்கையை சோள உற்பத்தியில் தன்னி றைவு அடையச்செய்வதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதை யும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he inform this House -

(i) separately, the requirement and the production of maize in Sri Lanka from year 2015 to date, according to each year;

(ii) if maize had been imported during the aforesaid period, separately, the imported quantity and the amount spent according to each year; and

(iii) the measures that will be taken to make Sri Lanka self-sufficient in maize?

(b) If not, why?

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law - State Minister of Agriculture)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

| වර්ෂය | නිෂ්පාදනය (මෙ. ටො.) | මිනිස් පරිභෝජනය සඳහා ජාතික අවශ්‍යතාව (මෙ. ටො.) | සත්ව ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන බඩඉරිඟු ප්‍රමාණය (මෙ. ටො.) | ශ්‍රී ලංකාවේ බඩඉරිඟු අවශ්‍යතාව (වසරකට/ මෙ. ටො.) |
|---|---|---|---|---|
| 2015 | 261,121 | 3,527 | 400,000 | 403,527 |
| 2016 | 243,960 | 3,567 | 450,000 | 453,567 |
| 2017 | 196,900 | 3,608 | 500,000 | 503,608 |
| 2018 | 270,041 | 3,646 | 600,000 | 603,646 |
| 2019 | 245,647 | 3,668 | 600,000 | 603,668 |
| 2020 | 313,521 | 3,688 | 550,000 | 553,688 |
| 2021 | 472,444 | 3,684 | 600,000 | 603,684 |
| 2022 | 259,040 | 3,770 | 500,000 | 503,770 |

- දැනට වාර්ෂික බඩඉරිඟු අවශ්‍යතාව (මිනිස් හා සත්ව පරිභෝජනය ඇතුළුව) මෙට්‍රික් ටොන් 600,000ක් පමණ වේ. බඩඉරිඟුවල සිදු වන වාර්ෂික මිල වෙනස්වීම මත, සහල් හා තිරිඟු ආදේශක ලෙස යොදා ගැනීම හේතුවෙන් වාර්ෂික බඩඉරිඟු අවශ්‍යතාවයේ උච්චාවචනයක් සිදු වේ.

- එසේම, කිරි කරල් පරිභෝජනය, ළදරු ආහාර නිෂ්පාදනය, රසකැවිලි නිෂ්පාදනය, ගව ආහාර සහ කුකුළු ආහාර නිෂ්පාදනය සඳහා බඩඉරිඟු ඉල්ලුම ඉහළ යාම නිසා එම අවශ්‍යතාව 2025දී මෙට්‍රික් ටොන් 650,000ක් පමණ වේ යැයි අපේක්ෂිතය.

- සත්ව ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන බඩඉරිඟු ප්‍රමාණය තීරණය කරනු ලබන්නේ නිපදවන සත්ව ආහාර ප්‍රමාණයෙන් සියයට 45ක් ලෙසිනි. සත්ව ආහාර නිෂ්පාදනයේදී උපරිමව සියයට 45ක සලාකයට එකතු කළ හැක.

(ii)

| වර්ෂය | බීජ හා *වෙනත් භාවිත සඳහා ආනයනික ප්‍රමාණය (මෙ. ටොන්) | බීජ හා *වෙනත් භාවිත සඳහා වටිනාකම (රු. මිලියන) |
|---|---|---|
| 2015 | 68,637 | 3,031 |
| 2016 | 43,058 | 2,175 |
| 2017 | 181,021 | 7,546 |
| 2018 | 120,569 | 5,937 |
| 2019 | 103,537 | 5,237 |
| 2020 | 29,820 | 2,638 |
| 2021 | 8,175 | 1,736 |
| 2022 | 178,652 | 23,473 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව *වෙනත් භාවිත-සත්ව ආහාර ඇතුළු වෙනත් පරිභෝජන

(iii)

- 2025දී බඩ ඉරිඟුවලින් ස්වයංපෝෂිත කිරීම සඳහා පහත පරිදි සැලසුම් කර ඇත.
  - වගා කිරීමට අපේක්ෂිත වපසරිය හෙක්ටෙයාර 130,000ක් දක්වා ඉහළ නැංවීම.
  - වගා ඵලදායීතාව ඉහළ නැංවීමට දැනට පවතින අස්වැන්න හෙක්ටෙයාරයට මෙට්‍රික් ටොන් 4.1 සිට 5 දක්වා වැඩි කිරීමට අපේක්ෂිතය. මේ සඳහා පහත වැඩසටහන් 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරේ.

01. සාම්ප්‍රදායික වගා ක්‍රමය වෙනුවට අධිසනත්ව වගා ක්‍රමය ප්‍රචලිත කිරීම.
02. පාංශු පරීක්ෂාව මගින් නිසි පරිදි කාබනික හා රසායනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම.
03. පාංශු සංරක්ෂණ ක්‍රම ගොවීන් අතර ප්‍රචලිත කිරීම හා පාංශු පෝෂක හායනය අවම කිරීම මගින් අස්වැන්න අඩුවීම වැළැක්වීම.
04. යල කන්නයේ කුඹුරු ඉඩම්වල බඩ ඉරිඟු වගා කිරීම සඳහා ගොවීන් යොමු කිරීම මගින් වගා වපසරිය ඉහළ නැංවීම.
05. Aflatoxin ආසාදනය අවම කිරීම සඳහා පෙර සහ පසු අස්වනු ශෂ්‍ය ක්‍රියා දියුණු කිරීම.
06. අස්වැන්න නෙළීම සඳහා සංයුක්ත අස්වනු නෙළන යන්ත්‍ර ගොවීන් අතර ප්‍රචලිත කිරීම.
07. වැඩි අස්වනු ගෙන දෙන නව දෙමුහුන් ප්‍රභේද හඳුන්වා දීම.
08. රෝග පලිබෝධ හානි වැළැක්වීම සඳහා විශේෂිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

උදාහරණයක් හැටියට සේනා දළඹු පාලනය සඳහා අපි විශේෂ වැඩ පිළිවෙළක් හඳුන්වා දී තිබෙනවා.

මූලාශ්‍රය: කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

(ආ) අදාළ නොවේ.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේ අන්තිමට නම් කිව්වේ හිත නිවෙන කථාවක්. 2025 දී බඩ ඉරිඟුවලින් ලංකාව ස්වයංපෝෂිත කිරීම සඳහා නිලධාරියෙකු විසින් ලියා දුන්නු හිත නිවන කථාවක් තමයි තමුන්නාන්සේ කියවා ගෙන ගියේ. නමුත් මගේ ප්‍රශ්නය ඒක නොවෙයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම බඩඉරිඟු ගැන උනන්දුවක් දැක්වූවේ මා නියෝජනය කරන පඩුවස්නුවර ආසනයේ විශාල පිරිසක් බිත්තර කර්මාන්තයේ නිරත වෙලා ඉන්න නිසායි. එතකොට බඩඉරිඟු නිෂ්පාදනය, බිත්තරයක වෙළෙඳ වටිනාකම වාගේම බිත්තර නිෂ්පාදනය එක්ක ඒකාබද්ධ වන කාරණයක්. බඩඉරිඟු හිඟය නිසා බිත්තරයක නිෂ්පාදන වියදම දවස ගණනේ වැඩි වෙනවා. දැන් තමුන්නාන්සේ කෘෂිකර්මයට සම්බන්ධ නිසා වැඩිදුර දැනගන්න ඕනෑ, විශාල ප්‍රශ්නයක් තිබෙන කාරණයක්, මේක. කුරුලු උණ වසංගතය තිබියදී ඉන්දියානු රුපියල් 3.80කට බිත්තරයක් දෙන්න නියම වෙලා තිබියදී වෙළෙඳ පොළත් එක්ක ගිවිසුමක් ගහගෙන, වෙළෙඳ ඇමතිවරයා බිත්තරයක් රුපියල් 13.80ට ගෙනාවා කියා ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒක තමුන්නාන්සේ වහාම පරීක්ෂා කරන්න ඕනෑ.

ඒ නිසා දැන් බඩඉරිඟු සඳහා සියයට 10ක්ව තිබුණු බද්ද සියයට 25ක් බවට පත් කරලා තිබෙනවා. මේ විධියට සියයට 25ක් බදු වැඩි කිරීම නිසා සාමාන්‍යයෙන් බිත්තරයක නිෂ්පාදන වියදම රුපියල් 8කින් විතර වාගේම, කුකුළු මස් කිලෝවක නිෂ්පාදන වියදම රුපියල් 210කින් විතර වැඩි වෙනවා, ගරු රාජ්‍ය ඇමතිතුමනි. තමුන්නාන්සේ ඒ පිළිබඳව තමුන්නාන්සේගේ කැබිනට් ඇමතිවරයා එක්කත් කථා කරලා මේ කාරණයට මැදිහත් විය යුතුයි. බඩඉරිඟුවලට සියයට 25ක බද්දක් ගහනකොට,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය ඇහුවා නම් හොඳයි. ඔබතුමා තවම කථාවක් කරනවා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

එහෙම තමයි. ප්‍රශ්නය තේරුම් කරලා අහන්න එපා යැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. බිත්තරයක මිල රුපියල් 7කින්, 8කින් වැඩි වෙද්දි, කුකුළු මස් කිලෝවක මිල රුපියල් 210කින් වැඩි වෙද්දි ඒ අස්සේ අපට ආරංචියක් ලැබී තිබෙනවා, ඉන්දියාවෙන් ආයෝජකයන් දෙදෙනකු ගෙන්වා ගෙන ඔවුන්ගේ සල්ලි ආයෝජනය කරලා, බිත්තර හා කුකුළු මස් අපේ රටේ නිෂ්පාදනය කරන්න යනවාය කියලා. ඒගොල්ලන් ඉන්දියාවෙන් අමුද්‍රව්‍ය ගෙනැල්ලා, ලාභයට ඒවා දෙන්න ගත්තාම අපේ රටේ බිත්තර නිෂ්පාදකයා වාගේම කුකුළු මස් නිෂ්පාදකයා නේද විනාශයට පත් වෙන්නේ? සම්පූර්ණයෙන් කෘෂි කර්මාන්තය අනාදැමූ කණ්ඩායමක් හැටියට -ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙන් පටන් ගෙන- මේ බිත්තර නිෂ්පාදකයා දිනෙන් දින, දිනෙන් දින මේ විධියට බිමට වට්ටන්නේ ඇයි කියන එක පිළිබඳව ඔබතුමාගේ අදහස මට කියන්න, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉන්දියාවෙන් ව්‍යාපාරිකයන් ගෙන්වන කථාව දැන් තමයි අපි දැන ගත්තේ. ඒ නිසා ඒ ගැන හොයා බැලීමක් කරලා ඔබතුමා දැනුවත් කරන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
බඩඉරිඟු ආනයන බද්ද සියයට 25කින් වැඩි කළාම බිත්තරයක් රුපියල් 8කින් වැඩි වෙන ප්‍රවණතාවක් තිබෙනවා; කුකුළු මස් කිලෝවක් රුපියල් 210කින් වැඩි වෙන ප්‍රවණතාවක් තිබෙනවා. ඒ ගැනයි මට ඔබතුමාගෙන් උත්තරයක් දැනගන්න ඕනෑ.

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law)
බද්ද වැඩි කරනකොට ඒවායේ මිල වැඩි වෙනවා. ඒක හරි. මොකක්ද ඔබතුමා මගෙන් බලාපොරොත්තු වන උත්තරය?

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඒ කාරණය ඔබතුමාට වැටහුණාද?

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law)
ඔබතුමා කියපු කාරණය මට වැටහුණා. ඔබතුමා කියන කාරණය හරි. *[බාධා කිරීමක්]* බද්ද වැඩි කරන කොට ඒවායේ මිල ගණන් වැඩි වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඔබතුමා මට කියනවා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න ලු. මම මෙච්චර තේරුම් කරලාත්,-

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law)
ඔබතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඔබතුමාගේ උත්තරය ඒකද?

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law)
ඔව්.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
එතකොට බිත්තර මිල වැඩි වුණාට කමක් නැද්ද?

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law)
පනවන බද්ද වැඩි කරන කොට ඒ ආශ්‍රිත නිෂ්පාදනවල මිල වැඩි වෙනවා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඉතින්, කෘෂිකර්ම රාජ්‍ය ඇමතිවරයා හැටියට ඔබතුමා ඒකට එකඟද?

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law)
මම ඒකට එකඟ නැහැ.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඒකට මොකක්ද කරන්නේ කියලායි මම ඇහුවේ.

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law)
ඒකට ඉතින් ඔබතුමා කියන විධියට බද්ද අඩු කරන්න ඕනෑ. ඒක මුදල් අමාත්‍යාංශය විසින් කරාවි.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඔබතුමා ඒකට සහයෝගය ලබා දෙනවාද කියලායි මම අහන්නේ.

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law)
ඔව්, අනිවාර්යයෙන් සහයෝගය ලබා දෙනවා. බද්ද අඩු කරන්න අපි හැමෝම එකඟයි. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, අහන්නන් වාලේ ප්‍රශ්න අහන්න එපා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අනේ! ගරු මන්ත්‍රීතුමා, දැනුත් විරෝධයක් ආවා වැඩිපුර අතුරු ප්‍රශ්න අහන්න දෙන්න එපා කියලා. ඒ නිසා අතුරු ප්‍රශ්න දෙකයි අහන්න පුළුවන්. ගරු තුෂාර ඉඳුනිල් මන්ත්‍රීතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
දෙවැනි අතුරු ප්‍රශ්නය තමයි මම අහන්නේ.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මට තව කාරණයක් අහන්න තිබෙනවා. මම ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් පැහැදිලි කර ගැනීමක් කළේ.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේ දකුණේ පුද්ගලයෙක්. දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව දැන් සති ගණනාවක ඉඳන් ගොවිතැනට වතුර ඉල්ලනවා. තමුන්නාන්සේලා සති තුනක් තිස්සේ කල් මරමින් සිටියා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ කාරණය ගැන ඊයේ ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නයකුත් ඇහුවා. ඊයේයි, අදයි මේ ප්‍රශ්නයට උත්තර දීලා තිබෙනවා. එම නිසා කෙටියෙන් අහන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඉතින්, ඔබතුමා නේ මේ කාලය විනාශ කරන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මම නොවෙයි. ඔබතුමා හැරෙනකොට මට තේරෙනවා කාලය කන්නයි හදන්නේ කියලා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
තමුන්නාන්සේ නේ මේ කාලය විනාශ කරන්නේ. මට අහන්න දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, ඉක්මනට අහන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
සති තුනක් තිස්සේ කල් මර මරා ඉඳලා ඊන්න දැන් වතුර දෙන්න පටන් ගත්තා. අන්තිමට ඒ දෙන වතුරවලින් ගොවීන්ට වැඩකුත් නැහැ. ඒ වතුර ටිකෙන් විදුලිය නිපදවෙන්නෙත් නැහැ. තමුන්නාන්සේට ඒකට උත්තරයක් තිබෙනවාද?

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law)
ඔබතුමාට වැඩක් නැති වුණාට ගොවීන්ට ඒ ජලය වැදගත්. ඔබතුමා ඔතැන ඉඳගෙන කථා කරනවා වාගේ නොවෙයි. ඔබතුමාට වැදගත් නැති වුණාට ගොවීන්ට ඒ වතුර ටික වැදගත්. *[බාධා කිරීමක්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අවස්ථාව දෙන්න විධියක් නැහැ, ගරු මන්ත්‍රීතුමා. දැනුත් ගරු ඇමතිතුමා විරෝධය පෑවා, අතුරු ප්‍රශ්න කීයද අහන්න පුළුවන්, කාලය කන්න එපා කියලා.

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව: ලාභය සහ අලාභය
## இலங்கைப் பெற்றோலியக் கூட்டுத்தாபனம்: இலாபம் மற்றும் நட்டம்
CEYLON PETROLEUM CORPORATION: PROFIT AND LOSS

2879/2023

**8. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලාභය/අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2023 වර්ෂය සඳහා එම සංස්ථාව ප්‍රසාද දීමනා ගෙවා ඇති බව දන්නේද;

(iii) ඒ සඳහා වැය කරන ලද මුදල එක් එක් සේවා බණ්ඩය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මහා භාණ්ඩාගාරයේ උපදෙස් නොතකා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පාලනාධිකාරිය විසින් ප්‍රසාද දීමනා ගෙවීම සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் இதுவரையிலான ஒவ்வொரு வருடத்திலும் இலங்கைப் பெற்றோலியக் கூட்டுத்தாபனத்தின் இலாபம்/நட்டம் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) 2023ஆம் ஆண்டுக்காக மேற்படி கூட்டுத்தாபனம் ஊக்குவிப்புக் கொடுப்பனவு செலுத்தியுள்ளது என்பதனை அறிவாரா என்பதையும்;

(iii) அதற்காகச் செலவுசெய்யப்பட்ட பணத்தொகை ஒவ்வொரு சேவைத் தொகுதியின் அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) பொதுத் திறைசேரியின் ஆலோசனைகளைக் கருத்திற்கொள்ளாது இலங்கைப் பெற்றோலியக் கூட்டுத்தாபனத்தின் நிருவாகத்தினரால் ஊக்குவிப்புக் கொடுப்பனவு செலுத்தப்பட்டுள்ளமை தொடர்பில் எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will he inform this House -

(i) separately, the profit/loss of Ceylon Petroleum Corporation in each year from 2015 to date;

(ii) whether he is aware that the aforesaid Corporation has paid bonus for the year 2023;

(iii) the amount of money that has been spent on paying bonus, separately in terms of each service category; and

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

(iv) the action that will be taken against the administration of Ceylon Petroleum Corporation regarding payment of bonus, disregarding the instructions issued by the Treasury?

(b) If not, why?

**ගරු කංචන විජේසේකර මහතා**
**(மாண்புமிகு கஞ்சன விஜேசேகர)**
(The Hon. Kanchana Wijesekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| වර්ෂය | වර්ෂය තුළ ලාභ/අලාභ රුපියල් මිලියන |
|---|---|
| 2015 | (20,520.164) |
| 2016 | 53,027.081 |
| 2017 | 1,055.634 |
| 2018 | (106,162.414) |
| 2019 | (11,856.600) |
| 2020 | 2,356.377 |
| 2021 | (81,816.434) |
| 2022 | (615,053.142) |

2023 ජූලි මාසය දක්වා ලාභය රුපියල් මිලියන 69,000යි.

(ii) 2023 සඳහා සංස්ථාව ප්‍රසාද දීමනා ගෙවා නැත.

සේවකයන්ගෙන් සියයට 4.2ක පොලියක්ද සමඟ වාරික 10කින් අයකර ගැනීමේ පදනම මත අලුත් අවුරුද්ද සඳහා උත්සව අත්තිකාරම් මුදලක් ලබාදී ඇත.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
**(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)**
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ කාරණය ගැන දන්නවා ඇති කියලා මම හිතනවා.

CPC සහ CPSTL ගරු සභාපතිතුමා විසින් SAP පරිගණක පද්ධතියේ දත්ත සහ backup පද්ධතියේ දත්ත පදනම්ව, එකම ඉන්වොයිස් අංකයක් පදනම්ව ඉන්වොයිස් පත් එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් මුද්‍රණය කර, ඒ තුළින් ඉන්ධන අවභාවිතයක් සිදු කර තිබේද යන්න පරීක්ෂා කර බලා විමර්ශනයක් ලබා දෙන ලෙසත්, එ් වාගේම එය තවදුරටත් ගැටලු සහගත වේ නම් ස්වාධීන බාහිර පාර්ශ්වයක් ලවා SAP පරිගණක පද්ධතියේ ක්‍රියාකාරකම්, order to cash, purchase to pay and finance පිළිබඳව තොරතුරු තාක්ෂණික පරිගණක විගණනයක් හෝ වෝහාරික විගණනයක් කිරීමට අවශ්‍යද යන්න වාර්තා කරන ලෙසත් මීට පෙර උපදෙස් ලබා දීලා තිබෙනවා.

ඒකට හේතුව තමයි, තොග, විශේෂයෙන් the total number of load returns විධියට 619ක් ඉතාම කෙටි කාලයක් -මාස 6ක් වාගේ කාලයක්- තුළ වාර්තා වෙලා තිබීම. සාමාන්‍යයෙන් මේ තොග අවලංගු කිරීම් ගත්තොත්, ප්‍රතිශතයක් විධියට දශම එකයි හතක්. මේක අවභාවිතයක්ද, හොරකමක්ද නැත්නම් තාක්ෂණික ප්‍රශ්නයක්ද කියන එක සොයා බලන්න, SAP system එක unlock කරන්න සභාපතිවරයා e-mail එකක් එවලා තිබෙනවා. CID එක මේ සම්බන්ධව පරීක්ෂණයක් පවත්වා තිබෙනවා. ඔබතුමා මේ සම්බන්ධව ඉදිරියේදී ගන්නා ක්‍රියා මාර්ග මොනවාද? ඒ වාගේම මේ පරීක්ෂණවලට අදාළ පුද්ගලයෙක් වන CPC එකේ හිටපු GM කෙනෙකු - ගරුසිංහ මහත්මයා - රට හැර ගොස් තිබෙනවා. මේ සම්බන්ධව ඔබතුමාට ගරු සභාවට දෙන්න පුළුවන් පිළිතුර මොකක්ද?

**ගරු කංචන විජේසේකර මහතා**
**(மாண்புமிகு கஞ்சன விஜேசேகர)**
(The Hon. Kanchana Wijesekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා ඇහුවේ අමාත්‍යවරයා හැටියට මම මේ සම්බන්ධයෙන් ගන්නා පියවර මොකක්ද කියන එකයි. අමාත්‍යවරයා හැටියට මම තමයි පසුගිය අවුරුද්දේ පැමිණිල්ල ඉදිරිපත් කළේ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඒ පැමිණිල්ල ඉදිරිපත් කළේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන අළෙවි කිරීම, ඉන්ධන බෙදා හැරීම සම්බන්ධ යම් තොරතුරු ප්‍රමාණයක් අපට වාර්තා කර තිබුණු නිසායි. මාධ්‍යයෙනුත් යම් අක්‍රමිකතා පිළිබඳව වාර්තා කර තිබුණා. ඒ නිසා එක පැත්තකින් රජය අපහසුතාවට පත් කිරීමට ගත්ත පියවරත්, ඒ වාගේම වංචා සහගතව යම් ආකාරයෙන් අයුතු ලාභ උපයා ගැනීම් කරන කණ්ඩායමක් පිළිබඳව ලැබුණු තොරතුරු අනුව තමයි අපි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට තොරතුරු ලබා දුන්නේ. ඒ අනුව ඔවුන් පරීක්ෂණයක් කරලා අපෙන් ඉල්ලීමක් කළා, වෝහාරික පරීක්ෂණයක් සහ අනෙකුත් තාක්ෂණික පරීක්ෂණ කරන්න කියලා. මේ වන විට ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සම්පූර්ණ වෝහාරික විගණනයක් කිරීම සඳහා දැන්වීම් කැඳවලා, ඒ සඳහා ප්‍රසිද්ධ සමාගම් කිහිපයක් ඉදිරිපත් වෙලා ඉන්නවා. මේ දවස්වල ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඒ සමාගම් පිළිබඳව අවසාන තීන්දුව ගනිමින් ඉන්නවා. ඒ අතරතුර මාධ්‍යයෙන් වාර්තා කර තිබෙනවා, හිටපු අතිරේක සාමාන්‍යාධිකාරීවරයෙකු -ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියූ විධියට සාමාන්‍යාධිකාරීවරයෙකු නොවෙයි- රටින් පිට වෙලා ගිහිල්ලා තිබෙනවා කියලා. නමුත්, අපට දැනගන්න තිබෙන විධියට දැනට ඒ පුද්ගලයන් සම්බන්ධයෙන් කිසිම පරීක්ෂණ කටයුත්තක් වෙන් වෙන් වශයෙන් ආරම්භ වෙලා නැහැ. අවසාන පරීක්ෂණ තොරතුරු අපට ලැබෙන්න ඕනෑ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන්. ඒ වාගේම සැකකරුවෙකු හැටියට කවුරුවත් නම් කරලාත් නැහැ. ඔබතුමා කියපු පුද්ගලයා රටින් පිට වෙලා ගියා කියලා නොවෙයි අපට වාර්තා වෙන්නේ. ඔහු සේවයෙන් ඉවත් වන බවට -විශ්‍රාම යන බවට- ලිපියකින් දැනුම් දීලා තිබෙනවා කියන එක තමයි මට පාලන අධිකාරිය විසින් දන්වා තිබෙන්නේ. නමුත්, මේ සම්බන්ධයෙන් තවමත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟිනුත්, වෝහාරික මට්ටමෙනුත් පරීක්ෂණ පැවැත්වෙනවා, මේ පුද්ගලයෝ කවුද කියලා හඳුනා ගැනීම සඳහා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
**(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)**
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු ඇමතිතුමනි, රුපියල් කෝටි 114කට ආසන්න මුදලක ප්‍රශ්නයක් මෙතැන තිබෙන්නේ. මම කියන්නේ නැහැ, ඒක වංචාවක්ද, අලාභයක්ද, එහෙම නැත්නම් තාක්ෂණික ප්‍රශ්නයක් නිසා සිදු වූවක්ද කියලා. කඩිනමින් ඒ සම්බන්ධ පරීක්ෂණ අවසන් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම මේ දවස්වල සමනලවැව ජලාශයෙන් ජලය මුදා හැරීම ගැන, සමනලවැව බලාගාරයේ විදුලිය නිෂ්පාදනය ගැන අපි කථා කළා. දැන් ඔබතුමන්ලා කැබිනට් තීන්දුවක් ගත්තා, සමනල වැවේ ජලය උඩවලව හරහා වලව නිම්නයේ තිබෙන ගොවි ජනපදවලට ලබා දෙනවා කියලා. විදුලිබල ඇමතිවරයා විධියට ඔබතුමාගෙන් මේ ගත්ත තීන්දුව ගැන අපි දැන ගන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා ජලය ලබාදීමේදී පළමු ප්‍රමුඛතාව ලබා දෙන්නේ පානීය ජලය වෙනුවෙන් බව. අපි මුලින්ම පානීය ජලය සඳහා වතුර දෙන්න ඕනෑ. මිනිස්සුන්ට බොන්න වතුර දෙන්න ඕනෑ. දෙවනුව ප්‍රමුඛතාව දෙන්න ඕනෑ කෘෂිකර්මාන්තයට ජලය ලබා දීමටයි. පානීය ජලයට දුන්නාට පස්සේ අපි කෘෂිකර්මාන්තයට ජලය දෙන්න ඕනෑ. විදුලි බලයට ජලය ලබා දීම තෙවන ප්‍රමුඛතාව විධියටයි අපි දකින්නේ. එතකොට ඔබතුමන්ලා මේ ප්‍රමුඛතාව කඩ කරමින් තමයි, පසුගිය දවස්වල සමනල වැවේ ජලය මුදා හරියේ නැත්තේ. වලව නිම්නයේ තිබෙන ගොවි ගම්මාන බහුතරයකට යම් වතුර ප්‍රමාණයක් දැන් මුදා හැරියත් බේරා ගන්න බැරි ගොවි ජනපද, ගොවි බිම් තිබෙනවා. ඒ වාගේම දැන් හෝ වතුර මුදා හැර බේරාගන්න පුළුවන් යම් ප්‍රමාණයකුත් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඊයේ ගත්ත කැබිනට් තීන්දුව ඒ ආකාරයෙන්ම ඔබතුමන්ලා ක්‍රියාත්මක කරනවාද? ඒ වාගේම ජලය ලබා දීම කියන කාරණයේ දී පානීය ජලය, කෘෂි කර්මාන්තය සහ විදුලි ජනනය කියන ප්‍රමුඛතාවට යටත්ව කටයුතු කරනවාද?

ඊළඟට මේ ගැටලුව එන්න පුළුවන්, මහවැලි පද්ධතියට. මොකද, මහවැලි පද්ධතියට තමයි අපේ ප්‍රමුඛතම ගොවි ගම්මාන ටික, ගොවි ජනපද ටික, ගොවි කලාප ටික අයත්ව තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, ඊළඟට ඔබතුමා කියන්න පුළුවන්, නියඟයක් එනවා. ඒ නිසා අපි විදුලි ජනනය සඳහා මේ ජලය තියා ගන්න ඕනෑ. අපට මහවැලි "සී" කලාපයට, මහවැලි "එච්" කලාපයට, මහවැලි "බී" කලාපයට ජලය දෙන්න විධියක් නැහැ කියලා. හැබැයි, ඒක නොවෙයි වෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ රජය ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්නවා ද, මුලින්ම පානීය ජලය ලබා දීමට, දෙවනුව කෘෂි කර්මාන්තය සඳහා ජලය ලබා දීමට සහ තුන්වනුව විදුලි ජනනය සඳහා ජලය ලබා දීමට? ඒ ප්‍රමුඛතාව පදනම් කරගෙන ඉදිරියේ දී ඔබතුමන්ලා අමාත්‍යාංශයක් විධියට සහ රජයක් විධියට කටයුතු කරනවාද කියා මම දැන ගන්න කැමතියි.

ඒ වාගේම සමනළවැව ජලාශයෙන් කෘෂි කර්මාන්තයට අවශ්‍ය ජලය අඛණ්ඩව ලබා දෙනවා ද කියන ප්‍රශ්නයත් මම ඔබතුමාගෙන් අහනවා.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා මුල් ප්‍රශ්නයෙන් අහලා තිබුණේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අදාළ කාරණාවක්. එම නිසා එතුමා අහපු පළමුවැනි අතුරු ප්‍රශ්නය ඒ ප්‍රශ්නයට අදාළ වන්නේ නැහැ.

ගරු මන්ත්‍රීතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නයටත් අදාළ වන සවිස්තරාත්මක පිළිතුරක් ඊයේ ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නයට ලබා දුන්නා. ඒ වාගේම ඒ කාරණය ගැන ප්‍රශ්න කරපු හැම මන්ත්‍රීවරයෙකුටමත් පිළිතුරු ලබා දුන්නා. ඒ නිසා මම නැවත වතාවක් ඒ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන්න යන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්න, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ධීවර කර්මාන්තය මුහුණ දෙන ගැටලු
### மீன்பிடிக் கைத்தொழில் எதிர்நோக்கும் பிரச்சினைகள்
### ISSUES FACED BY FISHING INDUSTRY

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව දීම පිළිබඳව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙරට ආර්ථික අර්බුදයත් සමඟ පැන නැඟුණු අභියෝග හමුවේ ධීවර කර්මාන්තය විශාල ලෙස බිඳ වැටීමකට ලක්ව තිබෙනවා. ඉන්ධන මිල අධික වීම, යන්ත්‍රෝපකරණවල මිල ගණන් අධික වීම ආදිය හේතුවෙන් ධීවර යාත්‍රා බොහොමයකට ධීවර කර්මාන්තයේ නියැළීමට නොහැකි වී තිබෙනවා. ධීවර කර්මාන්තයේ යෙදුණු පිරිස් මෙන්ම ඔවුන්ගෙන් යැපෙන්නන් ද අද අන්ත අසරණභාවයට පත් වී සිටිනවා. පසුගිය වසරේ දී මත්ස්‍ය නිෂ්පාදනය සියයට 8.9කින් පහළ ගොස් ඇති අතර, අප රට මහා සාගරයෙන් වට වී ඇතත් නිෂ්පාදනය අඩු වීම නිසා මත්ස්‍ය මිල ගණන්වල අඩුවක් දකින්නට ලැබෙන්නේ නැහැ. දෙමව්පියන්ට සිය දරුවන්ගේ පෝෂණය සඳහා වැදගත් වන මාළු ආහාරය සඳහා ලබා දීමේ දී මේ වන විට දෙවතාවක් සිතන්නට සිදු වෙලා තිබෙනවා.

ධීවර අමාත්‍යාංශය සහ ලංකා ධීවර සංස්ථාවේ අරමුණ විය යුත්තේ නිසි කළමනාකරණ ක්‍රම මඟින් වෙළෙඳ පොළ ඒකාධිකාරය මැඩ පවත්වා මෙම තත්ත්වයට පිළියම් සෙවීමයි. එමඟින් ධීවර ප්‍රජාවට හා පාරිභෝගික ජනතාවට සහන සැලසීම රජයේ වගකීම වී තිබෙනවා. නමුත්, ඒ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමක් සිදු වන බවක් නම් පෙනෙන්නට නැහැ. එබැවින්, පීඩාවට පත්ව සිටින ධීවර ප්‍රජාවට සහන සැලසීම සම්බන්ධයෙන් රජයේ කඩිනම් අවධානය යොමු කළ යුතු බව මම ප්‍රකාශ කර සිටිනවා.

මම ගරු ධීවර ඇමතිතුමාට විශේෂ කාරණයක් මතක් කරන්න කැමතියි. ධීවර අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ දී අප ප්‍රශ්න කරන කොට දැනගන්නට ලැබුණා, එක්ස්ප්‍රස් පර්ල් ඛේදවාචකයේ - "X-Press Pearl" disaster එකේ - හානිය ධීවර අමාත්‍යාංශයෙන් තීරණය කරලා තිබෙන්නේ, ගණනය කරලා තිබෙන්නේ මීගමුව සිට පානදුර දක්වා විතරයි කියලා. ඒක සම්පූර්ණයෙන් වැරදියි. ඒ කියන්නේ, පුත්තලම දිස්ත්‍රික්කයේ සහ පානදුරෙන් පහළට තිබෙන වෙරළාසන්න දිස්ත්‍රික්කවල මේ ඛේදවාචකයෙන් මත්ස්‍ය සම්පතට, ධීවර ක්ෂේත්‍රයට සිදු වුණු හානිය ධීවර අමාත්‍යාංශය තවමත් ගණනය කරලා නැහැ. මම ඒ පිළිබඳව විෂය භාර ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. කරුණාකර ඒ වැරැද්ද නිවැරදි කරන්න කටයුතු කරන්න.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඒ අනුව, මෙය ජාතික වැදගත්කමින් යුතු ගැටලුවක් වශයෙන් සලකා පහත සඳහන් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු හා පැහැදිලි කිරීම් රජයෙන් බලාපොරොත්තු වෙනවා.

1. සාගර සම්පත නිසි පරිදි කළමනාකරණය කිරීම තුළින් ධීවර කර්මාන්තය මෙරටට ආදායම් උපයා දෙන ප්‍රමුඛතම කර්මාන්තයක් වශයෙන් ගොඩ නැංවිය හැකි බව රජය පිළිගන්නේ ද? එසේ නම්, මෙම ආර්ථික අර්බුදය ඉලක්ක කොට ගෙන ධීවර කර්මාන්තයේ උන්නතිය සඳහා රජය ගෙන ඇති පියවර මොනවාද? මෙරට කලපු ආශ්‍රිත මත්ස්‍ය සම්පත රැක ගැනීම උදෙසා කලපු සංරක්ෂණය කිරීමේ විධිමත් වැඩ පිළිවෙළක් රජය දියත් කර තිබේද? එසේ නම් ඒ කවරේ ද?

2. භූමිතෙල් හා ඩීසල් මිල ගණන් ඉහළ යෑම, බහුදින ධීවර යාත්‍රා සඳහා දැරිය යුතු ආහාර පාන වියදම්, ධීවර යාත්‍රා අමතර කොටස් වෙනුවෙන් දැරිය යුතු වියදම් ඇතුළු අනෙකුත් වියදම් ඉහළ යෑම වැනි කරුණු හේතුවෙන් ධීවරයින් රැසක් අද වන විට ධීවර කර්මාන්තය අතහැර ගොස් ඇති බව රජය දන්නේ ද?

   ධීවර කර්මාන්තයේ යෙදීමට අවශ්‍ය ඉන්ධන සහනදායී මිලක් යටතේ ධීවරයින්ට ලබා දීම සඳහා ක්‍රමයක් සකස් කළ නොහැකිද?

   විශේෂ කාරණයක් කෙරෙහි ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරවන්න මා කැමැතියි. මම පසුගිය දිනක දොඩන්දූව වරායේ සංචාරයක නියැළුණා. චීන රජය ලබා දුන් ඉන්ධන ටිකවත් හරියට බෙදා දීලා නැහැ, ධීවර ප්‍රජාවට. පොරොන්දු වූ ප්‍රමාණය නොවෙයි දීලා තිබෙන්නේ; ඊට වඩා අඩු ප්‍රමාණයක්. මම ඔබතුමාගෙන් අහන්න කැමතියි, විදේශ ආධාරයක් හැටියට ලැබුණු ඒ ඉන්ධන ටික ධීවර ප්‍රජාව වෙනුවෙන් ලබා දීමට ඔබතුමා කටයුතු කරන්නේ කවදාද කියලා.

3. ධීවරයින් කර්මාන්තයේ නොයෙදීම හේතුවෙන්, මෙරටට ගෙන එන මත්ස්‍ය අස්වැන්න විශාල ලෙස අඩු වී ඇති බව රජය පිළිගන්නේද? ඒ කියන්නේ, කර්මාන්තය අඩපණ වීම තුළ මත්ස්‍ය නිෂ්පාදනය කඩා වැටීමකට ලක් වී තිබෙනවාය කියන එක රජය පිළිගන්නවාද? මේ නිසා වෙළෙඳ පොළ තුළ මත්ස්‍ය මිල ගණන් ඉහළ ගොස් ඇති බව රජය දන්නේද? ඉහළ මන්දපෝෂණ තත්ත්වයක් පවතින කාල පරිච්ඡේදයක දරුවන්ගේ පෝෂණය කෙරෙහි මෙය සෘජුවම අහිතකර අන්දමින් බලපාන බව රජය දන්නේද?

4. 2022 වසරේදී ධීවර අංශය මඟින් මෙරටට කොපමණ අපනයන ආදායමක් -ඇමෙරිකානු ඩොලර්වලින්- හිමිව තිබේද? එය 2021 වර්ෂය හා සැසඳීමේදී වැඩි වීමක්ද, නැතහොත් අඩු වීමක්ද? එසේ නම් ඊට හේතු කවරේද? මෙරට මත්ස්‍ය සම්පත ආශ්‍රිතව සිදු කරනු ලබන අතුරු නිෂ්පාදන පිළිබඳ සෑහීමකට පත් විය හැකිද? නො එසේ නම්, මත්ස්‍ය සම්පත ආශ්‍රයෙන් සිදු කරනු ලබන මෙම අතුරු නිෂ්පාදන කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා රජය ගෙන ඇති පියවර කවරේද?

5. විදේශීය රටවල් මත්ස්‍යයින් ඇල්ලීම සඳහා භාවිත කරනු ලබන විවිධ ක්‍රම - use of trawlers for fishing - නිසා මෙරට සාගර කලාපය තුළ වෙසෙන මත්ස්‍ය සම්පතට හානි සිදු වන බව රජය දන්නේද? එවැනි තත්ත්ව වළක්වා ලීම සඳහා රජය ගෙන ඇති පියවර කවරේද?

6. ලංකා ධීවර සංස්ථාවේ පාලන අධිකාරිය විසින් එහි සේවකයන්ගේ සේවක අර්ථ සාධක අරමුදල් -EPF-, සේවක භාරකාර අරමුදල් -ETF- සහ විශ්‍රාමික පාරිතෝෂික දීමනා ගෙවීම් සිදු කර නොමැති බව වාර්තා වෙනවා. මෙය සත්‍යයක්ද? එසේ නම්, ඒ කොපමණ මුදලක්ද? මෙම ගෙවීම් ප්‍රමාද වීමට හේතු කවරේද? මෙම ගෙවීම් සිදු කිරීමට රජය අපේක්ෂා කරන්නේ කවදාද?

   ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට කියන්න කැමතියි, 700ක් පමණ වන සේවකයින්ගේ EPF, ETF සහ විශ්‍රාමික සේවකයින් හැත්තෑදෙදෙනෙකුගේ විශ්‍රාමික පාරිතෝෂික දීමනා ගෙවීම් පැහැර හැර තිබෙන බව. ඒ අනුව රුපියල් කෝටි 65ක් පමණ වන EPF, ETF මුදල් සහ විශ්‍රාමික පාරිතෝෂිකය වශයෙන් රුපියල් කෝටි 2.5කට අධික මුදලක් තිබෙනවා. ඒවා ගෙවන්නට කටයුතු කරන්නේ කවදාද කියලා මම අහන්න කැමැතියි.

7. පසුගිය වසරේදී ලංකා ධීවර සංස්ථාව මඟින් ධීවරයින්ගෙන් කොපමණ මත්ස්‍ය අස්වැන්නක් සෘජුව මිල දී ගෙන තිබේද? සෘජුවම ධීවරයින්ගෙන් කරනු ලබන මිල දී ගැනීම් හැරුණු කොට, වෙනත් ආකාරයකට මත්ස්‍ය අස්වැන්න මිල දී ගැනීම සඳහා ලංකා ධීවර සංස්ථාව කටයුතු කර තිබේද? එසේ නම්, කොපමණ මත්ස්‍ය අස්වැන්නක් මිල දී ගෙන තිබේද? ඊට හේතු කවරේද?

   ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට කියන්න කැමතියි, ලංකා ධීවර සංස්ථාවේ මසුන් මිල දී ගනු ලබන්නේ මිල දී ගැනීමේ විධායකය හරහා නොව, පෞද්ගලික වෙළෙඳුන් හරහා බව. මේ වංචනික ක්‍රියාව නිසා, ලංකා ධීවර සංස්ථාවට අය විය යුතු රුපියල් කෝටි 10කට අධික මුදලක් මාසිකව කොටස් වශයෙන් ආයතනයට අහිමි වෙනවා. කවුද මේ හොර ධීවර මත්ස්‍ය ජාවාරමට වග කියන්නේ? ඔබතුමා ද, එහෙමත් නැත්නම් අමාත්‍යාංශයේ නිලධාරියෙක් ද? ඒ කවුද කියන එක ඔබතුමාගෙන් මම බොහොම පැහැදිලිව අහන්න කැමැතියි.

8. දකුණු පළාතේ ගාල්ල නගරයේ පිහිටුවා ඇති විශාලතම ශීතාගාරය බඳු දීමට රජය කටයුතු කර තිබේද? ඒ කුමන පිරිසකටද? ඒ සඳහා වූ බදු මුදල් ලංකා ධීවර සංස්ථාව වෙත සම්පූර්ණයෙන් හිමි වී තිබේද? නොඑසේනම්, ඊට හේතු කවරේද? මේ සම්බන්ධයෙන් රජය ගන්නා පියවර කුමක්ද?

ගරු ඇමතිතුමනි, දකුණු පළාතේ පිහිටි විශාලතම ශීතාගාර පද්ධතිය තිබෙන්නේ ගාල්ලේයි. ලාභ ලැබූ එම ශීතාගාරය පාලන අධිකාරිය විසින් විධිමත් ටෙන්ඩර් පටිපාටියකින් තොරව දූෂිත ආකාරයෙන් බදු දීලා තිබෙනවා. මේ වනවිට එම බදු මුදල් ද ක්‍රමවත් ආකාරයට ආයතනයට ලැබිලා නැහැ. මේ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද ?

ගරු ඇමතිතුමනි, මීට අමතරව මම තව කරුණු කිහිපයක් ඔබතුමාගෙන් අහන්න කැමතියි. ධීවර අමාත්‍යාංශයට හා ධීවර ක්ෂේත්‍රයට අදාළ ආයතනවල වංචා දූෂණ කටයුතු රැසක් සිදුවී තිබෙනවා. මම මේ කරුණ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි. කොළඹ දිස්ත්‍රික් කාර්යාලයේ පැවැති ණයවලින් රුපියල් ලක්ෂ 333ක් 2017 වර්ෂයේ මහ භාණ්ඩාගාරයෙන් ගෙවා මෙට්‍රෝ නමින් නැවත ආරම්භ කළ - කොළඹ දිස්ත්‍රික් කාර්යාලයේ ණයවලින් ආරම්භ කළ- එම වැඩ සටහනේ ණය බර රුපියල් කෝටි 15ක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා. හැබැයි, ණය රුපියල් කෝටි 15ක් දක්වා වැඩි වෙන මොහොතේ වැඩබලන කළමනාකරු ලෙස කටයුතු කරන නිලධාරියාට එරෙහිව කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. මීට පෙර එම කාර්යාලයේ ණය රුපියල් කෝටි තුනක්ව තිබියදී එහි කළමනාකරු ඉවත් කරලා තිබෙනවා. හැබැයි, ඒ ණය බර කෝටි 15ක් වෙනකොට ඔබතුමන්ලා වැඩබලන කළමනාකරුට එරෙහිව කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ.

ධීවර සංස්ථාවේ 2022 වර්ෂයේ අභ්‍යන්තර විධායකය මඟින් මිලදී ගත් මසුන් ප්‍රමාණය පිළිබඳව සම්පූර්ණ විස්තර වාර්තාවක් අවශ්‍යයි. විශේෂයෙන් ලංකා ධීවර සංස්ථාව 2022 වර්ෂයේ පෞද්ගලික වෙළෙඳුන්ගෙන් මිලදී ගත් මසුන් ප්‍රමාණය කොපමණද කියන එක ගැනත් අපට සවිස්තර වාර්තාවක් අවශ්‍යයි.

මම තව කරුණක් ඔබතුමාට කියන්න කැමැතියි. මේ සිද්ධිය වුණේ ඔබතුමාගේ කාල වකවානුවේද කියලා මම දන්නේ නැහැ. 2021 කොරෝනා වසංගතය පැවැති කාල සීමාව තුළ, වෙනත් ඇමතිවරයෙක් ඉන්න කාලයේ තලපත් මාළු සහිත කන්ටේනර් දෙකක් ලංකා ධීවර සංස්ථාවට මුදා හැරීමට අවසර අරගෙන තිබෙනවා. ගරු ඇමතිතුමනි, හැබැයි මේ තලපත් මාළු කන්ටේනර් දෙක ලංකා ධීවර සංස්ථාවට ලැබිලා නැහැ. මේ මසුන් සංස්ථාවට ලබා ගැනීම සඳහා කටයුතු කළ කළමනාකාර අධ්‍යක්ෂවරයා වන ක්‍රිෂාන්ත රත්නවීර මහත්මයා සේවයෙන් ඉවත් කරලා තිබෙනවා. කිලෝග්‍රෑම් 54,000කට ආසන්න තලපත් මාළු සහිත කන්ටේනර් දෙකට මොකක්ද සිදු වුණේ කියන එක ගැන ඔබතුමා අංගසම්පූර්ණ පිළිතුරක් ලබා දෙනවාද කියන එක මම මේ අවස්ථාවේ අහන්න කැමතියි.

අවසාන වශයෙන් මම මේ කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. ලංකා ධීවර සංස්ථාවේ නිෂ්පාදන අංශයට වැකුම් යන්ත්‍රයක් මිලදී ගැනීමේ දී වංචාවක් සිදු වෙලා තිබෙනවා. ඒ පිළිබඳව ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද? 2015 ධීවර සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ ආරම්භ කරන ලද අපනයන මත්ස්‍ය සැකසුම් ඒකකයේ වර්තමාන තත්ත්වය මොකක්ද? මේ සඳහා රුපියල් කෝටි 20ක් වැය කරලා තිබෙනවා. නමුත් තවමත් වැඩ අවසන් කරලා නැහැ. ඒ වාගේම ධීවර සංස්ථාවේ රුපියල් කෝටි ගණනක මූල්‍ය කටයුතු සිදුවන ගම්පහ කාර්යාලයේ කළමනාකරු වසර 13ක්ම එකම තැන. මොකක්ද මේකට හේතුව?

ගරු ධීවර ඇමතිතුමනි, මම ඔබතුමාට ධීවර ක්ෂේත්‍රයේ වංචා, අක්‍රමිකතා, දූෂණ, ප්‍රශ්න පිළිබඳව කරුණු ගණනාවක් ඉදිරිපත් කළා. වැඩබලන කළමනාකරුවන් වශයෙන් පාලන අධිකාරියට හිතවත්, සුදුසුකම් නොමැති පුද්ගලයන් පත් කරලා තිබෙනවා කියලා මම ඔබතුමාට කියන්න කැමැතියි. මේක වැරැදි ක්‍රියාවක්. ඒක නිවැරැදි කරන්න.

ඒ වාගේම අභ්‍යන්තර විගණක තනතුරට සුදුසුකම් ලත් පුද්ගලයෙක් මේ දක්වා බඳවා ගෙන නැහැ. මේ කරුණු කාරණා පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා ධීවර ක්ෂේත්‍රය ගොඩ නඟන්නට කටයුතු කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ධීවර අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතන තුළ ක්‍රියාත්මක වෙන දූෂණ, වංචා, හොරකම් පිළිබඳව සොයා බලා වැරදි කරන අයට නිසි ක්‍රමයක් තුළ දඬුවම් ලබා දෙන්නට කටයුතු කරන්නය කියාත් මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා (ධීවර අමාත්‍යතුමා)**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா - கடற்றொழில் அமைச்சர்)
(The Hon. Douglas Devananda - Minister of Fisheries)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கௌரவ எதிர்க்கட்சித் தலைவர் அவர்கள் நிலையியற் கட்டளை 27(2) இன்கீழ் கேட்பதற்காக 08 கேள்விகளை எனக்கு அனுப்பி யிருந்தார். நேற்று மாலைதான் அவை எனது கைகளுக்குக் கிடைத்தன. அவற்றுக்கு மேலதிகமான கேள்விகளையும் அவர் இன்று கேட்டிருந்தார். எனினும், அவை எழுத்தில் இல்லை. அவற்றையும் கருத்திலெடுத்து, கேட்கப்பட்ட கேள்விகளுக்குப் பதில் அளிப்பதற்கு எனக்கு ஒரு கிழமை கால அவகாசம் தேவைப்படுகிறது. ஏனென்றால், இன்று நான் இங்கு எனது அமைச்சு சார்பில் ஐந்து ஒழுங்குவிதிகளைச் சமர்ப்பிக்க இருக்கின்றேன். நிச்சயமாக உங்களுடைய கேள்விகளுக்கு அடுத்த வாரம் பதில் தருவேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ.

## II

## ජල හිඟය නිසා ගොවීන් මුහුණ දෙන ගැටලු
## நீர் பற்றாக்குறையால் விவசாயிகள் எதிர்கொள்ளும் பிரச்சினைகள்
## PROBLEMS FACED BY FARMERS DUE TO SCARCITY OF WATER

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මම අහන්න යන ප්‍රශ්නය ගැන ඊයේ මේ පාර්ලිමේන්තුව තුළ විපක්ෂ නායකතුමාත්, තවත් මන්ත්‍රීවරු පිරිසකුත්, පක්ෂ නායකයිනුත් විශාල වශයෙන් ප්‍රශ්න කර තිබෙනවා.

අක්කර 30,000ක පමණ වී වගාවේ, කෙසෙල් වගාවේ නියුතු ගොවීන් බරපතළ අර්බුදයකට අද මුහුණ දීලා තිබෙනවා. මෙයින් සිදුව ඇති පාඩුව ඩොලර් බිලියන 15ක් පමණ වෙනවා. නමුත්, දැන් වතුර ලබා දීම නිසා ඒ තත්ත්වය මඟ හැරිලා තිබෙනවා. විශේෂයෙන්ම ඉලක්කම්වලින් සිදු වූ පාඩුවට වඩා මේ හා ආශ්‍රිත වෙළඳාමට පාඩුවක් සිදුවෙලා තිබෙනවා. ජීවත් වෙන පවුල් දෙස බැලුවාම 150,000ක විතර ජන සමූහයක් මේ ප්‍රශ්නයට සෘජුවම දායක වෙනවා; මේ පාඩුවලට මුහුණ දෙනවා. මේ නිසා රටේ සහල් නිෂ්පාදනයේ අඩු වීමක් වෙන්න පුළුවන්. මොකද, දැන් වතුර ලබා දුන්නත් මෙහි පාඩුව පිළිබඳව විධිමත් සංගණනයක් කළ යුතු වෙනවා. ආණ්ඩුව මේ අර්බුදයේ බරපතළකම තේරුම් ගත්ත බවක් අපට පෙනෙන්නට නැහැ. ඒ නිසා විශේෂයෙන්ම කෘෂිකර්ම අමාත්‍යතුමා හා මහවැලි අමාත්‍යාංශය භාර ඇමතිතුමා මේ සම්බන්ධව නිසි අවධානයකින් කටයුතු කළ යුතු වෙනවා. අඩුම තරමින් අදාළ අමාත්‍යාංශ ඒකාබද්ධ වී මේ සම්බන්ධයෙන් සාකච්ඡාවක් කළ යුතු වෙනවා. එක පැත්තකින් විදුලිය නිෂ්පාදනයට සම්බන්ධ අය, ඒ වාගේම නිලධාරීන් සහ ඇමතිවරුන් ඒකාබද්ධ වී මේ පිළිබඳව සාකච්ඡාවක් කළ යුතු වෙනවා. රටක මේතරම් අර්බුදයක් තිබියදී මේ අයට එකතු වී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කොට, එකඟතාවකට පත් වීමට නොහැකි වීම ගැන අතිශයින්ම කනගාටුවක් ඇති වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, ගොවීන්ට වතුර ලබා දෙන්න අපට සෑහෙන කාලයක් ගත වුණා. ඒ මිනිස්සු උපවාසයක නිරත වුණා; සත්‍යාග්‍රහයක නිරත වුණා. අන්තිමේදී උඩවලව ආශ්‍රිත කුඹුරු අක්කර 50,000ක් - අනෙකුත් වගාව සහිතව - සෑහෙන අර්බුදයකට මුහුණ දුන්නා. ඉතින්, මේ තීරණය ගන්න මේ සා විශාල කාලයක් පමා වීමේ හේතුව මොකක්ද? අපි ඒ වතුර දුන්නේ මහජන උද්ඝෝෂණ නිසාද, එහෙම නැත්නම් පාර්ලිමේන්තුවේ මැති ඇමතිවරුන් ඒ සම්බන්ධයෙන් කථා කිරීම නිසාද? මොන කාරණය නිසාද? අපි තීරණයක් ගත යුතුව තිබුණේ ගොවි ජනතාව උද්ඝෝෂණය කරන්න පෙරයි. එහෙම නැත්නම් ගොවියෝ උද්ඝෝෂණය කරලා දවස් දෙක තුනක් ඇතුළත.

දැන් ප්‍රශ්නය තිබෙන්නේ, වතුර දීමේ පටිපාටිය සම්බන්ධවයි. ජලය මුදා හැරීමේදී කරුණු 2ක් බලන බව අපි දන්නවා. එකක් තමයි, විදුලි නිෂ්පාදනය. අනෙක් එක තමයි කෘෂි කර්මාන්තය. විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, මේ සම්බන්ධයෙන් අදටත් විධිමත් පටිපාටියක් සකස් වෙලා නැහැ කියන එක. උදාහරණයක්

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි]

ගත්තොත්, යල කන්නයේ දී බොහෝ ප්‍රදේශවල වගා කරන්නේ නැහැ. වී ගොවිතැන ගත්තොත් හෙක්ටෙයාර හත්ලක්ෂ පනස්දාහක් අපි වගා කරනවා. ඒක බහිනවා 3,500ත් 4,000ත් අතරට. එතකොට යල කන්නයේ ගොවිතැන අත්හරින කණ්ඩායම ලක්ෂ තුනහමාරක් පමණ වෙනවා. ඒ ලක්ෂ තුනහමාර මහ කන්නයේදී ගොවිතැන් කරන්නේ වැව් වතුර ලබා දීමෙන් නොවෙයි, වැහි වතුරෙන්. එහෙම නම්, මහ කන්නයේ දී අපි වැහි වතුර මුදා හැරීම ඉතා අඩු මට්ටමකින් කරන්න ඕනෑ. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, ගොවි ජනතාවට අපි කිසිම මහ පෙන්වීමක් සිද්ධ නොකිරීමයි. ඒ කුමක් සම්බන්ධයෙන්ද? වැස්ස එනකොටම වගා කිරීමට ගොවීන්ට අපි මහ පෙන්වීමක් කර නැහැ. වැහැලා වැහැලා ඉවර වුණාට පස්සේ තමයි අපි කන්න රැස්වීම තියලා වතුර දෙන්නේ. මෙන්න මේක සෑහෙන අර්බුදයක් බවට අද පත් වෙලා තිබෙනවා. ඒ නිසා විදුලි බල මණ්ඩලය හා කෘෂිකර්ම අමාත්‍යාංශය ඒකාබද්ධව සාකච්ඡාවක් කරනවා නම්, ජලය ලබා දීම සම්බන්ධයෙන් මීට වඩා යථාර්ථවාදී විසඳුමකට එන්න පුළුවන්. මහ කන්නයේදී වැව් නැති ප්‍රදේශවල වගා කරනවා, වැව් වතුර නැතිව.

එහෙම නම් වැව් තිබෙන ප්‍රදේශවලත් වතුර ටික ආරක්ෂා කරගන්න පුළුවන්. අපි මහ කන්නයේදී, එනම් ඔක්තෝබර් සිට පෙබරවාරි දක්වා, කරන වගාවේදී පුළුවන් තරම් වැව් ජලය අඩුවෙන් පරිභෝජනය කළොත්, මෝසම් වර්ෂාවෙන් ලැබෙන වතුර අපට ගබඩා කරලා තබාගන්න පුළුවන්. නමුත්, කන්න රැස්වීමේදී වතුර දෙන පටිපාටිය තීරණය කරන්නේ නිලධාරින් වීම නිසාත්, ඒ වාගේම විදුලිය සහ ගොවිතැන් කිරීමට අදාළ වතුර දීම සඳහා විධිමත්, යථාර්ථවාදී සාකච්ඡාවක් නොකිරීම නිසාත් තමයි මේ ගැටලුව පැන නැඟිලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අක්කර 50,000ක අස්වැන්නකට හානි වුණොත් ඒක කොච්චර පාඩුවක්ද? විදුලිය නොදී හැරියොත් කොච්චර පාඩුවක්ද? මේක ගණනය කළාම අපට පෙනෙනවා, එකට එකක් නොවෙයි, එකට පහකට වැඩි ප්‍රමාණයක පාඩුවක් වෙනවා කියලා. වතුර නැතුව ගොවීන් වගා පාළුවකට මුහුණ දුන්නොත් ඒකෙන් වෙන පාඩුව පස් ගුණයකින් වැඩියි. එහෙම නම් අපට බොහොම ලේසියෙන් මේ තීන්දුව ගන්න තිබුණා. ඇයි, ඒ තීන්දුව ගන්න බැරි වුණේ? එම නිසා ජල විදුලිය නිෂ්පාදනයට හා ගොවිතැනට මහ කන්නයේ වතුර දීමේ පටිපාටිය සහ වැව්වල වතුර රඳවා තබා ගැනීමේ ප්‍රතිපත්තිය කොයි විධියටද ක්‍රියාත්මක කරන්න ඕනෑ කියලා අලුත් තීරණයකට එළඹෙන්න ඕනෑය කියා මම හිතනවා. නමුත්, එහෙම ඒකාබද්ධ සාකච්ඡාවක් කරන බවක් පෙනෙන්නේ නැහැ.

ඇත්ත වශයෙන්ම අපි කල්පනා කරන්න ඕනෑ, උතුරු-නැඟෙනහිරට බලතල බෙදනවාද, නැද්ද කියන අනන්මනන් නොවෙයි, දැන් තිබෙන්නේ ගොවීන්ට වතුර නැති ප්‍රශ්නය. ඒකට උත්තරයක් දීමට අපි ප්‍රමුඛතාවක් දක්වන්න අවශ්‍යයි. නමුත්, ආර්ථිකය පැත්තෙන් බැලුවොත් ඒ ගැන කිසිදු සාකච්ඡාවක් වෙලා නැහැ. එම නිසා පහත සඳහන් ප්‍රශ්න මම අහන්න කැමැතියි. මේ ප්‍රශ්නය මම ඊයේ අහන්න තීරණය කරලා තිබුණේ. නමුත්, ඊයේ මට ඒක අහන්න බැරි වුණා. කෙසේ වුවත් කෘෂිකර්ම ඇමතිතුමා මේ සම්බන්ධයෙන් මීට පෙර ප්‍රමාණවත් උත්තර ලබා දීලා තිබෙනවා. ඒ වාගේම විරුද්ධ පක්ෂයෙනුත් මෙවැනි ප්‍රශ්න අහලා එතුමා උත්තර ලබා දීලා තිබෙනවා. ඊට අමතරව තවත් ප්‍රශ්න කිහිපයක් දැන් පැන නැඟිලා තිබෙනවා.

01. ඒ අනුව දැනට සිදුව ඇති වගා හානිය කොපමණද? දැන් වැදගත්ම ප්‍රශ්නය මෙයයි. කෙසෙල් වගාවට හෝ අතුරු භෝගවලට හෝ වී ගොවිතැනට වෙච්චා වෙලා තිබෙන වගා හානිය කොයි තරම් ප්‍රමාණයක්ද? වතුර ලබා දීම සඳහා තෝරාගෙන ඇති ව්‍යුහය කවරේද?

    වතුර ලබා දීමේදී කන්න රැස්වීමේදී ගොවියෝ සමඟ නොවෙයි සාකච්ඡාව කළ යුතු වෙන්නේ. වතුර දෙන පටිපාටිය පිළිබඳ සාකච්ඡාව වෙනස් එකක්. ඒ කියන්නේ මේ සඳහා ජාතික මට්ටමේ සාකච්ඡාවක්, සම්මුතියක් අවශ්‍ය වෙලා තිබෙනවා. නමුත්, ඒ ගැන සාකච්ඡාවක් තිබෙනවාද?

02. උඩවලව ජලාශයෙන් ගොවිතැන් කරන ගොවීන් කුමන ගොවිතැන්වල නිරත වන්නේද? වී ගොවිතැනට අමතරව කුමන භෝග වගා කරන්නේද?

03. මේ සිදුව ඇති පාඩුව කෙතරම් දැයි ගණනය කර ඇත්තේද?

04. සිදු වූ වගා හානිය සඳහා ගොවීන්ට වන්දි ලබා දීමේ වැඩ පිළිවෙළක් දියත් කර ඇත්තේද?

    ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දින 15කට වැඩි කාලයක් වතුර නොදීම නිසා -ගොවිතැනට තීරණාත්මක අවස්ථාවක වතුර නොදීම නිසා- බරපතළ පාඩුවක් වෙලා තිබෙනවා. ඒ පාඩුව කොච්චරද කියලා ගණනය කරන්න වෙනවා. මොකද, ගොවීන්ගේ වගා හානියට අනිවාර්යයෙන්ම වන්දි දෙන්න සිදුවන නිසා.

05. දිනෙන් දින වී මිල පහත වැටීමත් සමඟ වී මිලදී ගැනීමේදී ප්‍රශ්න රැසක් ඇති වෙනවා. ඒ පිළිබඳවත් විධිමත් වැඩ පිළිවෙළක් නැහැ. ඒ ප්‍රශ්නය ගිය වර මහ කන්නයේදීත් මතු වුණා. මේ යල කන්නයේදීත් ඒ ප්‍රශ්නය මතු වෙනවා. ඒ සඳහා තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද?

06. ගොවීන්ට පොහොර ලබා දීම සම්බන්ධයෙන් දැනට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද?

මෙම ප්‍රශ්න සම්බන්ධයෙන් මේ ගරු සභාව දැනුවත් කරන මෙන් ඉල්ලා සිටිමි.

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law - State Minister of Agriculture)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ විසින් ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නයට කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා පිළිතුර ලබා දෙනවා. සම්පූර්ණ උත්තරයක් තිබෙනවා. මා එය සභාවට ප්‍රකාශ කරන්නද? එහෙම නැත්නම් සභාගත කරන්නද?

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ඔබතුමා කරුණු දෙකක් කිව්වා නම් හොඳයි. එකක් තමයි, වගා හානිය කොච්චරද කියන එක. වැනි කාරණය තමයි, මේ වගා හානියට මුදල් ගෙවන්න මොකක් හෝ පටිපාටියක් තිබෙනවාද කියන එක. මම ඊයේත් ගොවීන් සමඟ සාකච්ඡා කළා. මොකද, වගා හානිය පිළිබඳ විශාල ප්‍රශ්නයක් ඔවුන්ට තිබෙනවා.

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law)

ඔබවහන්සේ අහපු ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

01. දැනට සිදුවී ඇති වගා හානිය හෙක්ටෙයාර 2,596ක් වන අතර එය ඇමුණුම 01හි Crop Damage තීරුවේ දැක්වේ. ඒ ඇමුණුම ඔබවහන්සේට ලබා දෙන්න පුළුවන්.

ජලය ලබා දීමේ ව්‍යුහය පහත පරිදි වේ.

- මඩ වැඩ සඳහා සති 03ක කාලයක් සතියකට අඟල් 5ක් බැගින් ජලය ලබා දෙනු ලැබේ.
- ආරම්භක සති 03න් පසු සතියකට එක් වරක් අඟල් 3ක් බැගින් මුර ක්‍රමයක් යටතේ ජලය ලබා දෙනු ලැබේ.
- මෙම කන්නය තුළ පැන නැඟුණු අර්බුදය හමුවේ ජූලි මස මුල් සතියේ සිට මුර ක්‍රමය දින 10ක්, 12ක් වැනි කාල පරාසයකට දීර්ඝ කරන ලදී.
- අගෝස්තු මාසය ආරම්භයේ සිට කොට්ඨාසයෙන් කොට්ඨාසයට දින 04 බැගින් ජලය ලබා දීම සිදු කරනු ලැබේ.

02. උඩවලව ජලාශය යටතේ වගා කරන භෝගවල විස්තර ඇමුණුම 02හි දැක්වේ.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
සම්පූර්ණ වගා හානිය තිබෙන්නේ හෙක්ටෙයාර 2,596යි. නමුත්, අවශ්‍ය කාලයේ ජලය නොදීම නිසා අනෙක් තැන්වල ගොවීන්ට සිදු වූ හානිය - drop- සමස්තයක් විධියට සියයට කීයක්ද?

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law)
මේ උත්තරයේ එවැන්නක් සඳහන් වෙන්නේ නැහැ. ඔබවහන්සේ අහපු ප්‍රශ්නවලට උත්තර තිබෙනවා.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මම අහන්නේ වගා හානිය ගැන. ඔබතුමා කිව්වේ අක්කර 2,596කට වගා හානියක් වෙලා තිබෙනවා කියන එක නේ. මම අහන්නේ කොච්චර ප්‍රමාණයකින් අස්වැන්න අඩු වෙලා තිබෙනවාද කියලායි. මම ඒකත් මේ ප්‍රශ්නයෙන් අහලා තිබෙනවා.

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law)

03. දැනට සිදු වී ඇති වගා හානිය දළ වශයෙන් රුපියල් බිලියන 3.07ක් පමණ වන අතර එය ඇමුණුම 01හි දැක්වේ.

ඔබවහන්සේට බලාගන්න අවශ්‍ය නම්, සවිස්තරාත්මක උත්තරයක් තිබෙනවා. අවශ්‍ය නම් ගරු ඇමතිතුමාත් සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්නත් පුළුවන්.

04. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වගා හානිය සඳහා ගොවීන්ට වන්දි ලබා දීමේ වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරලා තිබෙනවා.

වගා කාල සටහන්වලට අනුකූලව හා දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු උපදෙස් පරිදි නිර්දේශිත ප්‍රභේද වගා කර ඇත්නම්, එසේ සිදු කරන ලද වගාවට ගං වතුරෙන්, නියඟයෙන් හෝ වනඅලින්ගෙන් හානි සිදුව ඇත්නම් කෘෂිකර්ම අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 2017/7 යටතේ වන්දි ගෙවීමට හැකියාව පවතින බව දන්වනවා.

ඒ අනුව, වගාවේ අවසන් අවස්ථාවේ හානිය සිදුවී ඇත්නම් අක්කරයකට උපරිමය රුපියල් 40,000කට යටත්ව මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබා ගැනීමෙන් අනතුරුව කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මඟින් වගා හානි සඳහා වන්දි ගෙවීමට අවශ්‍ය කටයුතු කරනවා.

05. මිල කමිටුවකින් තීරණය කරන ලද මිලට -කිලෝවක් රුපියල් 95ට- ගොවීන්ගේ වී මිලදී ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලය වෙත ගොවි භාරකාර අරමුදල මඟින් රුපියල් මිලියන 500ක ණය මුදලක් ලබා දී ඇති බැවින් වී මිලදී ගැනීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. ඒ අනුව, දැනට වී අලෙවි මණ්ඩලය විසින් වී කිලෝ ලක්ෂ 20කට අධික ප්‍රමාණයක් මිලදී ගෙන ඇත.

එසේම, ඉදිරියේදී රාජ්‍ය බැංකුවලින් රුපියල් මිලියන 750ක ණය මුදලක් ලබා දීමට එකඟ වී ඇති නිසා තවදුරටත් වී මිලදී ගැනීමේ කටයුතු පුළුල් කළ හැකි ය.

06. "2023/24 මහ කන්නය සඳහා කුඹුරු ඉඩම්වල වගා කරන ගොවීන් සඳහා පොහොර සහනාධාරය ලබා දීම" මැයෙන් මා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලද 2023.06.28 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශය සඳහා 2023.07.17 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණය අනුව 2023/24 මහ කන්නයේ සිට කෘෂිකර්ම අමාත්‍යාංශය පොහොර ආනයනය කර ගොවීන් වෙත ලබා දීමේ ක්‍රමවේදය වෙනුවට, සීමාසහිත ලංකා පොහොර සමාගම සහ සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම, පෞද්ගලික අංශයේ සමාගම් සමඟ තරගකාරී ලෙස පොහොර ආනයනය කර ගොවීන් වෙත අළෙවි කිරීම සඳහා අනුමැතිය ලැබී ඇත.

තවද, 2023/24 මහ කන්නයේ වී වගාව සඳහා හෙක්ටෙයාරයකට රුපියල් 15,000 බැගින් එක් ගොවියෙකු වගා කරන උපරිම හෙක්ටෙයාර 2ක් සඳහා උපරිම රුපියල් 30,000ක මූල්‍ය සහනාධාරයක් ගොවීන් වෙත ලබා දීම සඳහා අනුමැතිය ලබා දී ඇත. එකී මූල්‍ය සහනාධාරය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගොවීන්ගේ බැංකු ගිණුම් වෙත ප්‍රේෂණය කිරීමට නියමිතය. එම මුදල් යොදා ගෙන වී වගාව සඳහා අවශ්‍ය පොහොර ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙතින් හෝ පෞද්ගලික අංශයේ පොහොර අළෙවි සැල් වෙතින් මිලදී ගැනීමට වී වගා කරන ගොවීන්ට අවස්ථාව සලසා ඇත.

ඇමුණුම් 01 සහ 02 **සභාගත*** කරමි

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අමාත්‍යාංශ නිවේදන, මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

## "අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ අඩුපාඩු: මුදල් රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## "அஷ்வசும" நலன்புரி நன்மைகள் திட்டத்திலுள்ள குறைபாடுகள்: நிதி இராஜாங்க அமைச்சரினது கூற்று

## SHORTCOMINGS IN "ASWESUMA" WELFARE BENEFIT SCHEME: STATEMENT BY STATE MINISTER OF FINANCE

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ranjith Siyambalapitiya - State Minister of Finance )

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ ගරු විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. වසර 28ක වූ සමෘද්ධි ව්‍යාපාරය දරිද්‍රතාව දුරලීමට සැලකිය යුතු වැදගත් මෙහෙයක් ඉටු කළ නමුදු අවසාන ඉලක්කය වූ ජීවන තත්ත්වය ඉහළ දැමීම තුළින් ශක්තිමත් පවුල් බිහි කිරීම ප්‍රතිශතාත්මකව අවම වීම සහ සහනාධාර සැලකිය යුතු ප්‍රමාණයක් නුසුදුස්සන්ට ලැබීම හා සුදුස්සන්ට නොලැබීම -2009 ලෝක බැංකු වාර්තාව අනුව සියයට 12ක් ඉහළම ආදායම් ලබන පන්තිය මේ සහනාධාරය ලැබීම- නව ක්‍රමයක අවශ්‍යතාව පෙන් වූ ප්‍රධාන සාධකය විය.

02. අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමයේ අරමුණ මෙතෙක් පැවති සුබසාධක යෝජනා ක්‍රමවලට වඩා වැඩි සහනයක් දුප්පත් ජනතාවට ලබා දීමයි. සමෘද්ධි ප්‍රතිලාභ ලබා දීමේ වැඩසටහන අවසන් කර අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට හේතු වූ අනෙකුත් කරුණු මෙසේ ය.

   අ. කොවිඩ් වසංගතය පැතිරීමත් සමඟ සිදු වූ ලෝක ආර්ථික අර්බුදයේ බලපෑමත්, ශ්‍රී ලංකා ආර්ථිකය තුළ වර්ධනය වූ ආර්ථික පසුබෑම හේතුවෙන් මෑත වර්ෂවලදී ජීවත්වීමට අවශ්‍ය අවම ආදායම නොලබන පවුල් සංඛ්‍යාව වැඩිවීම.

   ආ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය අනුව ආදායම් වියදම් බෙදී යාමේ විෂමතාව, වත්කම් බෙදී යාමේ විෂමතාව වැඩිවී ඇති අතර අධ්‍යාපන මට්ටම් ආදී අනිකුත් නිර්ණායකද සැලකිල්ලට ගත් විට දරිද්‍රතා රේඛාවෙන් පහළ පවුල් ප්‍රතිශතය බෙහෙවින් වැඩිවී ඇත. එමෙන්ම දරිද්‍රතා රේඛාවෙන් පහළට වැටීමේ අවදානමේ සිටින සංඛ්‍යාවද වර්ධනය වී ඇත.

   ඇ. දරිද්‍රතාව නිරූපණය කරනු ලබන ආදායම පරිභෝජනය, අධ්‍යාපනය, සෞඛ්‍ය, දේපළ හිමිකම් වැනි විවිධ සාධක මත විද්‍යාත්මක හා විධිමත් ක්‍රමවේදයක් යටතේ ආරක්ෂණය ලැබිය යුතු පිරිස් හඳුනා ගැනීමට වැඩ පිළිවෙළක් නොතිබිණි.

   ඈ. සමාජ ආරක්ෂණය ලැබිය යුතු පවුල් සඳහා ප්‍රමාණවත් සුබසාධක ප්‍රතිලාභ ලබා දීමටත්, එම පවුල් දරිද්‍රතාවෙන් මුදා ගැනීමටත් යොදා ගැනීම පිණිස අවශ්‍ය දත්ත රැස් කිරීමට හා දත්ත යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාමට හැකි පරිගණක දත්ත පද්ධතියක් නොතිබුණි. මේ අනිකුත් හේතූන්.

ඉහත පසුබිම් කරුණු මත මෙම ගැටලුවට විසඳුමක් වශයෙන් අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. දුගී බව තීරණය කිරීම සඳහා අස්වැසුම යෝජනා ක්‍රමය යටතේ උපමාන හා නිර්ණායක දක්වා ඇත. මෙම නිර්ණායක දුප්පත්කම මැනීම සඳහා භාවිත කරන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ හා ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය පදනම් කරගෙන සකස් කර ඇත. එම නිර්ණායකවල අඩුපාඩු ඇති බවට මෙතෙක් නිසි අධ්‍යයන ක්‍රියාවලියක් තුළින් තහවුරු කරගෙන නොමැත. එබැවින්, භාවිත කරන ලද නිර්ණායක නිවැරදි නොවන බවට ඉදිරිපත් කරනු ලබන කරුණු පිළිගත නොහැක. ඒ, විද්‍යාත්මක කරුණු.

මෙම වැඩසටහන මෙම නිර්ණායක පදනම් කර ගනිමින් ක්‍රියාත්මක කරන ලද පළමු වතාව බැවින් එහි අඩුපාඩු තිබේද යන්න නිගමනය කළ හැක්කේ යම් අධ්‍යයනයක් සිදු කිරීමෙනි. ඉදිරියේදී එවැනි අධ්‍යයනයක් තුළින් නිර්ණායකවල අඩුපාඩු හෙළිදරවු වන්නේ නම් ඊළඟ වටය සඳහා එම ක්‍රමවේදය වැඩිදුරටත් වැඩිදියුණු කළ හැකිය.

දෙවන කරුණ, අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය මඟින් ආවරණය කිරීමට බලාපොරොත්තු වූ පවුල් සංඛ්‍යාව මිලියන 2කි -ලක්ෂ 20කි.

දැනට මූලික තේරීම් සිදු කර එය ප්‍රසිද්ධ කර අභියාචනා හා විරෝධතා ලබාගෙන ඇත. එම අභියාචනා හා විරෝධතා පරීක්ෂණ දැනට සිදු කරමින් පවතී. එම ක්‍රියාවලියෙන් පසුව මෙම අපේක්ෂිත මිලියන දෙකක පවුල් සංඛ්‍යාව ආවරණය වනු ඇත. අස්වැසුම ප්‍රතිලාභ සඳහා මිලියන 3.7ක් පමණ අයදුම් කර තිබුණි. ඉන් සමීක්ෂණයට ඉදිරිපත් වූයේ පවුල් ලක්ෂ 32ක් -මිලියන 3.2ක්- පමණි. එහෙත් මේ අය තුළින් සමෘද්ධි සහනාධාරය ලැබූ පවුල්වලට තවදුරටත් එම සහනාධාරය ලබා දීමට ද අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලැබී ඇත. සුදුසුකම් නොලැබූ පුද්ගලයන්ගෙන් මෙන්ම සුදුසුකම් ලැබූ පුද්ගලයන්ගෙන් ද අභියාචනා ලැබී ඇත. සුදුසුකම් ලැබූ අයත් ඊළඟ ආදායම් පන්තියට -ඊළඟ ලැබීම් පන්තියට- යන්න අභියාචනා දීලා තිබෙනවා. ඒ අනුව, අභියාචනා මිලියන 1.02ක් පමණ ලැබී ඇත. මෙම අභියාචනා සහ විරෝධතා විභාග කිරීම සඳහා අභියාචනා කමිටු පත් කර අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. ඒ අනුව දැනට එම කටයුතු සිදු වෙමින් පවතී. අගෝස්තු මාසය අවසන් වන විට මෙම කටයුතු අවසන් වනු ඇතැයි අපේක්ෂිතය. අභියාචනා පරීක්ෂණ මඟින් සුදුසුකම් ලබන ප්‍රතිලාභීන් ඇතුළත් කිරීමෙන් පසුව ප්‍රතිලාභ පවුල් මුළු ගණන මිලියන දෙකක් නොඉක්මවනු ඇතැයි විශ්වාස කෙරේ. එම පවුල් සංඛ්‍යාවට අමතර මූල්‍ය ප්‍රතිපාදන අවශ්‍ය වන්නේ නැත. දැනට සමෘද්ධි වැඩසටහන යටතේ මසකට රුපියල් බිලියන 5.3ක් පමණ ප්‍රතිලාභ සඳහා රජය වැය කරයි. අස්වැසුම ප්‍රතිලාභ පිරිනැමීම කාණ්ඩ හතරක් යටතේ රුපියල් 15,000, රුපියල් 8,500, රුපියල් 5,000 සහ රුපියල් 2,500 වශයෙන් විවිධ වටිනාකම්වලින් සිදු වෙයි. එමෙන්ම පවුල්වල සාමාජිකයන් ගණන දෙකක් හෝ ඊට අඩු නම් ප්‍රතිලාභයෙන් අඩක් පමණක් හිමිවෙයි. අභියාචනා හා විරෝධතා පරීක්ෂණවල ප්‍රතිඵල අනුව එක් එක් කාණ්ඩ යටතේ පූර්ණ හෝ අඩක් වශයෙන් ප්‍රතිලාභ ලබන සංඛ්‍යාව වෙනස් වන හෙයින් අස්වැසුම ප්‍රතිලාභ සඳහා අවශ්‍ය වන මුදල් ප්‍රමාණය එක්වර නිශ්චිතව දැනට කිව නොහැක. සමීක්ෂණ කටයුතු සිදු කරන අවස්ථාවේ QR කේතය

නොලැබුණු හෝ සමීක්ෂණයට භාජන නොවුණු පවුල් සඳහා ද අභියාචනා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන ලදී. ඒ අනුව ඉදිරිපත් වූ අභියාචනා ද අභියාචනා මණ්ඩලය විසින් පරීක්ෂා කර ඔවුනට අසාධාරණයක් නොවන අයුරින් ක්‍රියා කිරීමට සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් උපදෙස් ලබා දී ඇත.

03. සමීක්ෂණ තුළින් ලැබී ඇති තොරතුරුවල නිරවද්‍යතාව සියයට 100ක් නොවිය හැකිය. අභියාචනා හා විරෝධතා පරීක්ෂණ ක්‍රියාවලියක් හඳුන්වා දී ඇත්තේ එය හැකිතාක් දුරට නිවැරදි කිරීම සඳහාය. සමීක්ෂණය සඳහා යොදාගෙන ඇති නිර්ණායක අනුව දරිද්‍රතා මට්ටම තීරණය කරනු ලබන බර තැබීමේ දිස්ත්‍රික්කවල දරිද්‍රතා මට්ටම දිස්ත්‍රික්කය අනුව වෙනස් වේ. මේ අනුව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත පදනම් කරගෙන, දිස්ත්‍රික්ක පදනම් කරගෙන ආර්ථික විෂමතා ආවරණය වන පරිදි මෙය සිදු කර ඇත. පුද්ගලයන්ගේ දුගී බව තීරණය කිරීමේදී ප්‍රදේශයේ ජනතාව පිළිබඳ මනා අවබෝධයක් ඇති නිලධාරීන් පිරිසක් යොදාගත යුතු බව පිළිගත හැකිය. මේ සඳහා ග්‍රාම නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සහ ආර්ථික සංවර්ධන නිලධාරීන් යොදා ගැනීමට සැලසුම් කර තිබුණි. එහෙත් එම සමහර නිලධාරීන් රැස් කරන තොරතුරුවල නිරවද්‍යභාවය පිළිබඳ වගකීම භාර ගැනීම පිළිබඳව පනතේ තිබුණු වගන්ති හේතුවෙන් මෙම වැඩසටහනට සහයෝගය නොදීම නිසා විකල්ප ක්‍රියා මාර්ගවලට යෑමට රජයට සිදු විය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එසේ නොකළේ නම් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම තවදුරටත් පමා වනු ඇත. එහෙත් අභියාචනා ක්‍රියාවලිය සඳහා ග්‍රාම නිලධාරීන්ගේ සහ අනෙකුත් ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සක්‍රිය දායකත්වය ලබා ගැනීම සඳහා තවදුරටත් අවශ්‍ය ක්‍රියා මාර්ග ගනිමින් තිබේ. නිර්ණායක ලෙස යොදාගෙන ඇත්තේ නිල වශයෙන් පිළිගත් සාධක පදනම් කරගෙනය. සුබසාධක පනතේ ඇති තොරතුරු ලබා දීමේ හා රැස් කිරීමේ නීතිමය ප්‍රතිපාදන තුළ වගකීම් සහිතව සත්‍ය තොරතුරු ලබාගෙන එම ප්‍රතිලාභීන් තෝරා ගැනීම මීට ආධාර ලබාදෙන ලෝක බැංකුවේ ප්‍රධානතම ඉල්ලීම විය.

එය ප්‍රධාන ඉල්ලීමක් නිවැරදි ලැයිස්තු හදාගැනීම පිළිබඳව, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

04. මෙම සමීක්ෂණය සඳහා යොදාගත් පුද්ගලයන්ට එක් අයදුම්පතක් සඳහා රුපියල් 300 බැගින් දීමනාවක් ලබාදෙන ලදී. දැනට ඒ සඳහා ගෙවා ඇති මුදල රුපියල් මිලියන 1,003කි. සමීක්ෂණය කිරීමේදී අදාළ අයදුම්කරුවන් නිවෙස්වල නොසිටීම, ප්‍රදේශය හැර යෑම, අයදුම්කරු මිය යෑම, සිරගත වීම, රෝහල්ගත වීම වැනි විවිධ හේතු මත අදාළ කාලය තුළ සමීක්ෂණය කිරීමට නොහැකි වූ ප්‍රමාණයක් ඇත. ඔවුන්ට අසාධාරණයක් නොවන ලෙස අභියාචනා මණ්ඩලය මඟින් එම දත්ත පරීක්ෂා කර තෝරා ගැනීමට ලක් කිරීම සිදු වේ. ඒ සඳහා උපදෙස් නිකුත් කර ඇත. මෙවැනි අඩුපාඩු යම් සුළු ප්‍රතිශතයක් තිබිය හැකි නමුත්, එය සමීක්ෂණය සම්පූර්ණයෙන් අසාර්ථක වීමට හේතුවක් නොවේ. එය නිවැරදි කර ගැනීමට සූදානම්ය.

05. අස්වැසුම සහනාධාර මුදල් රාජ්‍ය බැංකු මඟින් පමණක් ලබා දීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන නැත. තෝරාගනු ලබන ප්‍රතිලාභීන් විසින් තොරතුරු ඉදිරිපත් කිරීමේදී ලබා දී තිබූ රාජ්‍ය හා පෞද්ගලික බැංකුවල ගිණුම්වල නිරවද්‍යතාව හා ක්‍රියාත්මක තත්ත්වය පිළිබඳ අදාළ බැංකු මඟින් තහවුරුවක් ලබා ගන්නා ලදී.

එසේ තහවුරු කිරීමට අසමත් වූ පවුල් සඳහාත්, බැංකු ගිණුම් අංක ලබා දී නොතිබූ පවුල් සඳහාත් නව ගිණුම් විවෘත කිරීමේදී පෞද්ගලික බැංකු විසින් වැඩි ප්‍රතිචාරයක් නොදැක්වූ හෙයින් රාජ්‍ය බැංකු 4ක් සමඟ සාකච්ඡා කර ඉක්මනින් ගිණුම් විවෘත කිරීමේ ක්‍රමයක් සකස් කර, ක්‍රියාත්මක කරන ලදී. සමෘද්ධි බැංකුව වැනි ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණයට ලක් නොවන බැංකු සහ මූල්‍ය ආයතන මෙම වැඩසටහන යටතේ මුදල් යැවීම සඳහා යොදා නොගැනීමට තීරණයක් ගෙන තිබුණි. සමෘද්ධි බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණයට ලක් වෙන බැංකු ක්‍රමයක් බවට පත් කිරීමෙන් පසුව මෙම වැඩසටහන සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

ඒක ඉතාම වැදගත්. සමෘද්ධි බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අධීක්ෂණයට ලක් වෙන බැංකුවක් බවට පත් කිරීමෙන් පසු ඒ බැංකුවත් මේ සඳහා යොදා ගන්න බලාපොරොත්තු වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ සඳහා මූලික පියවර ආරම්භ කරලා තිබෙනවා.

රාජ්‍ය බැංකු වෙත කෙටි කාලයක් තුළ වැඩි පුද්ගලයන් සංඛ්‍යාවක් පැමිණීම නිසා යම් අපහසුතාවක් ඇති වුවද, වරින් වර ඇති වන ගැටලු පිළිබඳව රාජ්‍ය බැංකු සමඟ සාකච්ඡා කරමින්, ඒවා සමනය කර ගනිමින් බැංකු ගිණුම් විවෘත කිරීමේ ක්‍රියාවලිය දැනට ගෙන ගොස් ඇත. නිවාඩු දිනවල වැඩ කිරීමෙන්ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ගොස් බැංකු ශාඛා විසින් ජංගම සේවා පැවැත්වීමෙන්ද මෙම ක්‍රියාවලිය සාර්ථකව සිදු කරමින් පවතී. පසුගිය සතිය වනවිට පැරණි ගිණුම් ඇතුළුව බැංකු ගිණුම් මිලියන 1.3ක් පමණ ප්‍රතිලාභ යැවීමට හැකි තත්ත්වයේ පැවතුණි.

අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ වැඩසටහනේ වත්මන් තත්ත්වය හා ප්‍රායෝගික ගැටලු සඳහා විසඳුම් මෙසේය.

- අස්වැසුම මූලික වටයේදී තෝරා ගත් ප්‍රතිලාභී පවුල් 1,792,265 අතරින් විරෝධතා ඉදිරිපත් වී නොමැති පවුල් 1,588,835කට කඩිනමින් ප්‍රතිලාභ ගෙවීම සඳහා බැංකු ගිණුම් ආරම්භ කිරීම සහ සනාථ කිරීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතී.

- අභියාචනා සහ විරෝධතා ඉදිරිපත් කරන කාලය තුළ අභියාචනා 1,024,059ක් සහ විරෝධතා 124,495ක් ලැබී ඇත.

- දැනට ප්‍රතිලාභීන් ලෙස තෝරාගෙන ඇති, එහෙත් ඊළඟ ප්‍රතිලාභී පන්තියට ඇතුළත් වීම සඳහා අභියාචනා ඉදිරිපත් කර ඇති පවුල් සංඛ්‍යාව 84,374ක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

  ඒ පවුල් 84,374ට අභියාචනා විමර්ශනය කරනතුරු ඒ ලැබිලා තිබෙන කාණ්ඩයට අනුව ප්‍රතිලාභ ගෙවීම සිද්ධ වෙනවා.

- දැනට සමෘද්ධි ප්‍රතිලාභ ලබන පවුල් අතරින් 1,280,747ක් අස්වැසුම සඳහා අයදුම් කර තිබේ. ඉන් පවුල් 887,653ක් අස්වැසුම සඳහා සුදුසුකම් සපුරා ඇත. අයදුම් කළ පවුල් අතරින් සුදුසුකම් නොලැබූ, -සමෘද්ධිලාභී පවුල් අතරින් පළමු වටයේදී සුදුසුකම් නොලැබූ- පවුල් 393,094ක් වෙනුවෙන් විරෝධතා සහ අභියාචනා ක්‍රියාවලිය සම්පූර්ණයෙන් අවසන් වෙනතුරු සමෘද්ධි ප්‍රතිලාභ අඛණ්ඩව ගෙවීම පැරණි විධියටම සිදු කරන්න කටයුතු කර තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

- පවුල් ලක්ෂ 20ක් වෙනුවෙන් ප්‍රතිලාභ ලබා දීම අස්වැසුම සමාජ සුබසාධන වැඩසටහනේ ඉලක්කය වන අතර, අභියාචනා සහ විරෝධතා ක්‍රියාවලිය අවසන් වීමේදී එම ඉලක්කගත පවුල් ප්‍රමාණයට ප්‍රතිලාභ හිමිවෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රතිලාභ ගෙවීම් සඳහා ගිණුම් ලක්ෂ 13ක

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

පමණ තොරතුරු මේ වනවිට පද්ධතියට ලැබී ඇති අතර, නව ගිණුම් ආරම්භ කිරීමේ කටයුතු රාජ්‍ය බැංකු මඟින් කඩිනමින් සිදු කරමින් පවතී. දැනට වකුගඩු, ආබාධිත සහ වැඩිහිටි දීමනා ලබන අයගේ ප්‍රතිලාභ ගෙවීම නව ක්‍රමය සකස් කරනතුරු පවතින ආකාරයටම ඉදිරියට සිදු කරන අතර, වකුගඩු සහ ආබාධිත දීමනා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින්ද, වැඩිහිටි දීමනා තැපැල් කාර්යාල මඟින්ද ලබා දීම සිදු කෙරේ.

ඔවුන් සියලුදෙනාටම පෙර සේම ගෙවාගෙන යනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

- රැක බලා ගන්නා මධ්‍යස්ථානවල, ආගමික ස්ථානවල සිටින අඩු ආදායම්ලාභී, ආබාධිත හෝ වැඩිහිටි පුද්ගලයන් 11,660 සඳහාද නව ක්‍රමයක් සකස් කරනතුරු, අදාළ ප්‍රතිලාභ පැවති ආකාරයෙන්ම තවදුරටත් ගෙවීම සිදු කරනු ලැබේ.

බොහොම ස්තුතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම බොහොම පොඩි වේලාවක් ගන්නවා කරුණු කීපයක් කියන්න, අපේ ගරු මුදල් රාජ්‍ය අමාත්‍යතුමා මේ ගරු සභාවේ ඉන්න වෙලාවේ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා හොඳින්ම දන්නවා අපේ රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 50කට වැඩි ප්‍රමාණයකට සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් දායකත්වය ලබා දෙන බව. පරාටේ නීතිය නිසා අද ඒ අය අන්ත අසරණභාවයට පත් වෙලා සිටිනවා. දේපොළ වෙන්දේසිය හරහා දැන් ඒ අය සතු සම්පත් අහිමි වෙමින් යනවා.

ඒ වාගේම මම ඔබතුමාට කියන්න කැමතියි, වාහන seize කරන කණ්ඩායම් අත්තනෝමතික ආකාරයට කටයුතු කරන බව. රටේ නීතිය උල්ලංඝනය කරලා එහෙම seize කරන්න බැහැ, සීසර්ලාට එහෙම කටයුතු කරන්න බැහැ.

හැබැයි, යම් යම් අවස්ථාවල ආරක්ෂක අංශ සමඟ එකට එකතු වෙලා මේ කටයුත්ත කරනවා.

මම ඔබතුමාගෙන් මේ කාරණයත් අහන්න කැමැතියි. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තවලට තමුන්නාන්සේලා මේ පරාටේ නීතිය යම් කාලයකට -අපි කියන්නේ නැහැ සම්පූර්ණයෙන්ම අයින් කරන්න කියලා- අත්හිටුවන්න කටයුතු කරනවා ද, නැද්ද කියන එක ගැන උත්තරයක් දෙන්න. අනෙක් කාරණය තමයි, රජයක් හැටියට මේ seize කරන උදවිය සම්බන්ධයෙන් යම් ක්‍රියා මාර්ගයක් ගන්න. මොකද, සීසර්ලා නිසා දැන් ජීවිත ගණනාවක් අහිමිවෙලා තිබෙනවා. ඒ අය අනීතිකවයි මේක කරන්නේ. එය නතර කරන්න ඔබතුමන්ලා ගන්නා පියවර මොකක්ද?

ඒ වාගේම මම ඔබතුමාට කියන්න කැමැතියි, පරාටේ නීතිය ලිහිල් කරන්න කියලා ඊයේ මහ බැංකුව ඉදිරිපිට උද්ඝෝෂණයක නිරත වූ දහදෙනෙකු අත්අඩංගුවට පත් වුණු බව. රසිකා කෝරළගේ, සුසන්ත ලියනආරච්චි, සංජය මහවත්ත, අසංක පොතුපිටිය, මහේන්ද්‍ර පෙරේරා, චමින්ද ප්‍රියන්ත, නිමල් පරාක්‍රම, කාලිංග සිල්වා, එම්.එන්.එම්. ප්‍රනාන්දු, ජාමුනි සහ කාමන්ත තුෂාර කියන මේ ඔක්කෝම කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවෝ. ඒ අයට දැන් ඇප ලැබිලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි ඇත්ත වශයෙන්ම අධිකරණයට ස්තුතිවන්ත වෙනවා. මම අහන්න කැමැතියි, ඔබතුමන්ලා මේ seize කරන උදවිය සම්බන්ධයෙන් ගන්නා පියවර මොකක්ද කියලා.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ වාගේම මම මෙන්න මේ සම්බන්ධවත් ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඔබතුමා දන්නවා, ද ෆිනෑන්ස් ආයතනයේ තැන්පත්කරුවන් පිළිබඳව මම පාර්ලිමේන්තුවේදී ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබතුමාගෙන් ප්‍රශ්නයක් ඇසූ බව. විශේෂයෙන්ම එම ආයතනයේ තැන්පත්කරුවන් 6,400ක් ඉන්නවා. රුපියල් බිලියන 11.6ක තැන්පතු තිබෙනවා. ඒ වාගේම, ඒ ආයතනයේ බිලියන 5.5ක වත්කම් තිබෙනවා. විශේෂයෙන් 2019දී කරපු වත්කම් පිළිබඳ තක්සේරුව තුළ මේක සනාථ වෙලා තිබෙනවා. හැබැයි, විශේෂයෙන්ම අද වාගේ දවසක මේ වත්කම්වලට මීට වඩා විශාල අගයක් ලබා ගන්න පුළුවන්. ඒ නිසා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය ඇවර කළ පරිදි මේ ද ෆිනෑන්ස් ආයතනයත් ඇවර කරලා, තැන්පත්කරුවන්ගේ සම්පූර්ණ තැන්පතු සහ ගෙවිය යුතු පොලී මුදල ලබා දෙන්නට ඔබතුමන්ලා කටයුතු කරන්නේ නැද්ද කියලා. එහෙම නැත්නම්, විදේශ ආයෝජකයෙක් හෝ සම්බන්ධ කරගෙන මේ ආයතනය ආරක්ෂා කරගෙන ඉදිරියට ගෙන යන්නට ඔබතුමන්ලා කටයුතු කරනවා ද? මම මේ කාරණය මීට පෙර අවස්ථා ගණනාවකදීම අසා තිබෙනවා. මේකටත් උත්තරයක් ලබා දෙන්න කියලා බොහොම ගෞරවයෙන් මම ඉල්ලා සිටිනවා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායකතුමා ඇසුවේ ඉතාම කාලෝචිත ප්‍රශ්නයක්. නමුත්, ඒක ඉතාම හොඳින් සොයා බැලීමෙන් යුතුව පිළිතුරු දිය යුතු ප්‍රශ්නයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කිව්වා වාගේම ඊයේ දවසේ පැන නැඟුණු සිද්ධීන් සමඟ අමාත්‍යාංශ ප්‍රකාශනයක් ලෙස සිකුරාදා දවසේ මේ සම්බන්ධයෙන් පැහැදිලි පිළිතුරක් ලබා දෙන්න මම බලාපොරොත්තු වෙනවා. එතෙක් ඉතාම සරලව මම ඊට පිළිතුරක් ලබා දෙන්නම්.

පරාටේ නීතිය සකස් කර තිබෙන්නේ බැංකු පද්ධතියේ ආරක්ෂාවටයි. සාමාන්‍ය බැංකු පද්ධතිය දළ වශයෙන් බැලුවොත්, බැංකුවක මුළු වත්කම් ප්‍රමාණයෙන් සියයට 6ක් තමයි කොටස්කරුවන්ට හෝ රජයට තිබෙන්නේ. අනෙක් සියල්ලම විපක්ෂ නායකතුමනි, තැන්පතුකරුවන්ටයි අයිති. අපේ රටේ තැන්පතුකරුවන් පන්කෝටි හැත්තෑදෙලක්ෂයක් ඉන්නවා. ඒ ප්‍රමාණයෙන් හරි අඩකටත් වැඩි ප්‍රමාණයක් රුපියල් 1,000ටත් අඩු තැන්පතු තිබෙන කණ්ඩායමක්. බැංකුවක වත්කම්වල ආරක්ෂාව කියන්නේ අර අහිංසක තැන්පතුකරුවන්ගේ ආරක්ෂාව. පරාටේ නීතිය ගෙනාවේ මේ තත්ත්වය සඳහා. මොකද, මේ කියන තත්ත්වයත් එක්ක 2019දී සියයට 4ක තිබුණු අය නොවීමේ ණය ප්‍රතිශතය, දැන් සියයට 13ක තිබෙන්නේ. නමුත්, 2011 දී ගෙනා සංශෝධන තුළින් පරාටේ නීතිය ක්‍රියාත්මක වෙන්නේ ලක්ෂ 50ට වැඩි ණය සඳහා පමණමයි. ලක්ෂ 50ට අඩු ණය සඳහා පරාටේ නීතිය පාවිච්චි කරන්න බැහැ. පළමුවැනි කාරණාව එයයි. හැබැයි, ඒකෙන් අදහස් වෙන්නේ නැහැ, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ගේ තිබෙන අපහසුතාව කෙරෙහි රජය සැලකිලිමත් නැහැ කියලා. ඒ ගැන රජය සැලකිලිමත් වෙනවා. ඒ නිසා තමයි මහ බැංකුව 15 වතාවක් චක්‍රලේඛ නිකුත් කරමින් ඒ සඳහා දැඩි උත්සාහයක් අරන් තිබෙන්නේ. ඔවුන් බැංකුවලට උපදෙස් දීලා

තිබෙන්නේ සමස්ත වශයෙන් පොදු තීරණයක් ගන්න බැහැ කියලායි. නමුත්, සිද්ධියෙන් සිද්ධියට තීරණ ගන්න කියලා පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා වෙනම දෙපාර්තමේන්තුවකුත් ආරම්භ කර තිබෙනවා. ඒක එක පැත්තක්.

අනෙක් කාරණාව තමයි, වාහන වාගේ දේවල් ගෙන යෑම සිද්ධ වෙන්නේ පරාටේ නීතිය අනුව නොවෙයි. ඒ දේවල් සිද්ධ වෙන්නේ කල්බදු පහසුකම් පිළිබඳ නීතිය අනුවයි. එතැනදී නොයෙකුත් අකටයුතුකම් සිද්ධ වෙනවා කියා වාර්තා වෙනවා. ඒ පිළිබඳවත් මහ බැංකුවේ සුවිශේෂී අවධානය යොමු කරලා, ඔවුන් මේ නීති පද්ධතිය වෙනස් කිරීම සඳහා කටයුතු කරගෙන යනවා. ඊට අමතරව මේ ද මිනැන්ස් සමාගම පිළිබඳව හොඳ යෝජනා කිහිපයක් තැන්පතුකරුවන් විසින්ම දැනට ඉදිරිපත් කරලා තිබෙනවා. එම යෝජනා මේ වන විටත් මහ බැංකුවට යොමු කරලා තිබෙනවා. යම්කිසි සාධනීය තීන්දුවකට ඔවුන් ඒවි කියලා අපි බලාපොරොත්තු වෙනවා. කෙසේ වුවත්, සිකුරාදා දවසේ මේ පිළිබඳව ඉතා පැහැදිලි වාර්තාවක් ගරු විපක්ෂ නායකතුමාගේත් ඉල්ලීම පරිදි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා.

## වරප්‍රසාද යෝජනා
## சிறப்புரிமைப் பிரேரணைகள்
## PRIVILEGE MOTIONS

### 2023.07.02 දින "ඉරිදා මව්රට" පුවත් පත් වාර්තාව
2023.07.02ஆம் திகதிய "இரிதா மவ்ரட" பத்திரிகை அறிக்கை
NEWS REPORT IN "IRIDA MAWRATA" NEWSPAPER OF 02.07.2023

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2023 ජූලි 20 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රධාන වැඩ කටයුතු, ගරු සභානායකතුමා.

## ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත
## பந்தய, சூதாட்ட விதிப்பனவு (திருத்தம்) சட்டமூலம்
## BETTING AND GAMING LEVY (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන් "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ඊට අමතරව, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 2 සිට 7 දක්වා වන යෝජනා ද මා ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු අංගජන් රාමනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] took the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. State Minister, please commence your speech.

ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
මට කොපමණ කාලයක් තිබෙනවාද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
You have 34 minutes.

[අ.භා. 1.30]

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සඳහා අද දින සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේක 2023 අය වැය යෝජනාවක්; අංක 5.1 යෝජනාව අනුව ගෙනාපු සංශෝධනයක්. පළමුවන සංශෝධනය, 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත යටතේ බලපත්‍රයක් ලබා ගන්නා නව කැසිනෝ ව්‍යාපාර සඳහා ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත යටතේ පනවා ඇති බදු ගෙවීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වීම සම්බන්ධයෙන්-

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Member, what is the point of Order?

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතා කනගාටුවෙන් වුවත් පෙන්වා දෙන්න සිදු වෙනවා, විවාදය පවත්වාගෙන යාම සඳහා සභාවේ ගණපූරණය නැති බව. අපි ඊයේ කිව්වා, අපි මේ කාරණය මතු කරනවාය කියලා. මොකද, අපට ලොකු අසාධාරණයක් කරලා තමයි මේ පාර්ලිමේන්තුව පවත්වාගෙන යන්නේ. ඒ නිසා අපට Parliamentary Business Committee එකේ නියෝජනය ලබා දෙනකල් අපි මේ කාරණය මතු කරන බව කිව්වා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාවේ ගණපූරණය නැහැ. ඒ අනුව සභාවේ කටයුතු පවත්වාගෙන යන්න බැහැ.

***පාර්ලිමේන්තුව ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණයක් තිබුණෙන්-***

*பாராளுமன்றம் கணக்கிடப்பட்டு, கூட்ட நடப்பெண் இல்லை யெனக் கண்டதனால், பிரிவு மணி அடிக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*பிறகு, கூட்ட நடப்பெண் இருந்ததனால் -*

*Parliament counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*
*Later, a Quorum being present-*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. State Minister, please continue.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කථා කරමින් සිටියේ 2023 අය වැය යෝජනාවක් අනුව 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතට සංශෝධන ඉදිරිපත් කිරීම සම්බන්ධවයි. අපේ රටේ සූදු බදු සඳහා පනත් කිහිපයක් ගෙනැල්ලා තිබෙනවා. 1988දී ගෙනාපු පනත තිබෙනවා. ඊට පෙර 1889දී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ කාලයේදී ගෙනාපු පනත බොහොම පැරණි පනතක්. ඊට පසුව 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත ගෙනැවිත් තිබෙනවා. එම පනතට 2013දී ගෙනාපු සංශෝධනයක් අනුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කැසිනෝ සඳහා ලියාපදිංචි වෙන අයට මාස 5ක කාලයක් දුන්නා, 2013 ජනවාරි පළමුවැනි දා සිට මැයි අවසානය දක්වා. ඒ කාල සීමාව තුළ සමාගම්, නැත්නම් ආයතන 4කට පමණයි ලියාපදිංචි වෙන්න ලැබුණේ. ඉන් පසුව කිසිම කෙනෙකුට නැවත නීත්‍යනුකූලව ඒ සඳහා ලියාපදිංචි වෙන්න ලැබුණේ නැහැ. අන්න ඒ ඒකාධිකාරය අපි මේ සංශෝධන තුළින් වෙනස් කරනවා. ඒකෙන් අදහස් කරන්නේ නැහැ, රට පුරා කැසිනෝ ව්‍යාපාරය ව්‍යාප්ත කරනවාය කියලා. නමුත් අර තිබුණු ඒකාධිකාරය මින් ඉදිරියට නැහැ. යම් කෙනෙක් නීත්‍යනුකූලව, අපේ සාරධර්මවලට ගැළපෙන පරිදි එයට ඉදිරිපත් වෙනවා නම්, ඔහුට අවස්ථාවක් තිබෙනවා. සංචාරක කර්මාන්තය සඳහා වෙන්න පුළුවන්, විදේශීය ආයෝජකයෙක් වෙන්න පුළුවන් අවස්ථාවක් තිබෙනවා. නීතිය තුළ අර තිබුණු සීමාව, නැත්නම් ඒකාධිකාරය අපි ඉවත් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

දෙවැනි කාරණය තමයි, 2023 අප්‍රේල් 01වැනි දින සිට බල පැවැත්වෙන පරිදි පිරිවැටුම මත දළ එකතු කිරීම් බද්ද සියයට 10 සිට සියයට 15 දක්වා වැඩි කිරීම. මෙතෙක් සිදු වුණේ කැසිනෝශාලාවක ආදායමෙන් පිරිවැටුම - turnover එක - මත දළ එකතු කිරීම් බද්ද සියයට 10ක් අය කිරීමයි. අප දැන් එය සියයට 15ක් බවට පත් කරනවා.

තුන්වැනි කාරණය තමයි, 2023 අප්‍රේල් මස 01වැනි දින සිට බල පැවැත්වෙන පරිදි එවැනි සූදු ව්‍යාපාරික ස්ථානයකට ඇතුළු වන හැම ශ්‍රී ලාංකිකයෙකුගෙන්ම ඩොලර් 50ක අය කිරීම. මේක 2015 ඉඳන් තිබුණු නීතියක්. 2015 ඉඳන් කියා තිබුණා, ඒ සඳහා ඩොලර් 100ක් අය කරනවා කියලා. හැබැයි මේ අවුරුදු 8ටම තවම ශතයක්වත් අය වෙලා නැහැ. අපි මේ අවුරුද්දේ තමයි ඒ අය කිරීම ආරම්භ කළේ. අපට දැනට - අප්‍රේල් මාසයේ 01වැනි දායින් පසුව - ඒ තුළින් රුපියල් කෝටි 20ක් විතර අය කරගන්න පුළුවන්කම ලැබී තිබෙනවා. ශ්‍රී ලාංකිකයෙකු කැසිනෝශාලාවකට ඇතුළු වනවා නම්, ඒ ඇතුළු වන හැම වාරයක් වෙනුවෙන්ම ඔහු ඩොලර් 50ක් ගෙවන්න අවශ්‍යයි. කෙනෙකුට අහන්න පුළුවන්, 2015දී එය ඩොලර් 100ක් ලෙස තිබුණා නේද කියලා. ඔව්, ඒ කාලයේ එම ප්‍රමාණය ඩොලර් 100ක්ව තිබුණා තමයි. හැබැයි එය අය කර තිබුණේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි දැන් ඒ අයකිරීම ඩොලර් 50කින් පටන් ගෙන රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ලිඛිත වැඩසටහනක් ලබා දුන්නා, වර්ෂ තුනක් තුළ මේ ප්‍රමාණය ඩොලර් 200ක් දක්වා ඉහළට ගෙන යනවා කියලා. ඩොලර් 200ක් කියන්නේ ඩොලරය සහ රුපියල අතර අද මිලත් එක්ක ගත්තාම, රුපියල් 60,000ක මුදලක්. ඒකෙන් අප බලාපොරොත්තු වන්නේ යම්කිසි කාල සීමාවක් තුළ කැසිනෝ ක්‍රීඩාව සඳහා ශ්‍රී ලාංකිකයන් සහභාගි වීම අවම කිරීම හෝ නතර කිරීමයි. රුපියල් 60,000ක් නියම කිරීම හරහා කැසිනෝශාලාවකට ඇතුළු වීම බෙහෙවින් අධෛර්යය කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. මම සංඛ්‍යාලේඛන ගත්තා, කැසිනෝශාලාවලට සහභාගි වීම පිළිබඳව. මේ අවුරුද්දේ පෙබරවාරි, මාර්තු, අප්‍රේල්, මැයි සටහන ගත්තොත්, 9,037දෙනෙක් ඒ මාස හතර තුළ කැසිනෝ ක්‍රීඩා සඳහා සහභාගි වෙලා තිබෙනවා. ඒ අතරින් 5,381ක් -සියයට 60කට ආසන්න ප්‍රමාණයක්- සහභාගි වෙලා තිබෙන්නේ විදේශිකයන්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපේ ඉලක්කය තමයි, කැසිනෝශාලාවලට ඇතුළු වීම සඳහා ආරම්භයක් හැටියට අය

කරන ඩොලර් 50ක මුදල ඩොලර් 200ක් දක්වා වැඩි කිරීම. මේ ඩොලර් 50ක මුදල අප්‍රේල් 01වන දා ඉඳන් අය වෙනවා. මේ ප්‍රමාණය ඩොලර් 200 දක්වා වැඩි කළොත් අපි බලාපොරොත්තු වෙනවා, සියයට 60ක් වූ විදේශිකයන්ගේ සහභාගිත්වය අඩු ගණනේ සියයට 90ක්, 95ක් දක්වා ඉහළ ගිහින් ශ්‍රී ලාංකිකයන්ගේ සහභාගිත්වය ඉතා අවම වෙයි කියලා. මේ තුන්වැනි සංශෝධනයෙන් අපි එය බලාපොරොත්තු වෙනවා.

ඊළඟට, හතරවැනි කාරණය. 2023 අප්‍රේල් 01වන දා හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහාම සූදු ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන පුද්ගලයෙකු විසින් ගෙවිය යුතු වාර්ෂික බද්ද මෙතෙක් කල් තිබුණේ රුපියල් මිලියන 200යි. අපි ඒක රුපියල් මිලියන 500 දක්වා වැඩි කළා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ කියන්නේ රුපියල් කෝටි 20 රුපියල් කෝටි 50 දක්වා වැඩි කළා. ඒක දැන් අය කරලාත් ඉවරයි. අප්‍රේල් 01වන දා ඉඳන්ම අපි ඒ මුදල අය කිරීමට පටන් ගත්තා.

පස්වැනි කාරණය තමයි, 2023 අප්‍රේල් 01වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වසරක් සඳහාම බුකී ව්‍යාපාරය කරගෙන යන පුද්ගලයන් විසින් ගෙවිය යුතු වාර්ෂික බද්ද වැඩි කිරීම. මෙය, කැසිනෝවලට අය කරන බද්දට අමතරවයි. නියෝජිතයෙකු හරහා කරන මේ සූදුව වෙනුවෙන් රුපියල් මිලියන 4ක් අය වුණා. අපි ඒක රුපියල් මිලියන 5ක් බවට පත් කරනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is the point of Order?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වෙලාවේ සභාවේ ගණපූරණය නැහැ. මේක ඉතා කනගාටුදායක තත්ත්වයක්. ගණපූරණය සම්පූර්ණ වීමට මන්ත්‍රීවරු 20දෙනායි ඉන්න ඕනෑ; මන්ත්‍රීවරු 225දෙනාගෙන් මන්ත්‍රීවරු 20දෙනකු පමණයි ඉන්න ඕනෑ. ඉතින් මේ වෙලාවේ සභාවේ ගණපූරණය නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා ඔබතුමා බෙදුම් සීනු නාද කරවන්න.

***පාර්ලිමේන්තුව ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණයක් තිබුණෙන්-***

*பாராளுமன்றம் கணக்கிடப்பட்டு, கூட்ட நடப்பெண் இல்லையெனக் கண்டதனால், பிரிவு மணி அடிக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*பிறகு, கூட்ட நடப்பெண் இருந்ததனால் -*

*Parliament counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*
*Later, a Quorum being present -*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Leader of the House.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟ Parliamentary Business Committee එකේදී, ඉදිරියේදී සභාවාර පවතින හැම දිනයකදීම මන්ත්‍රීවරුන්ට දිවා ආහාරය ගැනීම සඳහා වන පැය භාගයක කාලය අනිවාර්යයෙන් වෙන් කරනවා. ඒ වාගේම සවස 5.30ට සභාවේ කටයුතු අවසන් කරනවා. අතිරේක කාලයක් දෙන්නේ නැහැ. එහෙම කළේ නැත්නම් ගරු මන්ත්‍රීවරුන්ට කෑම ගන්න විධියක් නැහැ නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. State Minister, please continue with your speech.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කැසිනෝ ව්‍යාපාරවලට අමතරව අප ගෙනාපු සංශෝධනයක් තුළින් නියෝජිතයන් හරහා කරගෙන යන බුකී ව්‍යාපාරවලින් රුපියල් මිලියන 4ක වාර්ෂික බද්දක් අය කළා. අපි එය රුපියල් මිලියන 5ක් දක්වා වැඩි කර තිබෙනවා. සජීවී විකාශන පහසුකම් භාවිතයෙන් එම කටයුත්ත කරන අයගෙන් රුපියල් ලක්ෂ 6ක වාර්ෂික බද්දක් අය කළා. එය රුපියල් ලක්ෂ 10ක් දක්වා වැඩි කර තිබෙනවා. සජීවී විකාශන පහසුකම් නොමැති අයගෙන් රුපියල් 50,000ක් අය කළා. ඒක රුපියල් 75,000ක් දක්වා වැඩි කර තිබෙනවා.

අංක 6 යටතේ අපි, මාර්ගගත ක්‍රියාකාරකම්වලට ඇතුළත් කිරීම සඳහා "බුකීකරු" සහ "සූදු" ආදී යෙදුම්වලට නැවත අර්ථ ගැන්වීම් සිදු කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ සමහර වචන බොහොම පැරණි සහ විශේෂයෙන්ම online ක්‍රමවලට නොගැළපෙන තත්ත්වයක තිබුණා. ඒ නිසා ඒවා යාවත්කාලීන කරගැනීමක් ද මේ සංශෝධන තුළින් අපි බලාපොරොත්තු වෙනවා.

දැනට බලාත්මකව පවතින අනෙකුත් පනත් වෙත යොමු කිරීම සඳහා ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ අදාළ වගන්ති ද, සමහර පනත් සමඟ ගැළපීමට අවශ්‍ය වගන්ති ද අපි මේ සංශෝධනය තුළින් ගෙනැල්ලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. හුඟක් අය කැසිනෝ වාගේ ව්‍යාපාරවල බදු පිළිබඳව හොඳින් සොයා බලනවා. ඒවා ගැන සොයා බැලිය යුතුයි. මොකද, මේ වෙලාව, රට තුළ විශේෂ බදු සංශෝධනයක් ක්‍රියාත්මක වන වෙලාවක්. ඒ වාගේම, මේ සංශෝධනවලට අමතරව, කැසිනෝ වාගේ ව්‍යාපාරවලින් ඉහළම බදු අනුපාතයක් ලබා ගන්න අපි තවත් ක්‍රම කිහිපයක් අනුගමනය කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉහත කී බද්දට අමතරව කැසිනෝ ව්‍යාපාරයක ලාභයෙන් සියයට 40ක ආදායම් බද්දක් අපි ලබා ගන්නවා. ඊටත් අමතරව, යම් අයෙකු ලක්ෂ 5කට වඩා වැඩි මුදලක් ජයග්‍රහණය කර තිබෙනවා නම් සියයට 14ක රඳවා ගැනීමේ බද්දකුත් අපි ලබා ගන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බොහෝ අය අහන දෙයක් තමයි, මේ කියන බදු අයකර ගැනීමට හරියාකාර

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

නියාමනයක් අවශ්‍යයි නේද කියන ප්‍රශ්නය. ඇත්ත වශයෙන්ම ඔව්. දඩ ආදිය සම්බන්ධයෙන් අපට තිබෙන්නේ 1889දී -බ්‍රිතාන්‍ය යුගයේදී- කුකුළන් කෙටවීමේ සූදුව සඳහා හඳපු පරණ දඩ ක්‍රමයක්. ඒක රුපියල් 100ක් වාගේ දඩයක්. ඒ නිසා අපි මේ වසර තුළ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව සමඟ එකඟ වෙලා, ඔවුන්ට කරුණු පෙන්වා දීලා මේ සියල්ල ආවරණය වන පරිදි දියුණු රටවල තිබෙන ආකාරයේ නියාමන පනත් කෙටුම්පතක් ගෙනෙන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම කැසිනෝශාලාවකට ඇතුළු වන කෙනෙකුගෙන් ආරම්භයේදී ඩොලර් 50ක මුදලක් අයකර ගන්නත් බලාපොරොත්තු වෙනවා. ඒවාට ඇතුළු වන පිරිස නිවැරැදිව හඳුනා ගන්නේ කොහොමද කියන කාරණාවත් ඒ නියාමන පනත් කෙටුම්පත තුළින් ඉදිරිපත් කරන්නට අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද විවිධාකාර සූදු බිහි වෙලා තිබෙනවා. උදාහරණයක් ගනිමු. නීත්‍යනුකූලව ලොතරැයි පවත්වාගෙන යන රජයේ ආයතන වන ජාතික ලොතරැයි මණ්ඩලයේ සහ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ටිකට් පත්වල අංක භාවිත කරමින් නීත්‍යනුකූල නොවන අතුරු සූදු ආදිය අද හැම තැනකම වාගේ බිහි වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒවා නීත්‍යනුකූල නැහැ. ඒවාට වගකීමක් නැහැ. රජය ඒවායෙන් බදු මුදලක් අය කරන්නේ නැහැ. ඒ සියල්ල දැනට තිබෙන නීති පද්ධතිය තුළින් ආවරණය කර ගැනීමේ අපහසුවක් අපට තිබෙනවා. ඒ නිසා අප අලුතින් ගෙනෙන්න බලාපොරොත්තු වන සූදු හා ඔට්ටු බදු නියාමන පනත් කෙටුම්පත තුළින් මේ රට තුළ නීත්‍යනුකූල නොවන විධියට කෙරෙන සියලු ඔට්ටු ඇල්ලීම් සහ සූදු නියාමනය කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒවා සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන දඩ සහ දණ්ඩන යාවත්කාලීන කිරීමට සහ ඒවා නීති විරෝධී දේවල් විධියට හඳුනා ගැනීමට අවශ්‍ය නීති රීති ගෙනෙන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊට අමතරව අද දවසේ කථා වුණු තවත් ඉතා වැදගත් කරුණක් තමයි 2022 අංක 43 දරන විසර්ජන පනතට ගෙනැවිත් තිබෙන සංශෝධන. මෙම විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත මගින් ණය ගැනීමේ සීමාව රුපියල් බිලියන 9,000කින් වැඩි වෙනවා. ඊට සාපේක්ෂව වියදම් සීමාවත් වැඩි කර තිබෙනවා. ණය ගැනීමේ සීමාව රුපියල් බිලියන 9,000කින් වැඩි කරනවා කිව්වාම කෙනෙකු හිතන්න පුළුවන්, ඒක විශාල ප්‍රචාරයක් ලබා දිය හැකි කාරණාවක් වෙන්න පුළුවන් කියලා.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is the point of Order?

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බෙදුම් සීනුව නාද කළත් ගරු සභාවේ ගණපූරණයක් නැහැ. ඇත්තටම අපි ඊයේ ප්‍රකාශයට පත් කළා, මේ පාර්ලිමේන්තුවේ කටයුතු සම්බන්ධයෙන් මැදිහත් වෙන්න අපට සාධාරණ නියෝජනයක් දෙන්න කියලා. අපව එම කමිටු සඳහා කැඳවීම කරන්නේ නැත්නම්, ගරු සභාවේ ගණපූරණය තියාගන්න ආණ්ඩු පක්ෂය බලා ගන්න ඕනෑ. අපි ඉල්ලන්නේ සාධාරණ ඉල්ලීමක්. පාර්ලිමේන්තුවේ කටයුතු සඳහා මැදිහත් වීමට අපටත් නියෝජනයක් දෙන්න. ඒකට විපක්ෂ නායකතුමාත් එකඟ වුණා, සභානායකතුමාත් එකඟ වුණා. හැබැයි, ක්‍රියාත්මක කරන්නේ නැහැ. කරුණාකරලා ඒ අවස්ථාව අපට ලබා දෙන්න. එහෙම නැත්නම් ඔබතුමන්ලා ගරු සභාවේ ගණපූරණය තබා ගැනීමට කටයුතු කරන්න.

***පාර්ලිමේන්තුව ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණයක් තිබුණෙන්-***

*பாராளுமன்றம் கணக்கிடப்பட்டு, கூட்ட நடப்பெண் இல்லை யெனக் கண்டதனால், பிரிவு மணி அடிக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*பிறகு, கூட்ட நடப்பெண் இருந்ததனால் -*

*Parliament counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*
*Later, a Quorum being present -*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Members, because of the delay that occurred earlier, some of the Opposition Members have only two minutes to speak. So, let us not delay this further.

Hon. Minister, please continue with your speech.

**ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera- Minister of Agriculture)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Mahinda Amaraweera?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන දිනවලම තමයි උපදේශක කාරක සභා රැස්වීම් පැවැත්වෙන්නේ. අපට ඒ කාරක සභාවලට සහභාගි වෙන්න සිදු වෙනවා. මන්ත්‍රීවරුන්ට එම කමිටුවලට සහභාගි වෙලා කටයුතු කරන්න තිබෙන අවස්ථාව තමයි මේ නැති වෙන්නේ. නිතර නිතර Quorum එක ගැන ප්‍රශ්නය මතු කරලා මේ කරන්නේ විකාරයක්. ගරු මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවේ කටයුතුවලට අවශ්‍ය තැන්වලදි සහභාගි වෙනවා. පාර්ලිමේන්තුව ඇතුළේ මන්ත්‍රීවරු සියලුදෙනාම වාගේ ඉන්නවා. මන්ත්‍රීවරුන් ගරු සභාව තුළ ඉන්න ඕනෑ බව ඇත්ත. අපි එය දන්නවා. නමුත්, මේ පාර්ලිමේන්තු භූමිය තුළ මන්ත්‍රීවරුන් ඉන්නවා. එතුමන්ලාට එම කාරක සභාවලට සහභාගීවීමට අවස්ථාව දෙන්න. මේ කරන්නේ අපරාධයක්. මේක විහිළුවක් කර ගන්න එපා. ගරු මන්ත්‍රීවරුන්ට කථා කරන්න තිබෙන වෙලාව තමයි මේ නැති වෙන්නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මන්ත්‍රීවරුන් 13දෙනෙකුගෙන් යුත් වෙනම ස්වාධීන කණ්ඩායමක් වශයෙන් සිටින අපට Parliamentary Business Committee එකේ කිසිම

නියෝජනයක් ලැබී නැහැ කියන එක අපි ඊයේත් මේ පාර්ලිමේන්තුවේ දී කිව්වා. විපක්ෂ නායකතුමාත්, සභානායකතුමාත් දෙදෙනාම එකඟ වුණා, ඒ අවස්ථාව අපට දිය යුතුයි කියලා. අපට ඒ අවස්ථාව දෙනවා කිව්වා. නමුත්, මේ දක්වා අපට ඒ අවස්ථාව ලැබිලා නැහැ. ඒ ගැන අපේ විරුද්ධත්වය පළ කරන සාමකාමී ක්‍රමයක් තමයි මේ. ගරු සභාවේ ගණපූරණය තියා ගන්න එක ආණ්ඩු පක්ෂයේ වගකීමක්. කාරක සභා පැවැත්වෙන්න පුළුවන්. මොනවා තිබුණත්, ගරු සභාවේ ගණපූරණය තියා ගන්න එක ආණ්ඩු පක්ෂයේ වගකීමක්. අපට සිදු වී තිබෙන අසාධාරණය නිවැරදි කරන්නේ කවදා ද, එතැන් සිට අපි මේ ගණපූරණ ප්‍රශ්නය මතු කරන්නේ නැහැ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තුවේ ගණපූරණය තියා ගැනීම ගැන ආණ්ඩු පක්ෂයට විතරක් නොවෙයි, විපක්ෂයටත් යම් වගකීමක් තිබෙනවා. සියලු දෙනාටම ඒ වගකීම තිබෙන බව ඇත්ත. නමුත්, පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන දිනවල උපදේශක කාරක සභා විශාල ප්‍රමාණයක් පැවැත්වෙනවා. ඒවායේ කථා කරන්නේ ජනතාවගේ ප්‍රශ්න. ජනතාවගේ ප්‍රශ්නවලට තමයි එතැනින් විසඳුම් දෙන්නේ. ඒ වාගේ අවස්ථා පැහැර හරින්නේ නැතුව කටයුතු කිරීමේ වගකීම මහජන නියෝජිතයන් විධියට අපි හැමෝටම තිබෙනවා. එක එක්කෙනාට පෞද්ගලික ප්‍රශ්න ඇති. විපක්ෂයේ ඉන්න කණ්ඩායම්වලට ප්‍රශ්න තිබෙනවා නම් විපක්ෂ නායක හරහා ඒවා බේරා ගන්න ඕනෑ. අපි කියන්නේ ඒකයි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Let us not make this a debate, Hon. Minister.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Mahindananda Aluthgamage?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, - *[බාධා කිරීම්]* ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, මට තත්පරයක් දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි දැන් එළියේ attendance list එක බැලුවාම, මේ වනකොට ගරු මන්ත්‍රීවරුන් 72ක් පාර්ලිමේන්තුවේ ඉන්නවා. හැබැයි, මෙතැනින් එළියට පණිවුඩය යන්නේ සභා ගර්භය තුළ මන්ත්‍රීවරුන් දහ දෙනෙක්වත් නැහැ කියලා. ඒ යන පණිවුඩය එච්චරම හොඳ නැහැ. මොකද, පාර්ලිමේන්තුවේ කාරක සභා විශාල සංඛ්‍යාවක් පැවැත්වෙනවා. ඒ නිසා හැම කෙනාම Chamber එකේ ඉන්නේ නැහැ. මොකද, මේ අවස්ථාවේ විවිධ කාරක සභා ගණනාවක් පැවැත්වෙනවා. මන්ත්‍රීවරුන් 72ක් එම කමිටුවලට සහභාගි වෙනවා.

විමල් වීරවංශ මන්ත්‍රීතුමන්ලාට අසාධාරණයක් වෙලා තිබෙනවා තමයි. ඒකට සාධාරණයක් කෙරෙන්න ඕනෑ. හැබැයි, මේ යන පණිවුඩය හොඳ නැහැ. මොකද, මේ අවස්ථාවේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 72ක් ඉන්නවා. නමුත් මන්ත්‍රීවරුන් දහ දෙනෙකුවත් සභා ගර්භයේ නැහැ කියන පණිවුඩයයි යන්නේ. මේ පිළිබඳව මූලාසනයේ අවධානය යොමු කරලා, මේකට මොකක් හරි විකල්පයක් ගෙනෙන්න. අඩු ගණනේ මේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම හෝ කරන්න. පාර්ලිමේන්තුව ඇතුළේ ඉන්න අය ගැන හිතලා හරි මේ ගැන යම් තීරණයක් ගන්න. නැත්නම් මේක හොඳ නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, please continue with your speech.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කථාවේ නතර කළ තැනත් මට මතක නැහැ. අද රාජ්‍ය ආදායම පිළිබඳව වූ වැදගත් විවාදයක් පැවැත්වෙන්නේ. Parliamentary Business Committee එකේදී විසඳාගත යුතු වූ ප්‍රශ්නයක් පිළිබඳව මෙවැනි තත්ත්වයක් උද්ගතවීම පිළිබඳව අපි සියලුදෙනා කනගාටු විය යුතුයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මොකද, මෙය ඉතා වැදගත් විවාදයක්. පාර්ලිමේන්තු සභා ගර්භය තුළ සිදු කළ යුතු වැදගත්ම කාර්යය තමයි, විවාදය හරියට පවත්වාගෙන යෑම. මම ඒ ගැන ඊට වඩා කියන්න යන්නේ නැහැ.

අපි අද දිනයේ විසර්ජන පනත් කෙටුම්පතටත් සංශෝධන කිහිපයක් ගෙනැවිත් තිබෙනවා, රුපියල් බිලියන 9,000කින් ණය සීමාව වැඩි කර ගැනීම සහ රුපියල් බිලියන 9,000කින් වියදම් සීමාව වැඩි කර ගැනීම සඳහා. ඒ අනුව, 2022 අංක 43 දරන විසර්ජන පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ රුපියල් බිලියන 4,979ක්වූ ණය ගැනීමේ සීමාව රුපියල් බිලියන 13,979 දක්වා වැඩි කිරීම මඟින් රුපියල් බිලියන 9,000ක් ලෙස නැවත ණය නිකුත් කිරීම සඳහා ණය සීමාව සංශෝධනය කර කර තිබෙනවා. අනෙක් පැත්තෙන්, පනතේ 2(4) උපවගන්තිය හා දෙවන උපලේඛනය සංශෝධනය කිරීම මඟින් ණය ආපසු ගෙවීම, වියදම් සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට අවශ්‍ය ප්‍රතිපාදන සලසා දීමක් ලෙස රුපියල් බිලියන 4,222.23 සිට රුපියල් බිලියන 13,222.23ක් වූ වියදම් සීමාව වැඩි කිරීමක් සිදු කර තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම ලබා ගැනීමට අදාළ වැඩසටහන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ දේශීය ණය ප්‍රතිව්‍යුහත කිරීමේ ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් සැලසීම වෙනුවෙන් සිදු කරන තාක්ෂණික ක්‍රියාවලියක් පමණයි, මේක. පොතේ ගණන් සකස් කිරීමක් පමණයි මෙහි සිදු වෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අපි ඉතා සරල භාෂාවෙන් කිව්වොත් කෙටි කාලීන ණය, දිගු කාලීන ණය බවට පත් කරනවා. ඒ නිසා කෙටි කාලීන ණය ටික මේ අවුරුද්දේ නිදහස් කිරීමක් සිද්ධ වෙනවා. අන්න ඒ නිදහස් කිරීම නව වියදමක් හැටියට අපි දකින නිසා, එය වියදමක් හැටියට අපේ පොත්වලට ඇතුළත් කළ යුතුයි. ඒක නැවත වතාවක් දීර්ඝ කාලීන ණය බවට පරිවර්තනය වීම නව ණය නිකුත් කිරීමක් ලෙස අපි පොත්වල සටහන් කරගත යුතුයි. යම් කෙනෙකු කියන්න පුළුවන්, නැවතත් බිලියන 9,000ක් ණය ගත්තා කියලා. කිසිසේත්ම නැහැ. වියදම් සහ ණය ගැනීම් සීමාව වෙනස් කිරීම සම්බන්ධයෙන් පොතේ සටහනක් දැමීම පමණයි සිදු කරන්නේ කියන එක ඉතාම වගකීමෙන් මම ඔබතුමාට ප්‍රකාශ කරන්න කැමැතියි. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවත් ඒ ගැන ඉතා පැහැදිලි ප්‍රකාශයක් කළා. ඒ ගැනත් අපි ස්තුතිවන්ත වෙනවා.

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

අද අපි කථා කළේ රාජ්‍ය ආදායම පිළිබඳවයි. අපට එය වැදගත්. අපි මේ අවුරුද්දේ පළමුවෙනි මාස හය බැලුවොත්, පසුගිය වර්ෂයේ -2022- පළමුවෙනි මාස හයට සාපේක්ෂව අපේ රාජ්‍ය ආදායම සියයට 38කට වැඩි ප්‍රමාණයකින් වර්ධනය කරගෙන තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ නිසා කෙනෙකු අහන්න පුළුවන්, "දැන් මුදල් තිබෙනවා නේද?" කියලා. නැහැ, සියයට 38කින් ආදායම වර්ධනය වෙනකොට සියයට 48කින් අපේ වියදම වර්ධනය වෙලා තිබෙනවා, ණය පොලී, සහනාධාර, සෞඛ්‍ය ගෙවීම්, රාජ්‍ය ආයතනවල බිල්පත් ආදියෙන්. ඒකෙන් අදහස් වෙන්නේ නැහැ, අනවශ්‍ය වියදම් කියලා. නමුත්, ඒක තමයි තත්ත්වය. මෙන්න, මේ අභියෝගයත් එක්ක ඉස්සරහට යෑමේදී අපි අපේ රාජ්‍ය ආදායම තවදුරටත් වැඩි කරගන්න ඕනෑ. පුරවැසියන්ට බදු බර වැඩි කිරීමක් නොවෙයි, තිබෙන බදු හරියාකාරව යාවත්කාලීන කර ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම අපේ ඇහැ යොමු විය යුතු ව්‍යාපෘති හැටියට කැසිනෝ වාගේ ව්‍යාපෘති අපි දකිනවා. එවැනි ව්‍යාපෘති මඟින් සමාජයේ ධෛර්යවත් නොකළ යුතු අංශ කෙරෙහි උපරිම බදු බරක් අපි ලබා දිය යුතුයි. අද අපි අලුතින් හඳුන්වා දුන් බදුත් එක්ක කැසිනෝ ව්‍යාපාරයකින් ඔවුන්ට ලැබෙන මුළු පිරිවැටුමෙන් සියයට 60-65 අතර ප්‍රමාණයක් රජයට ලබා ගැනීම තමයි අපේ අරමුණ. ඒක ඉතා ඉහළ බදු අනුපාතයක්, මුළු ආදායමින් සියයට 65ක් රජයට ලබා ගැනීම. එවැනි ස්ථාවරයක ඉඳගෙන තමයි අපි මේ රටේ රාජ්‍ය ආදායම කළමනාකරණය කරන්නේ කියන එකත් ගරු සභාවට පෙන්වා දෙන්න මම කැමැතියි. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Dilip Wedaarachchi. You have nine minutes.

[අ.භා. 1.52]

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට වෙන් කර තිබූ කාලය කපා හැරපු නිසා සුළු වෙලාවයි ඉතිරිව තිබෙන්නේ. ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ ඉදිරිපත් කර තිබෙන පළමුවෙනි නියෝගයට අදාළව, අංක 2310/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් වෙනවා, යාන්ත්‍රික ධීවර බෝට්ටු සඳහා පිටත් වීමේ සහ පැමිණීමේ අවසර පත්‍රය ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂවරයාගෙන් ලබා ගන්න ඕනෑ කියලා. ගරු අමාත්‍යතුමා, මේක බහුදින යාත්‍රාවලට පමණක් සීමා කරන්න. පොඩි බෝට්ටු, පිටතින් එන්ජින් සවි කරපු බෝට්ටු මේ නීතියට ඇතුළත් කරන්න එපා. මොකද, කිලෝමීටර 4, 5යි ඒ අය රැකියාව සඳහා යන්නේ. එවාට VMS වාගේ ඉලෙක්ට්‍රොනික උපාංග සවි කළොත් ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා. ලාම්පු තෙල් මිල වැඩි වීම නිසා අහිංසක මිනිස්සුන්ට ධීවර කර්මාන්තය කර ගන්න බැරිව සිටින වෙලාවේදී නොයෙක් නියෝග ඇතුළු කරලා, ඒවා ක්‍රියාත්මක කරනකොට මේ කර්මාන්තය එහෙමම කඩාගෙන වැටෙනවා. ඒ ගැන මම වැඩිය කථා කරන්නේ නැහැ. එම නියෝග අයින් කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

අද ලංකාවේ බහුදින ධීවර යාත්‍රා 5,792ක් රැකියාව කරනවා. ඒ 5,792න් 3,000කට වැඩිය ඩීසල් මිල වැඩි වුණු නිසා ධීවර කර්මාන්තය කරගන්න විධියක් නැතුව අද ගැට ගහලා තිබෙනවා. ඒකයි මාළු මිල මෙච්චර වැඩි වෙලා තිබෙන්නේ. ඒ ගැන පිළිවෙළක් ඇතිව කථා කරන්න අපට විනාඩි 15ක්, 20ක් තිබුණා. අද මේ ප්‍රශ්න නිසා අපේ වෙලාව නැති කරලා තිබෙනවා. මේ අය පාර්ලිමේන්තුවට එනවාට වැඩිය හොඳයි ගෙදරට වෙලා ඉන්න එක. අපට ධීවර ක්ෂේත්‍රය ගැන කිසි දෙයක් කථා කරන්න වෙලාව නැහැ නේ.

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)
ඔබතුමා කාලය ඉල්ලා ගන්න.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මොකක්ද කිව්වේ? *[බාධා කිරීම්]* කට වහගෙන ඉන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ඩීසල් ප්‍රශ්නය සහ ලාම්පු තෙල් ප්‍රශ්නය ගැන මම අද ජනාධිපතිතුමා එක්ක සාකච්ඡා කළා. ඩීසල් හා ලාම්පු තෙල් ලීටරය රුපියල් 200කට ලබා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ජනාධිපතිතුමා තීරණය කරන බව කිව්වා. පාර්ලිමේන්තුවේදී අද කථා කරන යෝජනාව නැවත සකස් කරලා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්න කියලා ධීවර ඇමතිතුමාට උපදෙස් දෙනවා කියලාත් කිව්වා. ගරු ඇමතිතුමනි, ඔබතුමාටත් මේ සම්බන්ධයෙන් උපදෙස් දීලා ඇති.

අපේ රටේ ධීවර වරායන් 22ක් පමණ තිබෙනවා. ඒ වරායන් 22න් තමයි ඒ බෝට්ටු පන්දහස් ගණනට තෙල් ගහන්නේ. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ නිලධාරින් හරහා තමයි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවෙන් ඒ තෙල් ගහන්නේ. එතකොට හොරකමක් සිද්ධ වෙන්නේ නැහැ. වංචාවක් සිද්ධ වෙන්නේ නැහැ. ගොවියාට පොහොර සහනාධාරය දෙනවා නම්, තෙල් සහනාධාරය දෙනවා නම්, ධීවරයාටත් තෙල් ලීටරයක් රුපියල් 100ක් අඩුවෙන් ලබා දීලා ධීවර කර්මාන්තය දියුණු කරන්න, කඩා වැටුණු කර්මාන්තය දියුණු කරන්න අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කියලා මා ඉල්ලනවා. මේ බෝට්ටු පන්දහස් ගණනටම ලීටරයක් රුපියල් 200 ගණනේ වරායන් 22න් තෙල් ගහන්න මාසයකට යන්නේ තෙල් ලීටර පනස්නව ලක්ෂයයි. එතැනදී ඒ නිසා හොරකමක් සිද්ධ වෙන්නේ නැහැ. මේ වටිනා කියන කර්මාන්තයක්; මේ රටට විදේශ විනිමය ගෙන එන කර්මාන්තයක්; මේ රටේ ජනතාවට අවශ්‍ය ප්‍රෝටීන් ලබා දිය හැකි කර්මාන්තයක්. ඒ වාගේම මේක විශාල කර්මාන්තයක්. මේ කර්මාන්තය කඩා වැටෙන්න දෙන්න එපා. ඒ වාගේම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ හා ධීවර අමාත්‍යාංශයේ නිලධාරින් වාගේම, තවත් ආයතන හයක නිලධාරින් මංකොල්ල කාලා, හොරකම් කරලා මේ ධීවර ක්ෂේත්‍රය විනාශ කරනවා. මේ වාගේ දේවල් සිද්ධ වෙන්න දෙන්න එපා. මේ, ජාතික සම්පතක්. මහ මුහුද කියන්නේ ජාතික සම්පතක්. ඒ සම්පත රැක ගැනීමට අවශ්‍ය නීති-රීති සකස් කරන්න. එහෙම නැතිව, අසාධාරණ විධියට අහිංසක ධීවරයාගේ රීරි මාංස සූරා කන්න එපා. මම මේ දේවල් කියන්නේ නිලධාරින්ටයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්වරිය අවුරුදු 60න් විශ්‍රාම ගිහිල්ලා තිබෙනවා. ඔබතුමා සේවා දිගුවක් ලබා දීලා තිබෙනවා. අමාත්‍යාංශයකට දැනුමක්, අවබෝධයක් තිබෙන නිලධාරින් පත් කරන්න ඕනෑ. අවබෝධයක් නැති නිලධාරින් පත් කළාම ඒක හොර ගුහාවක් වෙනවා. මේ කර්මාන්තය කඩා වැටිලා. ධීවරයෝ ගැන සොයන්නේ බලන්නේ නැහැ. ධීවරයන් ගැන නීති-රීති සකස් කරලා නැහැ. ඒ වාගේ ප්‍රශ්න රාශියක් අද මේ කර්මාන්තයට තිබෙනවා. බහුදින ධීවර යාත්‍රා හිමියන්ගේ බෝට්ටු 3,000ක් විතර රැකියාවේ යන්නේ නැතිව අද ගැටගහලා තිබෙනවා. ඒ මිනිස්සු රටට ණය වෙලා තිබෙනවා. දේපළ උකස් තියලා තිබෙනවා. බඩු මුට්ටු උකස්

කරලා තිබෙනවා. මේ ඉල්ලීම හරියාකාරව ඉෂ්ට නොවුණොත්, බහුදින ධීවර යාත්‍රා හිමියන් සහ කුඩා බෝට්ටු හිමියන් -කුඩා බෝට්ටු 40,000ක් විතර තිබෙනවා- සමඟ පාර්ලිමේන්තුව අසල උපවාසයක් ආරම්භ කරන්න අපි කටයුතු ලැහැස්ති කරලා තිබෙනවා. ඒ නිසා මම ජනාධිපතිතුමාටත් කියනවා, මේ ආණ්ඩුවටත් කියනවා, ඇමතිතුමාටත් කියනවා, කරුණාකරලා ධීවර කර්මාන්තය කඩා වැටෙන්න නොදී, මේ තෙල් ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්න කියලා. ඩීසල් ලීටරය රුපියල් 200කට හා ලාම්පු තෙල් ලීටරය රුපියල් 200කට ලබා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. ජනාධිපතිතුමාට ඒ වාර්තාව හදලා යවන්න. කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්න. කැබිනට් මණ්ඩලයේ ධීවර ක්ෂේත්‍රය ගැන අවබෝධයක් ඇති ඇමතිවරුන් ඉන්නවා, මේවා ගැන කථා කරන්න. තමුන්නාන්සේලාට මාළු කෑල්ලක් කන්න විධියක් නැහැ. අද මාළු මිල ඉහළ ගිහිල්ලා. මේ කර්මාන්තය මේ විධියට වැටෙන්න ඉඩ දෙන්න එපා. ගරු ඇමතිතුමනි, ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ධීවර බෝට්ටු හිමියන් වෙනුවෙන් හා මේ කර්මාන්තය වෙනුවෙන් මේ දේ ඉෂ්ට කරන්න කියලා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම තමයි ඔබතුමාට මම මාස දෙකකට කලින් තොරතුරක් ඉදිරිපත් කළා, අම්බලන්ගොඩ ධීවර වරායේ රේඩියෝ මධ්‍යස්ථානය කැඩිලා, මුහුදේ ඉන්න ධීවරයන්ට අමතන්න විධියක් නැහැ කියලා. ඒවා මාස ගණනක් තිස්සේ කැඩිලා තිබෙනවා. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙන්වත්, ධීවර අමාත්‍යාංශයෙන්වත් ඒවා හරිගස්සන්නේ නැහැ. ඇයි, ඒ ආයතන මිනිස්සුන්ගේ ප්‍රශ්නවලට උත්තර ලබා නොදෙන්නේ? එම නිසා ඒ වෙනුවෙනුත් කටයුතු කරන්න කියා ඔබතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා, ගරු ඇමතිතුමනි.

අද උදේ වරුවේ මුහුදේදී රෝගී වුණු ධීවරයෙකු රැගත් රුපියල් කෝටි දෙක තුනක් වටිනා මීගමුවේ බෝට්ටුවක් හම්බන්තොට ධීවර වරායේ ජැටියට ඇතුළු කරන්න හැදුවත්, ඒ ධීවර වරායේ මෝය කටේ හිරවෙලා ඒ බෝට්ටුව කුඩු වෙලා, විනාශ වෙලා තිබෙනවා. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවට උපදෙස් දීලා, ඒ වරායවල තිබෙන අඩුපාඩු වාගේම කැඩුණු මෝය කටවල් පිළිබඳවත් හොයා බලා ඒවා නිසි ලෙස සකස් කරන්න කියලාත් මේ අවස්ථාවේදී මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ගරු ඇමතිතුමනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, you have two more minutes.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ඊළඟට, මාදැල් කර්මාන්තය ගැනත් මම කියන්න කැමැතියි. පට්ටිය වරායේ මාදැල් 24ක් තිබෙනවා. අවුරුදු සියයකටත් වඩා පරණ කර්මාන්තයක් තමයි, මේ මාදැල් කර්මාන්තය. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2017 දී දේශපාලන හයිය පාවිච්චි කරලා බලපත්‍රයක් අරගෙන අනවසරයෙන් මාදැල් දෙකක් වට කරන්න කටයුතු කරලා තිබුණා. මේ බලපත්‍ර ලබා දීමේදී අනුගමනය කළ යුතු නීති-රීති තිබෙනවා. නමුත්, එම බලපත්‍ර ලබා දීලා තිබෙන්නේ ඒ නීති-රීති යටතේ නොවෙයි.

අදාළ නිලධාරින් එම ප්‍රදේශයේ මැනුම් කටයුතු කරන්න ගියා. වෙරළ තීරයේ කිලෝමීටර 1,609ක් මැනුම් කටයුතු කරන්න තිබෙනවා. ඒ ප්‍රමාණය ටිකක් අඩු කරලා, මම කලින් කියපු අයට වෙනම ඒ අවස්ථාව ලබා දෙන්න හදනවා. ඒවා නීති විරෝධී වැඩ. නිසි වැඩ පිළිවෙළක් යටතේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙන් මේ දේවල් ක්‍රියාත්මක කරන්න ඕනෑ. එහෙම නැතිව මංකොල්ලකාරයන්ට, හොරුන්ට, දේශපාලන හයිය තිබෙන මිනිස්සුන්ට මේ අහිංසක මිනිසුන්ගේ ධීවර තොටුපොළවල් මංකොල්ල කන්න ඉඩ දෙන්න එපා කියන කාරණයත් මම මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාට මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩියක් දෙන්න. අපි ධීවර කර්මාන්තය ගැන කොතෙක් කථා කළත්, අද වන විට පොඩි බෝට්ටු හිමියන් 40,000ක් විතර අසරණ තත්ත්වයට පත් වෙලා සිටිනවා. ඒ මිනිස්සුන්ට ලාම්පු තෙල් ප්‍රශ්නය තිබෙනවා. ඒ ප්‍රශ්නවලට විසඳුම් ලබා දිය හැකි විධියට වාර්තා හදලා, ඒවා ජනාධිපතිවරයා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ලාම්පු තෙල් හා ඩීසල් ලීටරයක් රුපියල් 200ක් බැගින් ලබා දීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්න කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මට වෙලාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Douglas Devananda. You have 20 minutes.

[பி.ப. 2.00]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා (ධීවර අමාත්‍යතුමා)**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா - கடற்றொழில் அமைச்சர்)
(The Hon. Douglas Devananda - Minister of Fisheries)
நன்றி! கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, 1996ஆம் ஆண்டின் 02ஆம் இலக்க, கடற்றொழில் மற்றும் நீர்வாழ் உயிரின வளங்கள் சட்டத்தின்கீழ் 05 ஒழுங்கு விதிகளைச் சமர்ப்பித்து, அதுதொடர்பில் உரையாற்றுவதற்கு வாய்ப்பு வழங்கியமை குறித்து முதலில் எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

முதலாவது, 1996ஆம் ஆண்டின் 2ஆம் இலக்க, கடற்றொழில் மற்றும் நீர்வாழ் உயிரின வளங்கள் சட்டத்தின் 61(1) ஆம் பிரிவின் (தஎ),(தஏ) மற்றும் (ந) சரத்துகளின்கீழ் வகுக்கப்பட்ட VMS கருவித் தொகுதியைச் செயற்படுத்துகின்ற 2015இன் திருத்திய ஒழுங்குவிதியாகும். இலங்கை நீர்ப்பரப்பிலும் ஆழ்கடலிலும் கடற்றொழில் நடவடிக்கைகளில் ஈடுபடுகின்ற கடற்றொழில் படகுகளை செய்மதி தரவின்மூலம் VMS கருவித் தொகுதி மற்றும் ஏனைய இலத்திரனியல் உபகரணங்களின்மூலமாகக் கண்காணிப்பது தொடர்பில் இந்த ஒழுங்குவிதியானது வகுக்கப்பட்டுள்ளது. இந்த VMS கருவித் தொகுதியானது, பல நாட்கலங்களில் பொருத்தப்படுவது கட்டாயமாகும். எமது அமைச்சின் கீழுள்ள கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் திணைக்களத்தினால் 24 மணித்தியாலங்களும் தரையில் செயற்படுத்தப்பட்டு வருகின்ற கண்காணிப்பு நிலையத்தின்மூலமாக குறித்த படகைக் கண்காணிப்பதற்கும் இனங்காண்பதற்கும் ஏதுவாகவே இந்த VMS கருவித் தொகுதி பொருத்தப்படுகின்றது.

**ගරු උදය ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is the point of Order?

**ගරු උදය ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාවේ ගණපූරණය නැහැ.

***පාර්ලිමේන්තුව ගණන් කොට ගණපූරණයක් නොමැති වුයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණයක් තිබුණෙන්-***

*பாராளுமன்றம் கணக்கிடப்பட்டு, கூட்ட நடப்பெண் இல்லையெனக் கண்டதனால், பிரிவு மணி அடிக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*பிறகு, கூட்ட நடப்பெண் இருந்ததனால் -*

*Parliament counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*
*Later, a Quorum being present -*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, please continue.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
இந்தக் கருவித்தொகுதி பொருத்தப்படுவதன்மூலம் கடற்றொழில் சார்ந்த கைத்தொழிலை மேலும் முகாமைத்துவம் செய்வதற்கு வாய்ப்புகள் அதிகம் ஏற்படுவதுடன், சட்டவிரோத மற்றும் அறிக்கையிடப்படாத கடற்றொழிலைக் கட்டுப்படுத்துவதற்கும் அதேநேரம், படகுகள் திசை மாறிச் செல்லாத வகையிலும், வேறு நாடுகளின் கடற்பரப்புக்குள் செல்வதைத் தவிர்க்கின்ற வகையிலும் பாதுகாப்பை வழங்குவதற்கும் இதன்மூலம் இயலுமாகின்றது. இந்த VMS கருவித்தொகுதிகள் பொருத்தப்பட்டதும் அதனது பராமரிப்பு மற்றும் பழுது பார்த்தல் போன்ற செயற்பாடுகளைக் கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் திணைக்களம் ஓராண்டு காலத்திற்கு இலவசமாக மேற்கொள்ளும். அதன் பின்னர் பழுதுபார்த்தல், பராமரித்தல் போன்ற நடவடிக்கைகளைப் பல நாட்கலங்களின் உரிமையாளர்களே மேற்கொள்ள வேண்டும். அதனை மேற்படித் திணைக்களத்தினால் பதிவுசெய்யப்பட்ட சேவை வழங்குநரினூடாகவே மேற்கொள்ள வேண்டும். அதற்கான வசதிகள் மற்றும் ஏற்பாடுகள் தொடர்பில் இந்த ஒழுங்கு விதியில் குறிப்பிடப்பட்டிருக்கிறது. மேற்படி சேவை வழங்குநரின் தலைமை அலுவலகம் பத்தரமுல்லைப் பகுதியில் அமைந்திருக்கின்றது. அதன் கிளைகள் அனைத்துக் கடற்றொழில் துறைமுகங்களிலும் அமைக்கப்பட்டிருக்கின்றன. இங்கு எனக்கு முன்னர் பேசிய முன்னாள் கடற்றொழில் இராஜாங்க அமைச்சர் அவர்கள் தவறான ஒரு செய்தியை முன்வைத்திருந்தார். இந்தக் கருவிகள் முழுக்க முழுக்க 4 நாட்களுக்கு மேற்பட்ட பலநாட்கலங்களுக்கு மாத்திரம்தான் பொருத்தப்படுகின்றதே ஒழிய, அவர் குறிப்பிட்டதுபோல சிறிய படகுகளிற்கல்ல.

VMS கருவித்தொகுதியானது, அவுஸ்திரேலிய அரசாங்கம் தங்களது நாட்டுக்கு மேற்கொள்ளப்படுகின்ற ஆட்கடத்தலைக் கட்டுப்படுத்தும் நோக்கில் இலங்கை அரசாங்கத்துடன் கலந்துரையாடி, அந்நாட்டு அரசாங்கத்தின் நிதியுதவியின்கீழ், அவுஸ்திரேலியத் தூதரகத்தினூடாக IOM என்ற சர்வதேச நிறுவனத்திடம் பொறுப்பு ஒப்படைக்கப்பட்டு, அதனூடாக சர்வதேச கேள்வி கோரப்பட்டு, சுலோவேனியா நாட்டிலுள்ள ஒரு நிறுவனத்திடமிருந்து கொள்வனவு செய்யப்படுகின்றது. அதேநேரம், பலநாட்கலங்களைக் கண்காணித்தல், சட்ட விரோதச் செயற்பாடுகளைத் தடுத்தல், பலநாட்கலங்களுக்கான பாதுகாப்பு, கடற்றொழில் முகாமைத்துவம் போன்ற காரணங்களுக்காக மேற்படி தொழில்நுட்பம் வாய்ந்த கருவித் தொகுதிகளுக்கான தேவைப்பாடு எமக்கும் இருந்தது. அந்தவகையில், அவுஸ்திரேலிய அரசாங்கத்தால் நன்கொடை அடிப்படையில் மொத்தமாக 4,200 VMS கருவித்தொகுதிகள் 10 கட்டங்களில் எமக்கு வழங்கப்பட்டன. இவற்றில் 3,734 VMS கருவித்தொகுதிகள் பலநாட்கலங்களுக்கு இலவசமாகப் பொருத்தப்பட்டுள்ளன. மீதமுள்ள VMS தொகுதிகள் இவ்வருட இறுதிக்குள் பொருத்தப்பட எதிர்பார்க்கப்பட்டுள்ளது. அத்துடன், 328 VMS தொகுதிகள் ஏற்கெனவே பலநாட்கலங்களின் உரிமையாளர்களால் நிதி வழங்கப்பட்டு பொருத்தப்பட்டுள்ளன. குறிப்பாக, கடலுக்குச் சென்று 4 நாட்களுக்கு மேல் கடற்றொழிலில் ஈடுபடுகின்ற படகுகளுக்கே இந்த VMS கருவித்தொகுதிகள் பொருத்தப்படுகின்றன. அந்த வகையில், எமது நாட்டில் சுமார் 7,246 படகுகள் பதிவுசெய்யப்பட்டுள்ள நிலையில், அவற்றில் பழுதடைந்த படகுகள், பயன்பாட்டில் இல்லாத படகுகள் என்பவற்றை அகற்றிப் பார்க்கின்றபோது, சுமார் 4,277 படகுகளே கடற்றொழிலுக்கெனத் தற்போதைய நிலையில் பயன் படுத்தப்பட்டு வருகின்றன.

இரண்டாவது, 1996ஆம் ஆண்டின் 2ஆம் இலக்க, கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் சட்டத்தின் 6,7,8,9 மற்றும் 10ஆம் பிரிவுகளுடன் இணைத்து வாசிக்கப்பட வேண்டிய 61ஆவது பிரிவின்கீழ் வகுக்கப்பட்ட 1996இன் திருத்திய கடற்றொழில் செயற்பாட்டு ஒழுங்குவிதியாகும். இலங்கையின் நீர்ப் பரப்பில் 'ஸ்கூபா' எனப்படும் சுழியோடி முறையில் மீன்பிடி நடவடிக்கைகளில் ஈடுபடுகின்றவர்கள் அதற்கெனப் பயன்படுத்தப்படும் படகுகளில் 10 'சிலிண்டர்'கள் வரையில் கொண்டுசெல்வதற்கு அனுமதி வழங்குகின்ற ஒழுங்குவிதியாக இது அமைகின்றது. இதுவரை காலமும் இம்முறையின்கீழ் கடற்றொழிலில் ஈடுபடுகின்றபோது, 08 'சிலிண்டர்'கள் வரையே கொண்டுசெல்வதற்கு அனுமதி வழங்கப்பட்டிருந்தது. எனினும், எரிபொருள் விலையேற்றம் காரணமாக கடற்றொழிலுக்குச் செல்ல இயலாமல், வாழ்வாதாரம் இன்றி, கடற்றொழிலாளர்கள் பெரும் இடர்களை எதிர்கொண்டிருந்த நிலையில், ஒரு நிவாரணப் பரீட்சார்த்த முயற்சியாகவே இந்த அனுமதி வழங்கப்பட்டுள்ளது. அத்துடன், பதிவுசெய்யப்பட்ட படகுகளில், ஏனைய பதிவுசெய்யப்பட்ட படகுகளில் தொழில் செய்வதற்கெனப் பதிவுசெய்யப்பட்ட நபர்கள் மாறி மாறி தொழிலுக்குச் செல்வதற்கான அனுமதியும் வழங்கப்பட்டுள்ளது. இதன் சாதக, பாதகங்களைக் கண்டறிந்து, எதிர்காலத்தில் மாற்றங்களை ஏற்படுத்துவதற்கும் நாம் எதிர்பார்த்துள்ளோம்.

மூன்றாவது, 1996ஆம் ஆண்டின் 2ஆம் இலக்க, கடற்றொழில் மற்றும் நீர்வாழ் உயிரின வளங்கள் சட்டத்தின் 61ஆவது பிரிவின் (1)ஆம் உட்பிரிவின் (தஉ)ஆம் பந்தியின் கீழ் வகுக்கப்பட்ட, 2023ஆம் ஆண்டின் மீன்பிடிப் பொழுது போக்கு விளையாட்டினை முகாமைத்துவம் செய்கின்ற ஒழுங்குவிதியாகும். இத்துறையானது பொழுதுபோக்கிற்காக மட்டுமன்றித் தங்களது வாழ்வாதாரங்களை ஈட்டிக்கொள்

கின்ற வகையிலும், தங்களுக்குத் தேவையான மீனினங்களை உணவுக்கெனப் பெற்றுக்கொள்கின்ற வகையிலும் மேற்கொள் ளப்பட்டு வருகின்றது. இந்தச் செயற்பாட்டின்போது, அனுமதிப் பத்திரமற்ற எவரும் இத்துறையில் ஈடுபடுவதற்கான வாய்ப்பு வழங்கப்பட மாட்டாது. அதேநேரம், ஏதேனும் ஆபத்துக்குரிய அல்லது பாதுகாக்கப்படவேண்டிய மீனினங்கள் அகப்பட்டால், அவற்றை உயிருடன் விடுவிக்க வேண்டுமென்ற விடயமும் கட்டாயமாக்கப்பட்டுள்ளது.

அதேநேரம், இத்துறையில் ஈடுபடுகின்றவர்கள் பயன் படுத்தும் படகுகளும் கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் திணைக்களத்தில் பதிவுசெய்யப்பட்டிருத்தல் வேண்டும். சூழல் மற்றும் வளங்களின் பாதுகாப்புக் கருதி மேற்படி ஒழுங்கு விதியானது வகுக்கப்பட்டிருக்கின்ற நிலையில், குறிப்பிட்ட தொரு கால அவகாசத்தில் இத்துறையின் சாதக, பாதகங்களைக் கண்டறிந்து, மேலும் ஆய்வுக்கு உட்படுத்தி, சில மாற்றங்களை இத்துறையில் கொண்டுவருவதற்கும் நாம் எதிர்பார்த்துள்ளோம். சுற்றுலாப் பயணிகளுக்கு நம்பிக்கையை யும் ஊக்குவிப்பையும் ஏற்படுத்தும் வகையிலும், இத்துறையில் தங்கியிருப்போரது வாழ்வாதாரங்கள் கருதியும் இத்துறையைப் பொருத்தமான வகையில் மேலும் மாற்றியமைப்பதற்கும் நாம் பல்வேறு துறையினரின் ஆலோசனைகளையும் கருத்துக்களை யும் அறிந்து வருகின்றமை குறிப்பிடத்தக்கது.

இங்கு பேசிய முன்னாள் இராஜாங்க அமைச்சர் அவர்கள், இன்றைய பொருளாதாரச் சிக்கலினால் கடற்றொழிலாளர்கள் எதிர்கொள்கின்ற பிரச்சினைகள் தொடர்பாகக் கூறியதோடு, எரிபொருளின் விலையைக் குறைக்குமாறும் கேட்டிருந்தார். எதிர்வருகின்ற வரவு செலவுத்திட்டத்தில் மாண்புமிகு ஜனாதிபதி அவர்கள் இந்த விடயத்தை உள்வாங்குவதாகச் சொல்லியிருக்கிறார். இருந்தாலும், கடற்றொழிலாளர்கள் எதிர்கொள்கின்ற பிரச்சினைகளைத் தீர்ப்பதற்கென நாங்கள் ஆலோசனை சபையொன்றை அமைத்திருக்கின்றோம். வருங்காலங்களில் அவருடைய பங்களிப்பையும் இதற்கு நாங்கள் எதிர்பார்க்கிறோம் என்பதை இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்கிறேன்.

நான்காவது, 1996ஆம் ஆண்டின் 2ஆம் இலக்க, கடற்றொழில், நீர்வாழ் உயிரின வளங்கள் சட்டத்தின் 61வது பிரிவின்கீழ் ஆக்கப்பட்ட 2023இன் 1ஆம் இலக்க, இயந்திர மயமாக்கப்பட்ட கடற்றொழில் படகுகளின் புறப்பாடு மற்றும் வருகை முகாமைத்துவ ஒழுங்குவிதியாகும். இந்த முறையானது தற்போது நடைமுறையில் இருக்கின்றது. கடற்றொழிலில் ஈடுபடுகின்ற படகுகள் தொழிலுக்கெனப் புறப்பட்டுச் செல்லல், மீள வருகை தரல் போன்ற விடயங்கள் கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் திணைக்களப் பணிப்பாளர் நாயகத்தினால் வழங்கப்படுகின்ற அனுமதிப் பத்திரத்தின்கீழ் மேற்கொள்ளப் படுதல் வேண்டும். கடற்றொழிலின் பாதுகாப்பு, அறுவடைக் குப் பின்னரான பாதிப்புக்களைக் குறைத்தல், வளங்களின் பாதுகாப்பு, சட்டவிரோத முறைமைகளிலிருந்து பாதுகாப்பு உள்ளிட்ட காரணங்களால் இந்த ஒழுங்குவிதியானது கொண்டு வரப்படுகின்றது. இதன்பிரகாரம், அனைத்துப் படகுகளும், அப்படகுகளின் அனைத்து விடயங்களும் ஆய்வுக்கு உட்படுத்தப்படும். முன்னாள் இராஜாங்க அமைச்சர் அவர்கள் கேட்டுக் கொண்டதற்கிணங்க, முதலில் பலநாட்கலங்களுக்கு அவற்றைச் சட்டபூர்வமாக அறிமுகப்படுத்துவதற்கு இருக்கின் றோம்.

ஐந்தாவது, 1996ஆம் ஆண்டின் 2ஆம் இலக்க, கடற் றொழில், நீர்வாழ் உயிரின வளங்கள் சட்டத்தின் 61ஆவது பிரிவின் முதலாவது உட்பிரிவின் (ப) பந்தியின்கீழ் ஆக்கப் பட்ட 2023இன் 1ஆம் இலக்க, செயற்கை அடிமூலக் கூறுகளில் வளர்க்கப்படுகின்ற பவளப் பாறைகளை இறக்குமதி மற்றும் ஏற்றுமதி செய்கின்ற ஒழுங்குவிதியாகும். குறிப்பாக, அலங்கார மீனினங்கள் வளர்ப்புச் செய்கையில் ஈடுபட்டுள்ளவர்களதும், ஏனைய தொழில்சார் பயனாளிகளி னதும் வாழ்வாதாரத்தை மேம்படுத்தும் வகையில் இந்த ஒழுங்குவிதி வகுக்கப்பட்டுள்ளது. இதன்மூலம் நேரடி மற்றும் மறைமுக கைத்தொழிலாளர்கள் பயனடையக்கூடிய வகையில், இந்த ஏற்பாடு செய்யப்பட்டிருப்பது குறிப்பிடத்தக்கதாகும். அந்த வகையில், இந்த ஒழுங்குவிதிகள் யாவும் எமது நாட்டின் கடற்றொழில் துறையைப் பாதுகாத்து மேம்படுத்தும் நோக்கில், அதன் முகாமைத்துவக் கட்டமைப்பை மேலும் வலுப்படுத்துவதற்காகக் கொண்டுவரப்பட்டதாகும்.

மேலும், கடற்றொழிலுக்கான புதிய சட்ட வரைவு தற்போது கடற்றொழில்துறை சார்ந்தோர் மற்றும் பொதுமக்க ளினது கருத்துக்களைப் பெறுவதற்காகச் சமர்ப்பிக்கப் பட்டுள்ளது. அதன் பின்னர் உரிய நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு, அமைச்சரவையின் அங்கீகாரம் பெறப்பட்டு, நாடாளுமன்றத்தில் சமர்ப்பிக்கப்பட்டு, விரைவில் நடைமுறைக்குக் கொண்டுவரப்படவுள்ளமையை நான் இங்கு தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். ஏற்கனவே நான் கூறியதுபோன்று நாங்கள் எமது அமைச்சில் ஓர் ஆலோசனை சபையை அமைத்திருக்கின்றோம். அந்தச் சபைக்கும் இதைச் சமர்ப்பிக்க இருக்கின்றோம். முன்னாள் இராஜாங்க அமைச்சருக்கும் இதன் ஒரு பிரதியை வழங்கவிருக்கிறோம். அவரும் தன்னுடைய ஆலோசனைகளைத் தரலாம். சட்ட விரோத முறைமையிலானதும், தடை செய்யப்பட்ட உபகரணங்களைக் கொண்டதுமான கடற்றொழில் முறைமைகளைக் கட்டுப்படுத்துவதற்கு இந்தப் புதிய சட்ட ஏற்பாடுகள் மிகுந்தளவில் வழிவகுக்கும். தற்போதுகூட, ஒருசில பகுதிகளில் சட்டவிரோதமான கடற்றொழில் செயற்பாடுகள் மேற்கொள்ளப்பட்டு வருவதாக ஒரு சாரார் குற்றம் சுமத்தி வருகின்றனர்.

அண்மையில் மாண்புமிகு சனாதிபதி அவர்களது தலைமை யில் சனாதிபதி செயலகத்தில் இடம்பெற்ற ஆளுநரப்புக் குழுக் கூட்டத்தின்போதும் இத்தகைய சில கருத்துக்கள் முன்வைக்கப்பட்டன. ஆரோக்கியமான கருத்துக்களையும் ஆலோசனைகளையும் நான் எப்போதும் வரவேற்பவன். எமது நாட்டின் அனைத்து கடற்றொழில் மாவட்டங்களுக்கும் நன்னீர் வேளாண்மை, அலங்கார மீனின வளர்ப்பு, கடலட்டைப் பண்ணைகள், கடற்பாசி வளர்ப்பு, இறால் மற்றும் நண்டுச் செய்கைகள் மேற்கொள்ளப்படுகின்ற இடங்களுக்கும் நான் நேரில் சென்று, அங்குள்ள பிரச்சினைகளை அறிந்து, அவற்றுக்கான தீர்வுகளை வழங்கி வருகின்றேன். எனவே, இந்தத் தொழிற்றுறையில் நிலவுகின்ற பிரச்சினைகள், தடைகள், அபிவிருத்திச் செயற்பாடுகள் தொடர்பில் எனக்கு நேரடி அனுபவங்கள் கிடைத்து வருகின்றன. அந்த வகையில், கடற்றொழில் துறையில் நிலவுகின்ற பிரச்சினைகள் தொடர்பில் தேவையான தீர்மானங்களை எடுத்து, அவற்றைச் செயற்படுத்துவதற்கு உங்கள் அனைவரது ஆலோசனைகளை யும் கருத்துக்களையும் நான் தொடர்ந்தும் வரவேற்கின்றேன். ஆரோக்கியமான ஆலோசனைகளும் கருத்துக்களும் எமக்குப் பக்க பலமாக அமையும்.

இந்த ஒழுங்குவிதிகளை இன்று இச்சபையில் சமர்ப்பிப்ப தற்கு ஆலோசனைகளையும் வழிகாட்டல்களையும் வழங்கிய மாண்புமிகு சனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்களுக்கும் கௌரவ பிரதமர் தினேஷ் குணவர்தன அவர்களுக்கும் முதற்கண் எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

அதேநேரம் இந்த ஒழுங்குவிதிகளை வகுக்கும் காலகட்டத்தில் எமக்குப் பெரிதும் உதவியாக இருந்த அப்போதைய கடற்றொழில் இராஜாங்க அமைச்சரும் தற்போதைய நீர் வழங்கல் இராஜாங்க அமைச்சருமான கௌரவ சனத் நிசாந்த அவர்களுக்கும் அப்போதைய கடற்றொழில் இராஜாங்க அமைச்சரும் தற்போதைய மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சருமான கௌரவ கஞ்சன விஜேசேகர அவர்களுக்கும் அப்போதைய கடற்றொழில் இராஜாங்க அமைச்சரும் தற்போதைய மின்சக்தி மற்றும் வலுசக்தி இராஜாங்க அமைச்சருமான கௌரவ டி.வி. சானக அவர்களுக்கும் எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். மேலும், இந்த ஒழுங்குவிதிகளை வகுப்பதில் பெரிதும் உதவிய கடற்றொழில் இராஜாங்க அமைச்சர் கௌரவ பியல் நிஷாந்த த சில்வா அவர்களுக்கும் கடற்றொழில் அமைச்சின் செயலாளர் திருமதி இந்து ரத்னாயக்க அவர்களுக்கும் கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் திணைக்களப் பணிப்பாளர் நாயகம் திரு. சுசந்த கஹவத்த அவர்களுக்கும் அமைச்சினதும், கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் திணைக்களத்தினதும் அதிகாரிகளுக் கும் நீர்வாழ் உயிரினச் செய்கை அபிவிருத்தி அதிகாரசபையின் தலைவர், பணிப்பாளர் நாயகம் உள்ளிட்ட அனைத்து அதிகாரிகளுக்கும் எனது நன்றியைத் தெரிவித்துக் கொள் கின்றேன்.

இன்று காலை இச்சபையில் மாண்புமிகு சனாதிபதி அவர்கள் நாட்டு நடப்புகள் தொடர்பாக குறிப்பாக, சிறுபான்மை மக்கள் - தமிழ் பேசும் மக்கள் - எதிர்கொள்கின்ற பிரச்சினைகள் மற்றும் அவற்றுக்கான தீர்வுகள் தொடர்பில் குறிப்பிட்டிருந்தார். இந்தக் காலகட்டத்துக்குப் பொருத்தமான, வரவேற்கத்தக்க, காத்திரமான ஒரு கருத்தாகவே அதனை நான் கருதுகின்றேன். நானும் ஒரு முன்னாள் போராளி! நான் என்னுடைய போராட்டத்தை இன ரீதியாகவோ, வன்முறை நாட்டம் கொண்டோ ஆரம்பிக்கவில்லை. எமது மக்களுடைய, தேசிய இனத்தினுடைய நியாயமான உரிமைகளைப் பெற்றுக் கொடுப்பதற்காகவே ஆரம்பித்தேன். இங்கு முன்னாள் போராளிகள் இருவர் இருந்தார்கள். ஏனையோர் ஒட்டுண்ணி களாகத்தான் அன்றும் இருந்தார்கள்; இன்றும் இருக்கிறார்கள். மாண்புமிகு சனாதிபதி அவர்களது கைகளைப் பலப்படுத்து வதற்கு வடக்கு, கிழக்கைச் சேர்ந்த தமிழ் பேசும் பாராளுமன்ற உறுப்பினர்கள் சகலரும் முன்வர வேண்டுமென்று கேட்டுக் கொண்டு, இந்த வாய்ப்புக்கு மீண்டும் நன்றி கூறி, விடைபெறு கின்றேன். வணக்கம்!

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. You have nine minutes.

[பி.ப. 2.19]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
நன்றி! கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்த நாட்டின் மத்திய அரசாங்கத்தின் கடற்றொழில் அமைச்சர் அவர்களுக்குப் பிறகு உரையாற்றுவதற்கு எனக்கு வாய்ப்புக் கிடைத்திருக்கிறது. இன்று விவாதத்துக்கு எடுத்துக் கொள்ளப் பட்டுள்ள அவருடைய அமைச்சு சார்ந்த ஒழுங்குவிதிகள் பற்றியும் ஒருசில கருத்துக்களைக் கூறவேண்டும். மத்திய அரசாங்கத்தில் அமைச்சராக இருந்து கொண்டு வடக்கு, கிழக்கில் வாழும் தமிழ் மக்களுடைய பிரச்சினைகளைத் தீர்க்க முடியாமல் இருக்கிறார் என்பதற்கு கௌரவ டக்ளஸ் தேவானந்தா அவர்கள் நல்லதோர் உதாரணம்! அவர் கடற்றொழில் அமைச்சராகப் பதவியேற்ற காலத்திலிருந்து இன்றுவரை நான் எத்தனையோ கோரிக்கை களை அவரிடம் முன்வைத்திருக்கிறேன். ஆனால், இன்றுவரை அவர் எந்தவொரு கோரிக்கையையும் நிறைவேற்றவில்லை. இந்த நாட்டில் எவர் சனாதிபதியாக வந்தாலும், அவருக்கு எடுபிடியாக இருந்துகொண்டிருக்கிறாரே தவிர, எங்களுடைய எந்தக் கோரிக்கையையும் நிறைவேற்றுபவராக அவர் இல்லை.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Minister?

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ உறுப்பினர் அவர்கள் எனது பெயரைக் குறிப் பிட்டபடியால், நான் அதற்குப் பதில் சொல்ல விரும்புகின் றேன்.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
நான் உங்களுடைய பெயரைக் குறிப்பிடவில்லை.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Rasamanickam, you mentioned the Hon. Minister's name.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் என்னுடைய பெயரைக் குறிப்பிட்டபடியால், நான் அதற்குப் பதில் சொல்லத் தானே வேண்டும்.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
நான் உரையாற்றி முடிந்த பிறகு பதில் சொல்லுங்கள்!

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
உடனுக்குடன் பதில் சொல்வதுதான் நல்லது. அப்பொழுது தான் அது உங்களுடைய மனதில் பதியும். நீங்கள் முன்வைத்த கோரிக்கைகள் எல்லாம் நிறைவேற்றப்பட்டிருக் கின்றன. அதற்கு மாறாக, நீங்கள் இச்சபையைத் தவறாக வழிநடத்தக் கூடிய வகையில் பொய்யான கருத்துக்களை முன்வைக்கின் றீர்கள். நான் இந்த மாத கடைசியில் உங்களுடைய பகுதிக்கு வரவிருக்கிறேன். அப்பொழுது நான் உங்களை அழைத்துக் கதைக்கும்போது, அங்கு தீர்க்கப் படாமல் இருக்கின்ற எனது அமைச்சு சார்ந்த பிரச்சினைகளைச் சொல்லுங்கள்!

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

கௌரவ அமைச்சர் அவர்களே. நான் எந்தவொரு பொய்யையும் சொல்லவில்லை. மட்டக்களப்பு மாவட்டத்தில் மீன்பிடித்துறையை நம்பி வாழுகின்ற மக்கள் அதிகளவில் இருக்கிறார்கள். இவர் அங்கு வந்து, தான் சார்ந்த ஒருசிலரை மட்டும் சந்தித்துப் பேசிவிட்டுப் போவார். இவர் வட மாகாணத்தின் யாழ்ப்பாணத்தில் எந்த வேலையையும் செய்யவில்லை. அதற்குள் மட்டக்களப்பில் EPDPஇன் காரியாலயமொன்றை அமைத்து, ஊழல், மோசடியில் ஈடுபட்ட ஒருவரை அதற்குப் பொறுப்பாக நியமித்திருக்கிறார். *[இடையீடு]* கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நான் யாருடைய பெயரையும் இங்கு குறிப்பிடவில்லை. ஏன் அதிகாரப்பகிர்வு முக்கியம் என்பதைத்தான் நான் இங்கு சொல்ல வந்தேன். மீன்பிடித் துறைக்கான Cabinet அமைச்சராகத் தமிழர் ஒருவர் இருந்தும் கூட, அவரால் எங்களுடைய மக்களின் பிரச்சினைகளைத் தீர்க்க முடியாமல் இருக்கிறது. அதனால்தான் எங்களுக்கான அதிகாரங்களை எங்களுடைய கைகளுக்குத் தருமாறு நாங்கள் கேட்கிறோம். அப்பொழுது நாங்களே எங்களுடைய பிரச்சினைகளைத் தீர்த்துக்கொள்வோம். ஊழல், மோசடியில் ஈடுபடக்கூடிய வகையிலே இவர்களுடைய செயற்பாடுகள் இருக்கின்றன. அவர் ஒரு பொறுப்பான அமைச்சராகப் பொறுமையாக இருந்தால் நன்று.

අද දවසේ පවත්වන මේ විවාදයේදී විශේෂයෙන්ම ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කථා කරද්දී මම කියනවා, පසුගිය කාලය පුරාම ලංකාවේ බදු පැටෙව්වේ සාමාන්‍ය ජනතාවට පමණක් බව. ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත හරහා මේ සංශෝධන ගෙන එන්නේ ශ්‍රී ලංකා රජය IMF එකට දුන් පොරොන්දු අනුව බදු වැඩි කිරීමටයි. මේ පනත් කෙටුම්පත යටතේ කරන සංශෝධනවලින් ඒ බදු වැඩි කරන්න එකඟ වෙච්ච කාණ්ඩ හතරකින්ම උද්ධමනයට සාපේක්ෂව බදු වැඩි වෙන්නේ නැහැ. උද්ධමනයට සාපේක්ෂව බදු අඩු වීමක් තමයි සිදු වෙන්නේ. IMF එකත් එක්ක ඇති කර ගත් එකඟතා අනුව කැසිනෝවලින් එන බදු ආදායමෙන් එකම එක කාණ්ඩයක විතරයි බදු වැඩි වෙන්නේ. උද්ධමනයට සාපේක්ෂව කැසිනෝවලින් එන බද්ද අනෙක් ඔක්කොම කාණ්ඩවලට අඩු වෙනවා.

2015 වර්ෂයේ පනත ගෙනෙන කොට එහි තිබුණා, කැසිනෝ එකක් ඇතුළට enter වෙන ඕනෑම පුද්ගලයෙකුගෙන් ඩොලර් 100ක entrance fee එකක් අය කරනවා කියලා. මේ පනත් කෙටුම්පත හරහා එය ඩොලර් 50කට අඩු කරලා තිබෙනවා. ලාංකික පුරවැසියෝ කැසිනෝශාලාවක් ඇතුළට යනකොට තමයි ඩොලර් 50ක බද්දක් ගෙවන්න ඕනෑ. විදේශිකයෝ ඩොලර් එකක්වත් ගෙවන්න ඕනෑ නැහැ. මීට කලින් පනතේ තිබුණේ, දේශීය හෝ විදේශීය ඕනෑම කෙනෙකු කැසිනෝශාලාවකට යනවා නම් ඩොලර් 100ක මුදලක් ගෙවන්න ඕනෑ කියලායි. මේ පනත් කෙටුම්පතින් ඒක ඩොලර් 50ට අඩු කරලා තිබෙනවා. ඒකත් ශ්‍රී ලාංකික පුරවැසියන් පමණයි ගෙවන්න ඕනෑ. මම දන්නේ නැහැ, සුද්දන්ට බදු අයින් කරලා ලංකාවේ අයට ඩොලර් 50ක් අය කරන්නේ ඇයි කියලා. ඒක ඩොලර් 100ට තිබුණා නම් අපට යම්කිසි සාධාරණීකරණයක් කරන්න තිබුණා. ඒකත් ඩොලර් 50ට අඩු කරලා. ඒ කියන්නේ, මේ රට තුළ කැසිනෝ ගහන්න යන මිනිසුන්ට තමයි මේ ආණ්ඩුව සහනයක් ලබා දෙන්නේ.

පසුගිය කාලයේ EPF එකට සහ ETF එකට අත තියන කොට, දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය ගැන කියන කොට අපි මේ කාරණය කිව්වා. ලංකාවේ රජයට සියයට 25ක, සියයට 30ක පොලී ප්‍රමාණයකට පෞද්ගලික ණය දීලා තිබෙන සියයට 15ක් විතර කණ්ඩායමකට බදු අය කිරීමේදී කිසිදු වෙනසක් කරන්නේ නැහැ. හැබැයි, EPF, ETF ගෙවපු ලක්ෂ 21ක ශ්‍රමිකයන්ට තමයි බදු ගහන්නේ. මේ රටේ ජනාධිපතිවරයා, කැබිනට් මණ්ඩලය, ආණ්ඩු පක්ෂයේ ඉන්න මැති ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් සියලු දෙනා මේ රටේ ධනපතියන් තවදුරටත් ආරක්ෂා කරමින් මේ රට තුළ ඉන්න දුප්පත් මනුස්සයාට තවදුරටත් බදු පැටවීම සිදු කරනවා. ඒක තමයි මේ රජයේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ. පෙබරවාරි මාසයේ ඉඳන් මැයි මාසය දක්වා දවස් 100ක් තුළ ඩොලර් 100 ගණනේ බදු අය කරපු එකෙන් විතරක් ලංකාවේ රජයට - ඒ දවස් 100ට - රුපියල් මිලියන 291ක ලාභයක් ලැබිලා තිබෙනවා. මේ ප්‍රමාණයට බදු එකතු කළා නම් අවුරුද්දකට ඩොලර් මිලියන තුනක ප්‍රමාණයක බදු ආදායමක් ලැබෙනවා. හැබැයි, මේක වෙනස් කිරීම තුළින් ලංකාවේ රජයට එන්න තිබෙන බදු ප්‍රමාණය අඩු වෙනවා.

IMF එකට agree වෙච්ච කොන්දේසිවලට අනුව ලංකාවේ සාමාන්‍ය ජනතාවගේ income tax වැඩි කරනවා; කොම්පැනිවල tax වැඩි කරනවා; EPF එකට, ETF එකට අත තියනවා. එතැනින් එහාට ගිහින් විදුලි බිලත් වැඩි කළා. තවදුරටත් විදුලි බිල වැඩි කරන්න යනවා කියලා අපට ආරංචියක් ලැබිලා තිබෙනවා. ඒ වාගේම තමයි වතුර බිල. මම අද උදෑසන අපේ ගෙදර වාඩි වෙලා ඉන්න කොට වතුර මීටරය කියවන මනුස්සයා ආවා. පව්! ඒ ළමයා දන්නේ නැහැ, ජලය unit එකක ගණන කීයකින් ද වැඩි වෙලා තිබෙන්නේ කියලා. "කොහොමද units ගණන වැඩි වෙලා තිබෙන්නේ කියලා ඊළඟ මාසය වෙද්දී කියන්නම්" කියලා වතුර මීටරය කියවන ඒ මනුස්සයා කිව්වා.

මේ රජයේ ප්‍රතිපත්තිය විධියට ජල ගාස්තුව වැඩි කිරීම නිසා රුපියල් 700ට තිබුණු ජල බිලක් අද රුපියල් 1,500 දක්වා වැඩි වෙලා තිබෙනවා. රුපියල් 3,000ක තිබුණු ජල බිලක් අද රුපියල් 6,000ක් වෙලා තිබෙනවා. ඒකක 0 ඉඳන් 30 වනකල්, ඒ කියන්නේ අවම units ගණන භාවිත කරන consumerට තමයි අද වැඩි පුර මුදල් ප්‍රමාණයක් ගෙවන්න වෙලා තිබෙන්නේ. මම හිතන්නේ units 60ට වඩා භාවිත කරන අයට සියයට 30ක වාගේ ප්‍රමාණයකින් තමයි වැඩි වෙන්නේ. ජනතාවට පිරිසිදු වතුර ලබා දෙනවා කියන එක රජයේ වගකීමක්. ඒ පිරිසිදු ජලය ලබා දීමේදී අඩුම ඒකක ප්‍රමාණයක් - ඒකක 0 ඉඳන් 10 දක්වා - භාවිත කරන කාණ්ඩයට සියයට 140ක විතර වැඩි වීමක් සහිතව අය කරනවා. මේවා මේ රජයේ ඉතාම වැරැදි ප්‍රතිපත්ති. විපක්ෂයේ ඉන්න කණ්ඩායම් එකතු වෙලා මේ සම්බන්ධයෙන් මොනවා හෝ දෙයක් කරන්න ඕනෑ කියා මම මේ අවස්ථාවේ කියා සිටිනවා. මොකද, අද රට තුළ සියලු අංශවල මිනිස්සු පීඩාවට පත් වෙලා ඉන්නේ. ධීවරයින්ට තෙල් නැහැ කියනවා; භූමිතෙල් නැහැ කියනවා. ඒ ප්‍රශ්න තිබෙන්නේ මගේ දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි. අද උදේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව තිබුණු වෙලාවේ හැම දිස්ත්‍රික්කයෙන්ම ආපු මන්ත්‍රීවරු කිව්වා, "තමන්ගේ ප්‍රදේශවල ගොවියන්ගේ වී ගන්න කවුරුවත් නැහැ, වී මිල පහළ ගිහිල්ලා, වීවලට ස්ථාවර මිලක් නැහැ" කියලා. ඇමතිතුමාත් කියනවා, "මේක සාධාරණ ප්‍රශ්නයක්. නමුත්, අපිට වී මිල දී ගන්න සල්ලි නැහැ" කියලා. ලංකාවේ ගොවීන්ගෙන් වී මිල දී ගන්න විධියක් නැහැ. ගොවීන්ට වෙලාවට පොහොර දෙන්නේ නැහැ; වෙලාවට වතුර දෙන්නේ නැහැ. ධීවරයින්ට ඩීසල් දෙන්නේ නැහැ. අද ධීවරයින්ගේ ආදායම අඩු වෙලා තිබෙනවා. මේ වාගේ අවස්ථාවක,-

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I did not mention his name. - *[Interruption]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, you can clarify it after the Hon. Member's speech. After the Hon. Member's speech, I will give you time.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Okay.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මට දිගින් දිගටම බාධා කරනවා නේ. ඇත්තටම 'ඇමතිවරු' කියන්නත් ලජ්ජයි, මේ වාගේ අයට. මොකද, උතුරු-නැඟෙනහිර ඉන්න ධීවරයින් ගැන හිතන්නේවත් නැතිව රජය වෙනුවෙන් කඩේ යෑමක් මේ කරන්නේ. ඇත්ත වශයෙන්ම කියනවා නම් මේ රට තුළ ධීවරයින් හා සියලු ජනතාව මුහුණ දෙන ගොඩක් ප්‍රශ්න තිබෙනවා. විපක්ෂයේ කණ්ඩායම විධියට අපි කියන්නේ ඒකයි. වතුර බිලත් වැඩි කරනවා. Electricity bill එකත් වැඩි කරනවා. ලංකාවේ සියයට 90ක් විතර පිරිසක් අද ඉතාම පීඩනයකින් ඉන්නේ; ජීවත් වෙන්න බැරි තත්ත්වයක ඉන්නේ. මට ඊයේ පෙරේදා දවසක හම්බ වුණා, Uber Eats එකේ වැඩ කරන මනුස්සයෙක්. ඇත්තටම එයාට පව්! එයා 2000දී විතර රියාල්වලින් සල්ලි හොයාගෙන ලංකාවට ආපු කෙනෙක්.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, you have one more minute.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Two minutes?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
No, you have one more minute.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, normally, you inform us two minutes before out time ends. So, I thought I have two more minutes. Let me finish, Sir. I will conclude.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔහු පිට රටක ඉඳන් සල්ලි හම්බ කරගෙන ලංකාවට ඇවිල්ලා බිස්නස් එකක් පටන් අරගෙන තිබෙනවා. හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ අමන ප්‍රතිපත්ති නිසා එයා අද Uber Eats එකේ වැඩ කරන තත්ත්වයට වැටිලා තිබෙනවා. එයාට දැන් රට යන්නත් වයස වැඩියි. එයා catering business එකක් කරපු මනුස්සයෙක්. දැන් තිබෙන තෙල් මිල නිසා එයාට ඒ බිස්නස් එක කර ගන්නත් බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ මහවැලි ඉඩම්වල ඉන්න කිරි ගොවීන් ගැනත් මම කියන්න ඕනෑ. කිරි ගොවීන් තමයි ඊළඟ ප්‍රධානම කණ්ඩායම. ප්‍රධානම කණ්ඩායම, වී වගා කරන ගොවීන්. ඊට පස්සේ ධීවරයන්. ඊටත් පස්සේ කිරි හරක් තියාගෙන ඉන්න කට්ටිය. කිරි හරක් පට්ටිවලට ඉන්න තිබෙන මහවැලි ඉඩම් කොහෙදෝ ඉඳන් ආපු කණ්ඩායම් සුද්ද කරනවා, තමන්ට ඕනෑ විධියට. ප්‍රධාන පාරේ දෙපැත්තේම මහවැලි ව්‍යාපාරයට අයිති ඉඩම් තිබෙන්නේ. රෑට කැලෑවට ගිනි තියනවා. උදේට වැට ගහනවා. දවල්ට එතැන ගෙයක් හදනවා. හවස් වෙද්දී වැඩිච්ච පොල් පැළ හිටවනවා. මේ ගැන රොෂාන් රණසිංහ ඇමතිවරයාට මම ඊයේ කිව්වාම, "මල්ලි, මේක ගැන බලමු" කිව්වා. කිරි හරක් ඇති කරන්න තිබෙන මහවැලි ඉඩම් අද අල්ලා ගන්නවා. හෙට අපිටත් ගිහිල්ලා ඒ ඉඩම් අල්ලා ගන්න පුළුවන් ද? තමන්ට කැමති කණ්ඩායම් ගිහිල්ලා ඕනෑ ඕනෑ විධියට ඒ කටයුතු කරනවා. රොෂාන් රණසිංහ ඇමතිතුමාගේ ඒ ප්‍රකාශය කිසිම වගකීමක් නැති ප්‍රකාශයක්. එහෙම නම්, මහවැලි විෂයය භාරව කටයුතු කරන්න එතුමා නුසුදුසුයි. මහවැලියට අයිති ඉඩම් අන්න අල්ලා ගන්නවා. මම මේ ලියුමත් අරගෙන ගිහිල්ලා පෙන්නුවා. මහවැලියට අයිති ඉඩම්වල, කැලෑව අස්සේ මොන මොන දේවල් වෙනවාද දන්නේ නැහැ. අපි පාරේ ඉඳන් දකින දේ තමයි කියන්නේ. කිරි හරක් ඇති කරන්න තිබෙන ඒ තෘණ බිම් එළි කරලා තමන්ට ඕනෑ ඕනෑ විධියට, තමන්ට ඕනෑ ඕනෑ කට්ටිය ගිහිල්ලා සුද්ද කරන කොට ඒකට වාරිමාර්ග ඇමතිතුමාට දෙන්න තිබෙන පිළිතුර, "මල්ලි, බලමු මේක ගැන" කියන එකයි. ඉතින්, මේක තමයි අද රජයේ ප්‍රතිපත්තියත්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමතියි. ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත වැනි අලුත් පනත් කෙටුම්පත් ගෙන ඒම තුළින් ධනපතියන් තවදුරටත් ධනපතියන් කරලා මේ රටේ ඉන්න ශ්‍රී ලාංකීය සාමාන්‍ය ජනතාව තවදුරටත් දුප්පත්කමට තල්ලු කරනවා. මම කලිනුත් කිව්වා වාගේ කැසිනෝශාලාවලට එන විදේශිකයන්ගෙන් ඩොලර් 100 බැගින් අරගෙන ඒ මුදල්වලින් අපේ රටේ වැසියන්ට සහනයක් දෙන්න බැරි ඇයි? අද "අස්වැසුම" කියලා system එකක් ගෙනැල්ලා තිබෙනවා. "අස්වැසුම" යටතේ එක පැත්තකින් සහනාධාර දෙනවා කියනවා. අනෙක් පැත්තෙන්, වතුර බිලයි, electricity bill එකයි වැඩි කරනවා. අස්වැසුම සහ සමෘද්ධිය කියන්නේ වැඩසටහන් දෙකක්. මේ වැඩසටහන් දෙකටම අදාළව කරපු තෝරා ගැනීම් වැරදියි කියලා අපි කියනවා. අපි කියන්නේ අඩුම තරමින් electricity bill එක පදනම් කරගෙන හෝ ඒ කණ්ඩායම තෝරා ගන්න කියලායි. ආණ්ඩුවේ ප්‍රතිපත්ති සියලු දෙයම ඉදිරි අනාගතයේ ශ්‍රී ලාංකිකයන්ට නරක ප්‍රතිඵල ගෙනෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනාධිපතිතුමා කිව්වා, එතුමාට පාර්ලිමේන්තුවේ ඉන්නේ මන්ත්‍රීවරු තුන්දෙනෙක් විතරයි, ඒ නිසා තමාට තීරණයක් ගන්න බැහැ කියලා. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමාට ඉන්නේ මන්ත්‍රීවරුන් තුන්දෙනෙක් විතරයි නම්, ඔබතුමාට තීරණ ගන්න බැරි නම් පාර්ලිමේන්තුව විසුරුවන්න. අලුතෙන් ඡන්දයක් තියන්න. තමන්ට ඕනෑ පනත් කෙටුම්පත් සම්මත කර ගන්නවා. තමන්ට ඕනෑ නැති පනත් කෙටුම්පත්, ජාත්‍යන්තරය සහ දෙමළ ජනතාව රවට්ටන්න හදන පනත් කෙටුම්පත් සම්මත කරන්න යන කොට තමන්ට ඉන්නේ මන්ත්‍රීවරු තුන් දෙනෙක් විතරයි කියනවා. ඒ නිසා මේ ආණ්ඩුවේ තිබෙන වැරදි ප්‍රතිපත්ති ඉතාම තරයේ විවේචනය කරන බව මේ අවස්ථාවේදී කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Hon. Douglas Devananda.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ මන්ත්‍රීතුමා සාමාන්‍යයෙන් මේ ගරු සභාවට වැරදි දේවල්ම තමයි කියන්නේ. එතුමා කියන්නේ ධීවර කට්ටියට ඉන්ධන නැහැ කියලා නම්, ඒක අසත්‍යයක්. ඉන්ධන වැඩියි කියලා ඔක්කොම කථා වෙනවා. මේ සභාවේ කවුරුවත් කිව්වේ නැහැ, ධීවර ප්‍රජාවට ඉන්ධන නැහැ කියලා. එහෙම නේද, මන්ත්‍රීතුමා?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

අසත්‍ය කියන්න එපා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Minister, please be brief with your clarification.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

රටේ සිටින ධීවර ජනතාවට ඉන්ධන හම්බ වෙනවා. නමුත් price එක වැඩියි. එහෙම නේද? ඉන්ධන කොහෙන් හරි ගන්න පුළුවන්. නමුත් price එක තමයි වැඩි. *[බාධා කිරීමක්]* ඒක තමයි මේ සභාවේ සිටින මන්ත්‍රීවරුන් කිව්වේ. ඒක අසත්‍යයක් කියලා මෙතුමා කියනවා. ඒකයි මම කියන්නේ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Sir, he mentioned my name.

මම කිව්වේ, quota ක්‍රමයට තමයි ඉන්ධන දෙන්නේ කියලා. මම දන්නේ නැහැ, මෙතුමා උතුර, නැගෙනහිර නියෝජනය කරන ඇමතිවරයෙක්ද, දකුණ නියෝජනය කරන ඇමතිවරයෙක්ද කියලා. ඒකයි මම කියන්නේ. බලය බෙදා ඉවර වෙලා ඒ ජනතාවට තමන්ගේ දේශපාලන මතය අනුව අසත්‍ය කියන්නේ නැතුව ඉන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Next, the Hon. Sampath Athukorala. You have seven minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Hesha Withanage to the Chair?

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

Sir, I propose that the Hon. Hesha Withanage do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு ஹேசா விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON.DEPUTY CHAIRMAN OF COMMITTEES left the Chair and THE HON. HESHA WITHANAGE took the Chair.*

[අ.භා. 2.31]

**ගරු සම්පත් අතුකෝරල මහතා**
(மாண்புமிகு சம்பத் அதுகோரல)
(The Hon. Sampath Athukorala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ ඉදිරිපත් කර තිබෙන නියෝග පහක් පිළිබඳවත් අපි කථා කරනවා. විශේෂයෙන්ම ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට ඒ සම්බන්ධයෙන් අදහස් කිහිපයක් දක්වන්න මා බලාපොරොත්තු වෙනවා. අපේ ගාල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව මඟින් ආරම්භයේ සිටම අපේ දිස්ත්‍රික්කය සංවර්ධනය කිරීමේ අංශ හතරක් පිළිබඳව ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළා. එයින් එක් ප්‍රධාන අංශයක් තමයි ධීවර කර්මාන්තය. ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතක විතර ප්‍රමාණයකින් ආවරණය වන මුහුදුබඩ කලාපය තුළ ධීවර කර්මාන්තයේ යෙදෙන ජනතාවගේ අවශ්‍යතා පිළිබඳවත්, ඒ වාගේම කර්මාන්තයක් විධියට ධීවර කර්මාන්තය තව තවත් නංවීම පිළිබඳවත් අපේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී අපි අවස්ථා ගණනාවක දී, මාසිකව පසු විපරම් කරමින් සාකච්ඡා කළා.

අපේ ගරු ඩග්ලස් දේවානන්දා ඇමතිතුමා මේ නියෝග පාර්ලිමේන්තුවේ අනුමතිය සඳහා ඉදිරිපත් කර තිබෙන මේ වෙලාවේ මම සිහිපත් කරන්න කැමැතියි, එතුමාගේ මැදිහත්වීමෙන් ගාල්ල ප්‍රධාන ධීවර වරාය සංවර්ධනය කිරීම සඳහා, එම ධීවර වරාය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රංශ ආධාර යටතේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු සූදානම් කළ බව. ගාල්ල ධීවර වරාය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයන කටයුතු සහ අනෙකුත් කාරණා සිදුවෙමින් පැමිණියත්, පසුගිය කාල සීමාව තුළ ඇති වුණු විවිධ ගැටලු එක්ක එහි කටයුතු අතරමඟ නතර වෙලා තිබෙනවා. ඒ නිසා මම නැවත වතාවක් අපේ ඩග්ලස් දේවානන්දා ඇමතිතුමාගේ අවධානයට ඒ කරුණ යොමු කරනවා. ගරු ඇමතිතුමනි, ලංකාවේ ප්‍රධාන ධීවර වරාය හතරක් තෝරා ගැනීමේ දී ඔබතුමා ගාල්ල වරායත් තෝරා ගැනීම පිළිබඳව අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. බේරුවල, ගාල්ල, කුඩාවැල්ල කියන ධීවර වරායවල් තමයි ඔබතුමා තෝරා ගෙන තිබුණේ. ප්‍රංශ ආධාර යටතේ ක්‍රියාත්මක වැඩසටහන කඩිනමින් සිදුකර ගාල්ල ධීවර වරායේ පහසුකම් ප්‍රමාණය වැඩි කරන්න පුළුවන් නම් හොඳයි කියා මම හිතනවා. මොකද, බහුදින ධීවර යාත්‍රාවලින් ගෙනෙන මාළු ගොඩබිමට ගන්න ඒ ධීවරයින් විශාල කාලයක් ගත කරනවා. ඔවුන්ට ලොකු කාලයක් ගත කරන්න සිදු වෙලා තිබෙනවා, තමන් ගෙනෙන මාළු ටික බාගන්න. ඒ නිසා එම ධීවර වරාය සංවර්ධනය කරලා පුළුල් කිරීමේ කටයුත්ත කඩිනම් කිරීම සම්බන්ධ කාරණය මේ වෙලාවේ මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

ගරු ඇමතිතුමනි, තවත් බරපතළ ගැටලුවක් තිබෙනවා. පාරම්පරිකව ධීවර කර්මාන්තයේ යෙදෙන බහුතර ධීවර පිරිසක් ජීවත් වන ප්‍රදේශයක් තමයි බලපිටිය කියන්නේ. බලපිටිය ආසනයේම ජීවත් වෙන්නේ පාරම්පරිකව ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයින්. ඒ ධීවර බෝට්ටු හිමියන්ටත් බලවත් අසාධාරණයක් සිදු වෙලා තිබෙනවා කියා මම හිතනවා.

[ගරු සම්පත් අතුකෝරල මහතා]

බලපිටියේ ධීවර කර්මාන්තයේ යෙදෙන සියලු දෙනාට සිද්ධ වෙලා තිබෙන්නේ තමන් රැගෙන එන මාළු ටික අරගෙන බේරුවල ධීවර වරායට යන්නයි. බේරුවල ධීවරයින්ටත් ඒක මහ කරදරයක්. මම හිතන විධියට වැඩි ආදායමක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් වෙන්න පුළුවන්, ඒ අය බේරුවල ධීවර වරායට යනවා ඇත්තේ. නමුත් බලපිටියේ බෝට්ටු ටිකත් බේරුවල ධීවර වරායට ගියාම, බේරුවල ධීවර වරාය තුළත් ලොකු තදබදයක් තිබෙනවා.

ගරු අමාත්‍යතුමනි, බලපිටියේ ධීවර වරායක් ඉදිකිරීම සඳහා දිගින් දිගටම සාකච්ඡා සිදු කළා. මම හිතන විධියට ඒ සඳහා දශක ගණනාවක් තිස්සේ ශක්‍යතා අධ්‍යයන කටයුතු සිදු කළා; සැලසුම් සකස් කළා. නමුත් ඒ කිසිම කාරණයක දී බලපිටියේ ජනතාවට සාධාරණයක් වුණේ නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා ධීවර අමාත්‍ය ධුරයේ සිටියදීම බලපිටියේ ධීවර ජනතාවට සාධාරණයක් කරන්නය කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින ගමන්, මේ වෙලාවේ එම කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. බලපිටියේ ධීවර ජනතාව කාලයක් තිස්සේ ඉල්ලන්නේ තමන්ට ධීවර වරායක් ලබා දෙන්න කියලා. ඒ ධීවර වරාය ලබා නොදීම තුළ කරදර, බාධක, දුක් ගැහැට විඳිමින් බේරුවලට ගිහිල්ලා තමන්ගේ මාළු ටික දාන්න බලපිටියේ ධීවරයාට සිදු වෙලා තිබෙනවා.

මේ වෙලාවේ මම මේ කාරණය ඔබතුමාට මතක් කරන්නට ඕනෑ. ඒ තමයි තාක්ෂණය පාවිච්චි කරලා අපේ ධීවරයාට අපි මහ පෙන්විය යුතුයි කියන එක. යාත්‍රාවලට VMS සවි කිරීම සම්බන්ධව ඔබතුමා මේ නියෝගවලට එකතු කරලා තිබෙනවා. අපි ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. හැම යාත්‍රාවකටම VMS ස්ථාපිත කිරීමට යෝජනා කර තිබෙනවා. නමුත් අපි මේ වෙලාවේ අපේ ධීවරයාට හරියාකාරව තාක්ෂණයෙන් සහය දෙනවාද කියලා හිතන්නට ඕනෑ. අපි ගාල්ල දිස්ත්‍රික්කයේ ධීවරයන් එක්ක සාකච්ඡා කරද්දී අපට දැන ගන්නට ලැබුණු කාරණයක් තමයි මාළු සිටින තැන් හඳුනා ගැනීමට තාක්ෂණය යොදා ගැනීම මේ වෙලාවේ ඔවුන්ට අත්‍යවශ්‍යයි කියන එක. අද වනවිට ඉන්ධන මිල ඉහළ යාම, භූමිතෙල්, ඩීසල් මිල ඉහළ යාම, ඔවුන්ට අවශ්‍ය කරන විවිධ උපකරණවල මිල ඉහළ යාම ආදිය නිසා අද මාළු මිල විශාල විධියට ඉහළ ගිහිල්ලා තිබෙනවා. අපේ හිටපු ධීවර ඇමතිතුමාත් ඒ සම්බන්ධව මේ වෙලාවේ මතක් කළා. මිල ඉහළ යන්නේ ලැබෙන අස්වැන්න පහළ යාම නිසායි කියලා මම හිතනවා. වැඩි අස්වැන්නක් ලබා ගැනීම සඳහා VMS භාවිත කරනවා වාගේම අපේ ලංකාවේ ධීවර කටයුතු සඳහා උදවු වෙන තාක්ෂණික ආයතන වන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව ආදී පර්යේෂණ ආයතන, නාරා ආයතනය කියන මේ සියලු ආයතන ඒක රාශි කරලා, තාක්ෂණය පාවිච්චි කරලා වැඩි අස්වැන්නක් ලබා ගැනීමේ ක්‍රමවේදවලට මේ රටේ ධීවරයා හුරු කිරීමට අපට පුළුවන්කම තිබෙන්නට ඕනෑ.

අපි පාර්ලිමේන්තුව තුළත් සාකච්ඡා කළා, එක්ස්ප්‍රස් පර්ල් නෞකාවෙන් සිදු වෙච්ච හානිය පිළිබඳව. එහි වන්දි ගණනය කිරීමේදී යම් අඩු පාඩුවක් අපෙන් සිදු වෙලා තිබෙනවාය කියන එක ගැන කථා කළා. අපේ රටේ වෙරළ ආසන්නයේ ඉන්න මාළු පිළිබඳව, ජලජ සම්පත් පිළිබඳව, අපේ තිබෙන මුහුදු පැළෑටි පිළිබඳව, සාගරයේ තිබෙන දේවල් පිළිබඳව නිවැරදි සංගණනයක් අපි සතුව තිබුණේ නැහැ. වෙනත් රටවල එහෙම හඳුනා ගත් සංගණනයක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු සම්පත් අතුකෝරල මහතා**
(மாண்புமிகு சம்பத் அதுகோரல)
(The Hon. Sampath Athukorala)
අපේ රටේ එහෙම සංගණනයක් තිබුණේ නැහැ. ඒ නිසා තමයි වන්දි ලබා ගැනීමේදී සහ අනෙකුත් කාරණාවලදී අපි ප්‍රමාද වුණේ. අපේ ධීවර ඇමතිතුමාට මේ කාරණා පිළිබඳව මතක් කරන ගමන්, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, අද කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සම්පත් අතුකෝරල මහතා**
(மாண்புமிகு சம்பத் அதுகோரல)
(The Hon. Sampath Athukorala)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම මත් ද්‍රව්‍ය ප්‍රවාහනය සම්බන්ධව චෝදනා එල්ල වෙන්නේ ධීවර කාර්මිකයාටයි. මත් කුඩු අත් අඩංගුවට ගත් අවස්ථාවලදී අපි ඒ පිළිබඳව ධීවර ජනතාව විධිමත්ව දැනුවත් කළා. විශේෂයෙන් ධීවර කර්මාන්තයේ යෙදෙන තරුණ ප්‍රජාව අද මත්ද්‍රව්‍ය භාවිතයට හුරු වෙලා තිබෙනවා. සමහර වෙලාවට බෝට්ටු හිමියා මත්ද්‍රව්‍ය දෙන්නේ නැත්නම්, ඒ තරුණයන් ධීවර රැකියාවට නොයන තරමට මැළිකමක් දක්වනවා, අපි දැකලා තිබෙනවා. අපේ තරුණ ප්‍රජාව -අපේ ධීවර කර්මාන්තයේ යෙදෙන තරුණයන් - මේකෙන් මුදා ගන්න යම් වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කළ යුතුයි. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.38]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉදිරිපත් කර ඇති ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පතෙන් දැනට තිබෙන කැසිනෝ ලයිසන් ප්‍රමාණය අසීමිත ලෙස වැඩි වෙනවා. අපේ රටේ දැනට තිබෙන්නේ කැසිනෝ ආයතන හතරයි. සිංගප්පූරුව ඒ සම්බන්ධව hub එකක් කියලා කියනවා. නමුත්, ඒ රටේ කැසිනෝශාලා දෙකයි තිබෙන්නේ. මුළු මැලේසියාවටම තිබෙන්නේ කැසිනෝ ශාලා එකයි. දැන් ඕනෑ ඕනෑ තැනක, හන්දියක් හන්දියක් ගාණේ කැසිනෝ බලපත්‍ර දෙන්න පුළුවන්. රනිල් වික්‍රමසිංහ මහත්මයා මුදල් ඇමති වුණාට පසුව මත් පැන් බලපත්‍ර 250ක්, 300ක් විතර මේ වනකොට දීලා තිබෙනවා. මෙහෙම කැසිනෝ බලපත්‍ර දෙන තත්ත්වයට ආවොත්, අපේ රටේ හැම හන්දියක්, හන්දියක් ගාණේම කැසිනෝශාලා ඇති වීමේ අනතුරක් තිබෙනවා. ඒක ඉතාම බරපතළයි.

කාරණා කිහිපයක් කෙරෙහි ගරු ධීවර ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න මම කැමැතියි. ගරු ඇමතිතුමනි, දැන් මිනිස්සු මාළු කන්නේ නැහැ. කන්න බැහැ. මාළු ගිනි ගණන්. ඒකට හේතුව තමයි ලාම්පු තෙල් මිල තුන් ගුණයකින් වැඩි වීම. ඊළඟට, ඩීසල් මිල තුන් ගුණයකින් වැඩි වීම. ඒ විතරක් නොවෙයි, ධීවර ආම්පන්නවල මිලත් සියයට 400කින් විතර වැඩිවෙලා

තිබෙනවා. අයිස් හොණ්ඩරයේ මිල වැඩි වෙලා තිබෙනවා. ඇත්තටම මුහුදු රස්සාව කරලා ධීවර ජනතාවට ජීවත් වෙන්න බැරි තත්ත්වයක් තිබෙනවා. බහුදින යාත්‍රා සඳහා ලක්ෂ 35ක්, 60ක් විතර වියදම් වෙනවා. එක් දින ධීවර යාත්‍රාවකට රුපියල් 20,000ක් විතර වියදම් වෙනවා. හැබැයි, රුපියල් 10,000ක විතර මාළු තමයි ගෙනෙන්න පුළුවන් වෙන්නේ. බහුදින යාත්‍රාවෙන් ලක්ෂ 10ක විතර තමයි මාළු ගෙනෙන්න පුළුවන් වෙන්නේ. එහෙම වුණාම රස්සාව කරන්න බැහැ. අද මේ වනකොට තොටුපළවල්වල, ධීවර වරායවල බෝට්ටු, ඔරු ගැට ගහලා තිබෙනවා. ඒවා වෙන්දේසි කරන්න දාලා තිබෙනවා. බෝට්ටු, ඔරු විකුණන්න දාලා තිබෙනවා Facebook එකේ ඕනෑ තරම් අපි දකිනවා. මේක තමයි අද තිබෙන තත්ත්වය.

2000 වර්ෂයේදී අපේ GDP එකට සියයට 1.2ක දායකත්වයක් ලබා දුන්නා, ධීවර කර්මාන්තයෙන්. අවාසනාවකට අද අපේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 1ක දායකත්වයක් තමයි ධීවර කර්මාන්තයෙන් ලැබෙන්නේ. මාළු ආහාරයට ගන්න බැරි වුණාම දරුවන් ඇතුළු සියලු දෙනාගේ සෞඛ්‍ය තත්ත්වය පිරිහෙනවා. අපේ රටේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය පිරිහෙනවා; පෝෂණය අඩු වෙනවා. ඔබතුමන්ලාට මේ සඳහා තිබෙන උත්තරේ තමයි, බිත්තර පිටරටින් ගේනවා වාගේ මාළුත් පිටරටින් ගෙනෙන එක. මාළු ලාභ කරන්න ඔබතුමන්ලා ක්ෂණිකව ගන්න පියවර තමයි, පිටරටින් ගෙනෙන එක. බිත්තරවලටත් කළේ ඒකයි. අනෙක් හැම දේටමත් කරන්නේ ඒක තමයි. ඉතින්, ඒකට ආණ්ඩුවක් ඕනෑ නැහැ නේ. ඇත්තටම කොළඹ තොග වෙළෙඳුන්ටත් පුළුවන්, මාළු පිටරටින් ගෙන්වන්න; බිත්තර පිටරටින් ගෙන්වන්න. ආණ්ඩුවක වගකීම තමයි, නිෂ්පාදනය වැඩි කරන්න මැදිහත් වීම; අපේ ධීවර කර්මාන්තය නඟාසිටුවන්න මැදිහත් වීම. නමුත්, තවමත් අපට නම් පේන්නේ නැහැ, රටට නම් පේන්නේ නැහැ, මේ තිබෙන අර්බුදකාරී තත්ත්වයෙන් මුදා ගෙන ධීවර කර්මාන්තය නඟාසිටුවීම සඳහා ධීවරයාට දරන්න සිදුවන පිරිවැය අඩු කර ගන්න කටයුතු කරන බවක්. ධීවරයින් මුහුදු රස්සාව කරලා, කළපු රස්සාව කරලා එකතු කර ගන්න මාළු ටික ලාභදායී විධියට විකුණාගෙන ජීවිතේ ගැටගහගන්න පුළුවන් තත්ත්වයක් තවම ඇති වෙලා නැහැ. ඔබතුමන්ලා ඒ තත්ත්වය ඇති කරයි කියන බලාපොරොත්තුවක්වත් අපට තබාගන්න බැහැ. මේ වෙනකොටත් ඒ ධීවර ජනතාව මුහුණ දෙන ගැටලු ගොඩක් තිබෙනවා. ඒ ගැන කථා කරන්න මට වෙලාවක් නැහැ.

ගරු ඇමතිතුමනි, ධීවරයා දැවෙන එක් ප්‍රශ්නයක් ගැන පමණක් මම ඔබතුමාට කියන්නම්. කිලිනොච්චියේ, පූනගර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිරාංචි ග්‍රාම නිලධාරි වසමේ මේ වෙනකොටත් ටෝකියෝ සිමෙන්ති ආයතනයෙන් ගිහිල්ලා දැවැන්ත ලෙස හුනු ගල් කැණීමක් කරනවා. ඒ හුනු ගල් කැණීමත් එක්ක ඒ ප්‍රදේශයේ ධීවර ජනතාව විශාල අපහසුතාවකට පත් වෙලා සිටිනවා. ඒ වාගේම ගොවි ජනතාව විශාල අපහසුතාවකට පත් වෙලා සිටිනවා. පූනගර් ප්‍රදේශයේ වේරවිල්, පොන්නවේලි, වැලෙප්පාඩු, කිරාංචි, පාලචි යන ග්‍රාම නිලධාරි වසම්වල ජනතාව දැන් පාරට බැහැලා කෑගහනවා, ධීවර රස්සාව කර ගන්න බැහැ, කුඹුරු ගොවිතැන කර ගන්න බැහැ, ටෝකියෝ සිමෙන්ති ආයතනයෙන් දැවැන්ත ලෙස හුනු ගල් හෑරීමක් කරනවා කියලා. ඒ නිසා ලොකු පරිසර හානියක් වෙලා තිබෙනවා. ප්‍රදේශයේ ගොවි ජනතාවට, ධීවරයන්ට හානියක් වෙලා තිබෙනවා. මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, මේ සඳහා මැදිහත් වෙලා නියෝජිතයෙක් හරි යවලා මේ ප්‍රදේශයේ ජනතාවත් එක්ක සාකච්ඡා කරලා මේ ප්‍රශ්නය වහාම නිරාකරණය කරන්න කියලා. මොකද, ධීවර කර්මාන්තයත්, ගොවිතැනත් මේ නිසා තවත් බරපතළ අනතුරකට ලක් වෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා පොරොන්දු වුණා, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා ඉන්දියාවට ගියාට පස්සේ උතුරේ, විශේෂයෙන් මන්නාරමේ සිට යාපනය දක්වා වූ ප්‍රදේශයේ ධීවර ජනතාව මුහුණ පාන ප්‍රශ්නය - ඉන්දියානු trawlers ඇවිත් නීති විරෝධී bottom trawling හරහා අපේ මුහුදු සම්පත, මත්ස්‍ය සම්පත ඩැහැගෙන යන එක - පිළිබඳව ඉන්දියානු රාජ්‍යයත් එක්ක කථා කරලා විසඳුමක් ලබා දෙනවා කියලා. ඉන්දියාව නිකුත් කරපු ඒ ප්‍රකාශය තුළ, රනිල් වික්‍රමසිංහ මහත්මයා ඉදිරිපත් කළ ප්‍රකාශය තුළ නාවික-ගුවන් සම්බන්ධීකරණය පිළිබඳ කරුණු කිහිපයක් තිබුණා වුණත්, උතුරේ ධීවරයන් මුහුණ පාන ප්‍රශ්නයට උත්තරයක් තිබුණේ නැහැ. ඔබතුමා Select Committee එකේදීත් පොරොන්දු වුණා, කථා කරලා මේ ප්‍රශ්නයට විසඳුමක් ගේනවා කියලා. නමුත්, අදටත් ඒ ප්‍රශ්නය විසඳිලා නැහැ. බලය බෙදන්න කලින් රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් මේ ප්‍රශ්නය විසඳලා උතුරේ ධීවරයන්ගේ දෛනික ජීවිතය ගැටගහගන්න පුළුවන් වන විධියට ඔවුන්ට ධීවර රැකියාව කර ගන්න ඉඩ දෙන්න. අන්න ඒ අවස්ථාව ඇති කර ගන්න ඔබතුමාගේ මැදිහත් වීම අත්‍යවශ්‍ය වෙනවා. මම දන්නවා, ඒක ඔබතුමාට පෞද්ගලිකව විසඳන්න බැහැ කියලා. ඉන්දියානු රජයත් එක්ක රාජ්‍ය තාන්ත්‍රික මට්ටමේ සාකච්ඡා සහ එකඟතාවලින් තමයි මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් වෙන්නේ. නමුත්, අද වෙනකම් මේ ප්‍රශ්නය විසඳිලා නැහැ. ඉන්දියාවට ගිහිල්ලා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කථා කරන්න කලින්, උතුරේ දමිළ ධීවර ජනතාව මුහුණ දෙන දැවෙන ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්න වහා මැදිහත් වන ලෙස ඉල්ලා සිටිමින් මා නතර වෙනවා.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Hon. Presiding Member,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩග්ලස් දේවානන්දා ඇමතිතුමා.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
ගරු මන්ත්‍රීතුමනි, දැන් smartphone application එකක් තිබෙනවා. ඒක උපයෝගි කරගෙන boat ownersලාට බලන්න පුළුවන්, ඒ ගොල්ලන්ගේ boats කොහේද තිබෙන්නේ, fish කොහේද ඉන්නේ කියලා.

අනෙක් කාරණය මේකයි. ටෝකියෝ සිමෙන්ති සමාගම ගැන කථා කළා. අදත් කියන්නේ ඒ ගොල්ලන්ට ඒක ඕනෑය කියලායි. එතැන දේශපාලන සෙල්ලමක් තමයි යන්නේ. ටෝකියෝ සිමෙන්ති සමාගම සම්බන්ධ ප්‍රශ්නයක් නැහැ. අද සියයකට වැඩිය protest කළා, ඒ ගොල්ලන්ට ඒකේ development ඕනෑ කියලා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු ඇමතිතුමනි, ඒ ප්‍රදේශයේ ජනතාවට කුඹුරු කර ගන්න බැහැ, මුහුදු රස්සාව කර ගන්න බැහැ, කැණීම් නිසා දූවිල්ල ඇවිත් හානියක් වෙලා තිබෙනවා කියලායි මම කිව්වේ.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
දේශපාලන සෙල්ලමක් තමයි එතැන තිබෙන්නේ. වෙන මොකුත් ප්‍රශ්නයක් එතැන නැහැ. ඕනෑ නම් කෙළින්ම ගිහිල්ලා බලන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (ආචාර්ය) සරත් වීරසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.44]

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මමත් එකඟ නොවන දෙයක් තිබෙනවා. ඒ තමයි, වෙනදා විදේශීය හෝ දේශීය පුද්ගලයෙකු කැසිනෝ ශාලාවකට ඇතුළු වෙනකොට - enter වෙනකොට - ඩොලර් 100ක් ගත්තා. නමුත්, මේ වෙනකොට ඒ මුදල ඩොලර් 50ට පහළ දමා තිබෙනවා. ඇත්ත වශයෙන්ම අපට ඒකට එකඟ වෙන්න බැහැ. මම හිතන විදියට, මුදල් රාජ්‍ය ඇමති රංජිත් සියඹලාපිටිය මැතිතුමා ඒ සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කරාවි. මෙතැනදී අපි උත්සාහ කරන්නේ, රට වැටී තිබෙන මේ ආර්ථික අර්බුදයෙන් ගොඩ ගන්නයි. එහෙම නම්, මේ කටයුතුවලදී දෙමළ දේශපාලනඥයන්ගේ කාර්ය භාරය මොකක්ද? මේ ආර්ථික අර්බුදයෙන් ගොඩ එන්න අපි පුළුවන් තරම් උත්සාහ ගන්නා විට, ඔවුන් එක පැත්තකින් බලය ඉල්ලනවා. අනෙක් පැත්තෙන්, අර දෙමළ නිජබිම කියන මිථ්‍යාව සනාථ කරන්න අපේ බෞද්ධ නටබුන් සම්පූර්ණයෙන් විනාශ කරනවා. ඒ වාගේම ඒවා ආක්‍රමණය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඓතිහාසික කුරුන්දි විහාරය ගැන මීට පෙරත් අපි විවිධ අවස්ථාවල කථා කර තිබෙනවා. ථේරවාදී බුදු දහමේ කේන්ද්‍රස්ථානය තමයි, අපේ ලංකාව. ඒ වාගේම උතුරේ තිබෙන විශාලතම බෞද්ධ මධ්‍යස්ථානය තමයි, කුරුන්දි විහාරය. ඇත්ත වශයෙන්ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඒ ස්ථානය සංරක්ෂණය කළා. එය සංරක්ෂණය කරන අතරතුර දෙමළ බෙදුම්වාදී නීතිඥයන් සහ දේශපාලනඥයන් පිරිසක් එකතු වෙලා විවිධ බාධා ඇති කළා. ඊට පස්සේ ඔවුන්ට විරුද්ධව නඩු දැම්මා. නඩු දමනකොට, මුලතිව්වල ඉන්න ඒ මහෙස්ත්‍රාත්වරයා ඒවා නවත්වනවා; අත්හිටුවනවා. අත්හිටුවන කාලය තුළදී මැරයෝ ගිහිල්ලා ඒ සංරක්ෂණය කරපු දේවලුත් කඩා බිඳ දමනවා; පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉන්න වෘත්තිකයන්ට මරණීය තර්ජන එල්ල කරනවා. ඒ තත්ත්වය තුළ උතුරේ සංඝ නායක පූජ්‍ය ගලිගමුවේ සන්තබෝධි හාමුදුරුවන් කරන කාර්යභාරය, ඒවා ආරක්ෂා කරන්න කරන කැපවීම ඇත්ත වශයෙන්ම මේ අවස්ථාවේදී අගය කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ කෝවිල් විශාල සංඛ්‍යාවක් තිබෙනවා. බෞද්ධයනුත් ගිහිල්ලා ඒ කෝවිල්වල පුද පූජා පවත්වනවා. නමුත්, ඔවුන් කෝවිල් භූමියට ගිහිල්ලා බුදු පිළිමයක් තියලා පිරිත් කියන්න පටන් ගන්නේ නැහැ. ඒ මොකද? හින්දු ආගමට ගරු කරන නිසා තමයි බෞද්ධයෝත් කෝවිල්වලට ගිහිල්ලා පුද පූජා පවත්වන්නේ. ඒක තමයි නියම සංහිඳියාව කියන්නේ. නමුත්, ඊයේ මුලතිව් උසාවියේදී මහා අරුම පුදුම තීරණයක් දෙනවා. ඒ ස්ථානයේ කිසිම කෝවිලක සාධකයක් නැහැයි කියලා පුරාවිද්‍යා කැණීම්වලින් සනාථ කරලා තිබෙද්දීත්, කුරුන්දි පූජා භූමියේ පොංගල් උත්සවය තියන්න මහෙස්ත්‍රාත්වරයා ඊයේ අවසර දෙනවා. ඒ පොංගල් පූජාව පවත්වන්න හින්දු අන්තවාදී කණ්ඩායම්වලට එතුමා දිගින් දිගටම අවසර දෙනවා. විහාරාධිපති ස්වාමීන් වහන්සේවත් කැඳවා නොගෙන, උන්වහන්සේටත් අධිකරණය හමුවේ කරුණු කියන්න අවස්ථාවක් නොදී තමයි ඒ වාගේ නින්දිත, ඉතාම අසාධාරණ තීරණයක් එතුමා ගන්නේ. ඇත්ත වශයෙන්ම පුරාවිද්‍යා නීතිය පිළිබඳවවත්, එය බෞද්ධ පුරාවිද්‍යා ස්ථානයක් වීම පිළිබඳවවත් නොසලකමින් තමයි මේ අන්තගාමී තීන්දුව දී තිබෙන්නේ.

පුරාවිද්‍යා ආඥාපනතේ 31 (ආ) වගන්තියේ තිබෙනවා, යම් තැනැත්තන් පන්තියක් විසින් පූජනීය ලෙස හෝ ගෞරවාදරයෙන් හෝ සලකනු ලබන යම් පැරණි ස්මාරකයක් මත ඒ අසල හෝ ඒ සම්බන්ධයෙන් ඒ පැරණි ස්මාරකයේ පූජනීය ලෙස හෝ ගෞරවාදරයෙන් සලකනු ලබන තැනැත්තන්ගේ ආගමික හැඟීම් රිද්දවන සේ හෝ ප්‍රකෝප කරවන සුළු සිදුවීමකට ඉඩ ඇති යම් ක්‍රියාවක් කරනු ලබන තැනැත්තෙකු වරදකට වරදකරු විය යුතුයි, ඔහුට සිර දඬුවම් දිය යුතුයි කියලා. ඒ ආඥාපනතේ එලෙස පැහැදිලිව තිබෙද්දීත් මේ වාගේ කටයුතු කරනකොට බෞද්ධයන්ගේ හිත රිදෙන්නේ නැද්ද? ඒ තීරණය සාධාරණද කියලා මම අහන්න කැමැතියි. ජාතිවාදී, ආගම්වාදී ගැටුම්වලට මුල පුරන්නේ, ඒ අසාධාරණ, නින්දිත තීරණවලට විරුද්ධ වන අපිද, එහෙම නැත්නම් ඒ වාගේ බෞද්ධ සිද්ධස්ථානයක් තුළ පොංගල් පූජාවක් තියන්න අවසර ඉල්ලන ඒ ජාතිවාදී නීතිඥයන් සහ එයට අවසර දෙන ජාතිවාදී මහෙස්ත්‍රාත්වරුන්ද කියලා මම අහන්න කැමැතියි. මේ රටේ අධිකරණ විනිසුරුවරුන් ස්වාධීනව, අපක්ෂපාතීව කටයුතු නොකරන බවට ඇතැම් අය පළ කරන අදහස් සනාථ වන සේ කටයුතු කරන ආකාරය පිළිබඳව වහාම පරීක්ෂණයක් පවත්වන්න කියලා මම අධිකරණ සේවා කොමිෂන් සභාවෙන්ද, ඒ වාගේම අධිකරණ අමාත්‍යතුමාගෙන්ද මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා. ඒ වාගේම මේ නියෝගය හරහා ඇති වී ඇති අනිසි ප්‍රතිවිපාක වැළැක්වීම සඳහා මේ පුද පූජා පැවැත්වීම වළක්වන්න කටයුතු කරන ලෙස ජනාධිපතිතුමා ඇතුළු බලධාරින්ගෙනුත් මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම නීතිඥ සංගමයෙනුත් මා ඉල්ලා සිටිනවා, මීට වඩා රට ගැන, ජාතිය ගැන, සමගිය ගැන හිතලා ලිපි නිකුත් කරන්න කියලා. හෙට වෙනකොට පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට මුවා වෙලා, අධිකරණයට අපහාස කළා කියලා මා සම්බන්ධයෙන් නිවේදන නිකුත් නොකර, ජාතිවාදී දෙමළ දේශපාලනඥයන්ගේ පැත්ත නොගෙන, සාධාරණව බලා අවංකව තමන්ගේ අදහස් ප්‍රකාශ කරන ලෙසත් මම නීතිඥ සංගමයෙන් ඉල්ලා සිටිනවා.

ගරු ජනාධිපතිතුමා අද උදෑසන දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැනත් කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම උතුරේ බෞද්ධ නටබුන් තිබෙන ස්ථානවලට ගියා. අපි දැක්කා, වඩුන්නාගල ඓතිහාසික බෞද්ධ සිද්ධස්ථාන. ඉතා පැරණි චෛත්‍ය බිමට සමතලා කරලා පාදම මත ශිවලිංගය තියලා පූජා පවත්වනවා. එතකොට බෞද්ධ නටබුන්, ගල් කණු, සඳකඩ පහන් විනාශ කරලා පොළොව යට හංගලා තිබෙනවා. ඉතින් ඉඩම් බලතල නැතුව එහෙම කරනවා නම්, ඒ බලය ලැබුණාම කොහොම වෙයිද කියලා මම අහන්න කැමැතියි. උතුරේ හඳුනාගත් බෞද්ධ සිද්ධස්ථාන 1,000කට වඩා තිබෙනවා. මේවා තමයි අපේ උරුමය. මේ උරුමය අයිති සිංහල බෞද්ධයාට පමණක් නොවෙයි. ඒක තමයි misconception එක, වැරදි අවබෝධය. මේ සියලු බෞද්ධ නටබුන්, බෞද්ධ සිද්ධස්ථානවල උරුමය අයිති සිංහල බෞද්ධයන්ට පමණක් නොවෙයි, සමස්ත ශ්‍රී ලාංකීය ජනතාවටමයි. එහෙම හිතන්නේ නැති අන්තවාදී දෙමළ

දේශපාලනඥයන් ඉන්න තාක් කල් දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කථා කරන්නවත් අපි කැමැති නැහැයි කියලා මේ අවස්ථාවේදී කියා සිටිනවා. අනික, මේ රට ආර්ථික අර්බුදයෙන් පෙළෙනකොට උතුරට බලය ඉල්ලන්නේ කවුද? විශේෂයෙන්ම **ද්‍රවිඩ සන්ධානය.** ද්‍රවිඩ සන්ධානය කියන්නේ කොටි සංවිධානයේ දේශපාලන හස්තය. ඔවුන්ට අවුරුදු 30ක් තිස්සේ යුද්ධ කරලා ගන්න බැරි වෙච්ච දේ දැන් ද්‍රවිඩ සන්ධානයට අපි තැටියක තියලා දෙන්න හදනවා නම්, ඒක ඉතාම අසාධාරණයක්. මොකද, යුද්ධයේදී අපේ 29,000ක් මැරුණා; 14,000ක් ආබාධිත වුණා.

ගරු ජනාධිපතිතුමා අද කිව්වා, පළාත් සභාවලට රුපියල් බිලියන 550ක් වාර්ෂිකව ගෙවනවා කියලා. පළාත් සභා ආවේ 1987 දී. ඒ වාගේම තමයි පළාත් නවයයි මධ්‍යම ආණ්ඩුවෙයි ගත්තාම, කෘෂිකර්ම අමාත්‍යවරු 10දෙනෙක් හිටියා. හැබැයි, අද කෘෂි කර්මාන්තය දියුණු වෙලා තිබෙනවාද? අධ්‍යාපන ඇමතිවරු 10දෙනෙක් හිටියා. නමුත් අද අධ්‍යාපනය දියුණු වෙලා තිබෙනවාද? සෞඛ්‍ය ඇමතිවරු 10දෙනෙක් හිටියා. නමුත් අද සෞඛ්‍ය දියුණු වෙලා තිබෙනවාද? ඒ නිසා මේ පළාත් සභා සුදු අලියෙක් කියලා අපි හැමෝම දන්නවා. ඒ නිසා ඇත්ත වශයෙන්ම පළාත් සභා අහෝසි කරන්න ඕනෑ. මොකද, අපි දන්නවා, ජන වරම තිබෙන්නේ අලුත් ව්‍යවස්ථාවකට බව. අපි ඒ අලුත් ව්‍යවස්ථා කෙටුම්පත සාකච්ඡාවට භාජන කරමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය සමාප්ත කරනවා. .

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.52]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ ගෙනෙන නියෝග ගැනත් විවාද කරන මේ අවස්ථාවේදී ප්‍රථමයෙන්ම මම මේ කාරණය කියන්න කැමැතියි. අපගේ හිටපු රාජ්‍ය අමාත්‍ය දිලිප් වෙදආරච්චි මැතිතුමා මේ සභාවට ධීවරයෝ වෙනුවෙන් යෝජනාවක් කළා. ඒ තමයි, ධීවරයෝ පාවිච්චි කරන ලාම්පු තෙල් සහ ඩීසල්වල මිල රුපියල් 100කින් අඩු කිරීමේ යෝජනාව. මම ඒ යෝජනාව ස්ථිර කරනවා. අපි දකිනවා, මේ වෙලාවේ ධීවර ජනතාව ඉතාම අමාරුවෙන් තමයි ඉන්නේ කියලා. මම හිතන විධියට ලංකාවේ වතු කම්කරු ජනතාව ළඟට සිටින ඊළඟ දුප්පත්ම ජනතාව වන්නේ ධීවර ජනතාවයි. එක අතකින් ආර්ථික අර්බුදය, අනික් අතින් "X-Press Pearl" නෞකාවෙන් වුණු විනාශය හින්දා ධීවර කර්මාන්තයට ප්‍රබල ප්‍රහාරයක් එල්ල වුණා. මොකද, මේ වෙනකොට තෙල් මිල වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම ධීවර ආම්පන්නවල මිල වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම "X-Press Pearl" නෞකා අනතුර නිසා සහ දීර්ඝ කාලීනව වුණු පරිසර විනාශය හින්දා මේ වෙනකොට මත්ස්‍ය අස්වැන්න අඩු වෙලා තිබෙනවා. ඒ හින්දා රටේ සමස්ත ජනතාවටත් පාඩුවක් වෙලා තිබෙනවා. මොකද, මේ වෙනකොට මාළු මිල වැඩි වෙලා තිබෙනවා. මාළු මිල වැඩි වුණාට අස්වැන්න අඩු හින්දා ධීවරයන්ට එහි ප්‍රතිලාභයක් යන්නේ නැහැ. කලින් කථා කරපු කථිකයෝ ධීවර ආම්පන්න ගැන කිව්වා. ඒ නිසා මම ඒ පිළිබඳව කථා කරන්න යන්නේ නැහැ. මොකද, ඒවා ගැන කියලායි තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ මුහුදු තීරය ඉතාම ප්‍රබල ලෙස දූෂණයකට ලක් වෙලා තිබෙන්නේ. ලෝකයේ දූෂණයට ලක් වෙලා තිබෙන මුහුදු තීර ගත්තොත්, ලංකාවේ මුහුදු තීරය එසේ දූෂණයට ලක් වුණු මුහුදු තීර අතරින් 5වෙනි තැනට තිබෙනවා කියලා තමයි අපට වාර්තා වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම ප්ලාස්ටික් අපද්‍රව්‍ය ටොන් මිලියන 1.59ක් වාර්ෂිකව මේ මුහුදු තීරයට එක් වෙනවා. අපේ රටේ ගංගා තුළින්, ඒ වාගේම අනිකුත් අපද්‍රව්‍ය බැහැර කිරීම තුළින් අපේ මුහුදු තීරය මේ වෙනකොට විනාශයට ලක් වෙලා තිබෙනවා. ඉස්සර ධීවර අමාත්‍යාංශයට තිබුණු වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ඒ වාගේම මීපා ආයතනය වැනි ඒවා ඔබතුමා යටතේ නැති හින්දා "X-Press Pearl" නෞකා අනතුර වාගේ විනාශ ඇති වුණාම අපි දැක්කා, ඒවා හරියට සම්බන්ධීකරණය කරලා වැඩකටයුතු වෙන්නේ නැහැ කියන එක. ඊයේත් "X-Press Pearl" නෞකාව පිළිබඳව පත් කර ඇති ඒ විශේෂ කමිටුවට අපි රැස්වුණා. අපි දකිනවා, ඒ නිලධාරින් ඇවිල්ලා කමිටුවේ සාක්කි දෙද්දී, එතුමන්ලා කියනවා, හරියට සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් නැති හින්දා මේ විනාශය වුණා, මේකට හරියට මුහුණ දෙන්න බැරි වුණා කියලා. මම හිතන විධියට ඒකෙන් වැඩිපුරම හානිය වෙලා තිබෙන්නේ ධීවර කර්මාන්තයටයි. වැඩිපුරම හානිය ධීවර කර්මාන්තයට වුණු හින්දා අපේ ධීවර ජනතාව අද වෙනකොට ආර්ථික වශයෙන් ඉතා අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවා.

ඒ වාගේම ධීවර කර්මාන්තය කඩා වැටීම නිසා අපේ රටේ සාමාන්‍ය ජනතාවට අද වෙනකොට ආහාර පිළිබඳවත් විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ වාර්තාවල තිබෙනවා මම දැක්කා, 2050 වෙනකොට අපේ රටේ මුහුදු තීරයේ මත්ස්‍යයින්ට වඩා ප්ලාස්ටික් අපද්‍රව්‍ය තිබෙන්න පුළුවන් කියලා. ඒ නිසා ඔබතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, මේ ප්ලාස්ටික් අපද්‍රව්‍ය සම්බන්ධව අවශ්‍ය නීති රීති ගෙනැල්ලා පළමුවෙන්ම අපගේ මුහුදු තීරය සුද්ද කිරීම සඳහා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා. ඒ වාගේම මේ ප්ලාස්ටික් අපද්‍රව්‍ය නිෂ්පාදනය කරන සහ පාවිච්චි කරන කර්මාන්තවලට යම්කිසි නීති රීති මාලාවක් ගෙනෙන්න වෙනවා, මේ අපද්‍රව්‍ය හරියට recycle කරලා, පරිසරයට මුදා නොහැර, ධීවර කර්මාන්තය විනාශ නොකර මේවා පාවිච්චි කිරීම ගැන. මොකද, ඒවා හරියට ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, මම මේ අවස්ථාවේදී ඔබතුමාගෙන් තවත් කාරණයක් අහන්න කැමැතියි. මම හිතන්නේ ඔබතුමා ඒකට උත්තරයක් දුන්නේ නැහැ. ඔබතුමා ජනාධිපතිතුමා එක්ක ඉන්දියානු සංචාරයට සහභාගි වුණා. මා දන්නා තරමින් ඒ ඉන්දියානු සංචාරයට එකතු වුණු අමාත්‍යවරු හතරදෙනාගෙන් එක් අමාත්‍යවරයෙක්, ඔබතුමා. මම හිතන්නේ ඔබතුමා ඒ ඉන්දියානු සංචාරයට එකතු වුණේ අපේ උතුරු මුහුදු තීරයට ඉන්දියානු බෝට්ටු ඒම පිළිබඳව සාකච්ඡා කරන්නයි. නමුත්, ඉන්දියාව හෝ ලංකාව මේ පිළිබඳව යම් ප්‍රකාශයක් නිකුත් කර තිබෙනවා අපි දැක්කේ නැහැ. ඒ නිසා ජනාධිපතිතුමාත් එක්ක ඉන්දියාවට ගිහිල්ලා ඒ ඉන්දියානු බෝට්ටු පිළිබඳව සිදු කළ සාකච්ඡා අසාර්ථක වුණාද, එහෙම නැත්නම් ඒ ගැන සාකච්ඡා වුණේ නැද්ද කියලා දැනගන්නට අපේ ධීවර ජනතාව බලා සිටිනවා. ඒකට යම්කිසි උත්තරයක් දුන්නොත් හොඳයි කියලා මම මේ අවස්ථාවේදී ඔබතුමාට කියනවා.

ඊළඟට, ඔබතුමා මේ වනකොට VMS පද්ධතිය ස්ථාපිත කරන්න කටයුතු කළාය කියලා කියනවා. විශේෂයෙන්ම අපි මතක් කරනවා, ඕස්ට්‍රේලියානු ආධාර යටතේ ඒ පද්ධතිය ක්‍රියාත්මක වන බව. අපට මතකයි, අපි මේ පාර්ලිමේන්තුවේත්

[ගරු නිරෝෂන් පෙරේරා මහතා]

විවාද කරලා මීට වසර ගණනාවකට පෙර 2014දී VMS පද්ධතියක් මේ රටේ ස්ථාපිත කළා. නමුත්, ඒක හරියට ක්‍රියාත්මක වුණේ නැහැ. ගරු ඇමතිතුමනි, ඒ වාගේ පද්ධති හරියට ක්‍රියාත්මක වෙන්නේ නැතිව අපේ ධීවර යාත්‍රා වෙනත් රටවල මුහුදු තීරවලට ගිහිල්ලා නීති විරෝධී ලෙස මසුන් අල්ලා ගත්තොත්, අපේ මත්ස්‍ය අපනයන කර්මාන්තයට විශාල ප්‍රශ්නයක් ඇතිවෙන බව අපි දන්නවා. එක කාලයක් යුරෝපා සංගමයෙන් අපට තහනමක් දාලා තිබුණා. එහෙම වුණොත්, ඩොලර් මිලියන 300ක් විතර වටිනා මේ මත්ස්‍ය අපනයන කර්මාන්තය අනතුරට ලක් වෙන්න පුළුවන්. එම නිසා මම මේ අවස්ථාවේදී ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ VMS පද්ධතිය හරියට ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත් වෙන්න කියලා. ඒ වාගේම VMS පද්ධතිය සවි කිරීමේදී ඒවා මහහැරලා, මේවා නීති විරෝධි ලෙස කටයුතු කරන අවස්ථා තිබෙනවා. අපි දන්නවා, විශේෂයෙන්ම බේරුවල පැත්තේ බෝට්ටු කිහිපයක් ඩියාගෝ ගාර්ෂියා කලාපයට නිතරම ගිහිල්ලා අහුවෙලා ප්‍රශ්න ඇතිවෙලා තිබෙනවා කියලා. මට වෙලාව නැති නිසා මම ඒ ගැන වැඩිදුර කියන්නේ නැහැ. විවිධ රටවලින් එහෙම අත් අඩංගුවට අරගෙන තිබෙනවා. අපේ රටේ මත්ස්‍ය අපනයන කර්මාන්තයට, ඒ වාගේම අපේ ධීවර කර්මාන්තයට හානි වන අයුරින් කටයුතු කරන එවැනි බෝට්ටු හිමියන් සම්බන්ධව නීතිය හරියට ක්‍රියාත්මක කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම, ඉන්දියානු ධීවර ප්‍රශ්නය ගැනත් මේ අවස්ථාවේදී යම් පැහැදිලි කිරීමක් කරන ලෙසත් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නසීර් අහමඩ් ඇමතිතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.58]

**ගරු නසීර් අහමඩ් මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு நஸீர் அஹமட் - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Naseer Ahamed - Minister of Environment)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டில் ஏறத்தாழ 40 வருடங்களாகப் புரையோடிப் போயிருக்கின்ற இனப் பிரச்சினைக்கான தீர்வு பற்றிப் பேசப்படுகின்ற இக்காலகட்டத்தில், அரசியலமைப்புக்கான 13ஆவது திருத்தச் சட்டத்தை முழுமையாக அமுல்படுத்த வேண்டுமென்று மாண்புமிகு ஜனாதிபதி அவர்கள் genuineஆகத் தன்னுடைய நிலைப்பாட்டை இன்று இச்சபையில் சொல்லியிருந்தார். அது ஒரு சரியான தீர்வாக, இந்த நாட்டிலுள்ள எல்லா மக்களுக்கும் பொருத்தமான ஒரு தீர்வாக அமைய வேண்டும் என்பதில் யாரிடமும் எந்தவிதக் கருத்து முரண்பாடும் இருக்க முடியாது. அதற்கு நாங்கள் எல்லோரும் ஒத்துழைப்பு வழங்க வேண்டும். இன்னும் நாங்கள் இந்த நாட்டில் இனப் பிரச்சினைக்கான தீர்வு பற்றிப் பேசிக்கொண்டிருக்கின்றோம் என்று எண்ணும்போது மிகவும் வேதனையாக இருக்கின்றது. அரசியலமைப்புக்கான பதின் மூன்றாவது திருத்தம் பற்றியும் அதனுடைய விளைவுகள் பற்றியும் அது சம்பந்தமாக இந்த நாட்டு மக்களுடைய பார்வை எவ்வாறு இருக்கின்றது என்பது பற்றியும் நான் இவ்விடத்தில் பேசவேண்டியிருக்கிறேன். டிய நிலைக்குத் தள்ளப்பட்டிருக் கின்றேன். குறிப்பாக, அது தொடர்பான முஸ்லிம் மக்களுடைய பார்வை எவ்வாறு இருக்கின்றது என்ற விடயம் தொடர்பாக கட்டாயம் பேசவேண்டிய நிலைக்கு நான் தள்ளப் பட்டிருக்கின்றேன்.

அரசியலமைப்புக்கான பதின்மூன்றாவது திருத்தத்தின் பின்னர், இந்த நாட்டில் இனப் பிரச்சினைக்கான தீர்வு கிடைக்கும் என்று சொல்லப்பட்டபோதிலும், அந்தத் திருத்தம் சரியானதொரு தீர்வைக் கொடுக்கவில்லை என்ற யதார்த் தத்தை நாங்கள் இன்றும் பேசிக்கொண்டிருக்கின்றோம். Subsequently, they merged the North and the East temporarily and that continued for about 30 years. வடக்கு, கிழக்கு இணைப்புக்குப் பின்னர், குறித்த இரண்டு மாகாணங்களிலும் பாரிய இனச் சுத்திகரிப்பு நடைபெற்றது என்பதை யாரும் மறுக்க முடியாது. வடக்கிலிருந்து இரவோடு இரவாக 24 மணித்தியாலங்களுக்குள் கிட்டத்தட்ட 95,000 முஸ்லிம்கள் விரட்டியடிக்கப்பட்ட வரலாற்றை நாங்கள் மறந்துவிட்டு, இப்போது பேச முடியாது. அதேபோன்று, கிழக்கிலுள்ள எத்தனையோ கிராமங்களில் வாழ்ந்தவர்கள் அன்று பயங்கரவாதிகளால் வெளியேற்றப்பட்டார்கள்; கொலை செய்யப்பட்டார்கள்; அவர்களுடைய உரிமைகள் பறிக்கப்பட்டன; வீடுகள் எரிக்கப்பட்டன. இவ்வாறு அவர்கள் தங்களுடைய நிலங்களிலிருந்து விரட்டியடிக்கப்பட்டு, ஒரு குறிப்பிட்ட நகர எல்லைக்குள் தள்ளப்பட்ட வரலாற்றை மறந்துவிட்டு, இப்போது பேச முடியாது. குறிப்பாக, அரசியலமைப்புக்கான 13ஆவது திருத்தத்தின் பின்னர்தான் வடக்கு, கிழக்கில் இவ்வாறான இனச் சுத்திகரிப்பு நடைபெற்றது என்பதை யாரும் மறுக்க முடியாது. அங்கு தாம் சார்ந்த இனம் தவிர, வேறு எந்தவோர் இனமும் இருக்கக் கூடாது என்று வெறித்தனமாகவும் காடைத்தன மாகவும் அன்று பயங்கரவாதிகள் நடந்துகொண்டனர். பள்ளிவாசலில் தொழுது கொண்டிருந்த முஸ்லிம்கள் அவர்களால் கொல்லப் பட்ட வரலாற்றையும் அங்குள்ள கிராமங்களில் உள்ளவர்கள் துப்பாக்கியால் மட்டுமல்லாமல், கத்தியால் குத்தப்பட்டுக் கொல்லப்பட்ட வரலாற்றையும் பேசாமல், நாங்கள் அரசியலமைப்புக்கான 13ஆவது திருத்தத்தைப் பற்றிப் பேச முடியாது.

வடக்கு, கிழக்கில் ஒரு முக்கிய இனமாக இருக்கின்ற முஸ்லிம் சமூகத்தினுடைய அடிப்படை உரிமைகள் அத்தனை யும் மறுக்கப்பட்டது. அதன் பின்னணியிலே இவ்வாறான விடயங்கள் நடத்தப்பட்டன என்பதை எல்லோரும் ஏற்றுக் கொண்டாக வேண்டும். என்னுடைய பார்வையில் இனப் பிரச்சினைக்கான தீர்வானது, நிரந்தரத் தீர்வாக இல்லாமல் இருப்பதற்கு, இந்த நாட்டில் முஸ்லிம்களுடைய அடிப்படை உரிமைகள் புறக்கணிக்கப் பட்டதுதான் காரணம் என்பதை நான் இவ்விடத்தில் ஆணித் தரமாகக் கூறிவைக்க விரும்புகின் றேன். 2002இல் சமாதானப் பேச்சுவார்த்தை நடைபெற்ற போதுகூட, முஸ்லிம்கள் புறக்கணிக்கப்பட்டார்கள். அப்போது நாங்கள் எங்களுக்குச் சம அந்தஸ்து வேண்டுமென்று கேட்டோம். எனினும், அதைத் தர மறுத்தார்கள் என்பதையும் நான் இவ்விடத்திலே கூறியாக வேண்டும்.

நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற மட்டக்களப்பு மாவட் டத்தை எடுத்துக்கொண்டால், அங்கு 14 பிரதேச செயலகப் பிரிவுகள் இருக்கின்றன. அவற்றில், 4 பிரதேச செயலகப் பிரிவுகளில் - காத்தான்குடி, ஏறாவூர், கோறளைப்பற்று மத்தி என்று சொல்லப்படுகின்ற வாழைச்சேனை பிரதேசம், கோறளைப் பற்று மேற்கு என்று சொல்லப்படுகின்ற ஓட்டமாவடியை மையமாகக்கொண்ட பிரதேசம் என்பவற்றில் - முஸ்லிம்கள் பெரும்பான்மையாக வாழ்கின்றார்கள். மட்டக் களப்பு மாவட்டம் ஏறத்தாழ 2,876 square kilometres நிலப்பரப்பைக் கொண்டுள்ளபோதிலும், அங்கு முஸ்லிம்கள் majorityஆக வாழுகின்ற 4 பிரதேச செயலகப் பிரிவுகளுக்கும் வெறுமனே 1.4 சதவீதத்துக்கும் குறைவான காணிகளே கொடுக்கப்பட்டிருக்கின்றன என்ற யதார்த்தத்தை நாங்கள் புரிந்தாக வேண்டும். இதனுடன் தொடர்புடைய விடயங்கள் அனைத்தும் சட்டவிரோதமாகச் செய்யப்பட்டவை.

பனம்பலான ஆணைக்குழுவின் பரிந்-து-ரை-களில் கோறளைப்பற்று மத்திக்கு 240 square kilometres காணி கொடுக்கப்பட வேண்டுமென்று சொல்லப்பட்டிருக்கிறது. தேவநாயகம் அவர்கள் அமைச்சராக இருந்தபோது, கோறளைப்பற்று மேற்கானது 176 square kilometres நிலப்பரப்பைக் கொண்டிருந்தது. இன்று அதன் காணிகள் கள்ளத்தனமாகவும் கபடத்தனமாகவும் பறிக்கப்பட்டு, 29 square kilometresஆகச் சுருக்கப்பட்டிருக்கிறது. அதேபோல், 3 square kilometres நிலப்பரப்பில் ஏறத்தாழ 50,000 மக்கள் வாழுகின்ற ஒரு பிரதேச செயலகப் பிரிவாக ஏறாவூர் இருக்கிறது. அவ்வாறே, 4.6 square kilometres நிலப்பரப்பில் 60,000க்கும் மேற்பட்ட மக்கள் வாழுகின்ற ஒரு பிரதேச செயலகப் பிரிவாக காத்தான்குடி இருக்கிறது. ஏறாவூரிலுள்ள hospitalஇன் கழிவுகளை அகற்றுவதற்கு 2 ஏக்கர் காணி வேண்டுமென்று நாங்கள் கேட்டதற்கு, ஏறாவூர் பற்றுப் பிரதேச செயலகத்திலிருந்து காணி இல்லை என்பதாகப் பதில் வந்து. அந்தப் பிரதேச செயலகப் பிரிவில் 286 square kilometres நிலப்பரப்பு இருக்கின்றது. இவ்வாறான மனநிலையில் நாங்கள் ஒருபோதும் செயற்படக்கூடாது எனக்கூறி, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෆයිසාල් කාසිම් මැතිතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.06]

**ගරු ෆයිසාල් කාසිම් මහතා**
(மாண்புமிகு பைசால் காசிம்)
(The Hon. Faizal Cassim)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நிதி அமைச்சுடன் சம்பந்தப்பட்ட திருத்தச் சட்டமூலங்கள் மற்றும் கடற்றொழில் அமைச்சுடன் சம்பந்தப்பட்ட ஒழுங்குவிதிகள் என்பவற்றின் மீதான இன்றைய விவாதத்தில் கலந்துகொண்டு பேசுவதையிட்டு மகிழ்ச்சியடைகின்றேன்.

இன்று இச்சபையில் நாட்டின் ஜனாதிபதி அவர்கள் அரசியலமைப்புக்கான 13ஆவது திருத்தச் சட்டம் பற்றிப் பேசினார். நான் சென்ற பாராளுமன்ற அமர்வொன்றில் முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களுடன் மாண்புமிகு ஜனாதிபதி அவர்கள் பேச்சுவார்த்தை நடத்த வேண்டுமெனக் கோரிக்கையொன்றை விடுத்திருந்தேன். எனினும், இன்றுவரை அது செவிசாய்க்கப்படவில்லை. இன்றும்கூட, அவர் வடக்கு, கிழக்கிலுள்ள தமிழர்களைப் பற்றிப் பேசினாரே தவிர, அங்குள்ள முஸ்லிம் மக்களைப் பற்றிப் பேசவில்லை. கௌரவ அமைச்சர் ஹாபிஸ் நஸீர் அவர்கள் பேசியதை நான் கேட்டுக்கொண்டிருந்தேன். மாண்புமிகு ஜனாதிபதி அவர்களுடன் பேசுவதற்காக முஸ்லிம் MPs அனைவரும் sign பண்ணி உங்களிடம்கூட கடிதம் ஒன்றைக் கொடுத்திருந்தோம். அதற்குக்கூட எங்களுக்கு இன்னும் நேரம் கிடைக்கவில்லை என்பதை நான் இந்த இடத்திலே ஞாபகப்படுத்த விரும்புகின்றேன்.

**ගරු නසීර් අහමඩ් මහතා**
(மாண்புமிகு நஸீர் அஹமட்)
(The Hon. Naseer Ahamed)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Yes, Hon. Naseer Ahamed?

**ගරු නසීර් අහමඩ් මහතා**
(மாண்புமிகு நஸீர் அஹமட்)
(The Hon. Naseer Ahamed)
மாண்புமிகு ஜனாதிபதி அவர்கள் முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களுடன் தனியாகப் பேசுவதாக இன்று காலையில் இச்சபையில் அறிவித்திருந்தார். கௌரவ றவுப் ஹகீம் அவர்கள் அதற்கான விண்ணப்பத்தை முன்வைத்தபோது, அதற்குரிய நேரத்தை ஒதுக்கித் தருவதாக மாண்புமிகு ஜனாதிபதி அவர்கள் வாக்குறுதி அளித்தார்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථා කරන්න.

**ගරු ෆයිසාල් කාසිම් මහතා**
(மாண்புமிகு பைசால் காசிம்)
(The Hon. Faizal Cassim)
கௌரவ கடற்றொழில் அமைச்சர் அவர்களே, கடந்த கடற்றொழில் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில் கல்முனையிலுள்ள ஆழ்கடல் மீனவர் களுடைய பிரச்சினைகள் பற்றி நான் பேசியிருந்தேன். அது பற்றி உங்களுக்கும் தெரியும்! அன்று உங்களுடைய DG அவர்கள்கூட இது பற்றிச் சொல்லியிருந்தார். இருந்தாலும், இதுவரை அது சம்பந்தமாகச் சாதகமான எந்தப் பதிலும் எங்களுக்குக் கிடைக்கவில்லை. கௌரவ ராஜித சேனாரத்ன அவர்கள் கடற்றொழில் அமைச்சராக இருந்தபோது, பொருத்தப்பட்ட கல்முனைப் பிரதேசத்திற்குரிய radio communication systemஐ இன்று வாழைச்சேனைக்குக் கொண்டுசென்றிருப்பதாகக் கூறினோம். இருந்தாலும், அது சம்பந்தமாகவும் எந்தப் பதிலும் இதுவரை எங்களுக்குக் கிடைக்கவில்லை. இன்று கல்முனைப் பிரதேசத்தில் கிட்டத்தட்ட 500க்கும் மேற்பட்ட ஆழ்கடல் மீனவர்கள் தொழிலில் ஈடுபட்டிருக்கிறார்கள் என்பது உங்களுக்குத் தெரியும்! அன்று நான் உங்களிடம் முன்வைத்த பிரச்சினை யைச் சற்று கருத்திற்கொண்டு, அதற்குரிய பதிலை மிக விரைவாகப் பெற்றுத்தர வேண்டுமென்று கேட்டுக்கொள் கின்றேன்.

இன்று இச்சபையில் பேசிய நிறைய பாராளுமன்ற உறுப்பினர்கள், மீனவர்களுடைய மீன்பிடிச் செலவினம் அதிகரித்திருப்பது பற்றிக் கூறினார்கள்; மண்ணெண்ணெயின் விலை பற்றிக் கூறினார்கள். அத்துடன், மீனவர்களுடைய boatsக்குரிய spare parts பற்றியும் பேசினார்கள். இன்று எமது பிரதேசத்திலுள்ள கரையோர மீனவர்களுக்கு தொழிலில் ஈடுபட முடியாத நிலை ஏற்பட்டிருக்கிறது. காரணம், இப்பொழுது jellyfish வந்துவிட்டது. மீன்பிடியில் ஈடுபடும் போது, மீன்களைவிட jellyfish கூடுதலாக வருவதனால், வலைகள் கல்லில் இழுபட்டு அறுபடுகின்றன. அதனால் அவர்களுக்கு நஷ்டம் ஏற்படுகின்றது. ஒலுவில் துறைமுகம் சம்பந்தமாக நீங்கள் ஒரு தீர்க்கமான முடிவைப் பெற்றுத் தருவதாகக் கூறியிருந்தீர்கள். அங்கு கரையோரத்திலுள்ள நீரோட்டத்தின் காரணமாக அங்குள்ள கற்கள் எழுப்பப்பட்டு, அதனால் வலைகள் இழுக்கப்பட்டு, அறுபடுகின்றன. இவ்வாறான பெரிய பிரச்சினைகளோடுதான் இன்று எமது கிழக்கு மாகாணத்திலுள்ள மீனவச் சமூகத்தினர் வாழ்ந்து கொண்டிருக்கிறார்கள்.

[ගරු ෆයිසාල් කාසිම් මහතා]

அவர்களுக்கு எந்தவிதமான உதவியையும் எங்களால் செய்ய முடியவில்லை. உங்களிடம் கேட்டால், அரசாங்கத் திடம் பணம் இல்லை என்பதால் ஒன்றும் செய்ய முடியாதென்று சொல்வீர்கள். உண்மையைச் சொல்வ தென்றால், வடக்கு, கிழக்கில் மீன்பிடித்துறை அபிவிருத்தி செய்யப்படவில்லை. இதை நான் இங்கு ஆணித்தரமாகக் கூறுவேன். இன்று தென்கிழக்குப் பகுதியிலுள்ள மீனவர் களுக்கு என்ன வேண்டுமோ, அவ்வளவும் கிடைக்கின்றன. ஆனால், வடக்கு, கிழக்கிலுள்ள எங்களுடைய மீனவர்களுக்கு எந்த உதவியும் இல்லை. எனவே, நீங்கள் இது சம்பந்தமாகக் கரிசனைகொண்டு, வடக்கு, கிழக்கிலுள்ள மீனவர்களுடைய தேவைகளை நிறைவேற்றுவதற்கும் மீன்பிடித் துறைமுகங் களை அமைப்பதற்குமான வேலைத்திட்டங்களைச் செய்ய வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, நான் மீன்பிடித்துறையுடன் சம்பந்தப்படாத ஒரு பிரச்சினை பற்றிப் பேச விரும்புகின்றேன். அண்மையில் எங்களுடைய பிரதம மந்திரி அவர்கள் அம்பாறை மாவட்டத் திற்கு விஜயம் செய்திருந்தார்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ෆයිසාල් කාසිම් මහතා**
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)
මට විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

அரசாங்கத்தால் வழமையாக 500 மில்லியன் ரூபாய் நெல் கொள்வனவுக்காகக் கொடுக்கப்படும். ஆனால், இம்முறை 50 மில்லியன் ரூபாய்தான் கொடுக்கப்பட்டிருக்கிறது. இந்த விடயம் அன்றுதான் எங்களுக்குத் தெரியவந்தது. அவர்கள் அந்தப் பணத்தைக் கொடுத்துவிட்டு, "சம்பா நெல்லை மட்டும் வாங்குங்கள்!" என்று சொன்னார்கள். இது கவலையான ஒரு விடயமாகும். ஏனெனில், அங்கு 90 சதவீதம் நீண்ட அரிசிக்கான நெல்தான் உற்பத்தி செய்யப்படுகிறது. இதனை அதிகாரிகள் தெரியாமல் செய்திருக்கிறார்கள். அதற்காக அமைச்சரைக் குறைகூறவேண்டிய அவசியமில்லை. அந்தந்தப் பிரதேசங்களில் என்ன நடக்கிறது என்று தெரியாமல் அதிகாரிகள் அறிக்கைகளை விடுவதன்மூலம் இன்று விவசாயிகள் மிகவும் கஷ்டப்பட்டுக்கொண்டிருக்கிறார்கள். எமது பிரதேசத்தில் விவசாயிகளும் மீனவர்களும்தான் கூடுதலாக இருக்கிறார்கள். ஆகவே, அவர்களுடைய வாழ் வாதாரத்தைக் காப்பாற்றித் தருமாறு உங்களிடம் கேட்டுக் கொள்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගුණතිලක රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.12]

**ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**
(மாண்புமிகு குணதிலக ராஜபக்ஷ)
(The Hon. Gunathilaka Rajapaksha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ මාතෘකාවට පිවිසෙන්න කලින් මට කිව යුතු දෙයක් තිබෙනවා. ඊයේ දිනයේ පාර්ලිමේන්තුවේදී ඇති වුණු ඒ ව්‍යාකූල තත්ත්වය පිළිබඳව මට ලොකු කනස්සල්ලක්, කනගාටුවක් තිබෙනවා. මා නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ආසනයේ මා අධ්‍යාපනය ලැබූ පාසලේ දරු දැරියන් තමයි ඒ අවස්ථාවේ මේ පාර්ලිමේන්තු ගැලරියේ සිටියේ. ඒ අයට පාර්ලිමේන්තුව නැරඹීමට එන්න කටයුතු සංවිධානය කර දුන්නේ මම. ඒ, මා ඉගෙන ගත් පාසලේ දරුවන් නිසා. ඒ ගොල්ලන් පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු බලලා යන්න ආවේ පුදුමාකාර සතුටකින්. නමුත්, ඒ සතුට මම දැක්කේ නැහැ ඒ අය මෙහෙන් යනකොට. මෙහෙන් පිටත් වෙලා යන්න කලින් ඒ අය මට කථා කරලා ගියා. එනකොට ඒ අයගේ මුහුණුවල තිබුණු සතුට යනකොට තිබුණේ නැහැ. ඒ ඇති වුණු තත්ත්වය පිළිබඳව මම ඉතාම කනගාටු වෙනවා වාගේම ජාතියේ සියලු පාසල් දූ දරුවන්ගෙන් සමාවත් අයැද සිටිනවා. ඒ අවස්ථාවේදී නරක විධියට කථා කරපු ඒ මන්ත්‍රීවරුන්ට තිබුණා අඩුම වශයෙන් මේ උඩ බැල්කනිය දිහාවත් බලන්න. එහෙම බැලුවා නම් පෙනෙනවා නේ මේ රටේ අනාගතය බාර ගන්න ඉන්න දූ දරුවන් - පාසල් දරුවන් - මෙහි සිටින බව. ඒ ගැනවත් හිතන්න තිබුණා. ඒක එක පැත්තක්.

අනෙක් කාරණය මේකයි. මම පාර්ලිමේන්තුවට ඇවිල්ලා දැන් අවුරුදු තුනකට ආසන්නයි. මේ අවුරුදු තුන තුළ මම නම් එක දවසකවත් දැක්කේ නැහැ ගණපූරණය පිළිබඳ ප්‍රශ්නයක්. මීට පෙර අවස්ථාවල මේ ගරු සභාවේ ගණපූරණය නැති වුණත් ඒ වාගේ ප්‍රශ්නයක් ඇති වුණේ නැහැ. නමුත්, අද ඒකත් දේශපාලනීකරණය වෙලාද දන්නේ නැහැ. මට පෙනෙන හැටියට නම් එහෙමයි. ඊයේ ඉඳලා ගණපූරණය පිළිබඳ ප්‍රශ්න කිරීමත් විහිළුවක් බවට පත් වෙලා. රටට ආණ්ඩු පක්ෂය ද, විපක්ෂය ද කියා නැතිව අපෙන් අහන දේවලට උත්තර දෙන්න අපට බැරි වෙනවා, මේ කරන විගඩම් දිහා බැලුවාම. මොනවා හෝ ප්‍රශ්න තිබෙනවා නම් අදාළ බලධාරීන් සමඟ ඒවා විසඳා ගත යුතු වෙනවා. එහෙම නැතිව අප වාගේ සාමාන්‍ය මන්ත්‍රීවරුන්ට කරන්න කිසි දෙයක් නැහැ. කාලයක් තිස්සේ තිබුණා නේ, "225දෙනාම එපා" කියලා කථාවක්. මේ ගරු සභාව නරඹන්න එන පාසල් දූ දරුවන්ටත් හිතෙනවා මේ කියන්නේ ඇත්ත තමයි කියලා. ඒකට පොහොර පාරක් වදිනවා මේ කරන දේවල්, මේ හැසිරීම් දැක්කාම. ඒ නිසා මම නැවත වතාවක් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ඒ වාගේ දේවල් මේ සභාව තුළ සිදු කරන්න එපා කියලා. එවැනි දේවල් තවදුරටත් සිදු නොවේවා කියලාත් මම ප්‍රාර්ථනා කරනවා.

අද විවාදයට ගන්නා විෂයයක් තමයි ධීවර අමාත්‍යාංශය යටතේ, ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ ගෙනෙන නියෝග. අපි පුවත් පත් මඟින් බොහෝ අවස්ථාවල දැක්කා මහ විශාල මුදල් කන්දරාවක් බහුදින ධීවර යාත්‍රා හිමිකරුවන්ට, ව්‍යාපාරිකයන්ට දීලා ජීවිතය පරදුවට තබලා අපේ තරුණ තරුණියන් විශාල පිරිසක් නීත්‍යනුකූල නොවන ආකාරයෙන් රැකියා සොයා පිට රට යන ආකාරය. ඒ විස්තර අපි නිතරම මාධ්‍ය තුළින් දකිනවා. ඒ මිනිසුන් ඒ ආකාරයට යන්නේ තමන්ට රැකියාවක් නැති නිසා හොර පාරෙන් හරි ගිහිල්ලා රැකියාවක් කරලා තමන්ගේ අඹු දරුවන් පෝෂණය කිරීමේ අරමුණින්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු හේෂා විතානගේ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு ஹேசா விதானகே அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. HESHA WITHANAGE left the Chair, and THE HON. MAYANTHA DISSANAYAKE took the Chair.*

**ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**
(மாண்புமிகு குணதிலக ராஜபக்ஷ)
(The Hon. Gunathilaka Rajapaksha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රැකියාවක් සොයා ගැනීමේ අරමුණින් එසේ නීත්‍යනුකූල නොවන ආකාරයට පිට රටවලට යන බොහෝ අය මහ මුහුද මැදදී හෝ පිට රටකට ඇතුළු වෙන්න පෙර ජීවිතක්ෂයට පත් වන බව අපට අසන්නට ලැබෙනවා. ඒ අය තම මරණ සහතිකය - මරණ වරෙන්තුව - ලියාගෙනම යන පිරිසක්. ඒ අය නිල නොවන ආකාරයෙන් හෝ ගිහිල්ලා අපේ රටට ඩොලර් එවනවා. ඒ නිසා අපි ඒ මිනිස් ජීවිත අවතක්සේරු කරන්න හොඳ නැහැ; ඒ මිනිස් ජාවාරම නොසලකා හරින්න හොඳත් නැහැ. ගරු ධීවර අමාත්‍යතුමාගෙන් අප ඉල්ලා සිටින්නේ මේ පිළිබඳව සියලු පක්ෂවල අදහස් ලබා ගෙන හොඳ වැඩසටහනක් -හොඳ ව්‍යාපෘතියක්- සකස් කරන්න කියලායි. එහෙම කළොත් ඔවුන්ගේ ජීවිත බේරා ගන්නත්, එම මිනිස් සම්පත රැක ගන්නත් අපට පුළුවන් වේවි කියා මම විශ්වාස කරනවා.

අප පොඩි කාලයේ, ධීවර සංස්ථාවට අයත් මාළු වෙළෙඳ සැල් - fish stalls - හැම නගරයකම වාගේ - හැම තැනම වාගේ - තිබෙනවා දැක්කා. අඩු මුදලට, හොඳ වර්ගයේ මාළු ටිකක් ගන්න ධීවර සංස්ථාවේ fish stall එකකටම යන්න ඕනෑ කියා මිනිසුන් තුළ ලොකු විශ්වාසයක් තිබුණා. හැබැයි, අපේ රට තුළ තිබුණු ඒ වාගේ මාළු වෙළෙඳ සැල් - fish stalls - අද වනකොට වැසී ගිහින් තිබෙන බව පෙනෙනවා. කවුරු මොනවා කිව්වත්, මාළු මිල අද ඉහළ ගිහින් තිබෙනවා.

රට වටේටම මුහුද තිබුණත් මාළු මිල අද අපි කාටවත් දරා ගන්න බැහැ. ඒ තරමටම අද අපේ රටේ මාළු මිල ඉහළ ගිහින් තිබෙනවා. එම නිසා, මේ සම්බන්ධයෙන් ක්ෂණික වැඩ පිළිවෙළක් සකස් කරලා, අපේ රටේ තිබෙන සම්පත්වලින් උපරිම ප්‍රයෝජනය අරගෙන අපේ රටේ ජනතාවට සහනයක් ලබා දෙන්න කියලා ගරු අමාත්‍යතුමාගෙන් අප ඉල්ලා සිටිනවා.

ධීවර ජනතාවගේ ප්‍රශ්න පිළිබඳවත් හැමදාම වාගේ මේ සභාවේ කථා කරනවා. මා නියෝජනය කරන්නේ ධීවර ජනතාව සිටින පළාතක් නොවුණත් ඒ අයගේ මැසිවිල්ල නිතරම මාධ්‍ය තුළින් අපට අහන්න ලැබෙනවා. ඒ අයටත් නොයෙක් ප්‍රශ්න ඇති. ඔවුන්ට ප්‍රශ්න නැතුවා නොවෙයි. ඒ ගැනත් සොයා බලා, එම ධීවර ජනතාවට දිය යුතු සහන පුළුවන් තරම් ලබා දෙන්න අපි කටයුතු කරන්න ඕනෑ. අපි ධීවර ක්ෂේත්‍රය වෙනුවෙන් තෙල් සහනාධාරය ඇතුළු අනෙකුත් අවශ්‍ය පහසුකම් ලබා දෙනවා නම්, ඒක එම ධීවර ජනතාවට කරන උපකාරයක් කියලායි මම විශ්වාස කරන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**
(மாண்புமிகு குணதிலக ராஜபக்ஷ)
(The Hon. Gunathilaka Rajapaksha)

මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතටත් අද සංශෝධන ගේනවා. මේක ඉතාම වැදගත්. ඔට්ටු අල්ලනවා කියනකොට මම නම් හිතුවේ නිකම් සාමාන්‍ය ඔට්ටු අල්ලනවා කියලායි. නමුත්, අපි නොදැකපු පැත්තක් එහි තිබෙනවා. අද විවිධ දේවලට ඔට්ටු අල්ලනවා. ටෙනිස් ගහනකොටත් ඔට්ටු අල්ලනවා; ක්‍රිකට් ගහනකොටත් ඔට්ටු අල්ලනවා; බැඩ්මින්ටන් ගහනකොටත් ඔට්ටු අල්ලනවා; ගොල්ෆ් ගහනකොටත් ඔට්ටු අල්ලනවා. මේවා control කරන්නේ ක්‍රීඩකයන් නොවෙයි. මේක මේ රටේ විතරක් නොවෙයි, අද ජාත්‍යන්තරවත් පැන නැඟී තිබෙන ප්‍රශ්නයක් බව අපි දන්නවා. කණ්ඩායම් දෙකක් හෝ කිහිපයක් තරග කරනකොට කොයි කණ්ඩායමද දිනන්නේ කියන එක තීරණය කරන්නේ බුකීකාරයෝ, නැත්නම් රේස්කාරයෝ. මේ අය මොන මොනවායින් හරි කොහොම කොහොම හරි ඒ ක්‍රීඩකයින්ව අල්ලාගෙන ඔට්ටු අල්ලනවා. අද රට පුරා, ලෝකය පුරා ජාත්‍යන්තර මට්ටමින් මේ වැඩේ සිද්ධ වෙනවා. අද බල්ලොත් රේස් දුවනවා නේ. මේ හැමදෙයක්ම අද අනෙක් පැත්තට ගිහිල්ලා තිබෙනවා. බල්ලොත් රේස් දුවන නිසා වෙන්න ඇති, අද අපේ සමහර ක්‍රීඩා බල්ලාට ගිහිල්ලා තිබෙනවා. මේ පිළිබඳව අපි කතිකාවක් ගොඩනගලා, ඔට්ටු ඇල්ලීම පිළිබඳව විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළොත්, මේ තැරැව්කාරයන්ට, ඔට්ටුකාරයන්ට හසු නොවී මේ රටින් පිට රටට හොර පාරෙන් යන මුදල් ඉතිරි කරලා, අපේ දක්ෂ ක්‍රීඩකයන්ගේ දක්ෂතා තවත් ඉදිරියට ගෙනයන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා. තව විශේෂ කාරණා කිහිපයක් කියන්න තිබුණත්, මට නියමිත කාලය අවසන් නිසා මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

[අ.භා. 3.22]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට කථා කරන්න අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. නමුත්, මේ වාගේ හිස් සභාවක කථා කරන්න මට නම් අමාරුයි. මේ සභාවේ සිටිය යුතු අවම මන්ත්‍රීවරු සංඛ්‍යාවවත් නැත්නම් අපි කථා කරලා මොකටද? පාර්ලිමේන්තුවට එන අපි අතරේ වගකීමක් තිබෙන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරුන්ගෙන් අඩු ගණනේ 20දෙනෙකුවත් රැස්වීම පැවැත්වෙන වේලාවේ මේ සභාවේ සිටිය යුතුයි. එම නිසා, කරුණාකරලා ගණපූරණය විමසන්න කියලා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. පාර්ලිමේන්තුවේ මේ සභා ගර්භයේ අඩුම තරමින් මන්ත්‍රීවරු 20දෙනෙක්වත් ඉන්න ඕනෑ. ස්ථාවර නියෝග 11හි එය සඳහන්ව තිබෙනවා.

***පාර්ලිමේන්තුව ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.***

***පසුව ගණපූරණයක් තිබුණෙන්-***

*பாராளுமன்றம் கணக்கிடப்பட்டு, கூட்ட நடப்பெண் இல்லை யெனக் கண்டதனால், பிரிவு மணி அடிக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது. பிறகு,*

*கூட்ட நடப்பெண் இருந்ததனால் -*

*Parliament counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present -*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, කාලය තමයි තිබෙන ගැටලුව. ඔබතුමා Quorum එක නොමැති බව මතු කළ නිසා බෙදුම් සීනුව නාද කරනවා. හැබැයි, කථා කරන්න ඉන්න ගොඩක් අය විපක්ෂයේ මන්ත්‍රීවරු. ඒ සියලුදෙනාටම කථා කරන්න තිබෙන කාලය අඩු වෙනවා, මේ වැඩෙන්.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඇත්තටම මම කථා කරන්නත් ඕනෑ. නමුත් මටත් කථා කරන්න පුළුවන්කමක් නැහැ. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවට අපව ඇතුළත් නොකරනවා නම්, ගණපූරණය නැති අවස්ථාවලදී දිගටම එය මතු කරන්න අපට සිදු වෙනවා. එහෙම නම් ඉතින් ස්ථාවර නියෝග suspend කරලා කටයුතු කරන්න ඕනෑ.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට පෙර අවස්ථාවල එක් මන්ත්‍රීවරයකු පමණක් මේ සභාවේ සිටිමින් කථා කර තිබෙනවා. මේක කාලය පිළිබඳව ප්‍රශ්නයක්. මොකද, අපේ මන්ත්‍රීවරු 56දෙනෙක් මේ වෙනකොට Committee roomsවල ඉන්නවා. එතකොට කමිටුවල ඉන්න මන්ත්‍රීවරු මේ සභාවට ආවාම කමිටු පවත්වාගෙන යන්න බැරි තත්ත්වයක් ඇති වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා මේ ගැන දන්නවා. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවට මෙතුමන්ලාගේ නියෝජනයක් නැති එක ගැන මෙතුමා කියනවා. නමුත් ඒක විපක්ෂයේ කාර්යභාරයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ ඉන්න ඕනෑ 15දෙනායි. දැන් 33දෙනෙක් ඉන්නවා. ඒ කියන්නේ දෙගුණයකටත් වඩා වැඩියි. ඉතින් එන එන ප්‍රමාණයට වැඩි කරන්න ගියොත් සීමාවක් නැතුව යනවා. අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නියෝජනය දීලා තිබෙනවා. ඒ නිසා මෙය කළමනාකරණය කර ගැනීම විපක්ෂයේ - විපක්ෂ නායකතුමාගේත්, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේත් - වගකීමක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඊයේත් මම මූලාසනයේ සිටින අවස්ථාවේ මේ ගැටලුව මතු වුණා.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ඒ නිසා, කාලය අඩු කරනවා නම් දෙපැත්තෙන්ම අඩු කරන්න කියලා අපි කියනවා. ඊයේ අපේ කාලයෙන් විනාඩි 76ක් අඩු වුණා. කථිකයන් 6දෙනෙක් කථා කළේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මම දන්නවා. මම ඊයේත් මූලාසනයේ සිටියා.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ඒ නිසා, අද දවසේ කාලය කළමනාකරණය කරද්දී දෙපැත්තටම සාධාරණ ලෙස කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා (දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி - சுதேச வைத்திய இராஜாங்க அமைச்சர்)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law - State Minister of Indigenous Medicine)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මම මේ කාරණය සඳහන් කරන්න ඕනෑ. ජනමාධ්‍යවලින් පාර්ලිමේන්තු විවාද පෙන්වනකොට මන්ත්‍රීවරු සභාවේ රැඳී නොසිටින බව තමයි පෙනෙන්නේ. නමුත් පාර්ලිමේන්තුව තුළ කමිටු 79ක් ක්‍රියාත්මක වෙනවා. ආංශික අධීක්ෂණ කාරක සභා 17කට වැඩි සංඛ්‍යාවක් ක්‍රියාත්මක වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

17ක්, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා 20කට වැඩි සංඛ්‍යාවක් තිබෙනවා. මේ වෙලාවේත් අපි සිටියේ -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

හොඳයි, ගරු රාජ්‍ය ඇමතිතුමනි. ගරු වාසුදේව නානායක්කාර මැතිතුමනි, දැන් Quorum එක සම්පූර්ණයි. ඔබතුමාට මිනිත්තුවක පමණ කාලයක් තමයි ඉතිරි වෙලා තිබෙන්නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

හරි. මම පිළිගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මේකෙන් වෙන්නේ, මන්ත්‍රීවරුන්ට කථා කරන්න තිබෙන අයිතිය නැති වෙන එක විතරයි, විශේෂයෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කථා කරන්න තිබෙන වෙලාව ගොඩක් අඩු වෙනවා, මේ වැඩෙන්. අන්තිමට ආණ්ඩුවට විතරක් නොවෙයි, පොදු විපක්ෂයටත් මේ ප්‍රශ්නය බලපානවා. ඒ ගැනත් කල්පනා කරන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඒක මම පිළිගන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊයේ දිනයේත් මේකම සිදු වුණා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මේක ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් - දෙගොල්ලන්ම - අපට විසඳා දිය යුතු ප්‍රශ්නයක්.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ වෙලාවේ ආණ්ඩු පක්ෂයේ 53දෙනෙක් පාර්ලිමේන්තුවේ ඉන්නවා, විපක්ෂයේ 28දෙනෙක් ඉන්නවා. සමස්තයක් විධියට 75කට, 80කට වඩා ඉන්නවා. මේක ඒ මන්ත්‍රීවරුන්ට කරන අසාධාරණයක්. මොකද, සමාජය - මිනිස්සු - හිතනවා, මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවේ නැහැ කියලා. නමුත් එතුමන්ලා කමිටුවලට සහභාගි වෙලා විශාල කාර්යභාරයක් කරනවා.

සමහර වෙලාවට එක් මන්ත්‍රීවරයකු පමණක් මේ ගරු සභාවේ සිටිමින් කථා කළ අවස්ථා තිබෙනවා. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව නියෝජනය කිරීමට අවස්ථාව ලබා දීම විපක්ෂය විසින් කළ යුතු දෙයක්. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now. I cannot really give you any more time because over seven minutes has been spent on this matter.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ වෙලාවේ සිදු වෙලා තිබෙනවා අද දිනට නියමිත විෂයයට පිටින් මේ කාරණාව ගැන කථා කරන්න. අද දවසේ ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග සහ -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, හැබැයි ඔබතුමාට නියමිත කාලය දැන් අවසානයි. As a courtesy - you are a very senior Member of Parliament - I am just giving you some time to wind up. But, I cannot give you any more time because we have spent over seven minutes on this matter.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, how long are you going to give me?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
I can give you a minute to wind up.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
One minute? Well, there is nothing to wind up in one minute, Sir, as you will be pleased to see the time was taken by the discussion we had around the question of the Quorum. The question of the Quorum is a principle position we are taking, however much it becomes uncomfortable to all the parties concerned. We will have to continue this action of ours in order to ensure our representation in the Committee on Parliamentary Business. Thank you, Sir.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මන්ත්‍රීතුමා.

[අ.භා. 3.29]

**ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ரஞ்சித் பண்டார)
(The Hon. (Prof.) Ranjith Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අදට නියමිත කටයුතු අතර ඉතා වැදගත් පනත් කෙටුම්පත් දෙකකට සංශෝධන ඉදිරිපත් කිරීමටත් නියමිතයි. එවැනි වෙලාවක මේ සභාව ආමන්ත්‍රණය කිරීමට අවස්ථාව ලැබීම මා ගෞරවයක් විධියට සලකනවා. අපි දන්නවා, දීර්ඝ කාලයක් තිස්සේ සිදු කළ පරිදිම යම් යම් අවස්ථාවල විවිධ අණ පනත් මේ ආකාරයට සංශෝධනය කරන්න සිද්ධ වෙන බව. අපි මේක සාමාන්‍ය දෙයක් විධියට දැක්කාට, ඊට වඩා ගැඹුරු අදහසක් මේ සංශෝධන තුළ තිබෙනවා කියා මම හිතනවා. ඒ නිසා තමයි, රාජ්‍ය ප්‍රතිපත්තිය ගතික දෙයක් විධියට අපි දකින්නේ. රජයකට පුළුවන්කමක් නැහැ, දීර්ඝ කාලයක් තිස්සේ එකම ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවන්න. අපි මුල් අවස්ථාවල හිතුවා, බ්‍රිතාන්‍යයන්ගෙන් අපට ලැබුණු ඒ සිවිල් පරිපාලනය සහ රාජ්‍ය පරිපාලනය පිළිබඳ අත්දැකීම් පමණක් අපට ප්‍රමාණවත් කියලා. අවාසනාවකට අපි ඒ මොහොතේ කල්පනා කළේ නැහැ, අපේ රටේ ජනගහනය වැඩි වෙයි, ජන ඝනත්වය වැඩි වෙයි, අපට මුහුණ දෙන්න සිද්ධ වෙන සමාජ ආර්ථික ප්‍රශ්න පෙරට වඩා වැඩි වෙයි කියලා.

නිදහස ලැබෙනකොට අපේ රටේ ජනගහනය මිලියන 7යි. අද රටේ ජනගහනය මිලියන 21 ඉක්මවා ගිහිල්ලා තිබෙනවා. නිදහස ලැබෙන කාල සීමාව තුළ අපේ රටේ තිබුණේ ඉතා සංවෘත ආර්ථිකයක්. එවකට අපේ ආර්ථිකයේ නිෂ්පාදන සීමාව ලකුණු කර ගන්න බොහොම පහසුයි. ඒ වාගේම, එවකට අපි විදේශයන් සමඟ කරපු ගනුදෙනු බොහොම සීමිතයි. සමහර අවස්ථාවල ලංකාව හඳුන්වා තිබෙන්නේ, "ලිප්ටන්ගේ තේ වත්ත" විධියටයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් අද තත්ත්වය ඊට වඩා සම්පූර්ණයෙන්ම වෙනස්; අතිශයින් සංකීර්ණයි. ඒ නිසා අදට මුහුණ දෙන්න අවශ්‍ය අණ පනත් අපි සංශෝධනය කරගත යුතුමයි. විශේෂයෙන්ම රාජ්‍ය වියදම කළමනාකරණය කිරීම සම්බන්ධයෙනුත්, රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සම්බන්ධයෙනුත්, සමහර නිෂ්පාදන අංශ ධෛර්යවත් කිරීම සම්බන්ධයෙනුත් අපට අලුත් අණ පනත් ගෙන ඒමටත්, තිබෙන පනත් සංශෝධනය කරන්නත් සිද්ධ වෙනවා.

අපි සමහර අවස්ථාවල අනපේක්ෂිත අතුරු-ආන්තරාවලට මුහුණ දෙනවා. අපි හිතුවේ නැහැ, කොවිඩ්-19 වැනි ගෝලීය වසංගතයකට අපට මුහුණ දෙන්න සිද්ධ වෙයි කියලා. අපි හිතුවා, 2019 අවුරුද්දේ සිදු වූ පාස්කු ප්‍රහාරය වාගේ ප්‍රහාරවලට අපට

[ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා]

ආපහු මුහුණ දෙන්න වෙන එකක් නැහැ කියලා. නමුත් අපි දන්නේ නැහැ. අද ලෝකයේ සිද්ධ වෙන දේවල් දිහා බැලුවාම, සමහර වෙලාවට අපි තුන්වැනි ලෝක යුද්ධයකට මුහුණ දෙන්න සිද්ධ වෙන තැනකද ඉන්නේ කියන එක ගැනත් අපට විශ්වාසයක් නැහැ. ඒ නිසා දේශීය වශයෙන් සමහර තීන්දු-තීරණ ගනිද්දී අපි කල්පනා කළ යුතු වැදගත් කාරණයක් තිබෙනවා. ඒ තමයි, අපි තවදුරටත් හුදෙකලා රාජ්‍යයක් නොවෙයි කියන එක. අපි හුදෙකලා රාජ්‍යයක් විධියට කටයුතු කිරීමට යෑම මං දකින්නේ, මේ ගෝලීය ප්‍රවණතා අත්හැර දාලා අපට අවශ්‍ය ආකාරයට රට කළමනාකරණය කරන්න ගන්නා උත්සාහයක් විධියටයි. අපට එවැනි අත්දැකීමක් තිබෙනවා. 1970 කාලයට ගියත්, 1956ට ගියත් පෙනෙනවා, අපි එක්තරා විධියක සීමාවක් ඇතුළේ කටයුතු කරපු බව. ඒ නිසා තමයි රාජ්‍ය සම්පත් කළමනාකරණය කිරීම පිළිබඳව, රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම පිළිබඳව, රාජ්‍ය වියදම කළමනාකරණය කිරීම පිළිබඳව අලුතෙන් හිතන්න අපට අද සිද්ධ වෙලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි මේක අවස්ථාවක් කර ගන්න ඕනෑ, ඉදිරි පරම්පරාවට අලුතින් හිතන්න අවස්ථාව ලබා දෙන්න.

ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා ඉතා වැදගත් කාරණයක් මේ සභාවේදී මතු කළා. එතුමා මතු කරපු ඒ කාරණය ඉතා වැදගත්. හැබැයි, ඒ කාරණය හරහා සමාජගත වන වැරදි කාරණයක් තිබෙනවා, වැරදි අර්ථ දැක්වීමක් තිබෙනවා. ඒ තමයි, මේ පාර්ලිමේන්තු සභාව තුළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු රැඳී සිටින්නේ නැහැ කියන කාරණය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඒක වැදගත් කාරණාවක් වුණත්, මේ Debate එක ඉදිරියට කරගෙන යෑම අවශ්‍යයි. මම ඔබතුමාට වෙන් කරපු කාලය ලබා ගන්නේ නැහැ.

**ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ரஞ்சித் பண்டார)
(The Hon. (Prof.) Ranjith Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කාරණය වැදගත් බව ඇත්ත. නමුත්, සමාජගත වෙන්නේ ඊට වඩා වැදගත් නොවන කාරණයක්. ඒ තමයි, සභාව තුළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු රැඳී ඉන්නේ නැහැ කියන කාරණය. ඒක සම්පූර්ණයෙන්ම අසත්‍යයක්. මොකද, මේ අවස්ථාව වෙනකොට හැම කමිටු කාමරයකම වාගේ රැස්වීම් පැවැත්වෙනවා. මම මේ සභාව ආමන්ත්‍රණය කරන්න ආවේත් එක කමිටුවකට සහභාගි වීමෙන් පසුවයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා මේ කාරණා පිළිබඳව ඔබතුමාගේ කාරුණික අවධානය යොමු වෙන්න ඕනෑ. මේ සභාව තුළ වාද විවාද කරනවාට අතිරේකව ඒ කටයුත්තට සහභාගි වෙන විශාල පිරිසක් තිරයෙන් පිටුපස ඉන්නවා. ඒ පිරිස අමතක කරලා තමයි අපි කථා කරන්නේ. පනත් සංශෝධනය කිරීම පිළිබඳව, ඒ පනත්වලින් ඇති කරන බලපෑම පිළිබඳව විශාල පිරිසක් තිරයෙන් පිටුපස ඉඳලා රාජකාරි කරනවා. ඒ පිරිස අමතක කරලා අපට කටයුතු කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා ශ්‍රී ලංකාව 21වන සියවසේ රටක් විධියට දකින්න කැමැති නම් අපට සිදු වෙනවා, මීට වඩා විවෘත මනසකින් කටයුතු කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එක පැත්තකින් අවශ්‍ය අණ පනත් සංශෝධනය කරන අතරවාරයේ අලුතින් හිතන්නත් පුරුදු වෙන්න ඕනෑ. එ් වාගේම අපට වැරැදුණු ස්ථාන ගණනාවක් තිබෙනවා. අපට වැරැදුණු හැම අවස්ථාවකදීම අපි එක පුද්ගලයෙකුට හෝ ආයතනයකට ඇඟිල්ල දිගු කරන එක තමයි කරන්නේ. නමුත්, අපි එසේ නොකළ යුතුයි. ඒකට හේතුව, අපි හැම වෙලාවකම කණ්ඩායමක් විධියට කටයුතු කිරීමයි. ඒ නිසා ඒ කණ්ඩායම වෙත වගකීම පැවරෙන ක්‍රමයක් මේ පාර්ලිමේන්තුව තුළ අපි සාකච්ඡාවට ගත යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Member, so sorry to cut your speech short.

මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා.

[අ.භා. 3.35]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්ස්ප්‍රස් පර්ල් නෞකාවෙන් සිදුවුණු පරිසර හානිය නිසා ගම්පහ දිස්ත්‍රික්කයේ ඉන්න ධීවරයන්ට වාගේම බොහෝ ප්‍රදේශවල ධීවරයන්ටත් ධීවර කටයුතුවල නිරත වීම සම්බන්ධයෙන් වසරක තහනමක් නිකුත් කළා. එලෙස වසරක තහනමක් නිකුත් කළත්, අදටත් මුහුදු පරිසරයට විෂ ද්‍රව්‍ය එකතුවීම සිදු වෙනවා. ඒ නිසා හරියාකාරව මත්ස්‍ය සම්පත ලබා ගැනීමට හැකියාවක් ලැබී නැහැ. ඒ ව්‍යසනය වෙලා මේ වෙනකොට අවුරුදු දෙකහමාරකට අසන්න කාලයක් ගතවෙලා තිබෙනවා. නමුත්, මේ වෙනකොට ධීවරයන්ට ලැබිලා තිබෙන්නේ රුපියල් 25,000ක පමණ වන්දියක් විතරයි. ඒ අවුරුද්ද දිහා බැලුවොත්, ජීවනෝපාය අහිමිවීම නිසා ධීවර පවුල් 25,000ක් අද අනාථ වෙලා සිටිනවා. මේ වෙනකොට අවුරුදු දෙකහමාරක් ගතවෙලා තිබුණත්, තවම වන්දිය වශයෙන් ගෙවලා තිබෙන්නේ ධීවර බෝට්ටුවකටත්, එහි යන කෙනාටත් රුපියල් ලක්ෂ හතරහමාරක් වාගේ මුදලක් පමණයි. ධීවර බෝට්ටුවක යන කෙනාට රුපියල් ලක්ෂ එකහමාරක් දීලා තිබෙනවා. අයිතිකාරයාට රුපියල් ලක්ෂ තුනක් දීලා තිබෙනවා. එතකොට මාසයට රුපියල් 12,000ක් වාගේ ප්‍රමාණයක් තමයි දීලා තිබෙන්නේ.

මම ධීවර අමාත්‍යතුමාගෙන් අහන්න කැමැතියි, එක්ස්ප්‍රස් පර්ල් නෞකාව නිසා ඇති වුණු ප්‍රශ්නය සම්බන්ධයෙන් ඔබතුමා ගත් ක්‍රියාමාර්ග මොනවාද කියලා. ඒ වාගේම මම අහන්න කැමැතියි, ඔබතුමා ධීවරයන් වෙනුවෙන් පෙනී සිටියේ මොනවාටද කියලා. ඔවුන්ට ඉතුරු මුදල් ලබා දෙනවාද, එහෙම නැත්නම් රුපියල් ලක්ෂ එකහමාරක් පමණක් දීලා ඒ කටයුත්ත නවත්වනවාද, එහෙමත් නැත්නම් ඒ ලබා දුන් ලක්ෂ එකහමාර ගැන ඔබතුමා සෑහීමකට පත් වෙනවාද කියලා මම දැනගන්න කැමැතියි. මොකද, ඔබතුමා තමයි සමස්ත ධීවර ජනතාව වෙනුවෙන් පෙනී සිටින්නේ. ධීවර ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින්නේ ඔබතුමාගේ අමාත්‍යාංශය. ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවාද? එහෙම නැත්නම් ඔබතුමාට ඒ ධීවරයන්ට කියන්න පුළුවන්ද, මෙන්න මේ දවසට අපි හිඟ මුදල් ප්‍රමාණය ලබා දෙනවා කියලා? අඩුම ගණනේ එහෙම දෙයක් ඔබතුමා තීරණය කරලා තිබෙනවාද? ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශය දෙන දෙයක් දීලා වෙන දෙයක් බලාගෙන ඉන්නවා වාගේ කටයුතු කරන්නේ නැතිව ධීවරයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කථා කරලා, ධීවරයන් ශක්තිමත් කරන්න වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවාද කියලාත් මම අහන්න කැමැතියි.

ගරු අමාත්‍යතුමනි, මම තවත් කාරණාවක් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ අනතුර වෙනුවෙන් වන්දි හැටියට රුපියල් ලක්ෂ එකහමාරක මුදලක් ධීවර බෝට්ටුවල යන අයට ලබා දුන්නා. නමුත්, -සමහර විට ඒක නිලධාරින්ගේ වැරදි නිසා හෝ නොදැනුවත්කම නිසා හෝ වෙන්න පුළුවන්- තෝරාගත් ධීවර පවුල් 500කට තවම වන්දි ලබා දීලා නැහැ. ඒ මුදල ලබා දෙනවා කියලා නිර්දේශ කළත් අර ලක්ෂ එකහමාරවත්, ලක්ෂ තුනවත්, ලක්ෂ හතරවත් තවම ලබා දීලා නැහැ. එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුර නිසා ධීවරයන්ට ඇති වුණු ප්‍රශ්නය සම්බන්ධයෙන් කටයුතු කරන්නේ ඉබි ගමනින් නම්, ධීවර අමාත්‍යාංශයක් තිබෙන්නේ මොනවාටද කියලා අපට එක වෙලාවකට හිතෙනවා. ගරු අමාත්‍යතුමනි, එක්ස්ප්‍රස් පර්ල් නෞකාවෙන් සිදුවුණු පරිසර හානිය නිසා වක්‍ර ලෙස ධීවර රැකියාවේ නිරත වුණු පවුල්වලටත් වන්දි ලබා දෙන්න කියලා තීන්දුවක් ලබා දීලා තිබෙනවා.

ගම්පහ දිස්ත්‍රික්කය ගත්තොත්, ඒ විධියේ පවුල් 15,000ක් විතර ඉන්නවා. හැබැයි, අද වනකල් ඒ අයට සතයක්වත් දීලා නැහැ. එකස්ප්‍රස් පර්ල් නෞකා අනතුර වෙලා මේ වෙනකොට අවුරුදු දෙකහමාරක් පමණ ගත වෙලා තිබෙනවා. මීට මාස හයකට ඉස්සෙල්ලා වක්‍ර ධීවරයන්ට වන්දියක් දෙනවා කියලා යම් මුදල් ප්‍රමාණයක් දුන්නා. ඒ මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තැන්පත් වෙලා තිබෙනවා මිසක් ධීවර ජනතාව අතර බෙදා දුන්නේ නැහැ. සල්ලිත් හම්බ වෙලා මාස හයක් ගත වෙලාත්, ඒ සල්ලි ටික ධීවර ජනතාවට දෙන්නේ නැතුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තිබෙනවා. ඒ සම්බන්ධව ඇමතිවරයා වශයෙන් ඔබතුමා කටයුතු නොකරන්නේ ඇයි කියලා මම විශේෂයෙන්ම අහනවා.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
ඒගොල්ලන්ට දුන්නා, සල්ලි.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගෙවලා නැහැ, ගරු ඇමතිතුමනි. වක්‍ර ධීවරයන්ට දෙන වන්දි මුදල් ටික ගෙවලා නැහැ. අන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තිබෙනවා, එ් මුදල්. සතයක්වත් දීලා නැහැ, වක්‍ර ධීවරයන්ට.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ உறுப்பினர் அவர்களே, இதுவரை 'எக்ஸ்பிரஸ் பேர்ள்' கப்பல் அனர்த்தத்தால் பாதிக்கப்பட்டவர்களுக்கான நட்டஈட்டுத் தொகையானது நான்கு கட்டங்களாக வழங்கப் பட்டிருக்கின்றது. இப்பொழுது ஐந்தாவது கட்டத் தொகையை யும் கொடுக்க இருக்கின்றோம். நீங்கள் சொல்வதுபோல் ஏதாவது நடந்திருந்தால், தயவுசெய்து உடனே எனக்கு எழுத்து மூலம் அறியத்தாருங்கள்! உங்களுக்கு ஓரிரு நாட்களில் நான் அதற்குரிய பதிலையும் வழங்கி, உரிய நடவடிக்கையையும் எடுப்பேன்.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු ඇමතිතුමනි, මට දුක හිතෙනවා, ධීවරයන්ගේ ප්‍රශ්න ගැන ඔබතුමා දන්නේ නැතුව මගෙන් තොරතුරු ඉල්ලන එක ගැන. ඔබතුමා නේ, ධීවර ඇමතිවරයා.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
அப்படி ஒன்றும் நடக்கவில்லை என்பதைத்தான் நான் செல்கிறேன்.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඔබතුමාට දැනගන්න මම කියන්නම්. එතකොට මම ආයෙත් ලියුම් ලිය ලියා ඉන්න ඕනෑ නැහැ නේ.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
அப்படி ஏதாவது நடந்தால், அது தொடர்பில் எனக்கு எழுத்துமூலம் அறியத்தாருங்கள் என்றுதான் சொல்கிறேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පැහැදිලියි, ගරු ඇමතිතුමනි.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මම ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. මම ඔබතුමාට මේ කාරණය කියන්නේ, ජනතාව වෙනුවෙන්. වක්‍ර ධීවරයන් සඳහා සත පහක්වත් වන්දි ලැබිලා නැහැ. මම එය කියන්නේ වගකීමෙන්. ඔබතුමා ඒ ගැන බලන්න.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
ඒක අසත්‍ය කථාවක්.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
කවුද වක්‍ර ධීවරයන් කියන්නේ?

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ධීවර රැකියාවෙන් දෙවැනියට යැපෙන පිරිස. ඒ කියන්නේ, ඍජුව ධීවර කර්මාන්තයේ යෙදෙන අය ගෙනෙන මත්ස්‍ය සම්පතෙන් යැපෙන පිරිස. ගරු ඇමතිතුමනි, ඒ අය හඳුනාගෙන වන්දි ගෙවන්න මුදලුත් වෙන් කරලා තිබෙනවා. ඒ වෙන් කරපු මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලැබිලාත් තිබෙනවා. නමුත්, ඒ වන්දි මුදල් බෙදා දීලා නැහැ. වක්‍ර ධීවරයන් කියන්නේ, මාළු විකුණන අය, මාළු කපන අය. වක්‍ර ධීවරයෝ කියන්නේ කවුද කියලා ඇමතිතුමා දන්නෙත් නැහැ නේ.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ධීවර ඇමතිතුමා නොවෙයි, මමයි ඒක ඇහුවේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඔබතුමාත් ඇමතිවරයෙක් නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න. ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු ඇමතිතුමනි, වැලි ඉවත් කිරීම නිසා අද ධීවරයන්ට ලොකු ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
ගරු මන්ත්‍රීතුමා,-

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මට වෙලාව නැහැ. ඔබතුමාගේ කථාවේදී කියන්න.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
ඔබතුමා අසත්‍ය දේවල් කියනකොට මම ඇත්ත කියන්න ඕනෑ.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඔබතුමාගේ කථාවේදී කියන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Minister, I will give you time immediately after his speech.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
වැලි ඉවත් කිරීම නිසා අද ධීවරයන්ට ප්‍රශ්න ඇතිවෙලා තිබෙනවා. පසුගිය දවස්වල නැව් හතරකින් වැලි ඉවත් කිරීම කළා. ඒ වෙනුවෙන් ධීවරයන්ට වන්දියක්වත් ලැබුණේ නැහැ, ධීවර කටයුතුවලට හානිවීම සම්බන්ධයෙන් කටයුතු කරලාත් නැහැ. මෙලෙස වැලි ඉවත් කිරීම නිසා ධීවරයාට වර්තමානයේදී විතරක් නොවෙයි, අනාගතයේදීත් ප්‍රශ්නයක් ඇති වෙනවා. වැලි ඉවත් කිරීම නිසා මත්ස්‍යයන්ගේ ආහාර, මත්ස්‍ය අභිජනන ස්ථාන විනාශ වෙනවා. වර්තමානයේ සිදුවන හානියත්, අනාගතයට බලපාන හානියත් calculate කරලා ධීවරයෝ වෙනුවෙන් අමාත්‍යාංශය මොනවා හෝ කරන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ සුන්බුන් ටික තවම මුහුදේ තිබෙනවා. ධීවරයන්ට තම ධීවර කටයුතු කර ගන්න විධියක් නැහැ. මොකද, ඒ සුන්බුන් දැල්වල පැටලෙනවා. එම නිසා දැල් ගහන්න විධියක් නැහැ. එය අනතුරුදායකයි. එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ සුන්බුන් ඉවත් කිරීමට ධීවර අමාත්‍යාංශයෙන් මොනවාද කරන්නේ? ඒ සඳහා තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? ගරු ඇමතිතුමනි, ධීවර අමාත්‍යාංශයට මේ කටයුත්ත තනියම කරන්න බැහැ. මොකද, මුහුදේ අයිතිකාරයා වෙන කෙනෙක්; වෙන අමාත්‍යාංශයක්. ධීවර කටයුතු විෂයය භාර ඔබතුමාට. එම නිසා ඔබතුමා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය - MEPA - ඇතුළු අදාළ ආයතන එක්ක එකතු වෙලා වගකීමෙන් යුතුව යම් වැඩ පිළිවෙළක් සකස් කරන්න, ධීවරයන් ශක්තිමත් කරන්න. එහෙම නැතුව, දෙන දේ අරගෙන ධීවරයන්ට දීලා වෙන දේ බලාගෙන ඉන්න අමාත්‍යාංශයක් අපට වැඩක් නැහැ නේ. අපට ඕනෑ ධීවරයන් වෙනුවෙන් කටයුතු කරන අමාත්‍යාංශයක් නිර්මාණය කිරීමයි. එය කරන්න කියලා මම විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා.

මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමාට අවශ්‍ය නම් පිළිතුරක් දෙන්න පුළුවන්.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
No, no. වේලාව -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Yes, time is a problem.

Next, the Hon. (Mrs.) Diana Gamage. ඔබතුමිය කථා කරනවාද? නැත්නම් ගරු මුෂාරෆ් මන්ත්‍රීතුමාට අවස්ථාව දෙන්නද?

**ගරු ඩයනා ගමගේ මහත්මිය (සංචාරක රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) டயனா கமகே - சுற்றுலாத்துறை இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Diana Gamage - State Minister of Tourism)
Sir, I will speak after him.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මන්ත්‍රීතුමා කථා කරන්න.

[පි.ව. 3.43]

**ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා**
(மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப்)
(The Hon. S.M.M. Muszhaaraff)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் 1996ஆம் ஆண்டின் 2ஆம் இலக்க, கடற்றொழில் மற்றும் நீர்வாழ் உயிரின வளங்கள் சட்டத்தின் கீழான ஐந்து ஒழுங்குவிதிகள் கௌரவ கடற்றொழில் அமைச்சரால் இங்கு சமர்ப்பிக்கப் பட்டிருக்கின்றது. இன்றைய விவாதத்தில் எனக்கும் பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கிய மைக்கு முதற்கண் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். அம்பாறை மாவட்டத்தைப் பிரதிநிதித்துவப் படுத்துகின்ற ஒரு பாராளுமன்ற உறுப்பினர் என்ற அடிப்படையில், நான் கௌரவ கடற்றொழில் அமைச்சரிடம் சில கோரிக்கைகளை முன்வைக்க விரும்புகின்றேன்.

இலங்கையின் பல்வேறு பகுதிகளிலுமுள்ள மீனவர்கள் எதிர்நோக்குகின்ற பொதுவான பிரச்சினைகளுக்கு அப்பால், எமது மாவட்டத்தில் குறிப்பாக, ஒலுவில் பிரதேசத்தை மையப்படுத்திக் கவனத்தில் கொள்ளப்பட வேண்டிய பல விடயங்கள் இருக்கின்றன. ஒலுவில் துறைமுகம் அமைக்கப் பட்டதன் பிற்பாடு, தங்களது வாழ்விடங்களையும் மிகப் பெறுமதியான சொத்துக்களையும் இழந்து, நிர்க்கதியாக இருக்கும் ஒலுவில் வாழ் சமூகத்திற்கு எந்தவோர் அரசாங்கமும் விடிவைப் பெற்றுக்கொடுக்கவில்லை என்பதுதான் யதார்த்தம். குறிப்பாக, சிறந்ததொரு துறைமுகத்தை அமைக்க வேண்டும் என்ற நோக்கத்தோடு, மர்ஹூம் எம்.எச்.எம். அஷ்ரப் அவர்கள் ஒலுவில் துறைமுகத்தை அமைக்கும் பணியை ஆரம்பித்தாலும், அவருடைய மறைவுக்குப் பின்னர், அவருடைய நோக்கத்தைச் சரிவர நிறைவேற்றுவதற்கான எந்தவோர் ஏற்பாட்டையும் அவருடைய கட்சித் தலைவரோ அல்லது கட்சிக்காரர்களோ செய்யவில்லை. துறைசார்ந்த அமைச்சர்கள்கூட, இத் துறைமுகம் தொடர்பில் சரியான முடிவை எடுக்கவில்லை.

அம்பாறை மாவட்டமானது, சுனாமியால் பாதிக்கப்பட்ட ஒரு மாவட்டமாகும். அங்கு ஒலுவில் துறைமுகம் அமைக்கப் பட்டதன் காரணமாக, சுனாமிக்கு முன்பிருந்தே ஒலுவில் வாழ் மக்களும் அதனைச் சூழவுள்ள நிந்தவூர், அட்டாளைச்சேனை, பாலமுனை போன்ற பிரதேசங்களிலுள்ள மக்களும் தொடர்ந் தேர்ச்சியாகக் கடல்சார் பிரச்சினைகளைச் சந்தித்து வருகின்றார்கள். குறிப்பாக, இன்று கடலரிப்பு மிக முக்கியதொரு பிரச்சினையாக மாறியிருக்கின்றது. அதனால் இன்று அம்மக்கள் தங்களுடைய வாழ்விடங்களையும் காணி களையும் இழக்கவேண்டிய ஒரு சூழல் ஏற்பட்டிருக்கின்றது. துறைமுகம் சார்ந்த அமைச்சராக இருக்கலாம் அல்லது அதனுடன் சம்பந்தப்பட்ட அதிகாரிகளாக இருக்கலாம். ஒலுவில் பிரதேசம் துறைமுகம் அமைப்பதற்குப் பொருத்தமான இடமல்ல என்று கூறி, இவர்கள் கையை விரித்திருக்கின்ற சூழலில், ஒலுவில் பிரதேசம் மீன்பிடித்துறைக்கு மிகவும் பொருத்தமான பிரதேசம், அங்குள்ள மீன்கள் சர்வதேச ரீதியில் விலைமதிப்புள்ள மீன்கள் என்பது, ஆய்வுகள் ஊடாகவும் கருத்துக்கள் ஊடாகவும் பல்வேறு மாவட்ட மட்டக் கூட்டங்களின்போதும் கண்டறியப்பட்ட ஒரு விடயமாகும். எனவே, அங்குள்ள மக்கள் பாதிக்கப்படாத வண்ணம் இந்தத் துறைமுகத்தை மீன்பிடித்துறைமுகமாக அபிவிருத்தி செய்ய வேண்டும். இது முக்கியமானது.

உண்மையிலே எனக்கு மிகக் கவலையாக இருக்கிறது. இது இன்று நேற்றுப் பேசுகின்ற ஒரு பேச்சு அல்ல. இப்பொழுது கடற்றொழில் அமைச்சராக கௌரவ டக்ளஸ் தேவானந்தா அவர்கள் இருக்கிறார். அவருக்கு முன்னர் பலர் இவ்வமைச்சுக்குப் பொறுப்பாக இருந்திருக்கிறார்கள். தொடர்ந்தேர்ச்சியாக ஒரே விடயத்தை ஒவ்வொரு பாராளு மன்றத்திலும் பேசுகின்ற நிலைமையை நாம் போக்க வேண்டும். உதாரணத்துக்கு, விடயத்துக்குப் பொறுப்பாக இருக்கின்ற அமைச்சர் குறித்த விவகாரம் சம்பந்தமான முடிவுகளை எடுப்பார். DCC - மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்திலும் - அது தொடர்பில் சில தீர்மானங்கள் எட்டப்படும். இன்னும் சில கூட்டங்களும் நடத்தப்படும். பின்னர் அதனை அப்படியே விட்டுவிடுவார்கள். அவருக்குப் பிறகு, இன்னொருவர் வருவார்; தீர்மானங்கள் எட்டப்படும்; பின்னர் அவற்றையும் அப்படியே விட்டுவிடுவார்கள். கௌரவ அமைச்சர் அவர்களே, நான் உங்களிடம் விநயமாகக் கேட்டுக்கொள்கின்ற விடயம் என்னவென்றால், ஒலுவில் பிரதேசம் மீன்பிடிக்கு மிகவும் பொருத்தமான பிரதேசம் என்ற உங்களுடைய கருத்து உண்மையாக இருந்தால், அங்குள்ள துறைமுகத்தை மீன்பிடித்துறைமுகமாக அபிவிருத்தி செய்வதனூடாக இலங்கையின் பொருளாதாரத்துக்குக் கணிசமான பங்களிப்பைச் செய்ய முடியும் என்ற கருத்து நியாயமானதாக இருந்தால், அதற்குரிய பூர்வாங்க நடவடிக்கை களைத் துரிதமாக மேற்கொள்ள வேண்டும் என்றுதான்.

கௌரவ அமைச்சர் அவர்களே, நான் உங்களிடம் ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். ஏற்கெனவே, இரண்டு முறை நேரடியாகச் சொல்லியிருக்கின்றேன். இன்று எல்லா மக்களும் கேட்கத்தக்கதாகச் சொல்கின்றேன். அம்பாறை மாவட்டத்தில் ஐந்து பிரதேச செயலகங்களின் ஒருங்கிணைப்புக் குழு வினுடைய தலைவராக நான் இருக்கின்றேன். அதுமாத்திர மல்ல, இந்த அரசாங்கத்தில் அங்கம்வகிக்கின்ற ஒரு பாராளுமன்ற உறுப்பினராகவும் முன்னாள் இராஜாங்க அமைச்சராகவும் நான் இருக்கின்றேன். கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் அந்தப் பிரதேசத்துக்கு வருகின்றபோது, அங்கிருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்களோடும் பிரதேச ஒருங்கிணைப்புக் குழுத் தலைவர்களோடும் கலந்துரையாடிச் செயற்பட்டால் மாத்திரம்தான், எங்களுடைய மக்களின் பிரச்சினைகளைச் சரியான விதத்தில் உங்களிடம் நாங்கள் சொல்ல முடியும். அண்மையில்கூட, நான் பொத்துவிலில் பிரதேச ஒருங்கிணைப்புக் குழுக் கூட்டமொன்றை நடத்துவ தாகத் தீர்மானித்து, சகல திணைக்கள அதிகாரிகளையும் வரவழைத்த சமயத்தில், "அமைச்சர் அவர்கள் கூட்டம் நடத்துவதற்காக இன்று அங்கு வருகிறார்" என்று உங்களுடைய அமைச்சின் அதிகாரிகளிடமிருந்து தகவல் வந்தது. எப்படி அமைச்சர் அவர்கள் திடீரென அங்கு வர முடியும்? அந்தப் பிரதேசத்தின் ஒருங்கிணைப்புக் குழுவின் தலைவரென்ற அடிப்படையில், உங்களை வரவேற்பதற்கு நான் தயாராக இருக்கின்றேன். ஆனால், நீங்கள் சரியான விதத்தில் வரவேண்டும். இதனை ஒரு கோரிக்கையாக நான் இந்த இடத்தில் உங்களிடம் அன்பாக முன்வைக்க விரும்பு கின்றேன்.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

ஒழுவில் துறைமுகம் தொடர்பில் ஒரு திட்டம் முன்மொழியப்பட்டிருக்கின்றது. நான் விரைவில் அங்கு வந்து, உங்களைச் சந்தித்துக் கதைக்கவிருக்கிறேன்.

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා
(மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப்)
(The Hon. S.M.M. Muszhaaraff)

நாங்கள் அந்தப் பிரதேச மக்களுடைய வாக்குகளால் தெரிவுசெய்யப்பட்ட மக்கள் பிரதிநிதிகள்! அதனால் எங்களுக்கும் பொறுப்பு இருக்கின்றது. எங்களிடம்தான் மக்கள் வந்து குறைபாடுகளைச் சொல்வார்கள். அவற்றை நிவர்த்தி செய்து கொடுக்கவேண்டும் என்பதில் நாங்கள் மிக ஆர்வமாக

[ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා]

இருக்கிறோம். எங்களோடு இணைந்து நீங்கள் இந்தப் பணியை ஆற்றுவதில் எந்தச் சிரமமும் இருக்காது. ஏனெனில், அமைச்சர்களுக்குரிய கௌரவத்தை வழங்குவதிலும் அவர் களுக்கு ஒத்துழைப்பு கொடுப்பதிலும் நாங்கள் முதன்மை யானவர்கள்.

ஒலுவில் துறைமுகம் சம்பந்தமாக சில முதலீட்டாளர்கள் கூட எம்மைச் சந்தித்திருக்கிறார்கள். அந்தப் பகுதியில் சரியான விதத்தில் மீன் உற்பத்திக்கான வழிமுறைகளைச் செய்து கொடுத்தால், அவற்றை ஏற்றுமதி செய்ய முடியுமென்று அந்தப் பிரதேசத்தில் பல்வேறு துறைகளிலும் முதலீடு செய்திருக்கின்ற பலர், proposals உடனும் பணத்துடனும் காத்திருக்கிறார்கள். எமது நாட்டில் முதலீடு செய்பவர்களுக்கு உரிய இடம் வழங்கப்படுவதில்லை என்பதுதான் பாரிய குற்றச்சாட்டாக இருக்கின்றது. வெளிநாட்டிலிருந்து முதலீட்டாளர்கள் எந்தத் துறையில் முதலீடு செய்வதற்காக வந்தாலும், அவர்களுக்கு உரிய இடம் வழங்கப்படுவதில்லை. எங்களுடைய கடந்த கால வரலாற்றைப் பார்த்தால்கூட இது புலப்படும். ஓமானிலிருந்து வந்த முதலீட்டாளர்கள்கூட தாக்கப்பட்டிருக்கிறார்கள் என்று நாங்கள் கேள்விப்படுகிறோம். அதேபோல், வெளிநாட்டி லிருந்து வருகின்ற முதலீட்டாளர்களை அலைக்கழித்துவிட்டு, அவர்களுடைய நாட்டுக்கே திருப்பி அனுப்பிவிட்டார்கள் என்று கேள்விப்படுகிறோம். கௌரவ அமைச்சர் அவர்களுக்கு எங்களுடைய பிராந்தியம் சார்ந்த எல்லோரும் ஒத்துழைப்பு வழங்கத் தயாராக இருக்கிறார்கள். ஒலுவில் பிரதேசத்தில் துறைமுக ரீதியாக ஏற்பட்டிருக்கின்ற பாதிப்புக்களுக்கான நட்டஈடு இன்னும் முழுமையாக வழங்கப்படாத ஒரு சூழலே இருக்கின்றது. இந்தத் துறைமுகத்தை மீன்பிடித் துறைமுகமாக அபிவிருத்தி செய்வதற்குரிய சரியான நடவடிக்கைகளை நீங்கள் எடுக்க வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

என்னுடைய சொந்த ஊரான பொத்துவில் பிரதேசத்தைப் பொறுத்தளவில், அங்கு சுற்றுலாத்துறைக்கும் மீன்பிடித் துறைக்கும் இடையில் பாரிய மோதல் தொடர்ந்தேர்ச்சியாக இருந்து வருகிறது. ஏனைய பிரதேசங்களைப்போல் அல்லாமல், அங்கு சுற்றுலாப்பயணிகள் வருகின்ற அதே இடத்தில்தான் மீனவர்களும் இருக்கிறார்கள். அதுவும் கட லரிப்பு ஏற்படுகின்றபோது, அங்கு படகுகளை வைப்பதற்குக் கூட இடமில்லாத ஒரு நிலை ஏற்படுகின்றது. நாங்கள் இது சம்பந்தமாக உங்களிடம் பலமுறை சொல்லியிருக்கிறோம்; DCCஇலும் பேசி இருக்கிறோம். மீனவர்களுக்கென தனியான தொரு துறைமுகத்தை அமைத்துத் தரவேண்டுமென்ற கோரிக்கையை நாங்கள் முன்வைத்திருக்கிறோம். அதற்கான நடவடிக்கைகளை நீங்கள் எடுப்பதாகவும் நான் அறிகின்றேன். எங்களுடைய ஒத்துழைப்பையும் பெற்று, அந்த விடயங்களைத் துரிதப்படுத்துவதற்கான நடவடிக்கைகளை நீங்கள் மேற் கொள்ள வேண்டுமென்று நான் கேட்டுக்கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up.

**ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා**
(மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப்)
(The Hon. S.M.M. Muszhaaraff)
Give me one more minute, please.

இன்னுமொரு முக்கியமான விடயத்தை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். மீன்பிடித்துறையில் பாடு முறைமை காணப்படுகின்றது. இது மீன்பிடி உரிமை சம்பந்தமானது. எங்களுடைய கடல் பிரதேசத்தில் 10 பேருக்கு பாடு இருக்கிறது, அந்த ஊரிலே 12 பேருக்கு பாடு இருக்கிறது என்கிறார்கள். இன்று இந்த பாடு முறைமையானது பெரியதொரு மாபியாவாக மாறி இருக்கிறது. எங்களுடைய கிழக்கு மண் எங்களது மக்களின் பூர்வீக இடமாகும். ஆனால், எங்கோ இருக்கின்ற ஒருவருக்கு அங்கு பாடு இருக்கின்ற தென்று சொல்லப்படுகின்றது. சில நேரங்களில் அந்தப் பாடுகளின் சொந்தக்காரர்களை அப்பகுதி வாழ் மக்கள் காண்பதுகூடக் கிடையாது. ஆனால், எப்போதோ வெளியிடப் பட்ட வர்த்தமானி அறிவித்தலூடாக அவை அவர்களுடைய பெயர்களில் இருக்கின்றன. அவற்றை அவர்களுடைய குடும்பத்தினருக்குத்தான் கொடுக்க வேண்டும் என்றும் ஏனையவர்கள் எடுக்க முடியாது என்றும் சொல்லப்படு கின்றது. குறிப்பிட்ட அந்தப் பாடுகளின் சொந்தக்காரர்கள் தென் பகுதியிலிருந்து வருவதாகவும் இல்லை. இங்கிருக்கின்ற வர்கள் மீன்பிடித் தொழிலில் ஈடுபடுபவதற்கு அவற்றைக் கொடுப்பதாகவும் இல்லை. எனவே, இதில் சரியானதொரு முறைமை பின்பற்றப்பட வேண்டும். ஒன்றில், அந்தப் பகுதியிலுள்ள மீனவர்களுக்குப் புதிய பாடுகளை வழங்குவதற் குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும் அல்லது நீண்ட காலமாகப் பயன்பாட்டில் இல்லாத பாடுகளுக்கு மாற்றுப் பாடுகளை வழங்குவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். பிரதேச ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தின்போது, ஒவ்வோர் ஊரிலிருந்தும் இந்த முறைப்பாடு என்னிடம் முன்வைக்கப் பட்டதென்பதை நான் கௌரவ அமைச்சர் அவர்களுக்குத் தெரிவித்துக் கொண்டு, விடைபெறுகின்றேன். நன்றி. வஸ்ஸலாம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (මහාචාර්ය) චරිත හේරත් මන්ත්‍රීතුමා.

[අ.භා. 3.52]

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විවාදයට එක් වීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. ඉතාම කෙටි වෙලාවක් ලැබී තිබෙන නිසා වැදගත් කරුණු දෙකක් ගැන කියන්න මම බලාපොරොත්තු වෙනවා.

මුලින්ම, අද සාකච්ඡාවට ගන්නා ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත, එහෙම නැත්නම් සූදු සම්බන්ධව අපේ තිබෙන නෛතික ක්‍රියාදාමය සම්බන්ධව කරන මැදිහත් වීම ගැන එක පැත්තකින් අපි සතුටු වෙනවා. මොකද, මේ ක්‍රියාවලිය regulate කරලා නැතුවයි අපේ රටේ බිස්නස්කාරයෝ කිහිපදෙනෙක් ඒ කටයුතු කරගෙන යන්නේ. මේ සම්බන්ධව නීති පැනෙව්වාට ඒ නීති ක්‍රියාත්මක කරන්නත් අපට බැරි වෙලා තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ සම්බන්ධව යම් මැදිහත්වීමක් කිරීම සුදුසුයි කියලා.

දෙවැනි කාරණය මේකයි. අද උදේ ගරු ජනාධිපතිතුමා මේ සභාවට ඇවිල්ලා යම් ප්‍රකාශයක් කළා. මම විශ්වාස කරනවා, ඒ සම්බන්ධව අනාගතයේ යම් විවාදයක් තිබෙන්න පුළුවන් කියලා. නමුත්, එතුමාගේ ඒ ප්‍රකාශය ඇතුළේ එක ගලෙන් කුරුල්ලෝ දෙදෙනෙකුට ගහන සැලැස්මක් තමයි තිබෙන්නේ. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා එක පැත්තකින් එතුමා උතුරේ ඉන්න දෙමළ ඡන්ද දායකයින් ආමන්ත්‍රණය කරන්න

හඳනවා, "මේකට මම විශාල අලුත් බලයක් ලබා දෙන්න යනවා" කියමින්. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බලසම්පන්න කරන්න ඕනෑය කියලා එතුමා තර්ක කරනවා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් එතුමා පෙනී ඉන්නවා කියලා තර්ක කරනවා. එහෙම කරන ගමන් එතුමාගේ කථාවේ දෙවැනි කොටසේදී, ඒ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් හඳුනා පළාත් සභාවලට පුද්ගලයෝ පත් කරන්නේ නැතිව මේ පාර්ලිමේන්තුවේ ඉන්න 45දෙනෙකුගෙන් - ඒ කියන්නේ ඇමතිවරු 4දෙනෙක්, නවයෙන් වැඩි කරලා එන සංඛ්‍යාව සහ තවත් නවදෙනෙකු මහ ඇමතිවරු විධියට එනවා- ඒ තනතුරු පුරවන්න පුළුවන් කියලා ඉඟියක් මන්ත්‍රීතුමන්ලාට දෙනවා. එක පැත්තකින් උතුරේ ජනතාවට ඉඟියක් දෙනවා, අපි පළාත් සභාවට ශක්තිය දෙනවා කියලා. අනෙක් පැත්තෙන් ඒක වහලා මේ ඉන්න මන්ත්‍රීතුමන්ලාට පොඩි ඉඟියක් දෙනවා, "තමුන්නාන්සේලා 45දෙනෙක් ලොකු පුටුවලට යවනවා" කියලා. මේ කාරණා දෙකම එතුමා ඡන්ද ගැට විධියටයි ගෙනෙන්නේ.

මේ වෙලාවේ මම මේ කාරණයත් කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක අපේ විපක්ෂයේත් ජනප්‍රිය මතය නොවෙයි. මම හිතන විධියට, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඉතාම ධනාත්මක එකතු කිරීමක් අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා යන්ත්‍රණයට කරලා තිබෙනවා. මම මෙහෙම කිව්වාම සමහර අය නොයෙක් දේ කිව්වා. අපි ළඟ ඉන්න අපේ සමහර මිත්‍රයන්ට පවා මේ ගැන විවේචන තිබෙන කාලයක මම ඉතාම පැහැදිලිව කියන්නේ, අපේ රටේ යටත් විජිතයෙන් පස්සේ හදන ආණ්ඩුව ගැන හොඳ මතයක් හදන්න අපට බැරි වුණා කියන එකයි. මේක තමයි පසුගිය අවුරුදු 73ක ඉතිහාසය පුරාම පෙනෙන්නේ. ඉන්දියාවට සංස්කෘතීන් 50ක්, 60ක් එකට තියා ගන්න, භාෂා 30ක් එකට තියා ගන්න ආකෘතියක් හදා ගන්න පුළුවන් වෙද්දී, භාෂා දෙකක් කථා කරන අපට අවුරුදු 73ක් තිස්සේ එක ආකෘතියක් හදා ගන්න බැරි වුණා. ඒ නිසා ඒ උත්සාහයට ගිය එක ධනාත්මක ගමනක් විධියට දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අපට පිළිගන්න පුළුවන් කියලා මම හිතනවා. හැබැයි ඒ කියන්නේ, මේ ජනාධිපතිතුමා හෝ වෙන කවුරු හෝ ඒක පාවිච්චි කරලා වෙන වෙන ගේම් ගහන්න යන එක ආරක්ෂා කිරීමක් ගැන නොවෙයි. මේ රට ශක්තිමත් රටක් කරන්න නම් ජාතීන් අතර තිබෙන විරසකය සහ නොගැළපීම අපි නැති කරන්න ඕනෑ. මේක කරන්න පුළුවන් දැනට තිබෙන ශක්තිමත් මෙවලමක් විධියට දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිගන්නවා නම්, මම කියන්නේ අපි ඒක ආරක්ෂා කරගන්න ඕනෑ කියලායි. ඒ නිසා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් වීසි කරන්න ඕනෑය කියන තර්කය යථාර්ථයට සම්බන්ධ එකක් නොවෙයි. ඒකයි ඇත්ත. නමුත්, ඒක එහෙම තිබෙද්දී අපි වැරදි තීරණ ගන්න හොඳ නැහැ. මේ වෙලාවේ ඊළඟ ඡන්දය දිනන්න දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාවිච්චි කරන්න පුළුවන් කියලා හිතලා ජනාධිපතිතුමා ඒකට උත්සාහ කරනවා නම් ඒක එච්චර බුද්ධිමත් වැඩක් නොවෙයි.

මම කියන්නේ ඒක කරන්න එපා කියලා. මේ රටේ ජනතාව කැමැති කාට හෝ ජනාධිපතිවරණයෙන් දිනන්න පුළුවන් වෙයි. ඒ නිසා අපි රටක් විධියට ඒ ගැන ඉතා තීරණාත්මකව කල්පනා කරන්න ඕනෑ. ඒ වාගේම ශක්තිමත්, දියුණු රටක් හදන්න පුළුවන් ආකෘතියක් කරා අපි ගමන් කරන්න ඕනෑ බව ප්‍රකාශ කරමින් අද දින ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සම්බන්ධයෙන් වන කටයුතු ඉදිරියට ගෙන යෑම ගැන මගේ සතුට පළ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. (Mrs.) Diana Gamage.

**ගරු ඩයනා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) டயனா கமகே)
(The Hon. (Mrs.) Diana Gamage)
Sir, how much time have I got?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
You have about seven minutes, thanks to the interventions made.

[3.58 p.m.]

**ගරු ඩයනා ගමගේ මහත්මිය (සංචාරක රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) டயனா கமகே - சுற்றுலாத்துறை இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Diana Gamage - State Minister of Tourism)
Sir, let me raise that matter first before I start my speech. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම පාර්ලිමේන්තුව තිබෙන්නේ රටේ ජනතාවට සහ මේ රටට යම්කිසි සේවයක් කරන්නයි. නමුත් මම මේ ගරු සභාවේදී හැම දාම කියනවා වාගේ විපක්ෂ නායකතුමා mike එක අත හරින්නේම නැහැ, මයික් ටයිසන් වාගේ. ඒ නිසා අපි ඔක්කොටම කථා කරන්න ලැබිලා තිබෙන කාලය කැපිලා යනවා. මොකද, එතුමා mike එක බදා ගත්ත ගමන් ඉන්නේ. එක්කෝ කරුණාකර Standing Orders වෙනස් කරන්න. ඒක තමයි කරන්න තිබෙන එකම දේ.

අනික් කාරණය තමයි, මේ ගරු සභාවේ Quorum එක නැහැ කියන කාරණය විටින් විට මතු කිරීම. අපි සියලුදෙනාම කාරක සභා meetingsවල ඉන්නේ. මොකක්ද මේ කරන විහිළුව? මේ පාර්ලිමේන්තුව විහිළුවකට අරගෙනද?

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු ඩයනා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) டயனா கமகே)
(The Hon. (Mrs.) Diana Gamage)
කරුණාකර වාඩි වෙන්න, ගරු තුෂාර ඉඳුනිල් මන්ත්‍රීතුමා. මගේ කාලය එතුමාට දෙන්න එපා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, what is the point of Order? අද කාලය ඉතා කෙටියි. ඉක්මනට ඔබතුමාගේ point of Order එක කියන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ඩයනා ගමගේ මැතිනිය, සජිත් ප්‍රේමදාස මැතිතුමාට ලොකු චෝදනාවක් එල්ල කළා. හැබැයි, සජිත් ප්‍රේමදාස මැතිතුමා කථා කරන්නේ විපක්ෂයට අයිති වේලාවෙන්. ගරු රාජ්‍ය ඇමතිතුමියනි, ඔබතුමියලාගේ ජනාධිපතිතුමා අද මේ ගරු සභාවට ඇවිල්ලා විශාල වෙලාවක් කථා කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි. ගරු ඩයනා ගමගේ රාජ්‍ය ඇමතිතුමියනි, ගරු තුෂාර ඉඳුනිල් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු තර්කය හරි; he is correct. සජිත් ප්‍රේමදාස මැතිතුමා කථා කරන්නේ විපක්ෂයට අයිති කාලයෙන්.

**ගරු ඩයනා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) டயனா கமகே)
(The Hon. (Mrs.) Diana Gamage)

එතුමා කියන කාරණය හරි වෙන්න ඇති. නමුත් දවසකට පැය 24යි තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපට මේ පාර්ලිමේන්තුවෙන් කථා කරන්න කාලයක් දීලා තිබෙනවා.

ගණපූරණය නැහැ කියා Division Bell එක ගහමින් මේ ගරු සභාවට ගරු මන්ත්‍රීවරු ගෙන්වා ගැනීම, එක කට්ටියක් ජෝක් එකක් කරගෙන තිබෙනවා. Parliamentary Business Committee එකට ඒගොල්ලන් පත් කරන තුරු මේ කටයුත්ත කරනවා කියන එකයි ඒගොල්ලන්ගේ අදහස. මේක ජෝක් එකක් කර ගන්න එපා කියා මම ඒ ගරු මන්ත්‍රීතුමන්ලාට කියනවා. එහෙම කරගෙන යන්න. නමුත් අපි කාරක සභාවල ඉන්නවා. COPA එකේ ඉන්න ඕනෑ, COPE එකේ ඉන්න ඕනෑ. ඒ කාරක සභාවල අපට කථා කරන්න තිබෙනවා. මේ ගරු සභාවේ ගණපූරණය නැහැ කිව්වාම ඒවා අත්හැර දමලා දුවගෙන එන්න බැහැ. අපි මේ පාර්ලිමේන්තුව තුළ ඉන්නවා, බය වෙන්න එපා. ඡන්ද පරද්දන්න කීයටවත් chance එකක් දෙන්නේ නැහැ.

අද ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත - Betting and Gaming Levy (Amendment) Bill එක- සහ විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පතත් තවත් නියෝග කිහිපයකුත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. ඒවා ගැන කථා කරනවාට වඩා, අපිට අද කථා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ අතිගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවේ කරපු විශේෂ ප්‍රකාශය ගැනයි.

Sir, we are talking about the Thirteenth Amendment to the Constitution. That is not something which was brought about by any other country, but by us; we ourselves brought the Thirteenth Amendment into the 1978 Constitution. There was an issue in this country; we had a 30-year war and it had to end at some point. Every person in this country should be able to live in a united Sri Lanka. Every Sri Lankan has to be given the right to live in this country. They have the right to live in this country and also the right to enjoy equal opportunities in this country. I think we cannot go ahead unless we come to some compromise. Obviously, there is going to be some compromise when it comes to the implementation of the Thirteenth Amendment. We are not going to give in to everything that it provides for. We have to make some amendments to it and come to some compromise. If that is what is needed, it has to be done. There has to be some sort of a solution to the problem we are having in this country because at Geneva, whether we like it or not, this issue going to be thrown in our face every year. So, we have got to find a solution to this problem because we cannot go ahead without doing that.

First of all, Sir, we should put a stop to racism in this country. මේ රටට සංහිඳියාවක් ඕනෑ නම් පළමුව ජාතිවාදය නවත්වා ගන්න ඕනෑ. අපි දෙමළ මනුස්සයාට "දෙමළා" කියායි කථා කරන්න පටන් ගන්නේ. ඒක සම්පූර්ණයෙන් වැරදියි. අපට ඔවුන්ට "ද්‍රවිඩ" එහෙම නැත්නම් "දමිළ" කියන්න පුළුවන්. නමුත් අපි කට ඇරපු ගමන් ඔවුන්ට කියන්නේ "දෙමළා" කියලායි. එහෙම තමයි අපි ඔවුන්ට කථා කරන්නේ. එතැනින්ම අපේ ජාතිවාදය ඉස්මතු වෙනවා. එහෙනම් අන්න එතැනින් තමයි පළමුව මේ ජාතිවාදය නවතින්න ඕනෑ, මේ රටේ සංහිඳියාවක් ඇති වෙන්න ඕනෑ නම්.

ගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුව තුළින් දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරන්නයි හදන්නේ. මේ සියලුදෙනාම ඒ වෙනුවෙන් කැමැත්ත දක්වන්න ඕනෑ. ඒ වාගේම compromise කරන්න ඕනෑ, මේක කරන්න ඕනෑ නම්. මොකද, අපේ රට united ශ්‍රී ලංකාවක්. අපේ රටේ තිබෙන්නේ එක කොඩියයි, එක ජාතික ගීයයි. මේ රටේ තිබෙන්නත් ඕනෑ එහෙමයි. ඒක වෙනස් වෙන්නේ නැහැ. නමුත් සංහිඳියාවක් ඇති කර ගන්න ඕනෑ නම් අපි ඔක්කොම එකතු වෙලා මේ ප්‍රශ්නයට විසඳුමක් හොයන්න ඕනෑ. එහෙම නැතිව අපිට මේ ප්‍රශ්නයෙන් ගැලවිලා යන්න ලැබෙන්නේ නැහැ.

අපට දියුණු රටක් විධියට ජීවත් වෙන්න ඕනෑ නම්, මේ ලෝකය එක්ක යන්න ඕනෑ නම් අපි මේ ප්‍රශ්නයට විසඳුමක් සෙවිය යුතුමයි. මේ රට, සිංහල, දෙමළ, මුස්ලිම් ආදි ජාතීන් සියල්ලටම අයිති රටක්. එහෙම නම් අපි ඒ සියලුදෙනාටම මේ රට තුළ තමන්ගේ අයිතිවාසිකම් දිය යුතුයි. මම ඉන්නේ එතැන. එහෙමයි කියලා, අපේ රටේ යුද්ධයෙන් ගන්න බැරි වුණු කොටස අයථා විධියට ගන්න ඉඩ තබන්න අපට බැහැ. ස්වාධීන රටක් හැටියට අපි බලය බෙදා ගෙන මේ රට තුළ වැඩ කර ගෙන යා යුතුයි. එහෙම නැත්නම් අපට මේ ගමන යන්න බැහැ.

මම මෙහිදී සංචාරක ව්‍යාපාරය ගැනත් කියන්න ඕනෑ. සංචාරක ව්‍යාපාරයට අත්‍යවශ්‍ය දෙයක් තමයි, අද අප ගෙනැල්ලා තිබෙන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත. එහි කැසිනෝ ගැන සඳහන් වෙනවා. අපි අවුරුදු 28ක් මේ රටේ කැසිනෝ පවත්වාගෙන ගිහින් තිබෙනවා. නමුත්, කිසිම නියාමනයක් යටතේ නොවෙයි. එතකොට ඒකෙන් taxes ගෙවන්නේ නැතුව සැහෙන්න මිනිස්සු ගැලවිලා තිබෙනවා. එම ව්‍යාපාරය සඳහා අද අපි ගෙනැල්ලා තිබෙනවා regulatory system එකක්. අන්න ඒ system එක implement කර ගෙන ඒවා පවත්වාගෙන යා යුතුයි. මේ රට සංචාරක පුරවරයක් කරන්න නම්, මේ රටට සංචාරකයෝ එන්න ඕනෑ නම් සංචාරකයින්ට අවශ්‍ය facilities මේ රටේ තිබෙන්න ඕනෑ.

මේ රට රෑ 10.00ට වහන්න එපා. රෑ 10.00ට වහන රටවල් කවදාවත් දියුණු වෙන්නේ නැහැ. මම මේ කැගසමින් හැමදාම කියන්නේ night economy එකක් ගැනයි; රාත්‍රී ආර්ථිකයක් ගැනයි මම මේ කථා කරන්නේ. ලෝකයේ ඕනෑම රටක් දියුණු වෙන්න නම්, ඒ රටේ රාත්‍රී ආර්ථිකයක් තිබෙන්නම ඕනෑ. දියුණු ඕනෑම රටක රජය රාත්‍රී ආර්ථිකයෙන් තමයි සියයට 70ක ආදායමක් ලබන්නේ. දිවා ආර්ථිකයෙන් සියයට 30යි ආදායම් ලබන්නේ. මොකද, අපි සියලුදෙනා කරන්නේ රැකියාවල්. අපි

කරන්නේ ව්‍යාපාර. අපට හම්බ කරන්න වෙලාවක් විතරයි තිබෙන්නේ; වියදම් කරන්න වෙලාවක් නැහැ. රාත්‍රී ආර්ථිකය තුළ තමයි අපි වියදම් කරන්නේ. එහෙම නම් මේ රටටත් රාත්‍රී ආර්ථිකයෙන් සියයට 70ක් ආදායම ගෙන එන්න ඕනෑ. දියුණු ඕනෑම රටක එහෙමයි. එංගලන්තය ගත්තොත්, ස්ටර්ලින් පවුම් බිලියන 66ක් රාත්‍රී ආර්ථිකයෙන් හැම අවුරුද්දේම හම්බ කරනවා. ඒකයි ඒ රටවල් දියුණු. ගිහිල්ලා නිදා ගන්න කියලා මේ රට රෑ 10.00ට වහලා තියන්න ගියොත් නම් මේ රට දියුණු කරන්න අපට බැහැ. *[බාධා කිරීම්]* මම මේ කථා කරන රාත්‍රී ආර්ථිකය ගැන තේරුම් ගන්න. Nightlife කියන්නේ ගණිකා වෘත්තිය නොවෙයි. මම මේ කාරණය කියද්දී ඒක තමයි බොහෝ අයගේ ඔළුවලට ඉස්සෙල්ලාම ආවේ. රාත්‍රී 10.00 ඉඳලාත් මේ රට ඇරලා තියන්න ඕනෑ කියලා මම කියපු ගමන් සියලු දෙනාම වගේ මට ගහන්න පටන් ගත්තා, ගණිකා වෘත්තිය ගැන කියනවා කියලා. ඒක තමයි අපේ මොළවලට ගිහිල්ලා තිබෙන එකම දේ. රෑට එළියට බැස්සොත් කරන්නේ ඒ වෘත්තිය විතරයි කියලා තමයි හිතා ගෙන ඉන්නේ. ඒ වෘත්තියට වෙලාවක් නැහැ. ඕනෑ නම් පැය 24 ම ඒ වෘත්තියේ යෙදෙන්නත් පුළුවන්. ගරු ජනාධිපතිතුමාගේ සංකල්පය යටතේ මේ රට ඉදිරියට ගෙන යන්න නම් අපි අනිවාර්යයෙන් එතුමාට සහයෝගය දක්වන්න ඕනෑ. මේ ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පතට මගේ සහයෝගය දෙන්න හේතුවත් ඒකයි. ජේම්ස් පැකර් ආපු වෙලාවේ අප ඒක කළා නම්, අද මේ රට මෙතැන නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. State Minister, your time is up.

**ගරු ඩයනා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) டயனா கமகே)
(The Hon. (Mrs.) Diana Gamage)
අද මේ රට මෙතැන නැහැ, ජේම්ස් පැකර් ආපු වෙලාවේ අප ඒක කළා නම්. එදා මොකක්ද කළේ? පාරවලට බැහලා කෑගැහුවා; අසත්‍ය කථා කිව්වා. ඒ විධියට හැමදේම විනාශ කරනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
කවුද ඒක කළේ නැත්තේ? *[බාධා කිරීම්]*

**ගරු ඩයනා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) டயனா கமகே)
(The Hon. (Mrs.) Diana Gamage)
මට කථා කරන්න ඉඩ දෙන්න. කවුද කළේ නැත්තේ කියන එක මට අදාළ නැහැ. කළේ නැහැ. එච්චරයි! *[බාධා කිරීමක්]* මේ රට මෙතැනට ගෙනාවා. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාත් ඒකට සම්බන්ධයි. මට කියන්න ඕනෑ එච්චරයි. ඊයේ බොරුවට එක මන්ත්‍රීවරයෙක් කෑගැහුවා, මහ බැංකුව ගැන කථා කරලා. එතුමා මාළු කුරියෙකු කපනවා වාගේ හිතාගෙනයි කථා කළේ. මාළු කුරියා ඒ පැත්තට කරකවලා කපනවා, මේ පැත්තට කරකවලා කපනවා වාගේ මහ බැංකු බැඳුම්කර සිදුවීම ගැනත් දෙපැත්තට කථා කරනවා. මොකක්ද ඒ කරන්නේ? හරියට මාළු විකුණනවා වාගෙයි. එකම දේ හෝද හෝදා මඩේ දමනවා. ඔබතුමන්ලා එදා යහ පාලන ආණ්ඩුවේ හිටපු අය. එතකොට ඒවා ගැන question කළේ නැත්තේ ඇයි? එතකොට මේ ජනාධිපතිතුමා ඔබතුමන්ලාගේ නායකයා. එතකොට එතුමා අගමැතිතුමා. ඇයි එතකොට ප්‍රශ්න කළේ නැත්තේ? ඇයි ප්‍රශ්න කළේ නැත්තේ අර්ජුන මහේන්ද්‍රන් දමන්නේ ඇයි කියලා? ඇයි ප්‍රශ්න කළේ නැත්තේ බැඳුම්කරය ගැන? ඇයි එහෙම කළේ නැත්තේ? ඒ වෙලාවේ කට වහගෙන හිටියේ ඇයි?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. State Minister, please wind up. Your time is up. I have given you an extra minute and a half.

**ගරු ඩයනා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) டயனா கமகே)
(The Hon. (Mrs.) Diana Gamage)
දැන් විපක්ෂයේ වාඩි වෙලා ඉන්න හින්දා ද කට්ටියගේම කටවල් ඇරිලා තිබෙන්නේ? නැවත මාළුවා කපනවා වාගේ එහෙට මෙහෙට කරකවමින් කැපීමයි කරන්නේ. එච්චරයි කරන්නේ. ඔබතුමන්ලා මේ පාර්ලිමේන්තුවේ කාලය කා දමමින් එහෙම බොරුවට කෑගහන්න එපා. බොහොම ස්තුතියි.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
අද කොච්චර වැදගත්ද? ඒ වාගේ හැසිරෙන්න බැරිද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා.

[අ.භා. 4.06]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව. මට ලැබී තිබෙන කාලය නම් ප්‍රමාණවත් නැහැ.

මට පළමුවෙන්ම කියන්න තිබෙන්නේ මේකයි. ඉන්දියාව එක්ක ඉදිරි සංවර්ධන කටයුතු කරන්නේ කොහොමද කියලා ඉන්දියාව එක්ක සාකච්ඡා පැවැත්වුවා. ඇයි එහිදී ඉන්දියාව එක්ක ධීවරයා ගැන පළමුවෙන්ම කථා කළේ නැත්තේ? මොකද, ඉන්දියාවේ ධීවරයන් ඇවිල්ලා තමයි විශේෂයෙන් ලංකාවේ උතුරු මුහුදු ප්‍රදේශය trawling පන්න ක්‍රමයට සූරා ගෙන යන්නේ. ඒ ගොල්ලන්ට trawling පන්න ක්‍රමය ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ලංකාවේ trawling ක්‍රමයට පන්න කරන කණ්ඩායමට අධිකරණයේ නඩුවක් තිබෙනවා. ඒ නිසා ඒ අයට ඒ කටයුත්ත තහනම් කරලා තිබෙනවා.

හැබැයි ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට කියන්න ඕනෑ මෙතැන විශාල ප්‍රශ්නයක් තිබෙන බව. ඔබතුමා එම පන්න ක්‍රමය තහනම් කළාට, උතුරේ ඒක කෙරෙනවා; හැඳලත් කෙරෙනවා. හැබැයි, කල්පිටියට ඒක කරන්න දීලා නැහැ. *[බාධා කිරීමක්]* නිල වශයෙන් කරන්නේ නැති වුණාට ඒක කෙරෙනවා. ගරු ඇමතිතුමා, ඒ ප්‍රදේශවල ඒක කරන්නේ නැහැ කියලා ඔබතුමා කියනවා නම්, ඉදිරි කාලයේදී අපි ඒ අය අල්ලලා ඉදිරිපත් කරන්නම්. ඒ කණ්ඩායම් ඒ වැඩේ කරනවා. එක කණ්ඩායමකට කරන්න ඉඩ දීලා තවත් කණ්ඩායමකට කරන්න නොදෙනකොට මොකද වෙන්නේ? කල්පිටියත් ඇතුළුව පුත්තලම දිස්ත්‍රික්කයට ඒක කරන්න තහනම්. හැබැයි, උතුරේ ඒක කරනවා. එහේ එහෙම කරන්නේ නැහැ කියලා ඔබතුමා කිව්වාට, එහෙම කරනවා. ඒක ඔබතුමාට නවත්වා ගන්න බැහැ. ඒක officially නොවෙයි කරන්නේ. එහෙම නැත්නම් ඒක එළිපිට කෑ කෝ ගහලා කරන වැඩක් නොවෙයි. ඒක වෙනම කරන්නේ.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු ඇමතිතුමා, ඔබතුමා මගේ වෙලාව ගන්නේ නැත්නම් උත්තර දුන්නාට කමක් නැහැ.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Court case එකේ,-

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ඔබතුමා කියන කථාව හරි. Court case එකේ,-

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
උතුරේ soft trawling එකයි කරන්නේ. NARA එක identify කරපු place එකේ තමයි උතුරේ කරන්නේ. ඉන්දියන් කට්ටිය තමයි bottom trawling කරන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමා කළේ පැහැදිලි කිරීමක් හින්දා මම ඔබතුමාගේ කාලය ගන්නේ නැහැ. ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු ඇමතිතුමනි, ඔබතුමා දැන් කිව්වා, bottom trawling කරන්නේ ඉන්දියන් කට්ටිය විතරයි කියලා. එතකොට ඉන්දියන් කට්ටියට මෙහේ මුහුදු සීමාවේ ඕනෑම තැනක ඒක කරන්න පුළුවන්ද?

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
ඒක තහනම්. අල්ලනවා නේ.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
කොහෙද අල්ලන්නේ? කොහෙද අල්ලන්නේ? බයේ දුවනවා මිසක් අල්ලන්නේ නැහැ. කොහෙද අල්ලන්නේ? ඉන්දියාවත් එක්ක ඒ ගැන කථා කරනවාද? මේ වෙද්දී ඉන්දියාවත් එක්ක කථා කරලා මේ ප්‍රශ්නය විසඳා ගෙන තිබෙනවාද? ඔබතුමන්ලා ඉන්දියාවත් එක්ක කථා කරලා මේ ප්‍රශ්නය විසඳා ගෙන නැහැ. මේ ප්‍රශ්නය පැහැදිලිව විසඳා ගෙන නැහැ.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
ඊයේත් ත්‍රිකුණාමලයේදී ඇල්ලුවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට අවස්ථාව දුන්නේ පැහැදිලි කිරීමක් කරන්න. ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ඉන්දියන් කට්ටිය මේ රටේ bottom trawling කරනවාද, නැද්ද කියලා ඔබතුමා මේ රටේ ධීවර ජනතාවගෙන් ඇහුවොත් ඔවුන් හරියට උත්තර දෙයි. හැබැයි, ඒක මේ රටේ බලෙන් කරන්න දෙන්න බැහැ. එහෙම වුණොත් ඉදිරි කාලයේදී ඉන්දියාව මේ රට අයිති කර ගනියි; ඉදිරි කාලයේදී ඉන්දියාව මේ රට යටත් විජිතයක් හැටියට තියා ගනියි. බලන කොට ඒ තත්ත්වයට තමයි දිනෙන් දින මේ යන්නේ.

ඔබතුමන්ලා සංවර්ධන කටයුතු ගැන කථා කරද්දී, ඔබතුමන්ලාගේ පළමුවැනි රාජකාරිය වෙන්න ඕනෑ ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයාව රැක ගන්නා වැඩසටහන ක්‍රියාත්මක කිරීමයි. මොකද, අපේ මුහුද අපට සම්පතක්. හැබැයි, ඉන්දියාවේ ධීවරයන් ඇවිල්ලා ඒ සම්පත අද සූරාගෙන යනවා. ඉන්දියාවත් එක්ක කථා කරද්දී තමුන්නාන්සේලාට මේ ප්‍රශ්නය බේරා ගන්න තිබුණා. නමුත් ඒක බේරාගෙන නැහැ, තමුන්නාන්සේලා. *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමා, මගේ වෙලාව ගන්න එපා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වෙලාව ගන්නේ නැහැ. ඔබතුමා කථා කරගෙන යන්න.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
ගරු මන්ත්‍රීතුමා,-

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
හැබැයි ගරු ඇමතිතුමා, දැන් තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්න. ගරු ඇමතිතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් පස්සේ උත්තර දෙන්න මම ඔබතුමාට මිනිත්තුවක කාලයක් දෙන්නම්. ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා කථාව කරගෙන යන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ඉන්දියාව එක්ක දැන් අවුරුදු ගණනක් තිස්සේ කථා කරනවා. හැබැයි, bottom trawling ක්‍රමයෙන් මුළු මුහුද පතුලම සූරාගෙනයි යන්නේ. මාළු බිත්තරයේ ඉඳලා, මුහුදු පැළෑටියේ ඉඳලා සියලු දේ සූරාගෙනයි යන්නේ. එහෙම සූරාගෙන ගිහිල්ලා ඉවර කළාට පස්සේ ඔය කථා කිරීම වැඩක් වෙන්නේ නැහැ. ඒ නිසා ඉන්දියාව එක්ක හුරතල් වෙවී මේ ගැන කථා කරලා වැඩක් නැහැ. මේ ප්‍රශ්නය හරියාකාරව විසඳාගෙන ධීවරයාට අවශ්‍ය කරන ශක්තිය ලබා දෙන්න.

ඊළඟට, ලුණුවිල තිබෙන Northsea Limited එක ගැනත් මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මම ඔබතුමාට මේ ගැන දිගින් දිගටම කිව්වා. Northsea Limited එක පෞද්ගලීකරණය කරන්න යනවා නම් ඒක පෞද්ගලික ආයතනයකට දීලා අවසන් කරන්න. හැබැයි ඔබතුමන්ලා ඒ ආයතනයේ වැඩ කරන සේවකයන් සම්පූර්ණයෙන් අනාථ කරලායි තිබෙන්නේ. කාලයක් තිස්සේ ඒ අය එහි වැඩ කරනවා. නමුත්, එ් අයට මාසික වැටුප හම්බ වෙන්නේ නැහැ. ඇතැම් විට මාස දෙකකට වැටුප් හම්බ වෙන්නේ නැහැ. සමහර වෙලාවට මාස තුනක්, හතරක් බලාගෙන ඉන්නවා, වැටුප් ගන්න. ඒ ආයතනය සම්පතක්. ඒ සම්පත හරි විධියට ප්‍රයෝජනයට අරගන්න බැරි නම් කරුණාකර ඔබතුමන්ලා ඒ ආයතනය පෞද්ගලීකරණය කරලා, ඒ වැඩ කරන කණ්ඩායමට සාධාරණයක් ඉෂ්ට කරන්න. එක පැත්තකින්, ඒ අයට සාධාරණය ඉටු වන්නේ නැහැ. රැකියාව කළාට එ් අය සෑහීමකට පත් වෙන්නේත් නැහැ. මොකද, ඒ අයට වැටුපත් නැහැ. ධීවරයන්ට අවශ්‍ය දැල් ටික සපයන්න, දැල් නිෂ්පාදන ක්‍රියාවලිය සිදු කරන්න පුළුවන්කම එතැන තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට තවත් මිනිත්තුවක කාලයක් තිබෙනවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ඔබතුමන්ලා ඒ කටයුත්ත කරන්නේ නැතිව දිනෙන් දින එය විනාශ කරන්න එපා. සමස්තයක් හැටියට මේ රට නාස්ති වෙන්නේ මේ වාගේ ආයතන නිවැරදිව කළමනාකරණය කරලා, නිවැරදි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේ නැති නිසා. ඒ නිසා කරුණාකර නිවැරදි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා Northsea Limited එක වෙනුවෙන් තීන්දුවක් අරගන්න කියලා අවසාන වශයෙන් මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තවත් මිනිත්තුවක කාලයක් ඉතුරු වෙලා තිබෙනවා. කමක් නැහැ. *[බාධා කිරීමක්]* හොඳයි, කමක් නැහැ.

ගරු ඩග්ලස් දේවානන්දා ඇමතිතුමා.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் இந்திய இழுவைப் படகுகள் சம்பந்தமாகக் குறிப்பிட்ட விடயம் உண்மைதான். இந்திய இழுவைப் படகுகளின் செயற்பாடு களைத் தடுப்பதற்காக நாங்கள் முழு முயற்சி எடுத்து வருகின்றோம். சமீபத்தில் நான் மாண்புமிகு சனாதிபதி அவர்களோடு இந்தியா சென்றிருந்தேன். அப்போதுகூட, அங்கு இது சம்பந்தமான உயர் மட்டப் பேச்சுவார்த்தை யொன்று நடைபெற்றது. இந்த விடயத்தில் அவர்கள் அடுத்த கட்டத்துக்கு நகர்வதாகச் சொல்லி இருக்கிறார்கள். ஆனபடி யால், விரைவில் பேச்சுவார்த்தைகள் நடத்தப்பட்டு, அப் பிரச்சினை தீர்க்கப்படும் என்று நான் நினைக்கின்றேன்.

அதேநேரம், இலங்கைக் கடற்படையினர் இந்திய மீனவர் களைக் கைதுசெய்து தடுத்து வைப்பது பற்றியும் கூற வேண்டும். அப்பிரச்சினை, Navy சம்பந்தமான பிரச்சினையே ஒழிய, வட மாகாணத்தில் இருக்கக்கூடிய தமிழ் கடற் றொழிலாளர்களுக்குரிய பிரச்சினை அல்ல என்று இந்திய மக்களுக்குச் சொல்லப்படுகின்றது. எனவே, வடக்கில் இருக்கின்ற தமிழ் நாடாளுமன்ற உறுப்பினர்கள் தமிழ் நாட்டிற்குச் சென்று, அங்குள்ள முதலமைச்சருக்கு இது சம்பந்த மாகச் சொல்வார்களாக இருந்தால், இந்தப் பிரச்சினையை விரைவில் தீர்க்க முடியும். அதைவிட, கொழும்புக்கும் டில்லிக்கும் இடையிலான பேச்சுவார்த்தைகளும் நடை பெற்றுக் கொண்டு இருக்கின்றன. ஆகையால், விரைவில் இப்பிரச்சினையை முடிவுக்குக்கொண்டு வரமுடியும் என நம்புகின்றேன்.

அடுத்து, நீங்கள் Northsea Limited பற்றிச் சொல்லி இருந்தீர்கள். இவ்விடயம் தொடர்பில் ஆராய்ந்து, விரைவில் நடவடிக்கை எடுப்பேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you, Hon. Minister. ගරු ඇමතිතුමනි, ඔබතුමාට කථා කරන්න කාලය නැති වුණාට, ඉතා කෙටියෙන් පිළිතුරු දෙන්නයි මම ඒ කාලය ලබා දුන්නේ.

මීළඟට, ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා.

[අ.භා. 4.13]

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත, විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත සහ ධීවර අමාත්‍යාංශයට අදාළව ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ ගෙනෙන නියෝග කිහිපයකුත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. විශේෂයෙන්ම පසුගිය කාලවල දී කථා කරපු දෙයක් තමයි ඉන්දියාව කියන රටත් එක්ක, ඉන්දියානු බලපෑමට අපි යටත් වෙනවා කියන කාරණය. අපි සත්‍ය තත්ත්වය පිළිගන්න ඕනෑ. මොකද හේතුව, රටක් යුද්ධයකින් ආක්‍රමණය කරනවා නම් ලෝකයේ ඉන්න ප්‍රධාන රටවලට අපේ රට බොහොම ක්ෂණිකව විනාඩි දෙක තුනකින් ආක්‍රමණය කර ගන්න පුළුවන්. නමුත් ලෝකයේ තිබෙන එකඟතා, සම්මුතීන් ඒ තිබෙන ගිවිසුම් හරහා තවත් රටක් ආක්‍රමණය කරන්න යන්නේ නැහැ කියන එක අපි දන්නවා. අපි ඒ රටවල් එක්ක සහජීවනයෙන් කටයුතු කරන්නේ කොහොමද කියන කාරණයත් එක්ක මේ සියල්ල වෙනස් වෙනවා. යුදමය කියන තත්ත්වය තුළ නොවෙයි, නමුත් අන්‍යෝන්‍ය වශයෙන් ඒ රටවල් එක්ක පවතින සම්බන්ධතා එක්ක, එකිනෙකාට ගරු කරමින් අපේ අයිතිවාසිකම් දිනා ගන්න ඒ අවශ්‍ය කාරණා ඉෂ්ට කර ගන්න අපි බැඳිලා ඉන්නවා. ධීවර ඇමතිතුමා ධීවර අමාත්‍යාංශය හරහා අපේ ධීවරයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න මේ මැදිහත්වීම පූර්ණ වශයෙන් අපේ ආණ්ඩුව හරහා කරනවාය කියන කාරණය අපට පැහැදිලිව පෙනෙන්න තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහෝමයක් වෙලාවට දැන් විපක්ෂය කියන කාරණයක් තමයි මේ ආණ්ඩුව යම් ආකාරයකින් ඡන්දයකට සැරසෙනවාය කියන එක. අද දිනයේ ජනාධිපතිතුමා ඇවිල්ලා මේ සභාවට ඉදිරිපත් කරපු දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හෝ ඒ අදාළ ජනවාර්ගික ගැටලුව නිම කරන්න අවශ්‍ය දායකත්වය දෙනවා කියන කාරණය ගත්තාම, බොහෝ වෙලාවට විපක්ෂයේ සමහර නියෝජිතයෝ කථා

[ගරු නිතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා]

කරන්නේ උතුරෙන් ඡන්ද ගන්න උත්සාහ කරනවා වාගේ කාරණයක් ගැන. එහෙම කියන නිසා මම විපක්ෂයෙන් අහන්න කැමතියි, ආණ්ඩුව මැතිවරණයකට ලැහැස්ති වෙනවා නම් ජල ගාස්තුව වැඩි කරන්නේ ඇයි කියලා. සමහර අමාරු, අපහසු, දුෂ්කර තීන්දු-තීරණ අපි ගන්නවා.

අද දිගින් දිගටම බදු මුදල් වැඩි කරලා තිබෙනවා. මත්පැන්, සිගරට්වල බදු මුදල් වැඩි කරලා තිබෙනවා කියලා සමහර වෙලාවට අපි විවේචනයට ලක් වුණා. මේ සමහර කාරණා දිහා බැලුවාම, අපි මේ මැතිවරණයකට යන්න උත්සාහ කරනවා නොවෙයි. මේ රටේ පැවැත්ම නිසි පරිදි පවත්වාගෙන යන්න අවශ්‍ය රීති හා රෙගුලාසි පනවමින් අදේශපාලනික තීන්දු ගැනීමයි මේ කරන්නේ. පසුගිය කාලය පුරාවටම දේශපාලන තීන්දු ගැනීම තමයි අපි දැක්කේ. මේ දේශපාලන තීන්දු ගැනීම හරහා දිගින් දිගටම අපේ රටේ ආර්ථිකයත් එක්ක අපි පසුගාමී වුණා.

මම දැන් කැමැතියි ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කථා කරන්න. මෙච්චර කාලයක් කැසිනෝ තිබුණා. කැසිනෝ පරිශ්‍රයට ඇතුළු වන පුද්ගලයකුගෙන් ඇමෙරිකානු ඩොලර් 100ක් අය කිරීමට නියමිතව තිබුණත්, මේ දක්වා එම මුදල අය කර ගැනීමේ ක්‍රමවේදයක් තිබුණේ නැහැ. එක අතකින්, දේශීය වශයෙන් කැසිනෝවලට යන අය අධෛර්යයට පත් කරන්නත්, ඒ එක්කම අපට බදු මුදලක් ලබා ගැනීම සඳහාත් කැසිනෝ පරිශ්‍රයට යන ඕනෑම පුද්ගලයකුගෙන් දැන් ඩොලර් 50ක බද්දක් අය කරන්න නියම කරලා තිබෙනවා. ඒ එක්කම පිරිවැටුම දළ එකතුව මත බද්ද සියයට 10 සිට සියයට 15 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ එක්කම සූදු ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා පුද්ගලයකු විසින් ගෙවනු ලබන වාර්ෂික බදු මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 200 සිට රුපියල් මිලියන 500 දක්වා වැඩි කරලා තිබෙනවා. බුකිකරුවෙකුගේ ව්‍යාපාරය ගත්තාම, අනුයෝජිතයකු මාර්ගයෙන් සිදු කරනු ලබන අවස්ථාවක ගෙවනු ලබන වාර්ෂික බදු මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 4 සිට රුපියල් මිලියන 5 දක්වා වැඩි කරලා තිබෙනවා. සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිත කිරීම වෙනුවෙන් අය කරන වාර්ෂික බදු මුදල් ප්‍රමාණය රුපියල් ලක්ෂ 6 සිට රුපියල් ලක්ෂ 10 දක්වා වැඩි කරලා තිබෙනවා. සජීවී විකාශන පහසුකම් භාවිත නොකර සිදු කරන අවස්ථාවක වාර්ෂිකව ගෙවනු ලබන බදු ප්‍රමාණය රුපියල් 50,000 සිට රුපියල් 75,000 දක්වා වැඩි කරලා තිබෙනවා. මේ බුකිකරුවන්ගේ ව්‍යාපාර ක්ෂේත්‍රය ගම්වලත් විශාල ප්‍රමාණයකින් තිබෙනවා කියලා අපි දන්නවා. මේ හැම ක්ෂේත්‍රයක් තුළින්ම අපි බදු අරගෙන, අදේශපාලනික තීන්දු අරගෙන මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න අවශ්‍ය තීන්දු තීරණ තමයි මේ අරගෙන තිබෙන්නේ. මේ ලැහැස්ති වෙන්නේ මැතිවරණයකටයි කියලා කිසියම් විටෙක කවුරුන් හෝ ඇඟිල්ල දිගු කරනවා නම්, මම ඒකට එකඟ වෙන්නේ නැහැ. මොකද, මැතිවරණයකට ලැහැස්ති වෙනවා නම් සමහර දැඩි, දුෂ්කර තීන්දු-තීරණ අපට ගන්න පුළුවන් වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි ඒ තීන්දු-තීරණ නොබියව ගන්නවා. අපි ඒ වෙනුවෙන් පෙනී ඉන්නවා. අපි ඒවා ආරක්ෂා කරන්න බැඳිලා ඉන්නවා.

අපි මේ වෙලාවේ සිද්ධ කරන්නේ මේ රටේ ආර්ථිකය ගොඩනඟන්න, රටේ මිනිස්සුන්ට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න, පෝලිම් නැතුව එදිනෙදා කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීමට අඩිතාලම දමන්න, ඒ අදේශපාලනික තීන්දු තීරණ ගන්න ඒවාට උදව් කරන එකයි. ඒ නිසා විපක්ෂය විසින් අනියත වශයෙන් කරන මේ චෝදනා අපි ප්‍රතික්ෂේප කරනවා. හැම වෙලාවේම ඔවුන් කියන්නේ දේශපාලනය ගැන. ඊළඟ මැතිවරණයට ඉදිරිපත් වෙන්න උත්සාහ කරන ස්වරූපයක් ගැන තමයි ඔවුන් කියන්නේ. අපි ඒක ප්‍රතික්ෂේප කරනවා.

අනෙක් කාරණාව මේකයි. මේ රටේ හැම දාම, දිගින් දිගටම ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ ජනවාර්ගික අර්බුදයයි කියන කාරණය අපි කවුරුත් පිළිගන්න ඕනෑ. මේ ජනවාර්ගික අර්බුදය තුළ උතුරේ නායකයන් සහ දකුණේ නායකයන් සියලු දෙනාම එකිනෙකාට චෝදනා කර ගනිමින් තමයි සිටින්නේ. හැබැයි, මේ වෙලාවේ පාර්ලිමේන්තුවට යම් බලයක් දීලා තිබෙනවා. ඒ අනුව පාර්ලිමේන්තුව තීරණය කරන්න ඕනෑ, මොකක්ද සුදුසු කියලා. ඒක හොඳ දෙයක්. ජනාධිපතිතුමා තමන්ගේ බලය අපට ලබා දීලා තිබෙනවා. ඒ අනුව අපිට සාකච්ඡා කරලා, තීන්දු තීරණ අරගෙන රටට අවශ්‍ය දේ මොකක්ද කියලා විග්‍රහ කරගන්න පුළුවන්. ඒක විය යුතු දෙයක්. කරුණාකරලා මේ අවස්ථාව මඟ හැර ගන්න එපා කියලා විශේෂයෙන්ම උතුරේ නායකයන්ගෙන් අපි ඉල්ලා සිටිනවා. මේ අවස්ථාව මඟ හැර ගන්න එපා. මොකද, ඒ අය හැම දාම ඉල්ලන්නේ වෙනම රාජ්‍යයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ රටේ උතුරේ යාපනයට ගියත් මේ මගේ රට. ඒ වාගේම අපේ දමිළ සහෝදරයෙක් කොළඹ වැල්ලවත්තට ආවත් මේ ඔවුන්ගේ රට. අපි කවදාවත් ඒකට බාධා කරන්නේ නැහැ. සමහර වෙලාවට උතුරේ නායකයෝ කියනවා, "නැහැ, තමුන්නාන්සේලාට ඒ පැත්තේ අයිතිවාසිකමක් නැහැ" කියලා. නමුත් එවැනි තත්ත්වයක් ඇති කරන්නේ නැතුව අපි සියලු දෙනාම සාකච්ඡා කරලා මේ රට අපි හැම දෙනාගේම රට කියන මැද තැනකට එන්න පුළුවන් නම්, ඒක තමයි විය යුත්ත.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය මේකයි. පූර්ව අවස්ථාවක දීත් මම මේ කාරණය මතු කළා. මේ පාර්ලිමේන්තුවට තමයි රාජ්‍ය මූල්‍ය පාලනය සම්බන්ධයෙන් සම්පූර්ණ බලතල තිබෙන්නේ. ගරු කථානායකතුමා අද ඉතාම පැහැදිලිව නිවැරදි තීන්දුවක් ලබා දුන්නා, රාජ්‍ය මූල්‍ය පාලනය සහ අධිකරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පාලනය තිබෙන්නේ පාර්ලිමේන්තුවට බවට. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 (ඇ) අනුව්‍යවස්ථාව කියෙව්වාම අපට පැහැදිලිවම තේරුම් යනවා, රාජ්‍ය මූල්‍ය පාලනය සහ අධිකරණමය කාරණා සම්බන්ධයෙන් සම්පූර්ණ බලතල තිබෙන්නේ ජනතාව නියෝජනය කරන මේ සභාවට බව. එතැනින් අපට වෙනස් වෙන්න පුළුවන්කමක් නැහැ. අපිට මතකයි, අනුර බණ්ඩාරනායක මැතිතුමාත් ලබා දුන් නියෝගය.

දැන් අහන්න ලැබෙන ඉතාම ශෝචනීය කාරණය මොකක්ද? අභ්‍යන්තර ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පසුගිය කාලයේ ජනතා විමුක්ති පෙරමුණ පැහැදිලිව දිගින් දිගටම කියපු දේවල් අපි දැක්කා. ATM යන්ත්‍ර ඉස්සරහ මිනිස්සු පෝලිම් ගැහෙයි, බැංකු කඩා වැටෙයි කියලා කිව්වා. ඒ විධියට තර්ක ගණනාවක් ගෙනාවා. නමුත් ඒ කටයුතු අවසන් කරලා එය නියමිත ක්‍රියාවලියක සිදු වෙනකොට අද මේ අය අධිකරණයට ගිහින් තිබෙනවා. මේ අය මේකට අධිකරණයත් සම්බන්ධ කරගෙන ව්‍යවස්ථාදායකය හා අධිකරණය අතර ඝට්ටනයක් ඇති කරලා උත්සාහ කරන්නේ කොහොම හරි මේ අභ්‍යන්තර ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය කඩා වට්ටන්නයි. පුළුවන් නම් අධිකරණය හරහා යම් ආකාරයක තහනම් නියෝගයක් අරගෙන මේ කටයුත්ත නවත්වා මේ අය මේ කරන්න හදන්නේ මොකක්ද? මේ කරන්නේ මේ රටේ විපක්ෂයට වුවමනා දෙයද? මම හිතන විධියට සියයට තුනක් නියෝජනය කරන පක්ෂයකට මේ රටේ සමස්ත ක්‍රියාවලියක් නවත්වන්න හැකියාවක් නැහැ. ප්‍රධාන විපක්ෂය නියෝජනය කරන සජබය වුණත් කියන්නේ, "IMF

එකට යන එකට අපි එකඟයි" කියන එකයි. ඒ තුළ සිදු වෙන සමහර කාරණාවලට ඒ අය එකඟ නොවුණත්, සමස්තයක් හැටියට ගත්තාම IMF එකට යන එකට ඒ අය එකඟයි. ඒ එක්කම අභ්‍යන්තර ණය ප්‍රතිව්‍යුහගතකරණයටත් ඒ අය එකඟයි. නමුත් සියයට තුනක් පමණක් නියෝජනය කරන, ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන්නේ නැති සමහර ඊනියා පක්ෂ අධිකරණයට ගිහිල්ලා අධිකරණය හරහා මේ ව්‍යවස්ථාදායකයේ ක්‍රියාවලිය නවත්වන්න අද උත්සාහ කරනවා. විශේෂයෙන්ම ව්‍යවස්ථාදායකයට අයිති රාජ්‍ය මූල්‍ය පාලනය කිරීම කියන ප්‍රධාන කාර්යය ඉවත් කරලා යම් ආකාරයේ අර්බුදයක් මවා පාන්න උත්සාහ කරනවා. ව්‍යවස්ථාදායකය හරහා, අධිකරණය හරහා යම් අර්බුදයක් මවා පාන්න ඒ අය උත්සාහ කරනවා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අපි බොහොම සවිඥානක වෙන්න ඕනෑය කියන කාරණය මම කියනවා.

මම හිතන විධියට, ගරු කථානායකතුමා ඉතා නිවැරදි තීන්දුවක් තමයි ලබා දුන්නේ. මොකද, මේ රටේ ඔය කියන සම්පූර්ණ බලතල සහිත විධායකය සඳහා ජනතාවගේ ඍජු ඡන්දයෙන් විධායක ජනාධිපතිවරයෙක් පත් කරනවා. ඒ කටයුත්ත ඒ ආකාරයෙන් ක්‍රියාත්මක කරනවා. හැබැයි, අපි කවුරුත් දන්නවා, නීතිය හැදීමේ ක්‍රියාවලිය සහ රාජ්‍ය මූල්‍ය පාලන කටයුතු අපි ව්‍යවස්ථාදායකය හරහා ක්‍රියාත්මක කරන බව. ඒ එක්කම ජනතාවගේ අධිකරණ බලයත් ක්‍රියාත්මක කරන්නේ අපේ නාමයෙන්; ව්‍යවස්ථාදායකයේ නාමයෙන් ක්‍රියාත්මක කරන අධිකරණ පද්ධතියක් තුළ. ඒ නිසා ඒ බලයට කාටවත් අත තබන්න බැහැ; ඒ බලය කාටවත් ගන්න බැහැ. ඒ නිසා, අධිකරණය ව්‍යවස්ථාදායකයත් එක්ක මේ වෙලාවේ අනවශ්‍ය ප්‍රශ්නයක් ඇති කරගෙන මුළු රටේම ආර්ථිකය රඳා පවතින IMF ක්‍රියාවලියට හෝ මේ අභ්‍යන්තර ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියට යම් බාධකයක් පමුණුවන තත්ත්වයකට මේ අර්බුදය නිර්මාණය කරන එකක් නැහැ කියලා මම විශ්වාස කරනවා. විශේෂයෙන්ම මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ මුදුන්මල්කඩ වන පාර්ලිමේන්තුව වටලා, පාර්ලිමේන්තුව විනාශ කරන්න කියලා වුවමනාවක් තිබෙන ඊනියා පක්ෂයක සිටින සියයට තුනක පිරිසකගේ අවශ්‍යතාව අනුව කටයුතු නොකර අධිකරණය මේ වෙලාවේ කටයුතු කරනු ඇතැයි මම හිතනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා.

[අ.භා. 4.23]

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත හා විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනිවර කියවීමේ විවාදය සහ ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ වන නියෝග පිළිබඳ විවාදය අදට නියමිතව තිබෙනවා. මට ලැබී තිබෙන්නේ ඉතාම කෙටි කාලයක්. ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා පටන් ගත්ත තැනින්ම මගේ කථාවත් පටන් ගන්නවා. එතුමාගේ තර්කය වුණේ ආණ්ඩුවට මැතිවරණ මානසිකත්වයක් නැත යන්නයි. ආණ්ඩුව ජල බිල, විදුලි බිල වැඩි කිරීම වැනි ජනතා හිතවාදී නොවන ආකාරයේ තීන්දු ගන්නේ මැතිවරණ මානසිකත්වයක් නැති නිසාය කියන එක තමයි එතුමාගේ තර්කය වුණේ. එතුමාගේ දැක්මේ හැටියට එතුමාට ඒක එහෙම පෙනෙනවා ඇති. හැබැයි, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා අද මේ පාර්ලිමේන්තුවට ආවා. එතුමා පාර්ලිමේන්තුවේදී දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක කරන්න, උතුරට බලතල දෙන්න යෝජනාවක් ගෙනාවා. එතකොට අපට එක දෙයක් පෙනී යනවා. ඒ තමයි, ජනාධිපතිතුමා ඉතා හදිසියේ උතුර සනසන්න සූදානම් වෙන බව. උතුරේ ජනතාවට හැම දාම කිව්වා වාගේ උතුරේ ජනතාව සනසන්න ජනාධිපතිතුමා බලාපොරොත්තු වෙනවා. එතකොට, අපේ ස්ථාවරය වෙලා තිබුණේ -

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා (උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன் - உயர் கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon.(Dr.) Suren Raghavan - State Minister of Higher Education)
Hon. Presiding Member, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Yes, Hon. (Dr.) Suren Raghavan?

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)
Sir, the Hon. Member is misleading the House, the country and the international community. The President never said that it is only for North and the East; he said that it is for the whole country. If you do not like it, bring in a motion and defeat it. Do not mislead the country, my Friend, my brother.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
එතුමා සැනසිලා තිබෙන තරම, ඇඳලා තිබෙන තරම හොඳටම පේනවා, ඒ සද්දෙත් එක්ක. ඒක අදාළ නැහැ.

උතුරට වැඩි බලතල දෙනවාද, නැද්ද කියන කාරණය ගැන අපි කථා කරන්න ඕනෑ. අපේ පක්ෂය බොහෝදුරට බලය බෙදීම කියන කාරණයට විරුද්ධ නැහැ. හැබැයි, අපේ ස්ථාවරය තමයි, තිබුණු කරත්තය ආපහු දෙන්න කියන එක. ඒ කරත්තයට alloy wheels දමනවාද, ඒ කරත්තය A/C කරනවාද, ඒ කරත්තයට තව තව පහසුකම් දෙනවාද කියන කථා නොවෙයි අපි කියන්නේ. ඉස්සර හදපු කරත්තය, තිබුණු කරත්තය ආපසු දෙන්න. මෙතෙක් නොපැවැත්වූ මැතිවරණය කරුණාකරලා පවත්වන්න. තිබුණු කරත්තය අපට දෙන්න. ඒකට alloy wheels දමනවා නම්, alloy wheels දමමු. A/C කරනවා නම්, A/C කරමු. Double wheels දමනවා නම්, double wheels දමමු. ඒ පහසුකම් ආපහු දෙමු. හැබැයි, තිබුණු කරත්තය ආපහු දෙන්න කියන තර්කය තමයි අපි ඉදිරිපත් කළේ.

ජනාධිපතිතුමා හදිසියේ ජනාධිපතිවරණයකට ලෑස්ති වෙනවා කියලා අපට පෙනෙනවා. එතුමා විශ්වාස කරනවා, පොදුජන පෙරමුණේ කණ්ඩායමත් එතුමාට සහයෝගය ලබා දෙයි කියලා. ඒ නිසා උතුරේ ජනතාව දිනාගන්න පොඩි උප්පරවැට්ටියක් දමන බවක් අපට පේනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාගේ ඉතිරි වුණු මිනිත්තුවත් මට ගන්න කිව්වා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එහෙම මිනිත්තුවක් ඉතිරි වෙලා තිබුණේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
අද මේ පාර්ලිමේන්තුවේදීම මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙන් අපේ මන්ත්‍රීවරු කිහිප අවස්ථාවකම ප්‍රශ්න කළා, එතුමා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ලබා දෙනවාට එකඟද කියලා. මහින්ද රාජපක්ෂ මැතිතුමා "මීක්" සද්දයක් නැහැ; කිසිම පිළිතුරක් දුන්නේ නැහැ. එතුමා නිශ්ශබ්දයි. එතකොට තමුන්නාන්සේලාගේ ස්ථාවරය මොකක්ද? මහින්ද රාජපක්ෂ මැතිතුමා, පොදුජන පෙරමුණේ මහ ලේකම් ඇතුළු ඒ කණ්ඩායම්වල ස්ථාවරය මොකක්ද? දහතුන දෙන්න කැමැතිද? මේක රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාගේ තනි කැමැත්තද? මේක රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාගේ තනි කැමැත්ත නම්, රනිල් වික්‍රමසිංහ මහත්මයා තනියම ගේමක් ගහන්නද මේ හදන්නේ? එහෙම නැත්නම් ඩබල් ගේමක්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මට තත්පර 30ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මහින්ද රාජපක්ෂ මැතිතුමන්ලා කලින් අවස්ථාවේ දකුණේ ජනතාව ඇන්දුවා වාගේ, එතුමන්ලා මේ පාරෙන් එන්නම් කියලා, රනිල් වික්‍රමසිංහ මහත්මයාට ඒ පාරෙන් එන්න කියලා, දෙපැත්තෙන් ගිහින් දෙගොල්ලන්ම එක හන්දියකදී හමු වෙමු කියලා මේක දෙගොල්ලන් කථා කරලා දාගත්ත ව්‍යාපෘතියක්ද කියන එකයි අපි අහන්නේ. එම නිසා, නරි නාවන්න හදන්න එපා කියන කථාව මම මේ අවස්ථාවේ කියනවා. දැන් මේ රටේ ජනතාව හොඳට තැම්බිලා, එම්බාම් වෙලා, රැවටිලා ඉන්නේ. හැටනව ලක්ෂයක් ජනතාව තමුන්නාන්සේලාගේ ගායනා අහලා, රැවටිලා ඡන්දය දීලා ඇඳගෙන නා ගත්තා හොඳටම ඇති.

දැන් රාජපක්ෂ මහත්තයලාට වෙන පාරකින් එන්න කියලා, රනිල් වික්‍රමසිංහ මහත්මයා තවත් පාරකින් ඇවිල්ලා මේ අය අලුත් ක්‍රමයකට ජනතාව ගොනාට අන්දන්නද හදන්නේ කියන ප්‍රශ්නය තමයි මම අහන්නේ. ස්තුතියි.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට රීති ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මොකක්ද, ඔබතුමාගේ point of Order එක?

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තුෂාර ඉඳුනිල් මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කළා. එතුමාගේ කථාවට බාධා කරන්න අකැමැති නිසායි ඒ වෙලාවේ මම කථා නොකළේ. මම විශේෂයෙන් කියන්න ඕනෑ, මේ කාරණයේදී අපි කියපු කාරණා විකෘති කරන්න එපා කියලා. මේ කරුණ දැන් සාකච්ඡාවට විවර කරලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමා කියන පරිදි ජනාධිපතිතුමා උතුර ජයග්‍රහණය කරන්න උත්සාහ කරනවා නම්, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරනවාට අකැමැති දකුණේ ජනතාව ජනාධිපතිතුමාට විරුද්ධ වෙනවා නේ. එහෙම නොවෙයි, ජනාධිපතිතුමා කරලා තිබෙන්නේ. ජනාධිපතිතුමා මෙම යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ කාටත් සාකච්ඡා කරන්නයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
It is not a point of Order. Thank you. මීළඟට, ගරු උද්දික ප්‍රේමරත්න මන්ත්‍රීතුමා.

Order, please! The Hon. Speaker will now take the Chair.

*අනතුරුව ගරු මයන්ත දිසානායක මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.*
*அதன்பிறகு, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. MAYANTHA DISSANAYAKE left the Chair, and THE HON. SPEAKER took the Chair.*

[අ.භා. 4.29]

**ගරු උද්දික ප්‍රේමරත්න මහතා**
(மாண்புமிகு உத்திக பிரேமரத்ன)
(The Hon. Uddika Premarathne)
ගරු කථානායකතුමනි, අද ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත හා විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනි වර කියවීමත්, ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ ගෙනෙන නියෝග පිළිබඳවත් සාකච්ඡාවට ගන්නවා. අපේ රටේ දේශපාලනයත් සූදුවක්, ඔට්ටුවක් වාගේ තමයි මෙතෙක් කල් පැවතගෙන ආවේ. එහෙම නැත්නම් game එකක් වාගේ තමයි මෙතෙක් අපේ රටේ දේශපාලනය පැවතගෙන ආවේ. ඒ දේශපාලන game එක තවදුරටත් ඉස්සරහට යන්න බැරි game එකක්. ඒ දේශපාලන game එක වෙනස් වෙන්න ඕනෑ. ඒ දේශපාලන game එකෙන් අපේ රටේ මිනිස්සුත්, දේශපාලනය කරන උදවියත් දෙගොල්ලන්ම ගැලවෙන්න ඕනෑ. අපි කාලයක් තිස්සේ පුරුදු කරගෙන ආ දේශපාලන ක්‍රමවේද ඇතුළේ අපේ රට සංවර්ධනය කිරීම පිළිබඳව අවධානය යොමු කරනවා වෙනුවට දේශපාලන පක්ෂ ගොඩනැඟීමේ අරමුණු තමයි හැම වෙලාවේම ඉදිරියට ආවේ. මේ ද්විපක්ෂ ක්‍රමය ආවාට පස්සේ එක කණ්ඩායමක් තව කණ්ඩායමකට වඩා වැඩ කරනවා කියන පොරොන්දු මත මිනිස්සුන්ගේ විශ්වාසය දිනාගන්න කටයුතු කළා. නමුත්, අද වෙනකොට මේ රට පිළිබඳව මිනිස්සුන්ට තිබෙන

හැඟීම, අභිමානය, විශ්වාසය කියන සියල්ල බිඳ වැටිලා තිබෙනවා. ඒක නිසා තමයි මිනිස්සු වෙන රටවලට යන්නේ. මේ රට තුළ තමන්ගේ අනාගතය ගැන, තමන්ගේ දරුවන්ගේ අනාගතය ගැන කිසිම විශ්වාසයක් නැති මොහොතක්, මේක. විශේෂයෙන් මේ වෙනකොට රටේ අභිමානය නැති වෙලා තිබෙනවා. මේ රට මගෙ රට, මා ඉපදුණු රට, උතුරේත් අපි, දකුණේත් අපි විධියට අපට තිබුණු අභිමානය දැන් නැති වෙලා තිබෙනවා. 70 දශකයේ වගා සංග්‍රාමයක් ගෙනැල්ලා ගුවන්විදුලියෙන්, රූපවාහිනියෙන් මිනිස්සුන්ට ශක්තිය, ධෛර්යය දීලා හැම බිම් අඟලකම වවන්න කියලා කිව්වා. මම හිතන විධියට මේ වෙලාවේත් අවශ්‍ය කරන්නේ ඒක. "ඈත ගමේ සරු පස පෙරළන්නට මා යනවා අද උදැසනේ", "අපි වවලයි අපි කැවේ උත්තම රජ ගොල්ලො වගේ" වැනි ගීත තමයි එදා අපට අහන්න ලැබුණේ. ඒ වාගේ motivation එකක් අපේ රටේ මිනිස්සුන්ට නැවත ඕනෑ. ඒ වාගේම පාලනය පිළිබඳ විශ්වාසයකුත් මේ මොහොතේ අපි හදන්න ඕනෑ.

යුක්රේනය සහ රුසියාව අද යුද වදිනවා. බෙලරුසියාවට සහ පෝලන්තයට අද යුද අවදානමක් තිබෙනවා. චීනය, තායිවානය වාගේ රටවල යුද උණුසුමක් තිබෙනවා. මේ අතර අනාගතයේදී අපට ලෝක යුද්ධයක් දකින්න ලැබෙයිද කියලාත් අපි දන්නේ නැහැ. මොකද, අපි හැම දාම රටේ ප්‍රශ්න ඇති වුණාට පස්සේ තමයි විසඳුම් හොයන්නේ. වතුර නැති වුණාට පස්සේ තමයි විසඳුම් හොයන්නේ. මේක තමයි වතුරවලට විසඳුම් හොයන්න තිබෙන හොඳම මොහොත. මේ, ඔක්කෝම වැව් හිඳිච්ච වෙලාවක්. මේක තමයි, වැව් ප්‍රතිසංස්කරණය කරන්න තිබෙන හොඳම මොහොත. හැබැයි, පසුගිය කාලයේ වැව්වල වතුර තිබෙද්දී තමයි වැව් ප්‍රතිසංස්කරණය කරන්න පටන් ගත්තේ. අවුරුදු ගණනක් තිස්සේ අපේ වැව් ටික ප්‍රතිසංස්කරණය නොකිරීමේ ඵල විපාක නිසා තමයි අද අපට වතුර නැහැ කියන්න සිදු වෙලා තිබෙන්නේ. ඒක නිසා මේ මොහොතේවත් මේ වියළි කාලගුණය ප්‍රයෝජනයට අරගෙන අපේ රටේ වැව් ටික ප්‍රතිසංස්කරණය කරන්න ඕනෑ. කථා කිරීමට කාරණා බොහොමයක් තිබුණත්, මට සීමිත කාලයක් තමයි ලැබිලා තිබෙන්නේ. ඒ නිසා, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු චාමර සම්පත් දසනායක රාජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 4.33]

**ගරු චාමර සම්පත් දසනායක මහතා (ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க - ஆரம்பக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Chamara Sampath Dasanayake - State Minister of Primary Industries)
ගරු කථානායකතුමනි, ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කථා කරන කොට සමහර අය සූදු ගැන කථා කළේ නැහැ, වෙනත් දේවල් ගැන කථා කළා. මම ඒක දන්නවා. සූදුවලට සම්බන්ධ පනත් ගැන කථා කරන කොට 1989 කියන ඉතිහාසයට අපට යන්න වෙනවා. ජැක්පොට් මැෂින් කොළඹ ආසන්න නගරවලට ගෙනාවේ ප්‍රේමදාස මහත්මයාගේ ආණ්ඩුව කාලයේ. ඒක නැහැ කියන්න බැහැ. ජැක්පොට් මැෂින් ගෙන්වපු කොල්ලුපිටියේ මිනිස්සු අද ලංකාවේ කෝටිපතියෝ වෙලා ඉන්නවා. ඒ කාලයේ ජැක්පොට් මැෂින් ගෙන්වපු අය තමයි ලංකාවේ විශාලම ව්‍යාපාරිකයෝ බවට පත් වුණේ. තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමනි, නරි නැව්වේ අපි නොවෙයි. අපේ ආණ්ඩු නොවෙයි, නරි නාවලා තිබෙන්නේ. ඔබතුමන්ලාගේම ආණ්ඩු තමයි ඒ කාලයේ නරි නැව්වේ. ඔබතුමා කිව්වා, නරි නැව්වා කියලා. නමුත්, අපි නොවෙයි නරි නැව්වේ. ඔබතුමන්ලාගේ හිටපු නායකයෝ තමයි නරි නැව්වේ. මට හොඳට මතකයි, ජැක්පොට් මැෂින් ගෙනාපු කාලයේ හන්දියක් හන්දියක් ගණනේ ජැක්පොට් මැෂින් තිබුණු බව.

මේ වෙලාවේදී මම මේ කාරණයත් කියන්න ඕනෑ. ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පතේ හොඳ හා නරක කිහිපයක් තිබෙනවා.

නමුත්, රටට බදු අවශ්‍යයි. සංචාරක ආකර්ෂණය සහිත රටක් හැටියට සංචාරකයන්ට අවශ්‍ය දේවල් රටට අවශ්‍ය වෙනවා. අපි කියන්නේ නැහැ, හැම දෙයක්ම රටකට අවශ්‍යයි කියලා. නමුත්, සංචාරකයන් එන රටක් හැටියට, දූපතක් හැටියට, ලෝකයේ ප්‍රසිද්ධ සංචාරක මාර්ගයක් තිබෙන රටක් හැටියට ලංකාව අද සංචාරක ව්‍යාපාරය හරහා දියුණු වෙනවා. ගරු කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත හරහා හොඳ තීන්දු කිහිපයක් අරගෙන තිබෙනවා. මොකද, කැසිනෝ ශාලාවකට ඇතුළු වන කෙනෙකුගෙන් ඩොලර් 50ක් අය කරනවා. මීට කලින් ශත පහක්වත් අය කළේ නැහැ. මේ පනත් කෙටුම්පතේ තිබෙනවා, ඩොලර් 50ක් නැතුව ඇතුළු වෙන්න බැහැ කියලා. පසුගිය කාලයේ කැසිනෝ සඳහා නොමිලේ ඇතුළු වෙන්න තිබුණු අවස්ථාව, අද ඇමෙරිකන් ඩොලර් 50ක් නැතුව ඇතුළු වෙන්න බැරි විධියට නීති සකස් කර තිබෙනවා.

ඊළඟ කාරණය තමයි ආදායම් බදු. කැසිනෝ ගහන අයට අනිවාර්යයෙන්ම ආදායම් බදු ෆයිල් එකක් විවෘත කරන්න ඕනෑ. ඒක බොහොම හොඳ වැඩක්. සල්ලි තිබෙන හින්දා නේ කැසිනෝ ගහන්නේ. සල්ලි නැති අයට කැසිනෝ ගහන්න බැහැ. බදුල්ලේ අයට කැසිනෝ නැහැ. බදුල්ල පැත්තේ කැසිනෝ ගහන අය නැහැ. කැසිනෝකාරයෝයි, සල්ලි තිබෙන අයයි ඔක්කෝම ඉන්නේ කොළඹ සහ නගර ආසන්න ප්‍රදේශවල නේ. ඒ නිසා සල්ලි තිබෙන අය කැසිනෝ ගහනවා නම්, ඔවුන්ගෙන් බදු ගන්නත් ඕනෑ.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, එතුමාගේ point of Order එකට ඉඩ දෙන්න. එතුමා ඔය විධිය තමයි. ඒ නිසා අවස්ථාව දෙන්නකෝ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද රීති ප්‍රශ්නය, ගරු තුෂාර ඉඳුනිල් මන්ත්‍රීතුමා?

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, චාමර සම්පත් දසනායක රාජ්‍ය ඇමතිතුමා මගේ නම සඳහන් කරමින් කථා කළා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේ රාජ්‍ය ඇමතිකමක් දරන්නේත්,

[ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා]

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

හැටියට තමුන්නාන්සේ හඳුන්වන රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවේම තමයි. බදුල්ල පැත්තේ කැසිනෝ නොගැහුවාට, තමුන්නාන්සේලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

බව අපි දන්නවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
කුලියාපිටියේ හොඳම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කවුද කියලාත් මම දන්නවා. ඒවා ඒ පැත්තේ මිනිස්සු කියනවා. ඉඩම් කඩන ඒවා, කසිප්පු පෙරන ඒවා කුලියාපිටිය පැත්තේ හරි ප්‍රසිද්ධයි.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ප්‍රසිද්ධයි. ඒවා ගැන අහගන්න අවශ්‍ය නම් අපි වෙන වෙනම කථා කරමු. උඩ බලාගෙන කෙළ ගහන්න ලෑස්ති වෙන්න එපා, මන්ත්‍රීතුමා. අපි හොඳට දන්නවා. විභාග පාස් කරපු විදිය, ඒවා මේවා ඔක්කොම ෆයිල් පිටින් ගෙනැල්ලා අපට අතහරින්න පුළුවන්. ඒ නිසා හොඳින් කථා කරනවා නම් අපි හොඳින් කථා කරගනිමු; නරකින් කථා කරනවා නම් නරකින් කථා කරගනිමු. ඒවාට අපි ළඟ උත්තර තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන් වෙනවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මට තව විනාඩි 2ක් ලබා දෙන්න, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වාගේම පසුගිය දිනවල මතු වුණු උඩවලවේ ප්‍රශ්නය පිළිබඳවත් විපක්ෂයේ කට්ටියට බෝල පාස් කරලා පහර ගහන්න දෙන්න හොඳ නැහැ. මොකද, ඒ ප්‍රදේශවලට වතුර දෙන්න තිබුණු වෙලාවේ වතුර දීලා තිබුණා නම් අද විපක්ෂයේ අය බෝල පාස් කරලා ගහන්න එන්නේ නැහැ. මේ ගොල්ලන් ලෑස්ති වුණේ වෙන සෙල්ලමක් දාන්න. අර, 9වැනි දා වාගේ නැවතත් එකතු වෙලා අපේ ගෙවල්වලට වැඩේ දෙන්න තමයි ලෑස්ති වෙලා හිටියේ. නමුත්, අපි වතුර දුන්නා. ගරු කථානායකතුමනි, දෙන්න අවශ්‍ය දෙයක් තිබෙනවා නම් ඒක ඉල්ලන වෙලාවට දෙන්න ඕනෑ. පසුව දීලා වැඩක් නැහැ.

මම කියන්න කැමැතියි, කැසිනෝවලින් -සූදුවලින්- නොවෙයි, මොනවායින් බදු ගත්තත් අහිංසක මිනිසුන්ට ඒ ප්‍රතිලාභය යන්න ඕනෑ බව. මම මීට කලිනුත් කිව්වා, ගල් අරක්කු බෝතලයේ මිල අඩු කරන්න ඕනෑ කියලා. කවුරු මොනවා කිව්වත්, සාධාරණය ඉෂ්ට වෙන්න ඕනෑ. මම මීට සති දෙකකට කලිනුත් මේ කාරණය ප්‍රකාශ කළා. කොහෙන් බදු ගත්තත් කමක් නැහැ. කැසිනෝවලින් හරි මොනවායින් හරි කමක් නැහැ බදු අරගෙන, ගමේ අහිංසක මනුස්සයාට සාධාරණයක් ඉෂ්ට වෙන්න ඕනෑ. අන්න! කථානායකතුමාත් ඔළුව වනනවා ගල් අරක්කු බෝතලයේ මිල අඩු කරන්න ඕනෑය කියනකොට. ඒක ඇත්ත කියලා එතුමාත් අනුමත කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඔළුව වැනුවේ ඔබතුමාගේ කථාව අවසන් කරන්න කියලායි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, ඔබතුමාත් ඒක අනුමත කරනවා. මොකද, ඔබතුමාත් වැලිගම, අකුරැස්ස, දෙනියාය ප්‍රදේශවල ඡන්දවලින් ආපු කෙනෙක් නිසා ඔබතුමා වුණත් ඒක අනුමත කරනවා. මම කියන්නේ මේකයි. ඒ අඩු කිරීම අවුරුද්දකින් දීලා වැඩක් නැහැ. දෙනවා නම් හෙට අනිද්දාට ඒකත් අඩු කරන්න ඕනෑ. අපට ඒ ගැන දෙපාරක් තුන්පාරක් කියන්න බැහැ.

ගරු කථානායකතුමනි, ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත නොවෙයි, මොන පනත් කෙටුම්පතක් ගෙන ආවත්, රටට යහපතක් වෙන, රටට බදු එන පනත්වලට අපේ සහයෝගය ලබා දෙනවා. හැබැයි, සූදුවට නොවෙයි, අපේ රටට ආදායම් එන, අපේ අය වැයට - Budget එකට - එහෙම නැත්නම්, අපේ ආර්ථිකයට හයියක් ලැබෙනවා නම් අපි ඒකට උදවු කරනවා. ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]***
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Susil Premajayantha]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[THE HON. SPEAKER in the Chair.]*

***1 සිට 6 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 6ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 6 ordered to stand part of the Bill.*

## 7 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය ප්‍රතියෝජනය කිරීම)

වාසකம் 7.- (முதன்மைச் சட்டவாக்கத்துக்கான அட்டவணையை மாற்றீடு செய்தல்)

CLAUSE 7.- *(Replacement of the Schedule to the principal enactment)*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"12 වන පිටුවේ, 32 වන සහ 33 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

| | |
|---|---|
| (i)අනුයෝජිතයකු මාර්ගයෙන් හෝ අන්තර්ජාලය හරහා සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිත කිරීමෙන් හෝ නොකිරීමෙන් සිදු කරනු ලබන අවස්ථාවක | රුපියල් මිලියන පහක්' " |

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***7 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*7ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 7, as amended, ordered to stand part of the Bill.*

***8 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*8ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 8 ordered to stand part of the Bill.*

## අලුත් වගන්තිය

புதிய வாசகம்

NEW CLAUSE

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් අලුත් වගන්තිය ඉදිරිපත් කරනවා:

"10 වන පිටුවේ, 8 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන නව වගන්තිය ආදේශ කරන්න:

'වලංගු කිරීම 7. 2023 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලබන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ බලය දෙනු ලැබූ කොමසාරිස් ජනරාල්වරයා හෝ යම් තැනැත්තකු විසින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (1අ) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුගෙන් අයකරනු ලැබූ සහ (1අඅ) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුගෙන් අයකර එකතු කර ගනු ලැබූ බදු මුදල් සියලු කාර්යයන් සඳහා මේ පනත යටතේ කොමසාරිස් ජනරාල්වරයා හෝ එම තැනැත්තා විසින් වලංගු ලෙස පනවා එකතු කරගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඉහත කී විධිවිධාන එකී කාලසීමාව තුළ දී අයකරගනු ලැබූ සහ එකතු කරගනු ලැබූ එම බදු මුදල් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් නිකුත් කරන ලද යම් තීරණයකට හෝ ආඥාවකට හෝ යම් අධිකරණයක විභාග වෙමින් පවත්නා නීති කෘත්‍යයකට බල නොපෑ යුතු ය.' "

***ඉදිරිපත් කරන ලදින්, පළමුවන වර කියවන ලදී.***
*கொண்டுவரப்பட்டு முதன்முறை மதிப்பிடப்பட்டது.*
*Brought up, and read the First time*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, "අලුත් වගන්තිය දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අලුත් වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***අලුත් වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*புதிய வாசகம் சட்டமூலத்தில் சேர்க்கப்பட வேண்டுமென்ற வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*புதிய வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Question, that the New Clause be added to the Bill, put and agreed to.*
*New Clause ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා හා මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරැදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත
## ஒதுக்கீடு (திருத்தம்) சட்டமூலம்
## APPROPRIATION (AMENDMENT) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන්, පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***

***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Susil Premajayantha]*

***කාරක සභාවේහිදී සලකා බලන ලදී.***
***[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. SPEAKER in the Chair.]*

***1 සිට 4 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 4ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 4 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## ධීවර සහ ජලජ සම්පත් පනත: නියෝග
## கடற்றொழில் மற்றும் நீர்வாழ் உயிரின வளங்கள் சட்டம்: ஒழுங்குவிதிகள்
## FISHERIES AND AQUATIC RESOURCES ACT: REGULATIONS

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ධීවර අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1) (ඍළ), (ඍළු) සහ (ත) වගන්ති යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2022 දෙසැම්බර් 15 දිනැති අංක 2310/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.07.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### II

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ධීවර අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 6, 7, 8, 9 සහ 10 වගන්ති සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2023 පෙබරවාරි 01 දිනැති අංක 2317/59 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.07.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### III

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ධීවර අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1) (ඍඉ) වගන්තිය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2023

පෙබරවාරි 13 දිනැති අංක 2319/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.07.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## IV

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ධීවර අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 වගන්තිය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2023 පෙබරවාරි 13 දිනැති අංක 2319/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.07.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## V

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ධීවර අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1) (ද) වගන්තිය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2023 පෙබරවාරි 13 දිනැති අංක 2319/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.07.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත

## இலங்கை வரிவிதிப்பு நிறுவகம் (கூட்டிணைத்தல்) (திருத்தம்) சட்டமூலம்

## SRI LANKA INSTITUTE OF TAXATION (INCORPORATION) (AMENDMENT) BILL

***පනත් කෙටුම්පත (ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවෙහි දී) සංශෝධනය කළ ආකාරයෙන් සලකා බැලීමේ නියෝගය කියවන ලදී.***

*[சட்டவாக்க நிலையியற் குழுவில்] திருத்தப்பட்டவாறு, சட்ட மூலத்தைப் பரிசீலித்தற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for consideration of Bill, as amended (in the Legislative Standing Committee), read.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, "ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ වාර්තාව පිළිගත යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

# කල්තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා.

## කුකුළු පාලනය සහ බීඩි කර්මාන්තය ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළක්

### கோழி வளர்ப்பு மற்றும் பீடிக் கைத்தொழிலைப் பாதுகாக்கும் வேலைத்திட்டம்

### PROGRAMME TO PROTECT POULTRY FARMING AND BEEDI INDUSTRY

[අ.භා. 4.44]

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

[ගරු කබීර් හෂීම් මහතා]

"ස්වයං රැකියා ක්ෂේත්‍රයේ කැපී පෙනෙන ක්ෂේත්‍රයක් වනුයේ කුකුළු පාලනය හා ගෘහ ආශ්‍රිතව සිදු කරනු ලබන බීඩි කර්මාන්තයයි.

අද වන විට කුකුළු පාලනය කරන ගොවීන් මුහුණ දෙන ගැටලු රාශියකි. සත්ව ආහාරවල මිල ඉහළ යෑම නිසා සිය ව්‍යාපාර කරගෙන යෑමට නොහැකි පිරිවැයක් දැරීමට සිදුව ඇත. මේ හේතුව නිසා කුකුළු මස් මිල ඉහළ යෑම, බිත්තර මිල ඉහළ යෑම පෙන්වා දිය හැකිය. රජය විසින් බිත්තර මිල පාලනය කිරීමට බිත්තර ආනයනය කිරීමට කටයුතු යෙදීම නිසා දේශීය ව්‍යාපාරිකයන්ට සිය නිෂ්පාදන අළෙවි කරගත නොහැකි තත්ත්වයකට පත්ව ඇත. එමෙන්ම මෙම ආනයනය කරනු ලබන බිත්තරවල ප්‍රමිතිය හා සෞඛ්‍ය තත්ත්වය සම්බන්ධයෙන් ද ජනතාව තුළ සැක සංකා මතුව ඇත. මේ හේතුව නිසා බිත්තර ආහාරයට ගන්නා ජනතාවට සැකයෙන් තොරව සිය අවශ්‍යතා සපුරා ගත නොහැකි තත්ත්වයක් උදා වී ඇති අතර, සිය ප්‍රෝටීන් අවශ්‍යතාව සපුරා ගැනීමට මස් හා බිත්තර ආහාරයට ගන්නා සාමාන්‍ය ජනතාවට දැරිය නොහැකි මිල ගණන් යටතේ සිය අවශ්‍යතා සපුරා ගැනීමට සිදුව ඇත.

එමෙන්ම රට පුරා සුළු හා මධ්‍ය පරිමාණයෙන් සිදු කරනු ලබන කර්මාන්තයකි, බීඩි කර්මාන්තය. මේ ආශ්‍රිතව ලක්ෂ සංඛ්‍යාත පිරිසක් සිය ජීවනෝපාය සපුරා ගනී. රජය විසින් ක්‍රම ක්‍රමයෙන් මෙම කර්මාන්තය කෙරෙහි බදු වැඩි කිරීම් සිදු කළ අතර, ආනයනය කරන බීඩි කොළ වෙනුවෙන් ද බදු වැඩි කර ඇත.

එසේම මෑතකදී රජය විසින් සුරාබදු දෙපාර්තමේන්තුව හරහා මෙම කර්මාන්තයේ නියැළෙන සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් ඉලක්ක කර ඔවුන්ගෙන් බදු අය කිරීමට වැටලීම් සිදු කිරීමේ වැඩ පිළිවෙළක නිරතව සිටින අතර, මේ තත්ත්වය හේතුවෙන් මෙම කර්මාන්තය තව තවත් පිරිහීමට ලක්ව ඇත.

විශාල පිරිසකගේ ජීවනෝපාය බවට පත්ව ඇති මෙම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කෙරෙහි වැඩි අවධානයක් යොමු කර මෙකී ව්‍යාපාර ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කර සිටී."

ගරු කථානායකතුමනි, අද මේ රටේ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට අභියෝග රැසකට මුහුණ දීමට සිදුවෙලා තිබෙනවා. ඒ වාගේම මේ ක්ෂේත්‍රවල විශාල කඩා වැටීමක් සිදුවෙලා තිබෙනවා. මේ රටේ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය තුළ ප්‍රධාන කර්මාන්ත දෙකක් තිබෙනවා. එකක් බීඩි කර්මාන්තය. අනෙක, කුකුළු පාලනය, බිත්තර නිෂ්පාදනය. ඒ කර්මාන්තවලට අද විශාල ගැටලු පැන නැඟී තිබෙනවා.

විශේෂයෙන්ම බීඩි කර්මාන්තය ගත්තාම, එය දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා මුළු රටේම ව්‍යාප්ත වෙලා තිබෙන කර්මාන්තයක්. මම නියෝජනය කරන කෑගල්ල දිස්ත්‍රික්කයේ විශාල පිරිසක් එම කර්මාන්තයේ යෙදිලා ඉන්නවා. සාමාන්‍යයෙන් මුළු දුම් පානයෙන් බීඩි දුම් පානය සියයට 23ක් වැනි ප්‍රමාණයක තිබෙනවා. මේක ග්‍රාමීය මට්ටමේ කර්මාන්තයක්; ගෘහ කර්මාන්තයක්. බීඩි නිෂ්පාදකයෝ අතරින් සියයට 80ක්ම ග්‍රාමීය, ගෘහ නිෂ්පාදකයෝ. ඒ වාගේම, එයින් සියයට 76ක් කාන්තාවෝ. දැනට බීඩි ඔතන අය දළ වශයෙන් ලක්ෂ තුනක, හතරක සංඛ්‍යාවක් අපේ රටේ ඉන්නවා. සාමාන්‍යයෙන් එයින් සියයට 80ක් කාන්තාවෝ. දවසකට රුපියල් 1,500 සිට 2,000 දක්වා උපයා ගන්නා ආදායම් මාර්ගයක් ලෙස මෙය සකස් වෙලා තිබෙනවා.

මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, බීඩියකින් රුපියල් දෙක බැගින් බදු අය කරන ලෙස මුදල් අමාත්‍යාංශයෙන් සුරාබදු දෙපාර්තමේන්තුවට උපදෙස් දීලා, නියෝග කර තිබෙනවා. දැන් ඒ අය බීඩි කර්මාන්තයේ යෙදෙන අයගේ ගෙවල් ගණනේ ගිහිල්ලා ඒ මිනිසුන්ට හිරිහැර කරන තරමට මෙය විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මේක බරපතළ ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමනි, 2016ට පෙර බීඩි එතුම් කොළවලට අය කළ ආනයන බද්ද රුපියල් 350යි. හැබැයි, 2016දී ඒක රුපියල් 2,000කින් වැඩි කළා. ඊට පස්සේ 2017දී කිලෝ එකක මිල තව රුපියල් 500කින් වැඩි කළා. ඊළඟට, 2019දී එතුම් කොළ කිලෝවක් තව රුපියල් 1,000කින් වැඩි කළා. රුපියල් 6,600ක් එතුම් කොළ කිලෝවකට වැය වෙනවා. මේක විශාල මුදලක්. එක බීඩියකින් රුපියල් 3.30ක් අය කරනවා. මෙහෙම තිබියදී තවත් මේ බදු වැඩි කරන්නට කටයුතු කර තිබෙනවා. තවත් රුපියල් දෙක බැගින් බීඩිවලින් අය කරන්න කියලා තිබෙනවා. ගිහිල්ලා බීඩි ගණන් කරලා, එහෙම එක ගබඩාවකින් අය කරන්න බැහැ. මොකද, බීඩි කර්මාන්තය කියන්නේ ගෘහ මට්ටමින් කරන කර්මාන්තයක්. ඒ නිසා දැන් ගෙවල්වලට ගිහිල්ලා කාන්තාවෝ බය කරලා බදු අය කරගන්න හදනවා. ඒ වාගේම සමහර නිලධාරින් සුරාබදුවලින් අල්ලස් ගන්න, කප්පම් ගන්න උත්සාහ කරනවා. පිස්තෝල අරගෙන ගිහිල්ලා මිනිස්සු බය කරවා මේ කර්මාන්තයම විනාශ කරන්න බලනවා. ලක්ෂ ගණනක් රැකියා කළ ඇඟලුම් කර්මාන්තය කඩා වැටිලා තිබෙන අවධියක, තරුණ තරුණියෝ රස්සා නැතිව ගෙදර ඇවිල්ලා ඉන්න අවස්ථාවක අම්මලා බීඩි ඔතලා ජීවත් වෙනවා. මේ අයටත් හිරිහැර කරලා මේක කඩා වැටෙනකොට ගම්වල ඉන්න අයට ජීවත් වෙන්න වෙනත් මාර්ගයක් නැති වෙනවා. බදු අය කරන එකට මේ බීඩි කර්මාන්තයේ යෙදිලා ඉන්න අයගෙන් ප්‍රශ්නයක් නැහැ. ඕනෑ තරම් බදු අය කරන්න පුළුවන්. හැබැයි, ඒ ක්‍රමවේදය මේ වාගේ සුරාබදු දෙපාර්තමේන්තුවට භාර දුන්නාම ඒ ආදායම රජයට එන්නෙත් නැහැ, රටට එන්නෙත් නැහැ. ඒක යන්නේ කාගේ හෝ සාක්කුවට. මේක වැරදි ක්‍රමවේදයක්. මේක වහාම නතර කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු විධියට මේ ගැන සංවේදීව බලන්න. දැනට සමස්ත ලංකා බීඩි සංගමය ජනාධිපතිතුමාට යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා මේ බදු අය කරන ක්‍රමවේදය වෙනස් කරන්න කියලා. ඒ ගොල්ලන් ක්‍රමවේද කිහිපයක් ගැන යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. මේ ගැන සොයා බලා වෙනසක් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා, ගරු කථානායකතුමනි.

ඊළඟට කුකුළු කර්මාන්තය සහ බිත්තර නිෂ්පාදනය ගත්තොත්, ලංකාවේ බිත්තර නිෂ්පාදන ගොවිපොළවල් 20,889ක් තිබෙනවා. බ්‍රොයිලර් නිෂ්පාදන ගොවිපොළවල් 10,491ක් සහ ගෙවතු සහ ක්ෂුද්‍ර ගොවිපොළවල් 222,000ක් විතර ලංකාව පුරාම තිබෙනවා. මේ ආර්ථික අර්බුදයත් එක්ක මේ කර්මාන්තයට විශාල ප්‍රශ්නයක් ඇති වුණා. රුපියල වැටෙන්න පටන් ගැනීමත් එක්ක, ඩොලර් හිඟයත් එක්ක, පොහොර නැති වීමත් එක්ක පළමුවෙන්ම මේ කර්මාන්තයට සිදු වුණේ මව් පිය සතුන්ගේ හිඟයක් ඇති වීම. ඒ කියන්නේ රුපියල් 125ක මිලකට තිබුණු කුකුළු පැටවා රුපියල් 500ට මිල ඉහළ ගියා. රජය විසින් ආනයනය කරන රැකුම් බිත්තරවලින් බිහි වෙන පැටවකු රජය විසින්ම රුපියල් 720ට විකුණන්න පටන් ගත්තා. එතැනින් ගොවිපොළවලට වියදම් වැඩි වුණා. මේක වුණේ කර්මාන්තයේ ඉන්න අයගේ වරදකින් නොවෙයි. මේක කෙළින්ම රජයෙන් සිදු වුණු ප්‍රශ්නයක්.

ඊළඟට කුකුළු කෑම, එහෙම නැත්නම් සත්ව ආහාර ප්‍රශ්නයත් තිබෙනවා. සත්ව ආහාරවලට සියයට 40ක්ම අවශ්‍ය වෙන්නේ බඩ ඉරිඟු. රසායනික පොහොර තහනම සිදු වුණු ගමන්ම ලංකාවේ බඩ ඉරිඟු නිෂ්පාදනය කඩා වැටුණා. ඒ වාගේම මිල වැඩි වුණා. ඊළඟට, රුපියල කඩා වැටීමත් එක්ක ආනයනය කරන බඩ ඉරිඟුවල මිල වැඩි වුණා. ඩොලර් හිඟය නිසා ඒවා ගෙන්වා

ගන්නත් බැරිකමක් ඇති වුණා. ගරු කථානායකතුමනි, ලංකාවේ සත්ව ආහාර සඳහා බඩ ඉරිඟු ඉල්ලුම තිබෙන්නේ මෙට්‍රික් ටොන් ලක්ෂ 5යි. හැබැයි, ලංකාවේ අපි බඩ ඉරිඟු මෙට්‍රික් ටොන් 250,000ක් පමණයි නිෂ්පාදනය කරන්නේ. ඉතුරු හිඟය ආනයනය කිරීමට අපට හරි ක්‍රමවේදයක් තිබුණේ නැහැ. රජය නිසි වේලාවට ආනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කරන්නේ නැහැ. රජය කරන්නේ ඩීල් දමන එක. එහෙම නැත්නම් කෘෂිකර්ම අමාත්‍යාංශය බලපත්‍රය අතේ තියාගෙන ඒ අයම තමයි බඩ ඉරිඟු ගෙන්වන්නේ. ඊට පස්සේ කීයක් හරි අරගෙන ඒ බලපත්‍රය නිෂ්පාදකයෙකුට අලෙවි කරන්න බලනවා. මේ වාගේ ප්‍රශ්න ගොඩක් සිදු වුණා. ඒකෙන් සත්ව ආහාර මිල වැඩි වෙලා, කුකුළු මස් කිලෝ එකක නිෂ්පාදන වියදම වැඩි වුණා. ඒකේ වගකීමත් කර්මාන්තකරුවන්ගේ නොවෙයි රජයේ. මොකද, රජය ඒකට අවශ්‍ය ක්‍රියාමාර්ග හරියට ගත්තේ නැහැ.

ගරු කථානායකතුමනි, 2012දී අපි බඩ ඉරිඟු මෙට්‍රික් ටොන් 209,000ක් නිෂ්පාදනය කළා. 2022දී -අවුරුදු 10කට පස්සේ- නිෂ්පාදනය කළේ මෙට්‍රික් ටොන් 273,000යි. පොඩි වෙනසක් තමයි ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා ඉතිරි හරිය අපට පිට රටින් ගෙන්වා ගන්න වෙනවා. අන්තිමට බඩ ඉරිඟු අවශ්‍යතාව වැඩි වීමත් එක්ක බඩ ඉරිඟු ගොවියා ආරක්ෂා කරනවා වෙනුවට, අද බඩ ඉරිඟු ආනයනය කරනවා.

දැන් බිත්තරත් ආනයනය කරනවා. වෙළෙඳ ඇමතිවරයා කියා තිබෙනවා ඊළඟට කුකුළු මස් ආනයනය කරනවා කියලා. අපි හිතුවේ වෙළෙඳ ඇමතිවරයෙක් ඉන්නේ මේ රටේ තිබෙන දේවල් අපනයනය කරන්න කියලා. හැබැයි, එතුමා කියනවා කුකුළු මස් ආනයනය කරන්න යනවා කියලා. පසුගිය කාලයේ බිත්තරවලට මිල පාලනයක් දැම්මා. ඒක දමපු ගමන් මොකක්ද වුණේ? බිත්තර හිඟයක් ඇති වුණා. ඊට පස්සේ බිත්තර පිට රටින් ගේන්න පටන් ගත්තා. රංජිත් සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමා කියා තිබුණා අපි දැනට බිත්තර ලක්ෂ 45ක් ආනයනය කර තිබෙනවා කියලා. දවසකට බිත්තර ලක්ෂයක් ගේනවා. මාසයකට ලක්ෂ 30යි.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාව වසරකට කුකුළු මස් මෙට්‍රික් ටොන් 228,000ක් නිෂ්පාදනය කරනවා. එ් කියන්නේ මාසික නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 19යි. රජය දැනට කිලෝවට අය කරන බද්ද රුපියල් 254යි. කිලෝග්‍රෑම් එකක බද්ද රුපියල් 254ක් නම්, ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමනි එක මාසයකට කිලෝග්‍රෑම් මිලියන 19කින් රජය මේ කර්මාන්තයෙන් උපයන බදු මුදල රුපියල් කෝටි 480යි. අවුරුද්දකට උපයන බදු මුදල රුපියල් කෝටි 5,700යි. ඒක තමයි ආදායම. හැබැයි, මේ අතරේ කුකුළු මස් ආනයනය කරන්න යනවා.

ගරු කථානායකතුමනි, අද කුකුළු මස් කිලෝ එකක මිල රුපියල් 1,290යි. ඒකට අය කරන බදු මුදල වන රුපියල් 254 ඒකෙන් අඩු කරන්න ඕනෑ. එතකොට retail margin එක, කඩේට, supermarket එකට ඒ ගොල්ලන්ගෙන් දෙන ලාභය රුපියල් 203යි. ඒක අඩු කළාම නිෂ්පාදකයාට යන්නේ රුපියල් 833යි. දැන් ඇමතිවරයා කියනවා එතුමා පිට රටින් කුකුළු මස් ගේනවා කියලා. පිට රටින් කුකුළු මස් ගේනවා නම් දළ වශයෙන් CIF price එක ඩොලර් 2යි. එතකොට රුපියල් 700යි. රුපියල් 700 ගානේ පිට රටින් ගේන ඒවාට බදු අය කරනවාද, නැද්ද? ලංකාවේ නිෂ්පාදනය කරන එ්වාට බදු අය කරනවා. පිට රටින් ගේන එකට බදු අය කරනවා නම්, බදු ලෙස ඒ රුපියල් 254 එකතු කළාම retail margin එකට එකතු කරන්න වෙනවා. නිකම් විකුණන්න බැහැ නේ. ඒකත් එකතු කළාම පිට රටින් ගෙනෙන කුකුළු මස් කිලෝ එකක් රුපියල් 1,157යි. අපේ රටේ ඒවා එක්ක වෙනස බැලුවාම වෙනස රුපියල් 113යි. ලක්ෂ ගානක් සේවය කරන, ජාත්‍යන්තර ප්‍රමිතියක් තිබෙන - දැනට අපි කුකුළු මස් අපනයනය කරන රටක් - මේ කර්මාන්තය විනාශ කරන්න රුපියල් 113ක වාසියට පිට රටින් කුකුළු මස් ආනයනය කරන එක හරිද? මම අහන්නේ මේ වෙළෙඳ ඇමතිවරයා ලංකාවේ ඇමතිවරයාද, නැත්නම් ඉන්දියාවේ ඇමතිවරයාද කියලා. මොකද, ඉන්දියාවෙන් නේ මෙහාට ගෙන්වන්න හදන්නේ. දැන් බිත්තර ගෙනාවා, කුකුළු මස් ගේන්නත් යනවා.

අපි එතුමාට අභියෝග කරනවා, පුළුවන් නම් අපේ කුකුළු කර්මාන්තයට ඉන්දියාවේ වෙළෙඳ පොළ විවෘත කර දෙන්න කියලා. අපේ අය ලෑස්තියි අපනයනය කරන්න. එම ක්ෂේත්‍රය තුළ අපට හොඳ ආහාර නිෂ්පාදන ඒකකයක් තිබෙනවා. හොඳම බ්‍රොයිලර් කුකුළු නිෂ්පාදන ඒකකයක් තිබෙනවා; හොඳ කර්මාන්තකරුවෝ ඉන්නවා. මේ කර්මාන්තය ආරක්ෂා කරන එක අපේ යුතුකමක්. අප නිෂ්පාදනය කරන කුකුළු මස් ප්‍රමාණය පිට රටින් ගේනවා නම්, අපට මාසයකට ඩොලර් මිලියන 38ක් යනවා. ඩොලර් හිඟයක් මේ රටේ තිබෙන වෙලාවේ අපේ රටේ නිෂ්පාදනය කළ හැකි මෙවැනි අත්‍යවශ්‍ය භාණ්ඩ පිට රටින් ගෙනෙන එක ඉතාම භයානකයි.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම තවත් කාරණයක් කියන්න ඕනෑ. කෘෂිකර්ම අමාත්‍යාංශයේ ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය නිකුත් කර තිබෙන ලේඛනයක් මා සතුව තිබෙනවා. එහි සඳහන් වෙනවා, බඩ ඉරිඟු ආනයනය කිරීම ආණ්ඩුවෙන් කරන්න යනවා කියලා. ආණ්ඩුව කියනවා, "ආණ්ඩුව බිස්නස් කරන්නේ නැහැ, ඔක්කොම ආයතන පෞද්ගලීකරණයට ලක් කරනවා" කියලා. එහෙම නම්, ආණ්ඩුව දැන් බඩ ඉරිඟු ගේන්නේ ඇයි? දෙපාර්තමේන්තු හරහා, අමාත්‍යාංශ හරහා මේවා ගේන්නේ මේවා තුළින් ඩීල් දමන්නයි. එහෙම නොවෙයි නම් මේ බඩ ඉරිඟු ආනයනය කරන්න නිෂ්පාදකයන්ට ඉඩ දෙන්න ඕනෑ. ඒ අයගේ අවශ්‍යතාව අනුව බලපත්‍ර ටික ඒ අයට නිකුත් කරන්න කියා මම ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
යෝජනාව ස්ථිර කිරීම, ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා.

[අ.භා. 4.54]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු කථානායකතුමනි, ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා අද දින සභාව කල් තබන අවස්ථාවේ ගෙන ආ යෝජනාව මම ස්ථිර කරනවා.

එතුමා ගෙනැත් තිබෙන්නේ ඉතාම වැදගත් යෝජනාවක්. විශේෂයෙන්ම අපේ රටේ කුකුළු කර්මාන්තයෙන් සියයට 60ක් සිදු වන්නේ අප නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කයේ. ගරු කථානායකතුමනි, කොරෝනා වසංගතයට ඉස්සෙල්ලා අපි මේ කර්මාන්තයෙන් ස්වයංපෝෂිතයි. ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා කිව්වා වාගේම අපි ඇත්තටම කුකුළු මස් අපනයනය කළා. නමුත්, වර්තමානයේ පවතින තත්ත්වය තුළ අපි රජය සම්බන්ධයෙන් ඇත්තටම කනගාටු වෙනවා. මොකද, එදා ස්වයංපෝෂිත වෙලා තිබුණු මේ කර්මාන්තය, වර්තමාන වෙළෙඳ ඇමතිවරයා ගත්තු යම් යම් ක්‍රියා මාර්ග නිසා විනාශ වන තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

ගරු කථානායකතුමනි, රටක් හැටියට අපි අපේ නිෂ්පාදන අද වැඩි කර ගන්න ඕනෑ. කොරෝනා තත්ත්වයත්, ආර්ථික බංකොලොත්භාවයත් නිසා කඩා වැටුණු මේ කර්මාන්ත නැවත නැඟිටින්න ලැස්ති වන අවස්ථාවේ තමයි ඒ සඳහා රජයෙන් කිසිම සහයෝගයක් ලැබෙන්නේ නැත්තේ. අපි ඒක පැහැදිලිවම කියන්න ඕනෑ. ඒකට හේතුව මම කියන්නම්. අපේ රටේ කොරෝනා තත්ත්වයට කලින්, දිනකට බිත්තර ලක්ෂ 70ක් පමණ නිෂ්පාදනය කළා. පසුගිය කාලයේ කොරෝනාවලින් පස්සේ බිත්තර නිෂ්පාදනය දිනකට ලක්ෂ 40ක් දක්වා විතර අඩු වුණා. දැන් අපේ රටේ බිත්තර නිෂ්පාදනය ආපසු දිනකට ලක්ෂ 50ක්, 55ක්, 60ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. අපි දැන් මේ නිෂ්පාදනය තවත් වැඩි කර ගන්න ඕනෑ. ඒ සඳහා අප කළ යුතු කාර්යයන් ගණනාවක් තිබෙනවා. අපේ ප්‍රදේශයේ ඉන්න කුකුළු ගොවීන් එක්ක කථා කළාම, ඒ කර්මාන්තයේ යෙදිලා ඉන්න අයත් එක්ක කථා කළාම අපට දැනගන්න ලැබුණා, මේ වනකොට කුකුළු කර්මාන්තයට අවශ්‍ය කෑම මිල ආපහු ඉහළ ගිහින් තිබෙන බව. සෝයා කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 255-260 අතර වෙනවා. ඒ වාගේම, හුනු සාල් කිලෝග්‍රෑම් එකක් රුපියල් 125යි, 130යි. Rice polish කිලෝග්‍රෑම් එකක් රුපියල් 80යි, 85යි. බඩ ඉරිඟු කිලෝග්‍රෑම් එකක් රුපියල් 175යි, 180යි. මේ සති කිහිපයට මෙම ආහාරවල මිල සියයට 20කින් විතර වැඩි වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, දැන් බලන්න කුකුළු පැටියෙක් කීයද කියලා. මේ වන විට පෞද්ගලික අංශයේ හදන දවසක පැටියෙක් රුපියල් 500ක්, 550ක් විතර වෙනවා. රජය මඟින් ක්‍රියාත්මක කරන NLDB එක මේ පැටවෙකු දෙන්නේ රුපියල් 750කට. එහෙම නම්, එතැනත් ජාවාරමක් සිදු වෙනවා. සාමාන්‍ය ගොවියෙකුට NLDB එකේ හදන පැටවුන් ගන්න බැහැ. මේ කුකුළු පැටවුන් ලබා ගන්න නිකවැරටිය, පඩුවස්නුවර, බිංගිරිය ප්‍රදේශවල ගොවීන් 10දෙනෙක්, 15දෙනෙක් ඉල්ලීම් කළා. මේ කර්මාන්තය සඳහා අවශ්‍ය පැටවුන් ලබා ගන්න ඔවුන්ට වෙනත් තැනක් නැහැ. මොකද, පෞද්ගලික අංශයෙන් කුකුළු පැටවුන් ගන්න මාස 6ක්, 7ක් බලාගෙන ඉන්න ඕනෑ. NLDB එකෙන් කුකුළු පැටවුන් ලබා දීමේ කටයුත්ත ඇත්තටම ජාවාරමක් විධියට තමයි අද සිදු වන්නේ. NLDB එකෙන් කුකුළු පැටවෙකු රුපියල් 750ට මිලට ගන්නා ජාවාරම්කරුවන් රුපියල් 1,000කට වඩා වැඩි මුදලකට - 1,050කට වාගේ මුදලකට- තමයි ගොවීන්ට විකුණන්නේ. එතකොට දවසක පැටියෙකු මිල දී ගන්න සාමාන්‍ය ගොවියෙකුට රුපියල් 1,000කට වඩා මුදලක් ගෙවන්න සිදු වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. මුදල් රාජ්‍ය ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ. අපි බිත්තර මිල එක මට්ටමක පවත්වාගන්න ඕනෑ. මේ වනකොට වෙළෙඳ පොළේ තිබෙන සුදු බිත්තරයක් ගොවියාගෙන් ගන්නේ රුපියල් 40ට.

රතු බිත්තරයක් මිල දී ගන්නේ රුපියල් 41ට. ග්‍රෑම් 50ට අඩු බිත්තරයක් නම් රුපියල් 35 ඉඳලා වන මිලකට තමයි ගොවියාගෙන් මිල දී ගන්නේ. ඒ තත්ත්වය තවත් අඩු කර ගන්න පුළුවන්, නිෂ්පාදන මිල අඩු කර ගන්නවා නම්. නිෂ්පාදන මිල අඩු කර ගන්න නම්, මීට වඩා අඩු මිලකට ගොවියාට පැටවුන් ලබා දීමේ වැඩ පිළිවෙළ සකස් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, කුකුළු පාලනය කියන්නේ අපේ රටේ ස්වයංපෝෂිත වෙලා තිබුණු කර්මාන්තයක්. ඒ කර්මාන්තය කොරෝනා වසංගතය කාලය තුළ සහ රටෙහි බංකොලොත්භාවය තුළ යම් කඩා වැටීමකට ලක් වුණා නම්, එය නැවත ගොඩනඟන්න අවශ්‍ය වැඩ පිළිවෙළ රජය වශයෙන් ක්‍රියාත්මක කරන්න ඕනෑ. නමුත්, ඒ වෙනුවට අද වෙළෙඳ ඇමතිවරයා කරන්නේ මොකක්ද? එතුමා පිට රටින් බිත්තර ගෙන්නුවා. මේ වනකොට ඒවායේ ප්‍රමිතිය ගැනත් ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ගරු කබීර් හෂීම් මැතිතුමා කිව්වා වාගේ දැන් පිට රටින් කුකුළු මස් ගෙන්වන්නත් යනවා. මේ ආකාරයට අපේ රටේ බිත්තර හා කුකුළු මස් කර්මාන්තය එහෙම පිටින් විනාශ කරන වැඩ පිළිවෙළකට තමයි මේ යන්නේ. ඒ තත්ත්වය තුළ රැකියා විශාල ප්‍රමාණයක් අහිමි වෙනවා. අපේ ප්‍රදේශවල කුඩා හා මධ්‍ය පරිමාණයෙන් සිදු වන කුකුළු පාලනයේ සිට එම නිෂ්පාදන වෙළෙඳ පොළ වෙත ගෙන යෑම දක්වා රැකියා ගණනාවක් බිහි වෙලා තිබෙනවා. ඒ රැකියා සියල්ල අනතුරට පත් වෙනවා. ඒ නිසා අපි පැහැදිලිවම කියනවා, මේ කර්මාන්තය ආරක්ෂා කරගෙන, නිෂ්පාදනය තවත් වැඩි කරලා හොඳ ඩොලර් ආදායමක් ලබන්න පුළුවන් කර්මාන්තයක් හැටියට පවත්වා ගෙන යන්න අවශ්‍ය සහයෝගය රජය පැත්තෙන් ලබා දිය යුතුය කියලා. ඒ වෙනුවෙන් වන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, මට තවත් විනාඩියක කාලයක් දෙන්න. බීඩි කර්මාන්තය ගැනත් මෙහිදී කථා කළා. ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාවේ ඒ ගැනත් සඳහන්ව තිබෙනවා. අපේ ප්‍රදේශයේ තමයි -කෑගල්ල දිස්ත්‍රික්කයේත්, කුරුණෑගල දිස්ත්‍රික්කයේත්- බීඩි කර්මාන්තය ආශ්‍රිත රැකියාවල වැඩිම පිරිසක් යෙදිලා ඉන්නේ. ඒක ස්වයං රැකියාවක් හැටියටයි කරන්නේ. කාන්තාවන් විශාල සංඛ්‍යාවක් ගෙදර ඉඳගෙන බීඩි කර්මාන්තයේ යෙදෙමින්, ඒ ලැබෙන ආදායමින් තමන්ට එදිනෙදා ජීවත් වෙන්න පුළුවන් තත්ත්වයක් දීර්ඝ කාලයක සිට ඇති කරගෙන තිබෙනවා. නමුත්, අද මේ ඇති කරලා තිබෙන බදු ක්‍රමයත් එක්ක එම කර්මාන්තය විනාශ වෙන තත්ත්වයට, එහෙම නැත්නම් ඔවුන් එය මඟ හැරලා, අත් හැරලා යන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මුදල් රාජ්‍ය ඇමතිවරයා හැටියට ඔබතුමා ඒ ගැන අවධානය යොමු කරන්න. මා දන්නා විධියට ඔබතුමාගේ දිස්ත්‍රික්කයේත් විශාල පිරිසක් බීඩි කර්මාන්තයේ නිරතව ඉන්නවා. ඒ නිසා සාධාරණ ක්‍රමවේදයකට අනුව, එම කර්මාන්තයත් ආරක්ෂා වන ආකාරයට, ස්වයං රැකියාවල යෙදිලා ඉන්න අයගේ ආදායම අහිමි නොවන විධියට අවශ්‍ය පියවර ගන්න කියලා මතක් කරමින්, මට වෙලාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

[පි.ව. 5.00]

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා (අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு அ. அரவிந்த் குமார் - கல்வி இராஜாங்க அமைச்சர்)

(The Hon. A. Aravindh Kumar - State Minister of Education)

கௌரவ சபாநாயகர் அவர்களே, விசேடமாக இன்று நாங்கள் கோழி வளர்ப்பு மற்றும் பீடிக் கைத்தொழில் தொடர்பான ஒத்திவைப்புப் பிரேரணைமீதான விவாதத்தில் கலந்து கொண்டு, எங்களது கருத்துக்களை முன்வைத்துக் கொண்டிருக்கின்றோம்.

இப்பொழுது நாட்டில் ஏற்பட்டிருக்கும் கோழி இறைச்சிக் கான தட்டுப்பாடாக இருக்கலாம், முட்டைக்கான தட்டுப் பாடாக இக்கலாம்! எமது நாடு ஒரு விவசாய நாடு என்ற அடிப்படையில், இவற்றை நாங்கள் எந்தவிதத்திலும் அனுமதிக்க முடியாது. நாங்கள் இவ்வாறான பொருட்களை ஏற்றுமதி செய்கின்ற இடத்தில் இருக்க வேண்டுமே ஒழிய,

இறக்குமதி செய்யக்கூடிய இடத்தில் இருக்கக் கூடாது. எமது நாடு எல்லா வளங்களையும்கொண்ட ஒரு நாடாக இருக்கின்றது. அவற்றை நாங்கள் முழுமையாகப் பயன்படுத்தவேண்டிய தேவை இருக்கின்றது. அதற்காகச் சம்பந்தப்பட்ட அனைத்துத் துறைகளும் அதிக அக்கறையோடு செயற்பட வேண்டுமென்று நான் கேட்டுக்கொள்கின்றேன்.

விசேடமாக, இன்று மலையகத்தில் தோட்டப் புறங்களிலுள்ள தேயிலை மலைகள் அனைத்தும் மூடப்பட்டு, தரிசு நிலங்களாக மாறி வருகின்றன. அந்தத் தரிசு நிலங்களை ஆக்கபூர்வமாக மாற்றக்கூடிய வாய்ப்பு இப்பொழுது ஏற்பட்டிருக்கின்றது. பெருந்தோட்டக் கம்பனிகள் இந்தத் தேயிலை மலைகளைக் கைவிட்ட நிலையில், தொடர்ந்தும் அவற்றிலிருந்து எந்தவிதப் பயனையும் பெற்றுக்கொள்ளாமல் இருப்பதனாலேயே அவை தரிசு நிலங்களாக மாறுகின்றன. இன்று பெருந்தோட்டங்களில் வாழ்பவர்கள் பொருளாதார ரீதியாக நலிவுற்றிருக்கிறார்கள். தோட்டங்களில் வேலைவாய்ப்பு மிகக் குறைவாகவே இருக்கின்றது. எனவே, அவர்களுக்கு வாழ்வாதாரத்தை ஏற்படுத்திக் கொடுக்க வேண்டும். அந்த வகையில், இந்தத் தரிசு நிலங்களைப் பயன்பெறும் நிலங்களாக மாற்றக்கூடிய நல்லதொரு வாய்ப்பு இப்பொழுது எங்களுக்குக் கிடைத்திருக்கின்றது.

ஒருபுறம் பால் மாவுக்குத் தட்டுப்பாடு ஏற்பட்டிருக்கின்றது. மறுபுறம் கோழி இறைச்சி, முட்டை என்பவற்றுக்குத் தட்டுப்பாடு ஏற்பட்டிருக்கின்றது. இன்று நாங்கள் இவற்றையெல்லாம் வெளிநாடுகளிலிருந்து இறக்குமதி செய்யவேண்டிய நிலைக்குத் தள்ளப்பட்டிருக்கின்றோம். இதனைத் தடுக்க வேண்டுமென்றால், எமது தேசிய உற்பத்தியை அதிகரிக்க வேண்டும். தேசிய உற்பத்தியை அதிகரிப்பதற்கு இந்த நாட்டில் எந்தத் தடையும் கிடையாது. இங்கு அனைத்து வளங்களும் இருக்கின்றன. இந்தத் தொழிற்றுறையில் ஈடுபடுபவர்களுக்கு மேலதிகமாக தோட்டத் துறையினரையும் இணைத்துக் கொண்டால், நாங்கள் தன்னிறைவடைவதோடு, வெளிநாடுகளுக்கும் எமது உற்பத்திகளை ஏற்றுமதி செய்யக்கூடிய நிலைமை ஏற்படும். ஏற்கெனவே நாங்கள் இந்த விடயத்தில் தாமதித்து இருக்கின்றோம். ஆகையால், இனியும் தாமதியாது, தோட்டப் பகுதிகளில் இருக்கின்ற தரிசு நிலங்களைப் பயன்படுத்த வேண்டும். வாழ்வாதாரம் நலிவுற்றிருக்கின்ற தோட்டப்புற மக்களுக்கு அவற்றைப் பயன்படுத்துவதற்குச் சந்தர்ப்பம் வழங்க வேண்டும். அவர்கள் அதில் மாட்டுப் பண்ணை, ஆட்டுப் பண்ணை மற்றும் கோழிப் பண்ணைகளை மேற்கொண்டு, தங்களது வாழ்வாதாரத்தை உயர்த்திக் கொள்வார்கள். அதேநேரம், அவர்கள் தேசிய உற்பத்திக்கும் பெரிதும் துணை போவார்கள். தேசிய உற்பத்தியை அதிகரிக்க வேண்டுமென்றால், அவர்களையும் இத்துறையில் இணைத்துக் கொள்ள வேண்டும்; தரிசு நிலங்களைப் பயன்படுத்த வேண்டும். அம்மக்களின் வாழ்வாதாரத்தை மேம்படுத்துவதற்கு இதுவொரு நல்ல கருவியாக இருக்கும் என்ற விடயத்தைப் பகிர்ந்துகொண்டு, சந்தர்ப்பம் அளித்த கௌரவ சபாநாயகர் அவர்களுக்கு நன்றி கூறி விடைபெறுகின்றேன். வணக்கம்.

[අ.භා. 5.03]

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු කථානායකතුමනි, කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ විශාල පිරිසක් මේ කර්මාන්තයේ නිරත වෙලා ඉන්නවා. ඒ වාගේම ඒ ආශ්‍රිත රැකියා කරලා විශාල සේවක පිරිසක් ජීවත් වෙනවා. විශේෂයෙන්ම මා නියෝජනය කරන පඬුවස්නුවර ආසනය, බිංගිරිය, කුලියාපිටිය ප්‍රදේශවල තමයි කුරුණෑගල දිස්ත්‍රික්කයේ විශාල වශයෙන් කුකුළු පාලනයේ යෙදෙන්නන් ඉන්නේ. එම ප්‍රදේශවල තමයි බිත්තර කර්මාන්තය, මස් කර්මාන්තය බහුලව සිදු කරන්නේ. පසුගිය කාල පරිච්ඡේදයේ මේ කර්මාන්තයට කණකොකා හඬලා මේ කර්මාන්තය දිනෙන් දින පිරිහී ගිහින් තිබුණා. විශාල පිරිසක් -සුළු පරිමාණ ගොවීන් රාශියක්- මේ කර්මාන්තයෙන් පසුගිය කාලයේ ඉවත් වුණා.

දැන් නැවත විශාල තර්ජනයක් ඇති වෙලා තිබෙනවා. විශේෂයෙන් මම මේ කාරණයත් කියන්නට ඕනෑ. බඩ ඉරිඟු ආනයනය සඳහා අය කරන බද්ද දැන් සියයට 25ක් බවට පත් කර තිබෙනවා. කලින් මේ සඳහා අය කළේ සියයට 10ක ආනයන බද්දක්. දැන් ඒක සියයට 25ක් කරලා තිබෙනවා. ඒ වැඩි කිරීමත් එක්ක සාමාන්‍යයෙන් ලංකාවේ බිත්තරයක විකුණුම් මිල රුපියල් 8කින් විතර වෙනස්වීමේ හැකියාවක් තිබෙනවා. මස් කිලෝවක විකුණුම් මිල රුපියල් 200කින්, 210කින් විතර වැඩිවීමේ හැකියාවක් තිබෙනවා. රජය විසින්ම බදු පනවලා එහෙම මිල වැඩිවීමේ තත්ත්වයක් ඇති කරලා, ඊට පස්සේ ලංකාවේ බිත්තරයක මිල වැඩියි, ඉන්දියාවේ බිත්තරයක මිල අඩුයි කියලා තර්ක කරනවා. ඒ නිසා බිත්තර ආනයනයට සහ මස් ආනයනයට අවශ්‍ය වන පසුබිම රජය විසින්ම සපයන තත්ත්වයක් අපට පෙනෙනවා. මේ නිෂ්පාදන ක්‍රියාවලිය අකර්මණ්‍ය කරලා, අඩපණ කරලා ආනයන ක්‍රියාවලිය වේගවත් කරන්නට අවශ්‍ය වන ප්‍රතිපත්තියක් හැදෙමින් පවතින බව අපට පෙනෙනවා.

ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමනි, මෙන්න මේ කාරණයත් අපි ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. බිත්තර කර්මාන්තය තුළින් විශාල ඩොලර් ප්‍රමාණයක් අපේ රටට ගෙනෙන්න පුළුවන් ආර්ථිකයක් තමයි මේ විනාශ වෙන්නේ. මේ වාගේ ඩොලර් හිඟ අවස්ථාවක අර කලින් කථා කරපු විධියට අපේ රට තුළින් ඉන්දියාවට විශාල වශයෙන් බිත්තර අපනයනය කරන වෙළෙඳ පොළක් විවෘත කරගන්න අපට පුළුවන් නම්, බිත්තර අපනයනය කිරීමට හැකියාවක් අපට තිබෙනවා නම් විශාල ඩොලර් ප්‍රමාණයක් අපට ගෙනෙන්න පුළුවන්. කලින් අවස්ථාවල කුකුළු බිත්තර ව්‍යාපාරයේ හිටපු අයටම තමයි බඩ ඉරිඟු ගෙන්වන quota එක හම්බ වුණේ. ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමනි, හැබැයි මේ වසරේ ඉඳලා බඩ ඉරිඟු ආනයනය කිරීමේ බලපත්‍රය, ඒ quota එක වාහන ඩේල්කරුවන්ට, spare parts ආනයනය කරන්නන්ට දීලා තිබෙනවා. වාහන ආනයනය කරන්නන්ටත් බඩ ඉරිඟු ගෙන ඒමේ අයිතිය - ඒ ආනයන බලපත්‍රය - දැන් දීලා තිබෙනවා. බිත්තර ව්‍යාපාරයේ හිටපු, කුකුල් කෑම ආනයනය කළ ඒ සැපයුම්කරුවන්ට අද බලාගෙන ඉන්න වෙලා තිබෙනවා. මොකද, බල්ලාගේ වැඩේ බූරුවාටත් බාරදීලා තිබෙනවා. ඒ අය දැන් ඒවා ආනයනය කරනකම් මේ අයට බලාගෙන ඉන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒකත් මේ කර්මාන්තයට බලපාන ලොකුම ප්‍රශ්නයක්.

ඊළඟ කාරණය මේකයි. සාමාන්‍යයෙන් ලංකාවේ බිත්තරයක් සති දෙකක් වාගේ කාලයක් මේ වෙළෙඳ පොළ තුළ සක්‍රියව තියාගන්න පුළුවන්. ලංකාවේ බිත්තරයක් ගොවිපළෙන් එළියට ඇවිල්ලා, වෙළෙඳ පොළෙන් එළියට ඇවිල්ලා පරිභෝජනය කරන අවස්ථාව දක්වා කාලය ගත්තොත්, අපට සති දෙකකට වැඩිය බිත්තරයක් තියාගන්න බැහැ. හැබැයි අපි දකිනවා, ඉන්දියාවෙන් ගෙනාපු බිත්තරයක් ඉන්දියාවේ ගොවිපළෙන් එළියට ඇවිල්ලා, නැව්ගත කරලා, ලංකාවට ඇවිල්ලා, සතොස වාගේ වෙළෙඳසැල්වලට ගිහිල්ලාත් කල් ඉකුත් වීමේ දිනය විධියට මාසයක් විතර තියාගන්න පුළුවන් බව. මොකක්ද ඒ තාක්ෂණය? ඉන්දියාවේ ඉන්න කිකිළියෝ වෙනස්ද? එහෙම නැත්නම් ලංකාවේ ඉන්න කිකිළියෝ වෙනස්ද? ඒ වර්ග දෙකක කිකිළියන්ද? එහෙම නැත්නම් ඒ බිත්තරවලට මොනවා හරි රසායනික ද්‍රව්‍යයක් ගල්වලාද? එතකොට ඒ රසායනික ද්‍රව්‍ය මිනිස්

[ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා]

ජීවිතයට හිතකරද, අහිතකරද? අපි ඔළුවේ තෙල් ටිකක් ගෑවාම ටිකක් වෙලා යනකොට අපට ඒක කටෙන් දැනෙනවා වාගේ ගතියක් එනවා. ඒ වාගේ මොනවා හරි රසායනික ද්‍රව්‍යයක් ඒකට ගල්වලා නම්, ඒ ගල්වන ලද රසායනික ද්‍රව්‍ය තුළින් බිත්තරය ඇතුළේ ක්‍රියාවලියට බලපෑමක් සිද්ධ වෙන්න ඕනෑ නේ, බිත්තරය නරක් නොවී තිබෙන්න නම්. බිත්තරය නරක් නොවී තබාගන්නා ක්‍රියාවලියට අදාළ රසායනික ද්‍රව්‍ය ආහාරයක් හැටියට මිනිස් ශරීරයකට ඇතුළත් වුණාම ඒක මිනිස් ශරීරයකට කොයි විධියටද බලපාන්නේ? ඒක පිළිකා කාරකයක්ද? මෙන්න මේ වාගේ ප්‍රශ්න ගැනත් අපට කථා කරන්න සිද්ධ වෙනවා.

මේ වෙනකොට ඉන්දියාවේ මහා පරිමාණ ආයෝජකයෝ දෙදෙනෙක් ලංකාවට ඇවිල්ලා ඒ ගොල්ලන්ගේ ව්‍යාපාර ආරම්භ කරන්න සූදානම් වන බවක් අපිට ආරංචි වෙනවා. ඒ තමයි කුකුළු මස් ව්‍යාපාරය සහ බිත්තර ව්‍යාපාරය. දැන් මේ පණ ඇදලා, බිම වැටිලා, බඩ ගාලා, හතර ගාතේ වැටිලා ගොඩ එන්න බැරිව දඟලන අපේ බිත්තර වෙළෙඳ ක්ෂේත්‍රය තුළ මේ වාගේ ආයෝජකයෝ සියලු පහසුකම් එක්ක අර යෙදවුම් ටිකත් අරගෙන ලංකාවට ඇවිල්ලා වැඩේ පටන් ගත්තොත්, යන්තමින් පණ ඇද ඇද හරි තිබෙන කුකුළු මස් ව්‍යාපාරයත්, බිත්තර ව්‍යාපාරයත් අවසන් වෙයි කියලා තමයි මට කියන්න සිද්ධ වන්නේ.

ගරු කථානායකතුමනි, මට කාලය ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි. මට බීඩි ගැන කථා කරන්න වෙලාවක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රංජිත් සියඹලාපිටිය ඇමතිතුමා.

[අ.භා. 5.10]

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ranjith Siyambalapitiya - State Minister of Finance )

ගරු කථානායකතුමනි, මෙතැන කරුණු දෙකක් ගැන සඳහන් වුණා. ඒ තමයි, බිත්තර සහ කුකුළු මස් ආනයනය ගැනත්, බීඩි සඳහා අය කරන බද්ද ගැනත්. පළමුවැනි කරුණ සම්බන්ධයෙන් අදහස් දැක්විය යුත්තේ වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින්. මේ සටහන අපි මේ ආකාරයෙන්ම ඒ අමාත්‍යාංශවල ඇමතිවරුන්ට යවන්න බලාපොරොත්තු වෙනවා, අවශ්‍ය කරුණු දැක්වීමට සහ පියවර ගැනීමට.

ගරු කථානායකතුමනි, බිත්තර ආනයනය සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කරලා තිබුණා. ඒ කමිටුවේ වාර්තාව මම මදක් පරිශීලනය කළා. ඒ වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා, අපේ රටේ දිනක බිත්තර අවශ්‍යතාව ලක්ෂ 65යි කියලා. අපි දැනට නිෂ්පාදනය කරන්නේ ලක්ෂ 55යි. ඉස්සර ලක්ෂ 65ම නිෂ්පාදනය කරලා තිබුණා. යම් පසුබෑමක් නිසා දැන් නිෂ්පාදනය කරන්නේ ලක්ෂ 55යි. ඒ ලක්ෂ 10 අඩුව ළමා මන්දපෝෂණයට ඉතා දැඩිව බලපානවා. විශේෂයෙන්ම දරුවන්ගේ ප්‍රෝටීන් අවශ්‍යතාවේදී අඩු ආදායම්ලාභී පවුල් බොහෝ විට භාවිත කරන්නේ බිත්තරයක්. ඒ නිසා අපේ අවශ්‍යතාව සහ සැපයුම අතර දිනකට මිලියනයක අඩුවක් තිබෙනවා. ඒ නිසා අප්‍රේල් මාසයේ 24වැනි දා, බිත්තර ආනයනය සම්බන්ධයෙන් අපි තීරණයක් ගත්තා. නමුත්, දින 70කට පසුව බලනකොටත් අපි ගෙනැල්ලා තිබුණේ බිත්තර මිලියන 35යි. ඒ කියන්නේ අවශ්‍යතාවෙන් භාගයක් පමණයි ආනයනය කරලා තිබුණේ.

ගරු කථානායකතුමනි, මේ වාර්තාව නිකුත් කරලා තිබෙන්නේ ජූලි මාසයේ 24වැනි දා. දැනට සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් අනුමත කරපු කුකුළු පැටවුන් 520,000ක් බිත්තර කර්මාන්තය සඳහා සපයන්න සූදානමින් ඉන්නවා. ඒ ප්‍රමාණය දෙසැම්බර් මාසය වෙනකොට ලක්ෂ 7ක් දක්වා වර්ධනය කර ගන්න පුළුවන් වෙයි කියලා ඔවුන් විශ්වාස කරනවා. ඒ වාගේම 2024 වර්ෂය මැද වෙද්දී පිටරටින් බිත්තර ගෙන්වීම සම්පූර්ණයෙන් නවත්වන්න පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා. ඒ වාගේම රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව හරහා බිත්තර ගෙන්වන්න තීරණය කරලා, සෞඛ්‍ය අමාත්‍යාංශයට සහ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට එහි සම්බන්ධීකරණ කටයුතු භාර දීලා තිබෙනවා. ඒ වාගේම අපි බිත්තර සම්බන්ධයෙන් මිල පාලනයක් ඇති කරලා තිබුණා. බිත්තර නිෂ්පාදන වියදම ඉහළ යෑම නිසා මිල පාලනයත් සමඟ නිෂ්පාදකයා විශාල අපහසුතාවකට පත් වුණා. ඒ නිසා මිල පාලනය සම්බන්ධයෙන් වූ ගැසට් එක වහාම අපි ඉවත් කරලා තිබෙනවා. ඒ නිසා විවෘත වෙළෙඳ පොළේ තරගකාරීව බිත්තර විකුණන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒ වාගේම බිත්තර නිෂ්පාදනය බහුලව කෙරෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 29කට පිටරටින් ගෙන්වන බිත්තර ගෙනයන එක සම්පූර්ණයෙන් තහනම් කරලා තිබෙනවා. එම නිසා ඒ ප්‍රදේශවලට මේ ආනයනික බිත්තර ගෙනයන්න බැහැ.

ගරු කථානායකතුමනි, බඩ ඉරිඟු සඳහා බද්දක් පනවන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශය කළ ඉල්ලීම සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය කටයුතු කරලා තිබෙනවා. එහි අරමුණ තමයි, බඩ ඉරිඟු ගොවියා ආරක්ෂා කර ගැනීම. හැබැයි, මේ කියන කරුණුත්, ඒ අමාත්‍යාංශවලින් සහ ආහාර සුරක්ෂිතතා කමිටුවෙන් අපට ලැබෙන තොරතුරුත් අනුව අපි සූදානමින් ඉන්නවා, අවශ්‍ය නම් ගැළපෙන පරිදි මේ වෙලාවේ ඒ බද්ද ඉවත් කරන්න. අපි ඒක විශේෂ බද්දක් හැටියට පනවා තිබෙන නිසා ඕනෑම වෙලාවක ඉවත් කරන්න පුළුවන්. ඒ නිසා මම වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට කිව්වා, අද මේ විවාදයට සජීවී ලෙස ඇහුම්කන් දෙන්න කියලා. මේ ගරු මන්ත්‍රීතුමන්ලා පෙන්වා දෙන කරුණු ප්‍රාදේශීය වශයෙන් ඉතා වැදගත් කරුණු නිසා අවශ්‍ය තීරණ ගැනීමේදී අදාළ අමාත්‍යාංශවල සහයෝගය සහ මඟ පෙන්වීමත් ඇතිව ඒවා හොඳට අධ්‍යයනය කරලා තබා ගන්න ඕනෑ. ඒවා එදිනෙදා ජන ජීවිතයට වැදගත් වෙනවා. ඒ කරුණු පෙන්වා දීම ගැන එක පැත්තකින් ඔබතුමන්ලාට මම ස්තුතිවන්ත වෙනවා.

ගරු කබීර් හෂීම් මැතිතුමා ඉදිරිපත් කරපු බීඩි සම්බන්ධ කාරණාවත් වැදගත් එකක්. අපි දෙදෙනාම නියෝජනය කරන දිස්ත්‍රික්කයේ බීඩි නිෂ්පාදකයෝ විශාල වශයෙන් ඉන්නවා. ඒක ගෘහ කර්මාන්තයක් විධියට කෙරෙනවා. පිළේ ඉඳගෙන, බීඩිය ඔතලා වට්ටියක තියලා පොඩි ආදායමක් ඒ අය හොයනවා. ගරු කථානායකතුමනි, බීඩි වාගේ දෙයක් ප්‍රවර්ධනයට රජයකට සෘජුවම මැදිහත් වීමට පුළුවන්කමක් නැහැ. මොකද, අපි ලෝකයත් එක්ක බැඳිලා ඉන්නවා, බදු මඟින් දුම්කොළ සහ දුම්වැටි පාලනය කරන්න. මොකද, බීඩි කියන්නේ නිකටින් වැඩිම දුම්වැටියක්. ඒවා නිතිපතා පානය කරන අයට කිසිම පෙරීමක් නැතිව නිකටින් ලැබෙනවා. ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ නායකයා වන විපක්ෂ නායකතුමා 2023 මාර්තු 23වැනි දා මේ සම්බන්ධයෙන් මාත් එක්ක ලොකු විවාදයකත් පැටලුණා. එතුමා අහනවා, උද්ධමනයට සාපේක්ෂව දුම්වැටිවල සහ මත්පැන්වල මිල වැඩි නොකරන්නේ ඇයි කියලා.

එතුමා ලොකු විවාදයක පැටලුණා. එතුමා ඒක නිකම්ම ගෙනා විවාදයක් නොවෙයි. ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාත් එක්ක තමයි එතුමා මා සමඟ ඒ කථා බහ ඇති කර ගත්තේ. අපි 2023 වසරට ඉදිරිපත් කළ අය වැයෙන් ගෙනා යෝජනාවක් විධියට තමයි, ඒ රුපියල් 2 වැඩි කළේ. හැබැයි, අපි උද්ධමනයට සාපේක්ෂව එය කළා නම් රුපියල් 2කින් නොවෙයි, රුපියල් 5කින් හෝ 6කින් ඒ බද්ද අපට වැඩි කරන්න වෙනවා, ගරු කථානායකතුමනි. අපි අනික් මද්‍යසාරවලට වැඩි කළ බදු ප්‍රමාණයත් එක්ක බලනකොට මේක සුළු වැඩි කිරීමක්. අපි මත්පැන් සඳහා මෑත මාස කිහිපය තුළ සියයට 20 ගණනේ දෙවරක් බදු වැඩි කළා. මත්පැන් බෝතලයක් රුපියල් 2,500ට තිබුණා නම්, රුපියල් 500 බැගින් දෙවරක් වැඩි වුණා. බීඩිවලට තිබෙන ආදේශකය තමයි, ෆිල්ටරය රහිත සිගරැට් එක. ඒ, සුදු සිගරැට්. ඒ සුදු සිගරැට් එකක් රුපියල් 15ට තිබුණේ. බීඩියකට රුපියල් 2ක බද්දක් නියම කරපු වෙලාවේ අපි ඒ සුදු සිගරැට් එකට සියයට 95ක tax එකක් නියම කළා. එතකොට මිල සියයට 95කින් වැඩි වුණා. අපි ඒ හැම දෙයක් ගැනම කිරලා මැනලා තමයි කටයුතු කරන්නේ.

ගරු කථානායකතුමනි, දුම්වැටි බොන්නේ ඊට ඇබ්බැහි වූ අය. එම නිසා රුපියල් දෙකකින් බද්ද වැඩි කළා කියා එහි අළෙවිය අඩු වෙන්නේ නැහැ, කර්මාන්තය බිඳ වැටෙන්නේ නැහැ. පිළේ ඉඳගෙන බීඩි ඔතන කෙනාට ඒකෙන් ලොකු බලපෑමක් වෙන්න කිසිදු විධියක් නැහැ. ඔබතුමාත් දන්නවා ඇති, ආර්ථික විද්‍යාවේදී කියනවා, ඇබ්බැහි වූ නිෂ්පාදනයක මිල වැඩි කිරීමකදී, ඒ වැඩිවීම ඉතාම ඍජුව යන්නේ පාරිභෝගිකයාට කියලා. අපට මේ ගනුදෙනුව කරන්න වෙලා තිබෙන්නේ බීඩි ඔතන අහිංසක කාන්තාව සමඟ නොවෙයි. නිලධාරියා එතැනට යන්නේ නැහැ. අපේ නිලධාරියා ගිහිල්ලා ඒ එක්රැස් කිරීම කරගන්නේ බීඩි නිෂ්පාදකයාගෙන්. බීඩි නිෂ්පාදකයෙක් ඉන්නවා. ඔහුගේ නමින් තමයි ව්‍යාපාරය පවත්වාගෙන යන්නේ. ඔබතුමාත් දන්නවා, එම ආයතනය ගාල්ලේ තිබෙන්නේ. ඔහු තමයි ශක්තිමත් ව්‍යාපාරයක් හැටියට එය කරගෙන යන්නේ. ඔබතුමන්ලා කිව්වා, අපේ නිලධාරින් ගියාම ප්‍රශ්නයක් ඇති වන බව. ඔව්, මම එය පිළිගන්නවා. ඒකට අපි උත්තර හොයන්න ඕනෑ.

දැන් අපි බලමු, බීඩියකට රුපියල් 2 ගණනේ බද්ද අය කරන්න පටන් ගත්තාට පස්සේ ලැබුණු ආදායම. ජනවාරි මාසයේ අපට ලැබුණා, රුපියල් මිලියන 56.7ක ආදායමක්. පෙබරවාරි මාසයේ එය රුපියල් මිලියන 60.3යි; මාර්තු මාසයේ රුපියල් මිලියන 64.2යි; අප්‍රේල් මාසයේ රුපියල් මිලියන 73.9යි. අපේ නිලධාරින් නිෂ්පාදකයන්ගේ ගබඩාවලට ගිහිල්ලා ඔවුන් කොච්චරක් අළෙවි කරනවා ද කියලා මැයි මාසයේ ඉඳලා පරීක්ෂා කරන්න පටන් ගත්තා. ඒ තුළින් කොච්චර ආදායමක් අපට හම්බ වුණා ද? ජනවාරි මාසයේ රුපියල් මිලියන 56.7ක් ලැබුණා. ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, නිලධාරින් ගිහිල්ලා බලන්න පටන් ගත්ත පළමු මාසයේ -මැයි මාසයේ- රුපියල් මිලියන 112ක් ලැබුණා, රාජ්‍ය ආදායමට. මේ, මෙතෙක් අපට අහිමි වූ ආදායමක්. බීඩි නිෂ්පාදකයන්ගෙන් අපට ලැබුණු ආදායම එකට එකක් වැඩි වුණා, ගරු කථානායකතුමනි. මේවා ගැන අපට එක කෝණයකින් විතරක් බලා කටයුතු කරන්න බැහැ. ජූනි මාසය වෙනකොට රුපියල් මිලියන 115.8කින් අපේ ආදායම වැඩි වෙලා තිබෙනවා. මම මේකෙන් කියන්නේ නැහැ, අපේ නිලධාරින් සියයට සියයක් හොඳයි, ඔවුන්ගෙන් ප්‍රශ්න නැහැ කියලා.

ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා නිවැරැදියි. මෙතැන තව ප්‍රශ්නයක් තිබෙනවා. බීඩි ඔතන තෙන්දු කොළ කිලෝවකට රුපියල් 5,000ක බද්දක් අය කරනවා. ප්‍රායෝගිකව බැලුවොත් මමත් හිතනවා, ඒ ගණන වැඩියි කියලා. ඒ තුළින් වෙන්නේ ඉතාම වැරැදි, නීතියෙන් පිට වෙළෙඳාමක්. අපේ රට වටේම තිබෙන්නේ මුහුද. එම නිසා හැම පැත්තෙන්ම තෙන්දු කොළ අපේ රටට එනවා. අපේ ඇස්තමේන්තුව අනුව රුපියල් 5,000ක් අය කළාට, නීත්‍යනුකූලව අපේ රටට එන්නේ ඉතා සුළු තෙන්දු කොළ ප්‍රමාණයක්. එම නිසා බීඩි නිෂ්පාදකයන් මේ සම්බන්ධයෙන් විවිධ යෝජනා ඉදිරිපත් කළා. තෙන්දු කොළ ආනයන බද්ද මීට වඩා අඩු කරලා, බීඩිවලින් බදු අය කරන යම්කිසි ක්‍රමයක් හදන්න කියලා. ඔබතුමා පෙන්වා දුන් ආකාරයට අපේ නිලධාරින් අතින් යම් වරදක් වෙනවා නම්, අපි ඒවාත් හොයා බලන්න ඕනෑ. මම ගිය සතියේත් බීඩි නිෂ්පාදකයන්ට සාකච්ඡාවක් සඳහා අවස්ථාව දීලා තිබුණා. ඔවුන්ගේ ලේකම්වරයාට ඩෙංගු උණ හැදිලා තිබෙන නිසා එම සාකච්ඡාවට එන්න බැරි වුණා. ගරු කථානායකතුමනි, ඒ සියලු දෙනාගේ අදහස්වලට ඇහුම්කන් දෙන්න අපි සූදානම්. ඒ අනුව අපි හොඳම විසඳුමට එන්නත් සූදානම්. මම මේ පෙන්වා දුන්නේ රජයක් හැටියට අපි ප්‍රායෝගිකව මුහුණ දෙන තත්ත්වයන්. බීඩි වාගේ දෙයක් අපට ප්‍රවර්ධනය කරන්න බැහැ. හැබැයි, මේ කර්මාන්තයට සම්බන්ධ අයට සහ නිෂ්පාදකයන්ට අනවශ්‍ය හිරිහැරයක් ඇති වෙන්න අපි ඉඩ තියන්නේත් නැහැ.

අද පැවැත්වෙන මේ විවාදයට අපේ නිලධාරිනුත් සජීවීව ඇහුම්කන් දෙනවා. අපි සූදානම්, සියලු දෙනා සමඟ සාකච්ඡා කරලා මේ තිබෙන අපහසුතා තවදුරටත් අවම කිරීම සඳහා කටයුතු කරන්න. ඔබතුමන්ලා මේ ඉදිරිපත් කරපු කරුණු සියල්ල ග්‍රහණය කර ගන්න මම සූදානම්.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 5.19ට, 2023 අගෝස්තු 10වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 5.19 மணிக்கு பாராளுமன்றம், 2023 ஓகஸ்ட் 10, வியாழக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 5.19 p.m. until 9.30 a.m. on Thursday, 10th August, 2023.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.